# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## *WESTERN PROVINCE PROVINCIAL COUNCIL*

**2014** දෙසැම්බර් **02** වන අඟහරුවාදා
2014 மார்கழி 02 செவ்வாய்க் கிழமை
Tuesday 02nd December 2014

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.18 ට පළාත් සභාව රැස් විය.**
**மு.ப. 09.18 க்கு சபை கூடியது**
*The Provincial Council met at 09.18 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு தவிசாளர் .[ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබ සැමට සුභ උදෑසනක් වේවා. ඊයේ දවසේ පැවැතුණු පොදු සාකච්ඡා විවාදයේදී අවාසනාවන්ත ලෙස ගණ පූරණය නොමැති නිසා සභාව අද දවසට කල් තබන්න මට සිදු වුණා. මම ඒ ගැන කනගාටු වෙනවා. විශේෂයෙන්ම මම ඉල්ලා සිටිනවා. මෙම අයවැය විවාදය පැවැත්වෙන දිනවලදී ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ යුතුකමක් තමයි මෙම අයවැය විවාදයට සම්බන්ධ වීම. අවුරුද්දට එක අවස්ථාවයි අයවැය විවාදය තිබෙන්නේ. ඒ නිසා ගණ පූරණය පවත්වාගෙන යෑම දෙපැත්තේම වගකීම. ආණ්ඩු පක්ෂයේ වාගේම විපක්ෂයේ. විශේෂයෙන්ම විපක්ෂයේ පැත්තෙන් තමයි මෙම අයවැය විවාදය පිළිබඳව ගොඩාක් විවේචන සහ යෝජනා ඉදිරිපත් කරන්න තිබෙන්නේ. අයවැයේ ගුණදොස් සම්බන්ධයෙන්. අද දවසේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ විෂයය පථය පිළිබඳ විවාදය පෙ.ව. 11.00 ට ආරම්භ වෙනවා. ඒ නිසා එම විවාදයන් තුළදී විෂයය පථයට අදාළ කරුණු පමණක් සාකච්ඡා කරන්න. මොකද ඊයෙත් මම දෙපැත්තේම දැක්කා, අනවශ්‍ය කරුණු කාරණා සභාව තුළ කථා බහට ලක් වුණා. ඒක ඇත්ත වශයෙන්ම විය යුත්තක් නොවෙයි. ඒ නිසා අද දවසේදී මට සිද්ධ වෙනවා, විෂයය පථයට අදාළ නැතිව කථා කරන මන්ත්‍රීවරුන්ගේ කථා හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න. එහෙම නැත්නම් මම ඒවා වළක්වන්න කටයුතු කරනවා. ඒ පිළිබඳව මම ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරනවා.

## නිවේදනය
ANNOUNCEMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"බස්නාහිර පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ වැඩ බලන අමාත්‍යවරයා වශයෙන් බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවර ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමාව ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014 නොවැම්බර් මස 24 දින පත් කර ඇති බවත්, ඊට අනුකූලව නිල ප්‍රතිඥාව දීමද සිදු කර ඇති බවත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයෙන් සභා ලේකම්තුමා වෙත දන්වා එවා තිබෙන බව මෙම සභාවට කාරුණිකව දැනුම් දෙනවා."*

## වාර්ෂික මුදල් ප්‍රකාශය - 2015
## පූර්ණ කාරක සභාව
ANNUAL FINANCIAL STATEMENT - 2015
COMMITTEE OF THE WHOLE COUNCIL

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව පූර්ණ කාරක සභා තත්ත්වයට පත් කළ යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක 100** | - | **ආණ්ඩුකාරවරයා** |
| **ශීර්ෂ අංක 101** | - | **බස්නාහිර පළාත් සභාව** |
| **ශීර්ෂ අංක 102** | - | **පළාත් රාජ්‍ය කොමිෂන් සභාව** |
| Head no 100 | - | Governor |
| Head no 101 | - | Western Province Provincial Council |
| Head no 102 | - | Provincial Public Service Commission |

[පූ.භා. 09.26]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, වැය ශීර්ෂ අංක 100 ආණ්ඩුකාරතුමා, ශීර්ෂ අංක 101 බස්නාහිර පළාත් සභාව, ශීර්ෂ අංක 102 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විවාදය ආරම්භ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා. ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂය, ශීර්ෂ අංක 100 යි. අපට ඔබතුමන්ලා විසින් එවලා තිබෙනවා, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරතුමාගේ මෙහෙවර මොකක්ද කියන එක මේ පොතේ එය ලියලා තිබෙනවා. *නෛතික බලතල මත බස්නාහිර පළාත් සභා පරිපාලන ක්‍රියාවලිය සඵල සේවාභි සත්කාරයක් සඳහා අධීක්ෂණය, මෙහෙයවීම හා නියාමනය තුළින් තිරසාර සංවර්ධනයකට දායකවීම* හැටියට මෙහෙවරහි සඳහන් කරනවා. ප්‍රධාන කාර්යයන් හැටියට බස්නාහිර පළාත් ප්‍රඥප්ති සෑදීමට. හැකි විෂයයන්ට අදාළව විධායක බලතල ක්‍රියාත්මක කිරීම. සභා අරමුදලේ මූල්‍ය පරිපාටි අදාළ විධායක බලතල ක්‍රියාත්මක කිරීම. පළාත් රාජ්‍ය සේවාවේ සියලු කටයුතු තීරණය ගැනීම හා පළාත් සභා පනතින් 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීම ආණ්ඩුකාරවරයාගේ කාර්යභාරය වන්නේය කියලා තියෙනවා.

අපි ඉතාමත් සතුටු වෙනවා. මෙවැනි කාර්යභාරයක් යටතේ අපේ පළාතේ ආණ්ඩුකාරතුමා ඉතාමත් සාර්ථක ලෙස දීර්ඝ කාලයක් අපේ පළාත් සභාව තුළ ඉඳගෙන මේ බලතල ක්‍රියාත්මක කරවීමට ඉතාමත් කැපවීමකින් වැඩ කටයුතු කරලා, ආණ්ඩුකාරතුමාගේ කාර්යය, එතුමාට පැවරෙන කාර්යය භාරයන් පිළිබඳව එතුමා ගන්නා ක්‍රියාමාර්ගවල යම් යම් අඩු තැන් කිහිපයක් අපට පෙන්නුම් කරනවා. ලිඛිතව එවලා තිබෙන මේ වාර්තාවේ පෙන්වනවා, මුලින්ම ආණ්ඩුකාරවරයාට ලබා දෙන දීමනාව. එතුමාගේ කාර්ය මණ්ඩලයට ලබා දෙන පහසුකම්. එතුමා සඳහා අවුරුද්දක් ඇතුළත එතුමාට වියහියදම් කරන කාර්යයන් පිළිබඳව පළාත් සභාවට වැය බරක් විය යුතු වියදම් කියලා දස ලක්ෂ 45490 කුත්, ඒ වාගේම පළාත් සභා අරමුදලේ වියදම හැටියට මුළු වියදම දස ලක්ෂ 5667.9 ක පෙන්නුම් කිරීමක් කරනවා. එතකොට මේ මුදල් පිළිබඳව අපි කථා කරනකොට මේ සියලුම මුදල් පළාත් සභා අරමුදලට වැය බරක් වෙනවා. ඒ වැය බරක් වෙන මුදල් ජනතාවගෙන් අය කරගන්න මුදල් බවට පරිවර්තනය වෙනවා.

මේ පළාත් සභාවේ පළාත් ආණ්ඩුකාරතුමාගේ කියැවෙන මේ වැය ශීර්ෂයේ බලය අපි හරියට ක්‍රියාත්මක වෙනවාද කියන එක මේ ඉලක්කම්වලින් ලබා දීම තුළ - පසුගිය කාලයේ අපි දැක්කා, එහි යම්කිසි අඩුපාඩුවක් සිද්ධ වෙනවා. අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට, පළාත් රාජ්‍ය සේවාවේ නිලධාරීන්ට, ඒ වාගේම පළාතේ ජනතාවට වගකීමෙන් වැඩ කටයුතු නොකිරීම තුළ දැවැන්ත ප්‍රශ්න රාශියක් අපේ පළාත් සභාව තුළ මතු වෙලා තිබෙනවා. එක උදාහරණයක් හැටියට මුලින්ම අපි කථා කරන්න බලාපොරොත්තු වෙනවා. වැය ශීර්ෂ අංක 101, බස්නාහිර පළාත් සභාව. අපේ සභා ලේකම්තුමාගේ කාර්යභාරය. එතුමා ඔබතුමාගේ නායකත්වයෙන් මේ සියලු වැඩ කටයුතු ක්‍රියාත්මක කරවීම පිළිබඳව, ලිපි ලේඛන, සභා රැස්වීම් පැවැත්වීම, සභාවේ මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව, මේ ඔක්කෝම එතුමාට හැකි උපරිම ප්‍රමාණයෙන් ක්‍රියාත්මක කරලා තිබෙනවා. හැබැයි, අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ නොදැනුවත්කම නිසා මන්ත්‍රීවරුන්ට ඒ පහසුකම් අහිමිවීම දිගින් දිගටම සිදුවෙලා තිබෙනවා. මම මේකට උදාහරණයක් හැටියට මතක් කරන්න ඕනෑ. මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරු 104 දෙනාට යම්කිසි දීමනාවක් ගෙවනවා. පළාත් සභා පනතේ කියලා තිබෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලැබෙන දේවල්වලින් 50% ක් අපට ලබා දෙන්න කියලා. අමාත්‍ය මණ්ඩලයට නියෝජ්‍ය ඇමැතිවරයෙකුගේ පහසුකම් ලබා දෙන්නය කියලා. එය අපේ පළාත් සභා පනතේම තිබෙනවා.

ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කැබිනට් අමාත්‍යවරයෙකුගේ පහසුකම් වරප්‍රසාද ලබා දෙන්නය කියලා මේ පනතේ තිබෙනවා. මේක තමයි ඇත්ත කථාව. මෙවායේ අයිතිවාසිකම් ගැන අපි කථා කරනකොට මාධ්‍යයෙන් හරි වෙනත් දේවල්වලින් හරි එළියට දාලා කියනවා නම් මේ මන්ත්‍රීවරුන්ගේ අයිතිය ආරක්ෂා කරන්න, ඒ පහසුකම් ලබා ගන්න කටයුතු කරනවා කියලා. ඒක වැරැදියි. ඒක නිසා මේ ගරු මන්ත්‍රීවරුන්ගේ දැවැන්ත අඩුවක් මම දකිනවා. මේ පහසුකම් ලබා දීම පිළිබඳව බලන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමා පනතේ තිබෙන සියලුම බලතල 100% ක්ම, 110% ක් විතර පාවිච්චි කරනවා. මම හිතන්නේ මේ සභාවේ ඉන්න ඕනෑම මන්ත්‍රීවරයෙක්ගෙන් ඇහුවොත් ඒක - එතුමාගේ වාහන ටික හරියට අරගෙන තිබෙනවා. එතුමාට ලබා දෙන ඉන්ධන ටික හරියට තිබෙනවා. එතුමාට ලබා දීලා තිබෙන ආරක්ෂාව තිබෙනවා. එතුමාට ලබා දීලා තිබෙන කාර්යාලයීය දුරකථන, ගෙදරට

දීලා තිබෙන දුරකථන තිබෙනවා. ගෙවල් කුළී සියලු දේවල් ඔක්කෝම තිබෙනවා. හැබැයි, මේ ඔක්කෝම එතුමාට හම්බ වුණේ මේ පළාත් සභාව නිසා කියන එක අද එතුමාට අමතක වෙලා තිබෙනවා. ඒ එකක්. ඒක නිසා මේ මන්ත්‍රීවරුන් පිළිබඳව ඔබතුමා නායකත්වය දරන මේ පළාත් සභාවේ සභාපතිවරයාට තිබෙන බලතල ඔබතුමා හරියාකාරව ක්‍රියාත්මක කරන්න. කිසි දෙයකට භය වෙන්න එපා. මේ පනතේ ලිඛිතව තිබෙන්නේ, නියම වැඩ කටයුතු ටික ක්‍රියාත්මක කරලා තමන් නිර්දෝෂ මිනිහෙක් බවට පත් වෙන්න පුළුවන්. හරියට කියවලා මේක තේරුම් ගත්තොත්. අනික් එක මේ මන්ත්‍රීවරු 104 දෙනා. අද අහන්න මන්ත්‍රීවරුන්ට ගෙදරකට දුරකථනයක් තිබෙනවාද කියලා. මම දන්නේ නැහැ. මම නම් හිතන්නේ නැහැ දීලා තිබෙනවා කියලා. මට නැහැ, කාර්යාල දුරකථනයක්. එතකොට මේ අපි කාර්යාලයේ පහසුකමුයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලාට දුරකථනයක් ලබා දීලා තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

බොහොම ස්තුතිවන්ත වෙනවා. මම හිතුවා ඒ පිළිබඳව. ඒක සත්‍ය වෙන්න ඇති. එතකොට හොරකම, නාස්තිය, දූෂණය අඩු වෙලා මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ඉතාමත් පැහැදිලි ලෙස ආරක්ෂා වෙනවා. එහෙමනම් ඒකට මම ඔබතුමාට ඉතාමත් ස්තුතිවන්ත වෙනවා. මේ වැය ශීර්ෂයන් යටතේ අපට ලැබිය යුතු දෙයක්. අවුරුදු 20 ක් නොලැබීම අපේ මන්ත්‍රීවරුන්ගේ දුර්වලකමක් කියන එක මම පෙන්වන්න කැමැතියි.

ඊළඟට අරගෙන බලමු රාජ්‍ය සේවා කොමිෂම් සභා වැය ශීර්ෂය මෙතැනට ඇතුළත් වෙලා තිබෙනවා. පළාත් රාජ්‍ය සේවා කොමිෂමේ වැය ශීර්ෂය පිළිබඳව අපි කථා කරනවා නම් ඒ වැය ශීර්ෂය මෙයට ඇතුළත්වීම තුළ ඒකෙත් අපි අද විවාදය - එහෙමනම් අපේ පළාත් සභාවේ නිලධාරීන් කොපමණ ඉන්නවාද? රාජ්‍ය සේවා කොමිෂන් සභාව මේ නිලධාරීන් බඳවා ගැනීමට අනුමැතිය ගන්නවා. මේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලබා දෙන අනුමැතියෙන් - අපි කියමු කෝ විදුහල්පතිවරුන් කණ්ඩායමක් අපේ අගලවත්ත, බුලත්සිංහල දුෂ්කර ප්‍රදේශවල්වලට යවනවා. දෙමළ මාධ්‍යයෙන් කථා කරන්න උගන්වන්න අවශ්‍ය ගුරුවරු. ටික දවසක් යනකොට මේ අය ආණ්ඩුකාරතුමාගේ යාළුවෙක් වෙන්න පුළුවන්. හිතවතෙක් වෙන්න පුළුවන්. මොනවා හරි දේශපාලන නියෝගයක් වෙන්න පුළුවන්. එයාව ආපසු කොළඹට ගන්නවා. එතකොට ගරු සභාපතිතුමනි, මේ දුෂ්කර ද්‍රවිඩ පාසල්වල ඉගෙන ගන්න දරුවන්ට ඒ ගුරුවරයා නැති වුණාම - අදටත් තිබෙනවා. මම කනගාටු වෙනවා. ප්‍රධාන අමාත්‍යතුමා ඇත්තෙන්ම ඇයි මේ සභාවේ නැත්තේ කියලා. එතුමා ඉන්න ඕනෑ. මේ එතුමාගේ වැය ශීර්ෂය. බලන්න. ආණ්ඩු පක්ෂයේ එක පැත්තක්ම හිස්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා, කරුණාකරලා පෞද්ගලික සාකච්ඡාවලින් වැළකී සිටින්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, ඒ ගුරුවරුන් ආපසු නගරයට එනවා. ඉතින් ඒ නිසා මෙවැනි දේශපාලන තීන්දු සහ බලය උපයෝගී කරගෙන පාසල්වල ඉගෙන ගන්න ද්‍රවිඩ, මුස්ලිම් ජනතාවගේ දරුවන්ට අධ්‍යාපනයට නියම සුදුසු සේවාවක් ලබා දීමට බැරිවන තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා. මේ නිලධාරීන් - අපි බැලුවා, ගුරුවරුන් කොහේද ඉන්නේ කියලා. පංගුවක් අය දේශපාලඥයින්ට අනුයුක්ත කරලා. හොරණ කලාපයේ අපි කථා කළා. මම දේශපාලඥයින්ගේ නම් කියන්න කැමැතිත් නැහැ. ඒවා සොයා බලන්න. ආණ්ඩුකාරතුමාට දැනුම් දීමක් කරන්න. මේවා සොයා බලලා නීතිය හරියට ක්‍රියාත්මක කරන්න පළාතේ ගෞරවය ආරක්ෂා වන, සුළු ජාතීන්ගේ අධ්‍යාපනය දියුණු කරගන්න පුළුවන් වැඩ පිළිවෙළකට මෙය යොදවන්න කියලා. ඔබතුමාගේ මාර්ගයෙන් අපි මේ වැය ශිර්ෂයන් යටතේ ගරු ආණ්ඩුකාරතුමන්ට මෙය දැනුම් දෙන්න කැමැතියි.

ඒ වාගේම අපේ පළාත් රාජ්‍ය සේවාවේ නිලධාරීන්. විශාල නිලධාරීන් පිරිසක් ඉන්නවා. මේ අයට ණය ලබා ගැනීම්, ස්ථාන මාරුවීම්, උසස්වීම් ලබා දෙන්න ගියාම පළාතේ පනතට වැඩියෙන් ඉහළින් ගිහිල්ලා තිබෙනවා, පළාතේ දේශපාලන අධිකාරියේ බලය. මේක ඉතාමත් කනගාටුදායක තත්ත්වයක්. අපි දැක්කා, මේ නිදහස ගත්ත දවසේ සිටම දේශපාලනයට පත්වීම්, උසස්වීම් දීපු යුගය අවසන් කළා, රණසිංහ ප්‍රේමදාස

[ ගරු කිත්සිරි කහටපිටිය ]

ජනාධිපතිතුමාගේ කාලයේ. සුදුස්සාට සුදුසු තැන දීලා, ලකුණු මට්ටමකින් විභාග පවත්වලා, ගම් මට්ටමින් ඒ අයගේ සේවාව ලබා දෙන්න වැඩ කටයුතු කරනවා. නමුත් අපි පළාත් සභාවේ මේක කථා කරලා කියනවා. එහෙම කිව්වාට අන්තිමේදී වචනයකට සීමා වෙලා පත්වීම ලබා ගත්තාම ඒ පත්වීමේ තිබෙන්නේ ප්‍රධානම හේතුව දේශපාලනය කිරීමේ හයියයි. ඒ අනුව එයාට උසස්වීම, මාරුව සහ පත්වීම ලැබෙනවා. අපි දැක්කා, මේ පළාත් සභාවට රෝහල් කම්කරුවන්, පාසල්වලට අවශ්‍ය පුස්තකාල සේවකයින්, ඒ වාගේම මේ පනතේ තිබෙන බලයත් එක්ක බඳවාගත්ත බඳවා ගැනීම්. ඒ අයට අපේ උපාධිධාරීන්ට ලබා දීපු ගුරු පත්වීම්. පළාත් රාජ්‍ය සේවා කොමිෂම හරියාකාරව ක්‍රියාත්මක කරලා කටයුතු කිරීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා, පළාත් රාජ්‍ය සේවා කොමිෂමේ නිලධාරීන්ටත්, දේශපාලනයට ඇඟිල්ලක් නොගහා අධ්‍යාපනයේ උසස්ම සහතිකය ලබා ගත්තු උපාධිධාරීන්ටත් ඒ පත්වීම් ටික ලබා දීම පිළිබඳව. හැබැයි, අනික් ඒවා මොනවාද වෙලා තිබෙන්නේ. ඒ අනික් පැත්තෙන් අරගෙන බැලුවාම ඒ අයගේ පත්වීම දීලා තිබෙන්නේ දේශපාලනයෙන්. දේශපාලනයෙන් ගිහිල්ලා විදුහලේ විදුහල්පති, නැත්නම් පුස්තකාලයාධිපති ගාවට ගිහිල්ලා ඒ අය සේවාව හරියට ලබා දෙන්න කිව්වාම දේශපාලන බලය අතට ගන්නවා පත්වීම ලබා ගෙන ගිය කම්කරුවා. එතැනදී ගැටලු ඇති වෙලා අර නිලධාරීන් අසරණ තත්ත්වයකට පත් වෙන තැනට අද අපේ පළාත් සභාවේ දේශපාලනය කිරීම තුළ රාජ්‍ය සේවාව පිරිහීමකට ලක් වෙමින් පවතින බව මම මෙම අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

එහෙමනම් ඊළඟට අපි කථා කරන්න ඕනෑ, මේ ආණ්ඩුකාරතුමා කැපවීමෙන් වැඩ කටයුතු කිරීම තුළ එතුමාගේ කාර්යභාරය පිළිබඳව වැය ශීර්ෂයන් ගණනාවක්ම මෙතැනට අයත් වන ලේඛනයක් පෙන්නුම් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

බස්නාහිර පළාත් සභාව 2015 වසරේ මුදල් ප්‍රකාශ පිළිබඳ වැය ශීර්ෂයන් ඔක්කෝම 100 සිට 126 දක්වා වැය ශීර්ෂයන් පිළිබඳ වාර්තාවක් අපට එවලා තිබෙනවා. මේ ගැන මම අධ්‍යයනය කරලා බැලුවා. අපි මේ ගැන සොයා බැලුවා. මේ සියලු වැය ශීර්ෂයන් තුළට මූල්‍ය ප්‍රතිපාදන ලබා දීලා වැඩ කටයුතු කිරීම තුළ, මේ මූල්‍ය ප්‍රතිපාදනවල ප්‍රගති සමාලෝචනය කළාම බහුතරය තිබෙන්නේ වංචාව, හොරකම, දූෂණය සහ අකාර්යක්ෂමතාවය උඩ මෙය හරියට ක්‍රියාත්මක කරන්න බැරි වෙලා තිබීමයි. එහෙමනම් මේ පළාත් සභාවට අලුතෙන් පත් වුණු මන්ත්‍රීවරු ඉන්නවා. අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා එනවා. අපි සතුටු වෙනවා. එතුමා ඉන්න අවස්ථාවේ මට මේ ටික කියා ගන්න බැරි වුණා. නමුත් වාර්තාව කියවලා හරි බලලා තමුන්නාන්සේලා සියලුදෙනාම ඒකරාශි වෙලා මේ අවශ්‍ය පහසුකම් ටික ලබා දීම සඳහා වැඩ කටයුතු කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මම තව එක කරුණක් මතක් කරන්න කැමැතියි. මේ ගරු මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් අපි මේ පළාත් සභාවේ විශ්‍රාම වැටුප් ක්‍රමයක් අවශ්‍යයි කියලා යෝජනාව සභාවට ගෙනැල්ලා භය නැතිව ඒකට මම කථා කිරීම තුළ දුරකථනවලින් අනන්ත අප්‍රමාණ බැණුම් ඇහුවා, මේ මොනවද උඹලා කථා කළේ කියලා. නමුත් මෝඩ මිනිස්සු දුරකථනයෙන් නොදැනුවත්ව කථා කිරීම පිළිබඳව මට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මම කථා කළේ පළාත් සභා පනතේ තිබෙන අයිතියත් එක්ක මේ අසරණ වුණු මන්ත්‍රීවරුන්ට මේක අනිවාර්යයෙන් ලබා දිය යුතුයි කියන පදනම මතයි. ජනාධිපති ලේකම් කාර්යාලයට ලෝරන්ස් මාදිවෙල මැතිතුමා යවාපු ලිපියකට මට ලේකම් කෙනෙක් කථා කරලා මේ ඊයේ පෙරෙයිදා මගෙන් විස්තර ඇහුවා. මම සභා ලේකම්තුමාට එතුමාගේ දුරකථන අංකයත් දීලා මම කිව්වා, මේ සභාවේ අපේ රංජිත් සෝමවංශ මැතිතුමා ඒ වේලාවේ සිටියේ. එතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. ඒක අරගෙන මම කිව්වා මෙතුමාට ඒක යවන්න කියලා. ඊට පස්සේ නැවත මට කරලා කිව්වා, එදා හම්බ වුණේ නැහැයි කියලා. යැව්වාද මම දන්නේ නැහැ. මේ මන්ත්‍රීවරුන්ට මේ විශ්‍රාම වැටුප් ක්‍රමය හිඟා කකා කෑ ගසා ඉල්ලන්න ඕනෑ නැහැ. මේ පනතේ බලතලත් එක්ක අනිවාර්යයෙන්ම දිය යුතුයි. ඇයි? මේ පනතේ කියනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් 50% ක් වරප්‍රසාද ඒ වැටුපෙන් දෙනවා නම්, ඒ 50% තමයි අපි ඉල්ලන්නේ. අවුරුදු 05 ක් අවසන් වුණු අයට ඒ විශ්‍රාම වැටුප් ක්‍රමය දෙන්න කියලා. අර ලෝරන්ස් මාදිවෙල ගරු මන්ත්‍රීතුමන්ලා, තව අපෙන් ගිය සියලු දෙනාම කථා

කර කර අහනවා මොකක්ද මේවාට වෙන්නේ කියලා. සභාවෙන් සම්මත වුණා. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඔබතුමාගේ නිර්දේශය ආණ්ඩුකාරතුමා වෙත යොමු කරවමින්, ආණ්ඩුකාරතුමාට එය ක්‍රියාත්මක කරන්න හැකියාව යොමු කරන්න කටයුතු කරන්න කියන එක ඉල්ලමින් අපේ මේ වැය ශීර්ෂ තුන ඉතාමත් සාධාරණව, සාර්ථකව මේ වසර තුළ නිලධාරීන්, දේශපාලඥයින් ආණ්ඩුකාරතුමා ඇතුළු සියලු දෙනාම එකතු වෙලා ජනතාවට සේවාවක් වන මන්ත්‍රීවරුන්ට ඒ සේවාවෙන් පහසුවක් ලැබෙන වසරක් බවට පත් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[පූ.භා. 09.43]

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්න මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ එක්කම කිත්සිරි කහපිටිය ගරු මන්ත්‍රීතුමා ඒ වැය ශීර්ෂය පිළිබඳව දීර්ඝ විස්තරයක් කරමින් කළ යුතු දේ මොකක්ද කියන එක පිළිබඳව කථා කරලා පෙන්නලා දීම පිළිබඳවත් මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ එක්කම කියන්න ඕනෑ, දීර්ඝ කාලයක් තිස්සේ බස්නාහිර පළාත් සභාව මේ ආකාරයට ගෙන යන්න ගරු ආණ්ඩුකාරතුමා, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය අපට දුන්නු සහයෝගය සහ ඒ මහපෙන්වීම පිළිබඳව මම ගරු ආණ්ඩුකාරතුමාට සහ ඒ කාර්ය මණ්ඩලයට බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. ඒ එක්කම අලුතෙන් මොනවාද කරන්න ඕනෑ කියන එක පිළිබඳව පෙන්වා දීමේ වගකීම, යුතුකම අපට මේ අවස්ථාවේ තිබෙනවා. ඒ නිසා අපේ බස්නාහිර පළාත් සභාව අද දෙවැනි වෙන්නේ පාර්ලිමේන්තුවට පමණයි කියන කථාව අපි කවුරුත් දන්නවා. ඒ නිසා මේ පළාත් සභාව කෙරෙහි අනිකුත් සියලු පළාත් සභා බලාගෙන ඉන්නවා, අපි ගෙනියන වැඩ සටහන මොකක්ද? අපි ගෙනියන නීති රීති මොනවාද? අපි ක්‍රියා කරන, අනුගමනය කරන දේවල් මොනවාද? කියන එක පිළිබඳව. දැන් සමස්ත පළාත් සභා පද්ධතිය ඉස්සරහාට ගේන්න නම්, සමස්ත පළාත් සභා පද්ධතිය ගරුත්වයක් ඇතිව ආරක්ෂා කර ගන්නට නම් අපි පළාත් සභාව තුළට මොනවාද කරන්න ඕනෑය කියන එක පිළිබඳව මේ සභාවේදී පෙන්වා දීමේ වගකීම සහ යුතුකම අපට තිබෙනවා. ඒ අනුව මම පැහැදිලිව ප්‍රකාශයක් කරනවා, අද සියලුම ගරු මන්ත්‍රීවරුන්ට විශේෂයෙන් අලුතෙන් පත්වෙලා පැමිණි මන්ත්‍රීවරු හරියාකාරව මේ අවුරුද්දේ අපට පුහුණුවීම්, වැඩ සටහන්, ඒ අයට මඟ පෙන්වීමක් කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒක නිසාම වෙන්න ඇති මේ පසුගිය කාලයේදී අපි සභාවේ දැක්කා, අලුත් මන්ත්‍රීවරු සභාවට දක්වන සැලකිල්ල මොකක්ද කියන එක පිළිබඳව. සභාවට එන්නේ යන්නේ කොහොමද කියන එක පිළිබඳව. සභාවේ තිබෙන චර්යා ධර්ම මොන ආකාරයෙන්ද ආරක්ෂා කරන්නේ කියන එක පිළිබඳව. අපි ඒක දැක්කා. ඒ නිසා ඒ අඩුපාඩු පිළිබඳව ඒ නවක මන්ත්‍රීවරුන්ට දොස් කියනවාට වඩා ඒ අයට ක්‍රමවත්ව දැනුවත් කිරීමක් ලබා දීම අවශ්‍ය වෙනවා. විශේෂයෙන් මේ කාරක සභාවල් පවත්වනකොට අපි දන්නවා. ඒ කාරක සභාවකින් මොකක්ද වෙන්නේ කියන එක පිළිබඳවත් අලුත් මන්ත්‍රීවරුන්ට හරි වැටහීමක්, තේරුමක් නැහැ. ඒ අය ලැහැස්තියි. ඒ අයට ඕනෑකමක් තිබෙනවා මේක ඉගෙන ගන්න. දැනුවත් කරගන්න ඕනෑකමක් තිබෙනවා. නමුත් ඒ පිළිබඳව වාතාවරණයක් සකස් වෙලා හරියාකාර වැඩ පිළිවෙළක් පසුගිය කාලසීමාව තුළදී තිබුණේ නැහැ. ඒක නිසා ගරු සභාපතිතුමනි, මම ආණ්ඩුකාර වැය ශීර්ෂය යටතේ ගරු ආණ්ඩුකාරතුමාට එය අවධානයට යොමු කරවනවා. මේ සියලු ගරු මන්ත්‍රීතුමන්ලාට පළාත් සභාව කෙරෙහි, ඒ වාගේම අපේ සභාවෙන් පැවැත්වෙන කාරක සභා කෙරෙහි මීට වඩා දැනුවත් කිරීමේ වැඩ සටහන්, වැඩ පිළිවෙළක් දියත් කරන්න අවස්ථාව ඉදිරියේදී සකස් කරන්නය කියන අවධානය මම මේ අවස්ථාවේදී යොමු කරනවා. ඒ වාගේම ඒ තුළින් අපට පුළුවන්කමක් ඇති වෙයි අනික් සභාවලට ආදර්ශවත් වන ආකාරයේ සභාවක්, බස්නාහිර පළාත් සභාව තුළ තිබෙනවා කියලා රටට පෙන්වන්න.

ඒ එක්කම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ පහසුකම් පිළිබඳව කථා කරන්නේ අපේ සභාව. සභාව බැලුවායින් පස්සේ සභාවේ අඩුපාඩුකම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ එක එක යුගයට අනුව, අද යුගයට අනුව සභාව බැලුවායින් පස්සේ අපට තේරෙනවා සභාව ගෙනි යනකොට, කාරක සභාව ගෙනි යනකොට සභාපතිතුමාගේ කාර්ය මණ්ඩලය, සභා ලේකම් කාර්යාලය බැලුවායින් පස්සේ විශාල අඩුපාඩු රාශියක් එතැන තිබෙන බව. විශේෂයෙන් ධුරධාරීන්ට අපි යෝජනාවක් ගෙනාවා. ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ කණ්ඩායම් එක්ක සාකච්ඡා කරලා, ධුරධාරීන් අනික් සභාවන්වලට යන්න ඕනෑ. අනික් සභාවල තිබෙන අඩුපාඩුකම් බලලා අපට ඒවායින් උපුටා

ගන්න පුළුවන් මොනවාද කියලා බලන්න ඕනෑ. මෙන්න මේවා පිළිබඳව කථා බහ කළාට එයින් එහාට ගෙනිය ගන්න පුළුවන් පරිසරයක්, වාතාවරණයක් සභා ලේකම් කාර්යාලය තුළ නැහැ. ඒ නිසා සභා ලේකම් කාර්යාලය තුළ ඒ ධූරධාරීන්ට සහ ඒ අනිකුත් අයව දැනුවත් කිරීමේ වැඩ සටහන් කරන්න බොහොම හිඟතාවයක්, බොහෙම අඩුවක් තිබෙන බව මම දැක්කා.

ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ප්‍රධාන ලේකම්තුමිය, ප්‍රධාන අමාත්‍ය ලේකම්තුමන්ලා බස්නාහිර පළාත් සභාව තුළ මහ අතිවිශාල වැඩ කොටසක් මේ සම්බන්ධව ඉටු කරනවා. පළාත් සභා අනන්‍යතාවය ඇති කරන්න මහන්සි වෙනවා. වැය කරනවාත් එක්කම ඒක රටට පේන්නේ, පළාත් සභාවට පේන්නේ පළාත් සභාවේ අනන්‍යතාවය පෙන්නුවොත් විතරයි. ඒක නිසා ගරු මන්ත්‍රීතුමන්ලා, ධූරධාරීන් ඒ වාගේ දැනුවත් කිරීම්, වැඩ සටහන් කරන්න වාතාවරණයක්, පරිසරයක් සභා ලේකම් කාර්යාලය තුළ ඇති කරන්නය කියන ඉල්ලීම මම ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂය යටතේ කථා කරනවා.

ඒ වාගේම අපි දන්නවා සභා ලේකම්තුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලය කොයිතරම් මහන්සියක්, කොයිතරම් වෙහෙසක් ගත්තත් ඒ අඩුපාඩුකම් නිසා, සභා ලේකම් කාර්යාලයේ තිබෙන යම් යම් දේවල් නිසා බොහෝ අඩුපාඩුකම් රාශියක් ඒ තුළ පවතිනවා. මම නැවත නැවතත් මතක් කරනවා. ඒ සම්බන්ධව මන්ත්‍රීවරුන් සම්බන්ධ කටයුතුවලදී ඒ තිබෙන අඩුපාඩුකම් සකස් කරලා පුහුණුවීමක් කරන්න අවස්ථාව ලබා දෙන්න කටයුතු කරන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කියන්න මොනවාද අඩුපාඩු කියලා. නැත්නම් දන්නේ නැහැ නේ?

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, අපට අවශ්‍යතාවයක් තිබුණා ධූරධාරීන්ව වෙනත් වෙනත් සභාවන්වලට යවලා ඒ තිබෙන අඩුපාඩුකම්, ඒ තිබෙන අලුත් දේවල් අපේ සභාවට ගේන්න අපට තවදුරටත් අවශ්‍ය මොනවාද කියලා බලන්න. ඒ වාගේම අපට ඕනෑකමක් තිබුණා, මේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මීට වඩා දැනුවත් කිරීමේ වැඩ සටහන් කරන්න. ඒවා කරන්න අපි යෝජනා කළාම මුදල් නැහැයි කියන එක අහන්නේ නැතිව ඒවාට මුදල් අවශ්‍ය ප්‍රමාණයක් ලබා දෙන්නය කියන එකයි මම පෙන්නුම් කරන්නේ. ඒක නිසා මේවා එකින් එක මම සභාගත කරන්න උත්සාහ කරනවා. ඒ අඩුපාඩු මොනවාද කියන එක පිළිබඳව. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විශ්‍රාම වැටුපක් ගැන යෝජනා කරලා කථා කළා. සමහර මන්ත්‍රීතුමන්ලා මේ සභාවේ ඉන්නවා, නොකඩවා අවුරුදු 20 ක් හිටපු අය. අවුරුදු 25 ක් හිටිය අය ඉන්නවා. මේ මන්ත්‍රීතුමන්ලාට තමන්ගේ ජීවිතයේ සැඳෑ සමය ගත කරන්න ගිය වෙලාවේදී මම හිතන්නේ තමන්ට ඉතුරු වෙන්නේ මොකක්ද කියන එක පිළිබඳව අපි අවධානය යොමු කරන්න වෙනවා. ඒක නිසා ඒ සම්බන්ධව අවධානය යොමු කරනවා. (බාධා කිරීමක්)

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මම තවත් එක දෙයක් පෙන්වා දෙනවා. මේ සභාවේ ඉන්න මන්ත්‍රීතුමන්ලා දැනුවත් කරලා, සභාවේ ඉන්න මන්ත්‍රීතුමන්ලා මේ සභාවේ කාර්යපටිපාටි, ඒ වාගේම කාරක සභා සම්බන්ධයෙන් දැනුවත් කරලා ඒ සභා රාමුවට ගන්න අවශ්‍ය වෙනවා. ඒ එක්කම මේ සභාවේ ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලාගේ කාර්ය මණ්ඩලය, සේවක පිරිස, නිලධාරී පිරිස අපේ සභාවට අනුයුක්ත වෙලා තිබෙන්නේ. අපි සභාවෙන් වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න වෙනවා. ඒ කාර්ය මණ්ඩලයේ ඉන්න නිලධාරීන් තමන්ගේ මේ ක්‍රියාදාමයේ නොතේරුම්කම නිසා මන්ත්‍රීවරයා අගෞරවය පත් වන ආකාරයේ කටයුතු සිදු වෙනවා. ඒක නිසා මම ඔබතුමා මාර්ගයෙන් ගරු ආණ්ඩුකාරතුමාට මේ අවස්ථාවේදී පෙන්වා දෙනවා. ඒ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ පාඨමාලාවක්, වැඩ සටහනක්, වැඩ මුළුවක් පවත්වන්න අවස්ථාව අවුරුද්දකට එක වතාවක් හෝ දෙවතාවක්වත් ලබා දෙන්නය කියලා අවධානය යොමු කරනවා.

ඒ වාගේම පාසල් පද්ධතිය පිළිබඳව කථා කරලා කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා පෙන්වා දුන්නා. ඒ සම්බන්ධයෙන් මම කියනවා. අද මම මේ අවස්ථාවේ බොහොම සතුටු වෙනවා. අපේ සමස්ත අධ්‍යාපන පද්ධතිය තුළ ගුරුවරුන් බඳවා ගැනීම ඉතාමත්ම සතුටුදායකව කෙරුණා. ඒ සම්බන්ධව උපරිම ආකාරයෙන්, මීට අවුරුදු 06 කට, 07 කට, නැත්නම් 10 කට, 12 කට වාගේ

නොවෙයි. අද සමස්ත ගුරු පද්ධතිය බොහොම සතුටුදායක තත්ත්වයක පාසල් මට්ටම පවතිනවා. හැබැයි, මේ දීර්ඝ කාලයක සිට මේ සුළු සේවක අඩුව අතිශයින්ම පාසල් පද්ධතියට බලපානවා. ඒක නිසා අන්න ඒ සුළු සේවකයන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ ආණ්ඩුකාර වැය ශීර්ෂය. පළාත් සභාව ගැන කථා කරන්න.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

බඳවා ගැනීමත් ඒ සඳහා අනුමැතිය ගරු ආණ්ඩුකාරතුමාගෙන් මීට වඩා අවධානයක් යොමු කරන්නය කියලා මතක් කරමින් අද ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂය යටතේ ආණ්ඩුකාරතුමා මෙතෙක් මේ සභාවට කරපු සේවාව සහ එය අගය කරමින් එය ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ ලේකම්තුමා ඇතුළු සියලුම දෙනාට බොහොමත්ම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ඔබ සියලුදෙනාටම සුභ අනාගතයක්.

[පූ.භා. 09.53]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ආණ්ඩුකාරවරයාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතියි. මෙහිදී මා පළමුකොට ගරු ආණ්ඩුකාරවරයාට සුභ ප්‍රාර්ථනා කරනවා, දීර්ඝ කාලයක් මේ පළාත් සභාවට සේවය කරමින් එතුමාගේ කෘතහස්ත දැනුම, ඒ පරිණත බුද්ධිය පාවිච්චි කරලා මේ සභාවට මහපෙන්වීමක් කරමින්, ඒ වැදගත් ධුරයේ කටයුතු කරගෙන යන්න අවස්ථාවක් ලැබීමත්, ඒ සේවය ලබන්නට මේ සභාව වාසනාවන්ත වීමත් ගැන මම සුභ ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම මම මතක් කරන්නට ඕනෑ. මේ බස්නාහිර පළාත් සභාව ගැන අපි කවුරුත් කථා කරනවා, ලංකාවම බලාගෙන ඉන්න වැදගත් කාර්ය භාරයක් ඉටු කරන පළාත් සභාවක්. ඉතින් මෙහිදී අපි ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂය කථා කරද්දී අපි සම්ප්‍රදායක් හැටියට ඒ සම්බන්ධයෙන් වැදගත් විවේචනයක් මිසක් අපි නොවැදගත් විවේචනයක් කරන්නේ නැහැ. කෙසේ වෙතත් අපේ ප්‍රඥප්ති හා නීති කාරක සභාව සහ සභා කටයුතු කාරක සභාව සම්බන්ධව ඒ අධීක්ෂණය කරන බලධාරියා හැටියට මම දකිනවා, විශේෂයෙන්ම මෙම පළාත් සභාව නීතිමය කටයුතුවලදී යම්කිසි අවධානයක් යොමු කරන්න ඕනෑ ක්ෂේත්‍රයක් තමයි නීති සම්පාදනය කිරීම. දැන් අපේ මධ්‍යම ආණ්ඩුවට නීති කෙටුම්පත් මණ්ඩලයක් තිබෙනවා. යම්කිසි කෘතහස්ත නීති දැනුම තිබෙන කෙටුම්පත් මණ්ඩලයක් තිබෙනවා. දැන් මේ පළාත් සභාවේ ඒ සෑම නීතියක්ම කෙටුම්පත් වෙනවා, නීතිය පිළිබඳව යම්කිසි අවබෝධයක් තිබෙන ප්‍රඥප්ති හා නීති කාරක සභාවක් මඟින්. ඒ වාගේම පළාත් සභාව නියෝජනය කරන යම් යම් නීති කටයුතුවලදී මම හිතන්නේ ඒ කාරක සභාවේත් යම්කිසි අනුමැතියක් ඇතිව විවිධ නීතිඥවරුන් පත් කර ගැනීමක් සිදු කරනවා. නමුත් අපේ නීතිය සම්පාදනය කර ගැනීමේදී විශේෂඥ දැනුමක් තිබෙන යම්කිසි මණ්ඩලයක් පත් කර ගැනීමට කටයුතු කරන්න අපි තවමත් පියවරක් අරගෙන නැහැ. ඒකෙන් වෙන්නේ මොකක්ද? මේ සම්මත කරන නීතිවල යම්කිසි දුර්වලතාවයක්, අඩුපාඩුවක් තිබෙනවා නම්, ඒක විටින් විට සංශෝධනය කිරීමට භාජනය වෙනවා. මේ නිසා යම්කිසි නීති කටයුත්තකදී පළාත් සභාව නියෝජනය කරන්න වෙන ආකාරයට ඒ කාරක සභාවන්වලට අවශ්‍ය පහසුකම් සපයා දීමක් සිදුවන්නට ඕනෑ. ඒක අඩුපාඩුවක් වශයෙන් මම දකිනවා.

දැන් උදාහරණයක් හැටියට පෙත්සම් කාරක සභාවෙන් දීපු තීන්දුවක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ යම්කිසි නඩු කටයුත්තක් පසුගිය කාලයේ පැවරිලා තිබුණා. එතකොට මේ වාගේ අවස්ථාවක ස්ථිර වශයෙන් අපි තෝරාගත්තු මණ්ඩලයක් නැහැ. ඉතින් මෙවැනි අවස්ථාවකදී පිටස්තර නීතිඥ මහත්ම මහත්මීන්ට පළාත් සභාවේ මුදල් අපට වැය කරන්න සිද්ධ වෙනවා. අපි යම්කිසි ක්‍රමෝපායක් ඒකට සකස් කරගෙන තිබෙනවා නම් ඒ වාගේ අවස්ථාවකදී සභාව ගැන දැනුවත් කෙනෙක් හැටියට, සභාව වැඩ කටයුතු කරන ආකාරය පිළිබඳව අවබෝධයකින් මේ දේ කරන්න පුළුවන්. එක්තරා ඉඩමක් සම්බන්ධ ප්‍රශ්නයකදී අපේ පෙත්සම් කාරක සභාව දීලා තිබුණු තීන්දුවක් ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රශ්නගත වෙලා තිබුණා. ඉතින් මෙවැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමාගේ අවධානය මම ඔබතුමා හරහා යොමු කර සිටිනවා, ඒක ඉතාමත් වැදගත් කටයුත්තක් හැටියට සලකලා ඒ ක්‍රමෝපායක් සකස් කරන්න ඕනෑ අවස්ථාවක් කියලා දැනුවත් කරනවා.

[ ගරු රෝස් ප්‍රනාන්දු ]

ඒ එක්කම බස්නාහිර පළාත් සභාවේ කාර්ය මණ්ඩලය පරිපාලනය කිරීමේදී ඇත්ත වශයෙන්ම අපි ස්තූති කිරීමක් කරන්න මෙය අවස්ථාවක් කරගන්නවා. ඒ කාර්ය මණ්ඩලයේ 90% ක් වාගේ සියලුම නිලධාරීන් ඉතාම වැදගත්, ඒ වාගේම මහජන මන්ත්‍රීතුමන්ලාට ඒ අවශ්‍යතා ඉෂ්ට කිරීමේදී බොහොම කාරුණිකව ඒ කටයුතු කරගෙන යන ආකාරය අපි ප්‍රශංසාවට ලක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම අපි පුරුදු වෙලා ඉන්නවා, හැම දෙයකම වැරදි විතරක් කථා කරන්න. නමුත් මේ සේවකයින් දිරිගන්වන්න, මේ පළාත් සභාව ඉදිරියට අපි අරගෙන යද්දී ඒ අයගේ ඒ කැප කිරීම - සමහර අවස්ථාවල අපි දකිනවා, මේ නිලධාරීන් හැන්දෑවේ හතරහමාර, පහ ඒ කාරක සභාවල කාලය ගත කරනවා. ඒ අයට විශේෂ දීමනා ලැබෙන්නේ නැහැ. නමුත් ඒ අවශ්‍යතාවන්වලදී කැප වෙලා වැඩ කරනවා අපි දැකලා තිබෙනවා. එය විශේෂයෙන්ම අගය කරන්න ඕනෑ. ඒ වාගේම යම්කිසි ප්‍රශ්නයක් ගිහිල්ලා ඉදිරිපත් කරපුවාම ඒක ස්වාධීනව සොයා බලලා කටයුතු කරන නිලධාරීන් 90% ක් විතර හොඳ නිලධාරීන් ඉන්නවා. එක්කෙනෙක්, දෙන්නෙක් අතර අඩුපාඩුත් අපි දකිනවා. නමුත් ඒ සියලු දෙනාටම ඒ කටයුතු සම්බන්ධයෙන් විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම මෙම පළාත් සභාව අද පවතින තත්ත්වයෙන් පරිපාලන කටයුතු පවත්වාගෙන යන්න ඒ ලබා දීලා තිබෙන දායකත්වය අපි ඇගයීමකට ලක් කරන බව සඳහන් කරන්නට ඕනෑ.

ඒ වාගේම මේ කොමිෂන් සභා සම්බන්ධයෙන් වචන කිහිපයක් කියන්න ඕනෑ. ඇතැම් කොමිෂන් සභාවල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් සොයා බැලීමේදී අඩුපාඩු තිබෙනවා. විශේෂයෙන් සමූපකාර කොමිෂන් සභාව, ඒ එක්කම රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක වීමේදී මේ දේශපාලන මතිමතාන්තර ඉස්මතු වුණු අවස්ථා අපට දකින්න ලැබුණා. කෙසේ වෙතත් හැකිතාක් දුරට මෙම ආයතන ස්වාධීන ආයතන වශයෙන් පවත්වාගෙන යන්න ඔබතුමා හරහා ගරු ආණ්ඩුකාරතුමාගේ අවධානය යොමු කරනවා. ඒ එක්කම අපි පළාත් සභාවක් හැටියට අපි මේ සම්මත කරන ප්‍රඥප්ති, එහෙම නැත්නම් අපි ගෙනෙන ස්ථිර කරන යෝජනාවන් ක්‍රියාත්මක කිරීමේදී ගරු ආණ්ඩුකාරතුමාගේ අවධානය යොමු කරලා එය නිසි ආයතන හරහා ඒවා ක්‍රියාත්මක කරගෙන මහජනතාවට ඒකෙන් ලැබෙන්න ඕනෑ සෙත සහනය ලබා ගන්න මේතාක් දුරට ගමන් කරනවාද කියන එක ගැන ගරු ආණ්ඩුකාරතුමාගේ අවධානය මීටත් වැඩිය යොමු වෙන්න ඕනෑය කියන එක මම මතක් කරනවා.

ඒ එක්කම අපි මේ පළාත් සභාව තුළ කථා කරලා තිබුණා, සමහර සමූපකාර ආයතන කටයුතු කරද්දී සිදු වුණු අක්‍රමිකතා සම්බන්ධයෙන්. ඒ පිළිබඳව යම්කිසි පියවරයන් ගත්තා නම් ඒක අවසානයේ කොමිෂන් සභාව වෙත එනවා. ඒ කොමිෂන් සභාවෙන් අවසානයක් දක්වා ගමන් කරලා තිබුණේ නැහැ. සමහර ඒවා එතැන නතර වෙලා තිබුණා. ඒ ප්‍රශ්නය අවසන් කරලා තිබුණේ නැහැ. ඒ අවස්ථා අපි සභාවේ අවධානයට යොමු කරලා තිබෙනවා. එවැනි දේවල් කුමන ආණ්ඩුවක් පැවතුණත්, කුමන පක්ෂයක් දේශපාලනයට ආවත් රටක් හැටියට අපි අවධානය යොමු කරන්න ඕනෑ. එවැනි කටයුතු කරන්න ඕනෑ අවස්ථාවල ඒවා ස්වාධීනව සහ රටට යහපතක් වන ආකාරයට සහ මහජනයාට පිළිගන්න පුළුවන් ආකාරයට පළාත් සභාවෙන් ක්‍රමානුකූලව සිද්ධ වෙනවා කියන එක පෙනී යන ආකාරයට මේ දේවල් සිද්ධ වෙන්න ඕනෑ.

ඒ එක්කම අපි ඇතැම් වකවානුවල සමහර ආණ්ඩුකාරවරු දේශපාලනමය වශයෙන් කටයුතුවලට ඍජුව මැදිහත්වීම් සිදු කරන අවස්ථා දැකලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපි දැක්කා, රාජ්‍ය ආයතනවල ඉහළම ඉන්න විනිශ්චයකාරවරුන් පවා සමහර අවස්ථාවලදී විවිධ ක්ෂේත්‍රවල දේශපාලනමය කටයුතුවලට සම්බන්ධ වෙලා ඒ තනතුරේ තිබෙන ගරුත්වය අහිමි කරගත් අවස්ථාවන්. ඉතින් මෙම ආණ්ඩුකාරතුමා කියන්නේ ඉතාම වැදගත්, ඉතාම උසස් තත්ත්වයක තබලා තිබෙන තනතුරක්. මෙම තනතුර දේශපාලනීකරණය වෙන්න යම්කිසි ඉඩ ප්‍රස්ථාවක්, පොඩි ඉඩ ප්‍රස්ථාවක් හරි පසුගිය කාලයේ ලැබුණා නම්, අපි ඔබතුමා හරහා මේ සභාවේ අවධානයටත්, ගරු ආණ්ඩුකාරතුමාගේ අවධානයටත් යොමු කරනවා. මේ ස්වාධීන පුද්ගලයෙක් හැටියට ඉඳගෙන මෙම සේවය සමස්ත පළාතටම ස්වාධීනව ඉටු කරන නිලධාරියෙක් බවට පත් වෙනවා මිසක් මේ දේශපාලනීකරණය කියන එක එහෙම නැත්නම් දේශපාලනය ඇතුළට ගන්න එක මේ සභාවේ ගරුත්වයට හානියක් කියන එක මතක් කරනවා.

ඒ එක්කම මම විශේෂ කොට මේ සියලුම කොමිෂන් සභාවල නිලධාරීන්ව - විශේෂයෙන්ම අර සුළු සේවකයින්

මතක් කරන්න ඕනෑ. ඉතාම කුඩා සේවය සපයන තැනැත්තාගේ සිට එහෙම නැත්නම් පියන් තනතුරේ සිට මේ ඉහළම ආණ්ඩුකාරවරයා දක්වා සියලුම නිලධාරීන්ගේ සේවය ඇත්ත වශයෙන් 2009 අපි පළාත් සභාවට පැමිණි දවසේ සිට අපට තිබුණු අත්දැකීම් අනුව මේ සියලු දෙනාම සෑම අවස්ථාවකම, මම නම් යොමු කරපු හැම දෙයක්ම ඉතාම හොඳින් ඒවාට අවශ්‍ය කරන පිළිතුරු ලබා දීලා, යම්කිසි තොරතුරක් ඉල්ලුවොත් ඒවා හරියට ලබා දීලා ඒවාගේ බොහොම වැදගත් සේවයක් අපට සපයලා තිබෙනවා. ඒක මම නැවතත් මතක් කරමින්, මේ ගරු ආණ්ඩුකාරතුමාට සුභ ප්‍රාර්ථනා කරනවා. යම්කිසි අවස්ථාවක ආණ්ඩුව පෙරළුනත් එතුමාගේ දක්ෂතාවය අනුව ඒ තනතුරේ ඉන්න සුභ ප්‍රාර්ථනා කරමින්, එතුමාට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

[පූ.භා. 10.02]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, බොහොම ස්තූතියි. බස්නාහිර පළාත් සභාවේ අයවැය විවාදය ඊයේ දිනයේදී ආරම්භ වෙනකොට අපේ රටේ ජාතික පුවත්පතක් වන ලංකාදීප පුවත්පතේ ප්‍රධාන කතු වැකිය බවට පත් වෙලා තිබුණේ, පළාත් සභා අවශ්‍යද? නැද්ද? කියන එකයි. ඒ කතු වැකිය ලියන්න ප්‍රධාන කර්තෘවරයා පදනම් කරගෙන තිබුණේ, දකුණු පළාත් සභා මන්ත්‍රිනී ගීතා කුමාරසිංහ මහත්මිය කරපු ප්‍රකාශයක්. එතුමිය කිව්වාලු,

**"***පළාත් සභාව සුදු අලියෙක්. පළාත් සභාවට ගිහිල්ලා පඩි ගන්න එක පාපයක්. එයාගේ එකම කාර්යය බවට පත් වෙලා තිබෙන්නේ පළාත් සභාවට ගිහිල්ලා තේ බීලා ගෙදර යන එක විතරයි***"** කියලා.

ඔය ප්‍රකාශය පදනම් කරගෙන තමයි ලංකාදීප කර්තෘවරයා ඉතාම කදිම විවරණයක් කරලා තිබෙන්නේ. ඔහු කියනවා, පළාත් සභාව සුදු අලියෙක්. පළාත් සභාව අපේ රටේ පරිපාලනය වියවුල් කරන යාන්ත්‍රණයක්. ඒ වාගේම පළාත් සභාව රට බෙදීම සඳහා දායක වන ආයතනයක් කියලා. මේ චෝදනා තුන, මේ විග්‍රහය මීට අවුරුදු 26 කට ඉස්සෙල්ලත් අපට තිබුණා. ඊට අමතරව එතුමා ඉදිරිපත් කරලා තිබෙන එකම කරුණ තමයි මේ පළාත් සභා වරිග සභාවක් කියන එක. අපි ඒ කාලයේ දැනගෙන සිටියේ නැහැ, පළාත් සභාව මැති ඇමැතිවරුන්ගේ දූ පුත්තු දේශපාලනයට පුරුදු පුහුණු කරන තැනක් කියලා. ඒ වාගේම අපි අවුරුදු 26 ක් තිස්සේ නඟන මහා ඝෝෂාවට මෙවැනිම කතුවැකියක් ලියන්න බැරි වුණු ජාතික පුවත්පත්වල මහත්වරු ගීතා නෝනාගේ හීන් කෙඳිරියට මේ වාගේ කතු වැකියක් ලිවීම ගැන පුදුම වෙන්නත් ඕනෑ. ඉතින් මම කල්පනා කළේ ගරු සභාපතිතුමනි, දැන් මේ අවුරුදු 26 ක් ගතවන පළාත් සභා මල්ලේ, මේ පළාත් සභා ගෝනියේ සියඔලා ඇත්තේම නැද්ද? දැන් අවුරුදු 26 ක්. කෙනෙකුගේ ජීවිත කාලයෙන් 1/3 ක්. දැන් මේ ඔක්කෝම විවේචන එන අතරේ පළාත් සභාවලට අපේ හැමදාමත් ඒ විවේචනය තිබෙනවා. අපි කල්පනා කරනවා, මේ තිබුණු ක්‍රමයෙන් අපේ රට ගොඩනඟන්න යම් ආදර්ශයක් ගන්න පුළුවන් කියලා. ඒ පළාත් සභා ක්‍රමය පවත්වා ගැනීමෙන් නොවෙයි.

දැන් අපි කල්පනා කළොත් විශේෂයෙන් මේ පළාත් සභාවට ආණ්ඩුකාරවරයෙක් ඉන්නවා. ආණ්ඩුකාරවර - ඔහුට තිබෙන බලතල සඳහන් කරලා තිබෙනවා. දැන් අපේ රටේ පාර්ලිමේන්තුවට පමණක් දෙවැනි වන, රටේ ජනතාවගේ 1/3 ක ගේ ප්‍රශ්න විසඳන්න මැදිහත් වන, ඒ වාගේම රටේ ජාතික ආදයමෙන් 45% ක් උපයන්න දායක වන බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා, ඔහුගේ කාර්ය මණ්ඩලය, ඔහු ජීවත්වන නිවාසය, ඔහුගේ ඉන්ධන, ඔහු දුවන වාහන, ඔහුගේ සමස්ත කාර්ය මණ්ඩලය මේ සියල්ලටම අපි පළාත් සභාවෙන් වෙන් කරනවා, රුපියල් ලක්ෂ 560 ක්. මාස 12 ට. අවුරුද්දට ලක්ෂ 560 ක්. මම කියන්නේ අපේ රටේ පාර්ලිමේන්තුවට විතරක් දෙවැනි වන, 30% ක් ජනගහනයට සේවය කරන, රටේ ජාතික ආදායමෙන් 45% ක් දායකවන පළාත් සභාවේ ඉහළම තනතුරට ලක්ෂ 560 ක්, සමස්ත කාර්ය මණ්ඩලය සහ ආණ්ඩුකාරවරයාට ඒකෙන් නඩත්තු වෙන්න පුළුවන් කියලා පළාත් සභාවේ මේ ඇමැති මණ්ඩලය හිතනවා. ඒක නේ දාන්නේ.

අපි අහන්නේ අපේ රටේ විධායක ජනාධිපතිවරයා නඩත්තු කරන්න අවුරුද්දකට කෝටි 959 ක් වියදම් කරන්නේ ඇයි? දැන් පළාත් සභාවේ කටයුතු ටික ආණ්ඩුකාරතුමාට මේ විධියට මේ මුදලින් පවත්වාගෙන යන්න පුළුවන් නම් - ඒ කියන්නේ ගරු සභාපතිතුමනි, ජනාධිපතිතුමාට දවස් දෙකකට වියදම් කරන ගණන තමයි ආණ්ඩුකාරයා ඇතුළු මුළු මහත්, කාර්ය මණ්ඩලයට අවශ්‍ය ඒ සියලු දීමනා සියල්ල ලබා දෙන්න වෙන් කරන්නේ. ජනාධිපතිතුමාගේ

[ ගරු නලින්ද ජයතිස්ස ]

දවස් දෙකක වියදම. එතුමාගේ වියදම රුපියල් ලක්ෂ 262 යි. එතුමාට විතරක්. අමාත්‍යාංශවලට නොවෙයි. එතුමාගේ කාර්ය මණ්ඩලයට නොවෙයි. එතුමාගේ ආරක්ෂක භටයන්ට නොවෙයි. එතුමාගේ වාහනවලට තෙල් ගහන්න නොවෙයි. එතුමාට පමණක් රුපියල් කෝටි 959 ක්, දවසකට ලක්ෂ 262 යි. ඒ වාගේ දවස් දෙකක සල්ලි තමයි ආණ්ඩුකාරවරයාගේ සමස්ත කාර්යය මණ්ඩලයට වෙන් කරන්නේ. ඉතින් පුළුවන් නේ දුවන්න. අපි ගත්තොත් එහෙම අවුරුදු 26 න් ආදර්ශය. ඔය මහා මුදලක් නාස්ති කරන විධායකය අහෝසි කරලා, මේ වාගේ ආණ්ඩුකාරවරයෙක්ට රට පාලනය කරන්න බැරි වෙයිද?

ඒ විතරක් නොවෙයි. දැන් බලන්න කෝ අපේ ඇමැති මණ්ඩලය. ඇමැති මණ්ඩලයට විධායක බලය තිබෙනවා. මේ මහ ඇමැතිවරයාටයි, පස් දෙනෙකුගෙන් යුත් කැබිනට් මණ්ඩලයටයි මේ පළාත් සභාව මෙහෙය වන්න පුළුවන් නේ? එතකොට බැරි අපේ ඇමැති මණ්ඩලය අඩු කරලා, මධ්‍යම ආණ්ඩුවේ වියදම් ඉතිරි කරලා රට මෙහෙය වන්න. ඇයි බැරි? දැන් පළාත් සභාව හොඳයි, හොඳයි කියලා තමුන්නාන්සේලා කියනවා නම්, මේ ඇමැතිවරුන් පස්දෙනාට අවුරුදු 26 ක් මේ පළාත් සභාව පාලනය කරන්න පුළුවන් නම් ඇයි බැරි අපේ ඇමැති මණ්ඩලයත් අඩු කරලා, විධායක බලය මහ ඇමැතිවරයා ප්‍රමුඛ ඇමැති මණ්ඩලයට දීලා රට පාලනය කරන්න. ගත්තොත් හොඳ නැද්ද ඒ වාගේ ආදර්ශයක්.

ඒ විතරක් නොවෙයි. මේ පළාත් සභා පනතේ කොපමණ අඩුපාඩුකම් තිබුණත්, 154 ඊ (1) වගන්තිය යටතේ තිබෙනවා, පළාත් සභාවේ ඉන්න පුළුවන් ඇමැතිවරු ගණන. ප්‍රධාන අමාත්‍යවරයාත් එක්ක ඇමැතිවරු පස් දෙනයි. සියලු දෙනාම 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ දාලා තිබෙනවා. 13 වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මුලිමුනින්ම වැරැදියි. හැබැයි, අඩු තරමේ ඒ වගන්තිය තිබෙන එකවත් හොඳයි. ඇමැති මණ්ඩලය 25 ට සීමා කරනු ලැබේ කියලා. අපේ රටේ මහ ව්‍යවස්ථාවටත් දැම්මොත් හොඳ නැද්ද? හොඳයි නේ. ඉතින් අඩු ගණනේ මම කියන්නේ, මේකේ මේ සියඹලා පොඩ්ඩක් හරි හෙව්වොත් එහෙම මොනවා හරි ටිකක් මේකෙන් දැන් ගන්න පුළුවන්. අවුරුදු 26 කට පස්සේ, අපි කියන්නේ, අඩුම ගණනේ ඒ ආදර්ශයවත් ගන්න. මේ සියලු ප්‍රතිපාදන යටතේ බස්නාහිර පළාත් සභාවක් කරගෙන යන්න පුළුවන් කියලා තමුන්නාන්සේලා හිතනවා නම්. ඇයි ඕක රටට ආදේශ කරන්න බැරි? රටට ආදේශ කළා නම් කොහොමට තියෙයිද? ඒක ගනිමු අපි මෙතැනට.

ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි. අපි කැමැති වුණත් අකමැති වුණත් මේ ව්‍යුහය ඉස්සරහාට යනවා. ඒ වාගේම බස්නාහිර පළාත් සභාව පිළිබඳව රටේ මාධ්‍යවල අවධානයකුත් යොමු වෙලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාට විශේෂයෙන් යෝජනා කරන්න කැමැතියි. දැන් බලන්න මේ පළාත් සභාවේ සමහර මාධ්‍ය පිළිබඳ විවේචන එල්ල වෙනවා. මම කියන්නේ, එන මාධ්‍ය ආයතනයකට බැණලා වැඩක් නැහැ. ඒවාට විවේචන එල්ල කරලා වැඩක් නැහැ. මොකද, මාධ්‍ය ආයතන පවත්වාගෙන යන්න ආයෝජනය කරන්නේ, යම් ව්‍යාපාරික අරමුණක් සහිතව. ඒ ගොල්ලන්ගේ විවිධ අරමුණු තිබෙන්න පුළුවන්. ඒකට අපි මොකද? කරන්න ඕනෑ, ඒකට බැණ බැණ ඉන්න එක නොවෙයි අපි කළ යුත්තේ. සභාපතිවරයාගේ මූලිකත්වයෙන් ඔබතුමාගේ සහ සභා ලේකම්වරයා යටතට මාධ්‍ය ඒකකයක් හදා ගැනීමයි. අපට මාධ්‍ය ඒකකයක් කෝ? අපට මහ ඇමැතිවරයාගේ මාධ්‍ය ඒකකයක් තිබෙනවා. ඒකෙන් මේ සභාවේ මන්ත්‍රීවරු කාටවත් වැඩක් නැහැ. මාධ්‍ය ඒකකයක් හදන්න කෝ. මාධ්‍ය ඒකකයක් හදලා මේ මන්ත්‍රීවරුන්ට දෙන්න කෝ තමන්ගේ කථා ටික බලන්න. ඔබතුමා යටතේ තියා ගන්න. ඒ විතරක් නොවෙයි. සභාව පුළුල් වෙන කොට, සභාවේ වපසරිය වැඩි වෙන කොට මන්ත්‍රීවරුන්ට ඕනෑ තොරතුරු ලබා ගන්න ඒකකයක්. ඉල්ලන තොරතුරු ලබා දෙන්න යම් නිලධාරී පිරිසක් ඉන්න ඕනෑ. අපට ඉන්නේ කවුද? එහෙම කෙනෙක් නැහැ. නිලධාරීන් හිතවත්කමට අපට ලබා දෙනවා. අපි තොරතුරු ඒකකයක් හදමු. ඒ නිසා මේක පවත්වාගෙන යන්න තමුන්නාන්සේලා උත්සාහ කරනවා නම්, අඩු තරමේ මේකේ ගුණාත්මක භාවය වර්ධනය කිරීම සඳහා යම් පියවරයන් ගන්නය කියලා අපි ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මේ වේලාවේදී කියනවා, මේ පළාත් සභාවේ අපි අද ගමන් කරමින් ඉන්නේ කොහාටද? ඔබතුමාට මම ඉදිරිපත් කරන්න කැමැතියි. 1988 අගෝස්තු මාසයේ 08 වැනිදා මේ පළාත් සභාවේ පළමුවැනි ආණ්ඩුකාරවරයා වුණු ශර්වානන්ද මැතිතුමා, එතුමා ආණ්ඩුකාරවරයෙක් විතරක් නොවෙයි. හිටපු අග්‍රවිනිශ්වයකාරවරයෙක්. එතුමා ආණ්ඩුකාරවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරලා මෙන්න මෙහෙම අවසානයේදී කියනවා,

"සංවර්ධනය භාණ්ඩවලින් ආරම්භ නොවන්නේය. - මහ ඇමැතිතුමා හිටියා නම් හොඳයි.

*"සංවර්ධනය භාණ්ඩවලින් ආරම්භ නොවන්නේය. බඩු බෙදලා හරියන්නේම නැහැ. එය ආරම්භ වන්නේ ජනතාවගේ ඔවුන්ගේ අධ්‍යාපනයෙන්, සංවිධානයෙන් සහ විනයෙන් ය. මේ ත්‍රිවිධකරු නොමැති කළ සියලුම සම්පත් ගුප්ත, අභාවිත, විභෝ ස්වරූපයක් ලෙස ඉතිරිව පවතී. මෙම අංශ තුනම, ඒ කියන්නේ සංවිධානය, අධ්‍යාපනය, විනය පියවරෙන් පියවරට පරිණාම ක්‍රියාවලියකින් දියුණු කරනු ලැබිය යුතුය. සංවර්ධන ප්‍රතිපත්තියට පැමිණෙන ප්‍රමුඛ කාර්යය මෙම පරිණාමය වේගවත් කිරීමයි. මෙම ත්‍රිවිධ තත්ත්වයන් සුළු සංඛ්‍යාවකට නොව සම්පූර්ණ සමාජයටම අයිති විය යුතු වන්නේය."*

මම හිතනවා, අවුරුදු 26 කට පස්සෙත් ශර්වානන්ද ආණ්ඩුකාරතුමාගේ ප්‍රකාශය ඉතාම වටිනවා. පළාත් සභාවේ පුළුවන් නම් මේක කොහේ හරි ලියලා තියන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි දෙක කාලයක් තිබෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

සංවර්ධනය භාණ්ඩවලින් පමණක් ආරම්භ නොවන්නේය. දැන් ආණ්ඩුවේ කට්ටිය හිතන් ඉන්නේ එහෙම නේ? බඩු බෙදුවාම සියල්ල හරි කියලා නේ? භාණ්ඩවලින් විතරක් පටන් ගන්නත් බැහැ. ක්‍රියාත්මක කරන්න බැහැ.

ඉතින් මේ වේලාවේදී, මේ ලැබුණු සුළු කාලයේදී - අපි දන්නවා, සභා කටයුතු ලේකම්වරයා, ඔහුගේ කාර්ය මණ්ඩලය මේ සියලු දෙනා ඉතාම දුෂ්කර තත්ත්වයන් යටතේ තමයි තමන්ගේ කටයුතු කරගෙන යන්නේ. අඩු තරමේ මේ රටේ තිබෙන පරිපාලන ක්‍රමවේදයේ වැරැදි, අවුල් සහගත තත්ත්වයන් නිසා සමහර නිලධාරීන්ට නිශ්චිත ක්‍රමවේදයන් යටතේ උසස්වීම් ලැබිලා නැහැ. විශේෂයෙන් අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, මෙන්න අපේ හැන්සාඩ් කාර්ය මණ්ඩලයට. 104 ක් මන්ත්‍රීවරුන්. ගණනත් ලොකුයි. ඒ වාගේම තමයි අපි වාගේ වේගයෙන් කථා කරන මන්ත්‍රීවරුත් ඉන්නවා. අමාරු කාර්යයක්. ඒත් හොඳට වැඩේ කරනවා. අපට නියමිත වේලාවට වැරැදි නැතිව හැන්සාඩ් එක ලබා දෙනවා. විශේෂ ස්තුතියක් දෙන්න ඕනෑ. හැබැයි, තාක්ෂණය ඉතාම දුර්වලයි. තාක්ෂණය දුර්වලයි. අපි කථාවක් ඉල්ලුවොත් එහෙම තවම දෙන්නේ අර කැසට් එක. අඩුම ගණනේ තවම CD එකක්වත් දෙන්න බැහැ. ඉතින් අපි ඒ පැත්තෙන් තල්ලුව දෙමු. මේ නිලධාරී මණ්ඩලයේ සියලු දෙනාටම ඔවුන්ගේ කැපවීම වෙනුවෙන් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. මේ වේලාව ලබා දීම සම්බන්ධයෙන් බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරලගේ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, ඔබතුමාට විනාඩි 15 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.13]

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ආණ්ඩුකාරවරයා, පළාත් සභාව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. මේවා අපේ බස්නාහිර පළාතේ ස්වාධීනව, අපක්ෂපාතව, පාට පක්ෂ භේදයෙන් තොරව කටයුතු කරන ආයතන වන නිසා අප කාගේත් පැසසුමට හා ප්‍රසංශාවට ලක්වන ආයතන ලෙස මුලින්ම අපි හඳුන්වා දෙනවා. විශේෂයෙන්ම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉතා සුවිශේෂ කාර්ය භාරයක් පසුගිය වකවානුව තුළ සිදු කළ බව ඉතා ඕනෑකමින් මතක් කරනවා. අපේ පළාත් රාජ්‍ය සේවයේ හැත්තෑ දහසකට වඩා වැඩි විශාල සේවක ප්‍රමාණයක් මෙහෙය වන්න, පත්වීම් ප්‍රදානය කරන්න සහ අනිකුත් ක්‍රියා මාර්ග සම්බන්ධයෙන්

[ ගරු සිසිර ජයකොඩි - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ]

ඔවුන් ඉතා දැඩි කැපවීමකින් කටයුතු කරන බව මතක් කරනවා. විශේෂයෙන් විශ්ව විද්‍යාලවලින් අධ්‍යාපනය ලබපු උපාධිධාරීන් ගස් ගල් යට උපවාස කරමින් හිටපු යුගය අවසන් කරලා අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙනුත්, ඒ වාගේම බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යතුමාගේ මෙහෙයවීම යටතේත් අපේ රටේ ඉතිහාසයේ උපාධිධාරීන් සුවිශාල ප්‍රමාණයකට පත්වීම් පිරිනමන්න පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කළමනාකරණ සහයකයන්, සංවර්ධන නිලධාරීන් සුවිශාල රැකියා ප්‍රමාණයක් බිහි කිරීමට අවශ්‍ය කාර්ය භාරය සිදු කළ බවත් මතක් කරනවා. ඒ විනිවිද භාවය නිසා තමයි අපේ රටේ රාජ්‍ය සේවයට මෙතරම් ඉල්ලුමක් පවතින්නේ.

අපි දන්නවා, පෞද්ගලික අංශයේ රුපියල් තිස් හතළිස් දාහ විශාල වැටුප් ලබා ගත්ත, බැංකුවල සේවයේ නියුතු අය පවා සේවයෙන් අයින් වෙලා රාජ්‍ය සේවයට එන්න අද උපරිම උත්සාහයක් දරනවා. එසේ සිදු වෙලා තිබෙන්නේ, අද රාජ්‍ය සේවයට ලැබිලා තිබෙන පහසුකම් හා වරප්‍රසාද හේතුකොටගෙන. ඉස්සර රාජ්‍ය සේවකයා පිළිබඳව මතයක් තිබුණා. රාජ්‍ය සේවකයා උපමා කරලා තිබුණේ, අණ්ඩ දාපු කළිමක් ඇඳගත්ත, හම්පඩ ගැහුණු බෑග් එකක් අතේ තියෙන, කෙසඟ සිරුරක් තිබෙන පුද්ගලයෙකු ලෙසයි. ඒ විධියට තමයි රාජ්‍ය සේවකයා, රාජ්‍ය සේවය පිළිබඳව අපේ චිත්‍රය. නමුත් රාජ්‍ය සේවයට බැඳෙන්න සුවිශාල වුණු ප්‍රමාණයක් අද එකට එකතු වෙනවා. ඒ පළාත් රාජ්‍ය සේවා කොමිෂම.

අපේ බස්නාහිර පළාත් සභාව පැත්තෙන් කරන සේවයත්, විශේෂයෙන්ම අප රජය විසින් රාජ්‍ය සේවය ශක්තිමත් කරලා ඔවුන්ව නිසි වැටුප් තලවල පිහිටුවීම නිසා තමයි ඒ හැකියාව ලැබිලා තිබෙන්නේ. අපි දන්නවා, විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අද වැටුප් වැඩි වීමේ වාසිය රාජ්‍ය සේවකයාට ලබා දීලා තිබෙනවා. රාජ්‍ය සේවය පුළුල් වෙලා තිබෙනවා. ඇතමුන් රජයේ සේවයේ ලක්ෂ හය, හතර, පහකට අඩු කරන්න උත්සාහ කරද්දී අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ පළාත් රාජ්‍ය සේවයත්, සමස්ත රාජ්‍ය සේවයත් ලක්ෂ 15 ක් දක්වා වැඩි කරලා අපේ රටේ රාජ්‍ය සේවය ශක්තිමත් කරන්න කටයුතු කරලා තිබෙනවා කියන මතක් කිරීම කරනවා. මේ වේලාවේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලා මේ සභාවේ නොසිටියත් මතක් කරන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. ඒ 80 ජූලි වැඩ වර්ජනය. 80 ජූලි වැඩ වර්ජනයේදී මට මතක් වෙනවා. රුපියල් 10/- ක වැඩි වැටුපක් ඉල්ලපු සේවකයන් 80,000 ක් එළියට දැම්මා. අද ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් වෙනුවෙන් සටන් කරන වෘත්තීය සමිති නායකයෝ අද එවැනි අයත් එක්ක තමයි ප්‍රජාතන්ත්‍රවාදය රැක ගැනීම සඳහා කියලා ගිවිසුම්වලට අත්සන් කරන්නේ. එය මහ බරපතළ කනගාටුවක්.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. බස්නාහිර පළාත් සභාව, සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ඉටු කරන සේවය ඉතාම අගය කළ යුතු බවට මේ අවස්ථාවේ මතක් කරනවා. ඇතැම් වේලාවට මහජන නියෝජිතයින්, පළාත් සභා මන්ත්‍රීවරුන් පිළිබඳව අපේ සමාජය තුළ වැරදි චිත්‍රයක් තිබෙන්නේ. වරප්‍රසාද ලබන, ප්‍රතිලාභ ලබන අය ලෙස තමයි ඇතැමුන් හඳුන්වන්නේ. නමුත් මේ සෑම මන්ත්‍රීවරයෙක්ම යම් සුවිශේෂ හැකියාවක නියුතු අය. ඒ අය මන්ත්‍රීවරු නොවී තමුන්ගේ ව්‍යාපාරය කළා නම් ඔවුන් ශක්තිමත් ව්‍යාපාරිකයෝ. අධ්‍යාපනවේදීන් ඉන්නවා. වෘත්තියවේදීන් ඉන්නවා. ඔවුන් තමන්ගේ රැකියාව කළා නම්, ඔවුන්ගේ ජීවිතය අනිවාර්යයෙන්ම සාර්ථකයි. නමුත් මුළු තුන්සිය හැටපස් දවසම උදේ පාන්දර පහට නැඟිටින පළාත් සභාවේ මන්ත්‍රීවරු රාත්‍රී 10, 11 දක්වා එක දිගට නිදිමරමින් වැඩ කරනවා. මිනිසුන්ගේ ප්‍රශ්නවලට විසඳුම් සොයනවා. තමුන්ගේ මුළු ජීවිත කාලයම මිනිස්සු වෙනුවෙන් වැඩ කිරීම සතුට කරගත්ත පළාත් සභා මන්ත්‍රීවරු ඇතුළු මහජන නියෝජිතයන් ඉන්නවා. ඒ නිසා මන්ත්‍රීවරුන්ට ලැබෙන දීමනා පිළිබඳව ද්වේශයෙන්, ක්‍රෝධයෙන්, වෛරයෙන් බැලිය යුත්තේ නැහැ.

අපි දන්නවා. අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කාරණය තිබෙනවා. අපේ සමහර කාරක සභා රාජ්‍ය ගිණුම් කාරක සභාව හැර අනික් කාරක සභාවක් සඳහා සහභාගිවන මන්ත්‍රීවරයෙකුට ලැබෙන්නේ රුපියල් 500/- ක දීමනාවක්. ඒ වුණාට මහා වරප්‍රසාද ලබනවයි කියන්නේ. තමුන්ගේ මන්ත්‍රී පදවියෙන් ගන්න වැටුප මුළු මාසයටම ඩීසල් ගහලා තමුන්ගේ දරුවන්ට වියදම් කරන්න විධියක් නැතිව දුක් විඳින මන්ත්‍රීවරු ඉන්නවා. මහජන මුදල් තඹ සතයක්වත් හොරකම් කරන්නේ නැති, අල්ප මාත්‍රව අසාධාරණයෙන්, අයුක්තියෙන් රුපියලක්වත් හම්බ කරන්නේ නැති මහජන නියෝජිතයන් මේ සභාවේ

ඉන්නවා. මේ රටේ එහෙම මහජන නියෝජිතයන් ඉන්නවා. ඔවුන්ගේ ජීවිත පිළිබඳ නැවත හැරිලා බැලුවොත් ඔවුන්ට ප්‍රශ්න දෙකක් අහන්න තිබෙනවා. එකක් තමයි, අපි සමාජ සේවය කරනවා. මිනිස්සුන්ට උදව් කරනවා. සමාජ කාර්යයන්ට නායකත්වය දෙනවා. රටේ ජාතික ප්‍රශ්නවලට මැදිහත් වෙනවා. මිනිස්සුන්ට උදව් කරනවා. ඒ ගැන තෘප්තිමත්ද කියන ප්‍රශ්නය ඇහුවොත් ඔවුන් කියනවා, ඔව් අපි තෘප්තිමත් වෙනවා කියලා අපේ මන්ත්‍රීතුමන්ලාගේ හෘදය සාක්ෂිය කියයි. හැබැයි, අපි ඇහුවොත් මන්ත්‍රීවරයෙක් විධියට ඔබ තෘප්තිමත්ද කියලා, මොකක්ද උත්තරය? ඔබට ඔබ ගැන දුකයි. මන්ත්‍රීවරයාට මන්ත්‍රීවරයා ගැන දුකයි. කන්න වේලාවක් නැහැ. නිදාගන්න වේලාවක් නැහැ. මුළු ජීවිත කාලයම දේශපාලනය වෙනුවෙන් කැප කරනවා. මහජන සේවය සතුට කරගත්ත දේශපාලන නායකයෝ තවත් මේ රටේ ඉන්නවා. ඒ නිසා සමහරු හිතනවා ඇති නිදහස් තීරු බදු සහන යටතේ වාහනයක් අරගෙන කුරුල්ලෝ වාගේ පියාඹන මන්ත්‍රීවරු තමයි අපේ රටේ ඉන්නේ කියලා. මුළු දීමනාවම ඩීසල් ගහන්න මදිව, තමුන්ගේ දරුවාගේ ඉස්කෝලේ තිබෙන උත්සවයට යන්න බැරිව, තෑග්ග ලබන දරුවාගේ සතුට කැප කරලා මේ සභාවට එන මන්ත්‍රීවරු ඉන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය සභා ලේකම්තුමා ප්‍රමුඛ නිලධාරීන්ව අපි ඉතාම අගය කරනවා. පළාත් සභා මන්ත්‍රීවරුන්ට පහසුකම් සැපයීම පැත්තෙන් ඔවුන් කරන සේවය ඉතාම විශිෂ්ටයි. ඕනෑම අවස්ථාවක සභා ලේකම් කාර්යාලයේ සියලුම නිලධාරීන්, සභා ලේකම් හේමන්ත සමරකෝන් මැතිතුමා ඇතුළු සියලුම සභා කාර්ය මණ්ඩලය මන්ත්‍රීවරුන්ට අවශ්‍ය ගෞරවය, තමුන්ගේ නීති රීති සීමාව තුළ මන්ත්‍රීවරයෙකුට පහසුකමක් සපයන්න පුළුවන් නම් ඒ රීති සීමාවන් තුළ ඔවුන් කටයුතු කරන්න වෙහෙස වන බව කිසිම සැකයක් නැහැ. සභා ලේකම් කාර්යාලය පැත්තෙන්, සභාව පැත්තෙන් අපට පැවරෙන කාර්යයන් තිබෙනවා. ඒ තමයි අද උදෙත් මම පාර්ලිමේන්තුවේ ගණ පූර්ණය පිළිබඳව කරුණු අධ්‍යයනය කළා. පාර්ලිමේන්තුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225 ක් හිටියාට ගණ පූරණයට අවශ්‍ය වන්නේ මන්ත්‍රීවරු 24 ක් පමණයි. නමුත් අපේ රීති සංග්‍රහය හදලා තිබෙන්නේ දැනට අවුරුදු 20 කට, 25 කට කලින්. අපේ පළාත් සභාවේ ගණ පූරණය සම්පූර්ණ වීම සඳහා පළාත් සභා මන්ත්‍රීවරු 35 දෙනෙක් මේ සභාවේ රැඳී සිටිය යුතු වෙනවා. අපේ මන්ත්‍රීවරු 104 යි. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225 යි. අපේ ගණ පූරණය පවත්වන්න 35 ක් ඕනෑ. පාර්ලිමේන්තුවේ 24 යි අවශ්‍ය වෙන්නේ. ඒ නිසා අපි සුහදතාවය, එකඟතාවය මත තමයි මේ පළාත් සභාවේ කටයුතු පවත්වාගෙන යන්නේ. ඒ නිසා සභා රීති ඇතුළුව පළාත් සභාවේ තව තවත් රීති සංග්‍රහයන්වල වෙනස්කම් කාලයට ඔබින ලෙස මේ රීති සංශෝධනය සඳහා කටයුතු කිරීම මේ පළාත් සභාවේ කාර්යයක් ලෙස අපි මතක් කර දෙනවා. හඳුන්වා දෙනවා. ඒ නිසා එය ඉටු කරන්න අපි සියලු දෙනා එකට මැදිහත් වෙමුයි කියන ආයාචනය කරනවා.

ඒ වාගේම මතක් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි සීතල කාමරවල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මත, ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනවලට විතරක් සීමා වෙලා නීතිය අර්ථ නිරූපණය කරන ආණ්ඩුකාරවරුන්ට වඩා අපි ප්‍රිය කරනවා, අපි කැමැතියි. අපේ රටේ ජනයාගේ හදවත්වලට සංවේදී වුණු, මහ පාරේ මිනිස්සුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන, ඒ වෙනුවෙන් පෙනී සිටින ඒ සඳහා ජීවිතයේ පරිචයක්, අත්දැකීමක් සහිත ආණ්ඩුකාරවරයන්ට. ඒ නිසා අලවි මවුලානා අපේ ආණ්ඩුකාරතුමා ඉටු කරන කාර්ය භාරය අපි ඉතාම ඕනෑකමින් යුතුව අගය කරනවා. ඒ නිසා බස්නාහිර පළාත් සභාව විධියට බස්නාහිර පළාත් සභාවේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවත්, ආණ්ඩුකාරතුමාත් සිදු කරන කාර්ය භාරයන් ඉතාම ඕනෑකමින් යුතුව අගය කරමින් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[පූ.භා. 10.23]

**ගරු කවින්ද හේෂාන් ජයවර්ධන**
Hon. Kavinda Heshan Jayawardena

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොමත්ම ස්තුතියි. ගම්පහ දිස්ත්‍රික්කයේ එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දුන්න, ඒ වාගේම දිවංගත පියා දොස්තර ජයලත් ජයවර්ධන මැතිතුමාට ආදරය කරපු ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව ඇතුළු මුළු මහත් රටේ ජනතාවට ස්තුතියක් කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. මට ගම්පහ දිස්ත්‍රික්කයෙන් ඡන්ද 41,000 ක් ලබා දීලා පළමුවැනි වතාවට දෙවැනි ස්ථානයට එන්නට අවස්ථාව ලබා දුන්නු සියලු දෙනාට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ආණ්ඩුකාරතුමාව අද අපි පත් කර ගන්නේ ජනාධිපතිවරයාගේ පත්වීමකින්.

[ ගරු කවින්ද හේෂාන් ජයවර්ධන ]

එහෙමනම් එතුමාගේ ඒ පත්වීම ඉතාමත් උත්තරීතර රාජකාරියක් බවට පත් වෙනවා. එතුමා කරන සේවය මේ පළාතේ ගම්පහ, කොළඹ, කළුතර කියන මේ දිස්ත්‍රික්ක තුනටම ඉන්න ජනතාවටම දැවැන්ත සේවයක් වෙනවා කියන එක අපි විශ්වාස කරනවා. ඒ වාගේම මේ උත්තරීතර තනතුර රැකගන්නට අපි සියලු දෙනාම ඇප කැප වෙන්නට ඕනෑ. ජනතාවට කරන මේ සේවයේදී දේශපාලනීකරණය නොවිය යුතුයි කියන විශ්වාසය මම පෞද්ගලිකව දකිනවා. මොකද හේතුව, අද ආණ්ඩුවේ සමහර ස්වාධීන ආයතන දේශපාලනීකරණය වෙලා. අධිකරණය යම්තාක්දුරට දේශපාලනීකරණය වෙලා. පොලීසිය අද දේශපාලනීකරණය වෙලා. ස්වාධීන රූපවාහිනිය ස්වාධීනයි කිව්වාට ඒකත් දේශපාලනීකරණය වෙලා. එහෙමනම් අපි මේ ක්‍රියාදාමයන් දේශපාලනීකරණය නොවිය යුතුයි කියන විශ්වාසය අපට තිබෙනවා. ඒ වාගේම එතුමාට සහ කාර්ය මණ්ඩලයේ සියලුම දෙනාට 0.11% ක් වෙන් කරලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේ පළාතේ ඉන්න ජනතාවට වෙන්න ඕනෑ සේවය 100% ක් ඉෂ්ට වේවි කියන එක.

ඒ වාගේම අපේ පළාත් සභාව තුළ අද මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් කිව්වා තාක්ෂණය අතින් අපි පොඩ්ඩක් පල්ලෙහායින් ඉන්නේ කියන එක. ඉතින් ඒක නිසා අපි විශ්වාස කරනවා, දැන් IPad තිබෙනවා. ඒ වාගේම දුරකථන තිබෙනවා. අපි සියලු දෙනාටම තාක්ෂණයත් එක්ක ඉදිරියට යන්න ඕනෑ. මොකද, නවක අපි අද Youtube එකේ එහෙම නැත්නම් Facebook එකේ තාක්ෂණයත් එක්ක ඉදිරියට යන කාලයක් මේක. එම නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම යෝජනාවක් කරනවා, Wifi අපේ පළාත් සභාවට ලබා දෙන ලෙස. ඒකත් එක්ක මම හිතන්නේ, දැවැන්ත සේවයක් රටේ මිනිස්සුන්ට සහ මේ ප්‍රදේශයේ මිනිස්සුන්ට කරන්න පුළුවන්. අපව Update කරන්න පුළුවන් කියන විශ්වාසය මට තිබෙනවා. ඒ වාගේම අපේ ආණ්ඩුකාරතුමා ඇතුළු මේ කාර්ය මණ්ඩලය, මේ පළාත් සභාවේ ඉන්න සියලුදෙනාම දැවැන්ත සේවයක් කරනවා. අවුරුදු 26 ක් තිස්සේ ඔවුන්ගේ සේවය කරගෙන ගියා. අපේ සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ලස්සන කථාවක් කළා. ඒ වාගේම අපේ ආණ්ඩුවේ, විපක්ෂයේ ඉන්න සියලු දෙනාම ගරු මන්ත්‍රීවරුත් දැවැන්ත කැපවීමක් කරලා තමුන්ගේ කාලය, ශ්‍රමය, ධාඩිය, මහන්සිය ජනතාව වෙනුවෙන් වැය කරනවා. ඉතින් ඔවුන්ට අපි කෘතඥතාවය, ඒ වාගේම ස්තූතිය, ප්‍රණාමය විපක්ෂයක් හැටියටත්, පෞද්ගලිකව මමත් පුද කරන අතර, මේ ආයතනයේ ඉන්න සියලුම දෙනාට මගේ ස්තූතිය, ප්‍රණාමය පුද කරන ගමන්, මෙම අවස්ථාව මට ලබා දීම ගැන ඔබ තමුන්නාන්සේලාට බොහොම ස්තූතියි කියමින් මම නවතිනවා.

[පූ.භා. 10.26]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය ලබා දීම පිළිබඳව බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන්ම මම ආරම්භ කරන්න කැමැතියි. අපේ ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක සිසිර ජයකොඩි මැතිතුමාව හෘද සාක්ෂියට එකඟව ඉතා වැදගත් කරුණු ගණනාවක් මතු කර පෙන්නුවා. ඒක එක විධියක අඳෝනාවක් වාගේ පෙණුනා. හැබැයි, ඒක අගය කරන්න ඕනෑ. මොකද, රුපියලක්වත් හම්බ කරන්නේ නැති මන්ත්‍රීවරු මේ පළාත් සභාවේත්, ඒ වාගේම පාර්ලිමේන්තුවේත් ඉන්න බව අපි දන්නවා. එතුමා කිව්වේ, මන්ත්‍රීවරුන්ගෙන් බොහෝදෙනෙක් පෞද්ගලිකව ඇහුවොත් ඔවුන් තෘප්තියකින් නොවෙයි ඉන්නේ. එක අතකින් බලනකොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එදා ඒ කිව්ව කථාව අද තවත් ආකාරයකින්, අනියමෙන් සිසිර ජයකොඩි මැතිතුමා අනුමත කළා. ඇත්ත වශයෙන්ම අපට පේනවා අද රට පුරා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සිසිර ජයකොඩි යන්නේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හැබැයි, මට පෙණුනේ, සිසිර ජයකොඩි මැතිතුමා මෛත්‍රී - චන්ද්‍රිකා පිළේද කියලා. එතුමා නොයන්න පුළුවන්. පස්සේ යයි. පෙරළුනාට පස්සේ බලමු. වැදගත් අය තමයි ඇවිල්ලා ඉන්නෙත්. අපි වැදගත් නැති අය ගන්නෙත් නැහැ. එතුමා වැදගත් බව අපි දන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා කැමැතියි ආණ්ඩුකාරවරයා, පළාත් සභා ලේකම් කාර්යාලය, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අදාළ වැය ශීර්ෂ යටතේ

කරුණු කිහිපයක් ගෙන හැර දක්වන්න. විශේෂයෙන්ම පසුගිය අයවැය කථාවලදීත් කියැවුණු කාරණයක් තමයි ආණ්ඩුකාරවරයාට නිල නිවසක් නැහැ. හැබැයි, ප්‍රධාන අමාත්‍යවරයාට නිල නිවසක් තිබෙනවා කියනවා. මේක මේ ප්‍රධාන අමාත්‍යවරයාගේ ප්‍රශ්නයක් නොවෙයි. නමුත් මේවා විසඳිය යුතු ප්‍රශ්න. අපි දන්නවා, ආණ්ඩුකාරවරයාට අයත් කාර්යාලය අවුරුදු 26 ක් තිස්සේ පවත්වාගෙන යන්නේ කුළී නිවසක. ඉතින් මම හිතන්නේ, මීට කලිනුත් මතු වුණු කාරණයක්. ඉදිරියේදී සැදෙන ගොඩනැගිල්ලේ අනිවාර්යයෙන්ම ඊට අවස්ථාවක් ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ විතරක් නොවෙයි. ආණ්ඩුකාරවරයා සහ ආණ්ඩුකාර ලේකම් කාර්යාලය. මන්ත්‍රීවරයෙක් හැටියට මම විශ්වාස කරනවා, මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් අපි ඉතාම ඈතයි කියලා. මම පෞද්ගලිකව දන්නේ නැහැ. ඉස්සර යුනිටි ප්ලාසා ගොඩනැගිල්ලේ තිබෙන කොට එක්වරක් මම ආණ්ඩුකාරවරයා හමු වෙන්න ගිහින් තිබෙනවා. වෙනත් කාරණාවකට. නමුත් දැන් මේ කාර්යාලය කොතැනද තිබෙන්නේ කියලා අපි දන්නේ නැහැ. ඒ කියන්නේ අපිත් ආණ්ඩුකාරවරයා සහ ආණ්ඩුකාර ලේකම් කාර්යාලය අතර දුරස්ථ භාවයක් තිබෙනවා කියන එකයි. ඒ නිසා මම විශ්වාස කරනවා. මේ ආණ්ඩුකාරවරයා සහ මන්ත්‍රීවරුන් අතර මීට වැඩිය සමීප සබඳතාවක් ගොඩනැඟෙන්න ඕනෑ. අඩුම ගණනේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉඳහිට හෝ අපේ ගරු මන්ත්‍රීවරුන්ට ගිහිල්ලා ආණ්ඩුකාරවරයා හමුවෙලා අපට තිබෙන ප්‍රශ්න විතරක් නොවෙයි,

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඇවිල්ලා කියන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු මන්ත්‍රීතුමා අපි කියන්නේ, අපි එකට හමුවෙලා සාකච්ඡා කරන්න ඕනෑ. පෞද්ගලික ප්‍රශ්න නොවෙයි. අපට එකට හමු වුණාම තමයි මේක කරන්න පුළුවන්. ඒකට වැඩ පිළිවෙළක් ඕනෑය කියලයි මම කියන්නේ. එහෙම කරන්න පුළුවන් නම් අපේ රටේ ජනගහනයෙන් 28.7% ක් ජීවත්වන බස්නාහිර පළාතේ ජනතාවට මීට වඩා නිර්මාණශීලී සේවයක් කරන්න අපට පුළුවන් වෙයි කියලා මා විශ්වාස කරනවා. මේවා පනත්වල ලියවිලා නැතිව ඇති. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නමුත් අපි කියන්නේ, ප්‍රායෝගිකව ජනතාවට සේවය කරන්න ගියාම - අපි සාමූහිකව තීරණ ගන්න ගියාම අපි අතර මතිමතාන්තර තිබෙන්න පුළුවන්. අපි අතර ප්‍රතිපත්තිමය වෙනස්කම්, ගැටීම් තිබෙන්න පුළුවන්. නමුත් අපි අවසානයේ කාටද සේවය කරන්නේ කියන කාරණාව තේරුම් ගන්න ඕනෑ. ඒ නිසා අපට ජනතාවට සේවය කිරීම ගැන වෙනස් විදියකට හිතන්න - අවුරුදු 26 ක් තිස්සේ අපි සාම්ප්‍රදායිකව හිතන්නේ. අර අපේ ගරු මන්ත්‍රීතුමා මතක් කළා, අපි තාක්ෂණය භාවිතා කරන්නේ නැහැයි කියලා. අපේ අයවැයෙන් තාක්ෂණය සම්බන්ධයෙන් විශේෂ වැයක් කරන්න ඕනෑ, මේ සභාවේ වෙන දේවල් ඒ වේලාවේම අපට බලන්න පුළුවන් නම්, රටේ ඉන්න මිනිස්සුන්ට බලන්න පුළුවන් නම් අපට හදිස්සියේදී වීඩියෝ පටයක් ගන්න පුළුවන් නම්, ඊට සැලසුමක් තිබෙනවා නම් - අපි තාක්ෂණය එක්ක යනවාද කියන ප්‍රශ්නය ගොඩනැඟෙනවා. ඒක නිසා අපි මේ සම්ප්‍රදායෙන් වෙනස්ව හිතන්න වැඩ සැලසුම් කරන්න ඕනෑය කියලා අපි විශ්වාස කරනවා. ඊට අමතරව කියන්න ඕනෑ වැදගත් දෙයක් තමයි මේ ආණ්ඩුකාරවරයා කියලා තනතුරක් තිබෙනවා. මේකත් සාම්ප්‍රදායික තනතුරක් විතරයි. අපි කනගාටු වෙනවා. මේ තනතුර මීට වඩා කාර්යක්ෂම සහ ජනතාවට සේවය කරන මන්ත්‍රීවරුන්, නියෝජිතයින් සමඟ සබඳතාවය ගොඩනඟමින් ඉදිරියට යන තනතුරක් බවට පත් වෙන්න ඕනෑය කියලා. අපි දන්නවා, අපේ ආණ්ඩුකාරතුමා දක්ෂ කම්කරු නායකයෙක්. ඒ වාගේම දක්ෂ කෘතහස්ත දේශපාලඥයෙක්. එතුමා වයසයි. අපි දන්නවා, ඒක ඇත්තයි. නමුත් මම හිතනවා, එතුමා අපේ රටේ අගමැතිවරයාට වැඩිය හොඳින් කටයුතු කරනවා කියලා. අපි දන්නවා. මේ ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා, ජනාධිපතිවරයාගේ ප්‍රසාදය හිමිවනතාක් කල් ආණ්ඩුකාරවරයාට කටයුතු කරන්න පුළුවන්. ඉතින් මේ ගැන මම වැඩිය කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් ඔබ තමුන්නාන්සේලාට මම ආරාධනා කරනවා, මේ මම කියන කාරණය ගැන ටිකක් ගැඹුරට හිතන්න කියලා.

අනික් එක අපි දන්නවා, ආණ්ඩුකාරවරයා පවා සමහර වේලාවට ඇතැම් නියෝග දෙනවා. ඒ නියෝග මේ පළාත් සභාවේ ක්‍රියාත්මක වෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ විතරක් නොවෙයි. සමහර මන්ත්‍රීවරුන්, ඒ වාගේම ජනතාව කියන දෙයක් තමයි අප ආණ්ඩුකාරවරයාට යම් පැමිණිල්ලක් යැව්වාම, යම් චෝදනාවක් සම්බන්ධයෙන්

[ ගරු සුසිල් කිඳෙල්පිටිය ]

වාර්තා කළාම ඒ පිළිබඳව අපට ආපසු පෙරළා පිළිතුරක් ලැබෙන්නේ නැහැ. අපට ඒකේ ප්‍රතිඵලය ලැබෙන්නේ නැහැ. Feedback එක අපට එන්නේ නැහැයි කියලා. ඒ නිසා ආණ්ඩුකාරවරයාගේ කටයුතු සහ ආණ්ඩුකාර කාර්යාලයේ කටයුතු මීට වඩා ජනතාවට සහ මන්ත්‍රීවරුන්ට සමීපවන විධියට ක්‍රියාත්මක වෙන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම ඉදිරි කාලයේදී මෙය නිවැරැදි තත්ත්වයට පත් කරලා කාර්යක්ෂම සේවයක් ආණ්ඩුකාරවරයාගෙන් ලබාගන්න අපට හැකි වෙයි කියලා විශ්වාස කරනවා. ඒ වාගේම එම කටයුතු එලෙස ඉටු කරන්නට අපේ ආණ්ඩුකාරතුමාට ධෛර්යය, ශක්තිය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

ඉතින් අධිපතිවාදයට යටත් වුණු රටක් ආණ්ඩුකාරවරයා විතරක් ඒකෙන් නිදහස් වෙන්නේ නැති බවත් අපි දන්නවා. කෙසේ වෙතත් මීළඟට මම කැමැතියි කාරණා කිහිපයක් මතු කරන්න, රාජ්‍ය සේවා කොමිසම පිළිබඳව. පළාත් රාජ්‍ය සේවකයින් බඳවා ගැනීම්, උසස් කිරීම්, මාරුකිරීම් සියල්ලම සිද්ධ වෙන්නේ මේ හරහා. ඇත්ත වශයෙන් අපි දන්නවා, පළාත් රාජ්‍ය සේවා කොමිෂමෙන් යම් සේවයක් සිද්ධ වෙන බව. අපි දන්නවා, සමහර නිලධාරීන් අපට ඇවිල්ලා කියලා තිබෙනවා. මේ ආයතනයෙන් සෑහෙන සේවයක් වෙනවා කියලා. අපි ඒක අගය කරන්න ඕනෑ. හැබැයි, තවත් කාරණයක් තමයි සමහර රාජ්‍ය සේවකයින් විතරක් නොවෙයි. සමහර අපේ මන්ත්‍රීවරුන්වත් දන්නේ නැහැ, මේ රාජ්‍ය සේවා කොමිසමෙන් මොකක්ද? කෙරෙන්නේ. මොනවාද? කරගන්න පුළුවන් කියන එක ගැන. ඇත්ත වශයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම යෝජනා කරනවා. මෙන්න මේවාට තමයි පුහුණු වැඩමුළු අවශ්‍යය. රාජ්‍ය සේවා කොමිසමෙන් මොකක්ද? කෙරෙන්නේ. ආණ්ඩුකාරවරයාගේ කාර්යාලයෙන් අපට මොනවද කරගන්න පුළුවන්. අපි කොහොමද? මේ කටයුතු කරගන්නේ කියන එක ගැන මීට වඩා විධිමත් දැනුමක් අපේ මන්ත්‍රීවරුන්ට ලැබෙන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. ඒක නිසා මේ ආයතනය සම්බන්ධයෙන් කෙරෙන කටයුතු ගැන මීට වඩා පුළුල් අවබෝධයක් ලබා දීමට ක්‍රියා කළ යුතුයි කියලා මම මේ සභාවේ මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම පළාත් සභා ලේකම් කාර්යාලය ගැනත් යමක් කියන්න ඕනෑ. රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නියෝජිතයෙක් හැටියට මම ඉන්නවා. පළාත් සභාවේ කටයුතුවලට අපි මේ කාර්යාලවලට යනවා. ඇත්ත වශයෙන්ම පළාත් සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන් අපට විශාල වශයෙන් උදව් කරනවා. මම අලුත් මන්ත්‍රීවරයෙක් හැටියට මම විශ්වාස කරන දෙයක් තමයි මගේ කටයුතු පසුගිය මාස කිහිපය තුළ ඉතාමත්ම කාර්යක්ෂමව කරගන්න ලැබුණේ, මගේ ළඟ ඉන්න නිලධාරීන් නිසා නොවෙයි. මේ පළාත් සභා ලේකම් කාර්යාලයේ ඉන්න නිලධාරීන් නිසා. යම් උදව්වක් ඉල්ලුවාම, යම් ලියවිල්ලක් ඉල්ලුවාම ඔවුන් එය ඇසූ සැනින්, අපට ලබා දීමට ක්‍රියා කරනවා. ඒ වාගේම මම දැක්ක දෙයක් තමයි මම මේ පළාත් සභාවට පැමිණි මුල් දවස්වලම මම ඇහුවා, මේ පළාත් සභා ක්‍රමය ගැන ලිපි ලේඛන අපට පරිශීලනය කරන්න, අපට පොත් පත් බලන්න, පළාත් සභා ක්‍රමය ගැන කියවන්න කොහේ හරි පුස්තකාලයක් තිබෙනවාද කියලා. එතකොට ඒ නිලධාරීන් මට පෙන්නුවා පොඩි පොත් කබඩ් දෙකක්. මෙන්න මෙච්චර තමයි අපට තිබෙන්නේ කියලා. ඇත්ත වශයෙන්ම මම කනගාටු වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අවුරුදු 26 ක් වුණු පළාත් සභාවට මේ පළාත් සභා ක්‍රමය ගැන කියවන්න පුස්තකාලයක් නැහැ. ඒ නිසා අඩුම වශයෙන් අලුතෙන් හදන ගොඩනැගිල්ලේ පුස්තකාලයකට අවශ්‍ය නිලධාරීන් යොදවා හොඳ පුස්තකාලයක් ස්ථාපනය කළ යුතුයි කියලා මම මේ සභාවට මතක් කරනවා.

ඒ වාගේම විෂයානුබද්ධ දැනුම ලබා ගැනීම. අපි දන්නවා පළාත් සභා ලේකම් කාර්යාලය හරහා අපට පුහුණු වැඩමුළු තිබෙනවා. පුහුණු වැඩ සටහන් තිබෙනවා. මේ පුහුණු වැඩ සටහන් විධිමත් බවක් පෙනෙන්න නැහැයි කියලා මට පෙනෙනවා. ඇත්ත වශයෙන් දේශපාලනීකරණය නොවුණු මධ්‍යස්ථ දේශකයෝ ගෙනැල්ලා අපට මීට වඩා විධිමත් පුහුණු වැඩ සටහන්වලින් පුහුණුවක් ලබා දිය යුතුයි. ඒ විතරක් නොවෙයි, අපි විදේශ සංචාර ගැන කථා කරනවා. ඇත්ත වශයෙන්ම මම විශ්වාස කරනවා. මේ පුහුණු වැඩ සටහන්, විදේශ සංචාර පළාත් සභාවේ ලේකම් කාර්යාලය හරහා වඩාත් විධිමත් වැඩ සටහන් විධියට - මම හිතන්නේ පාරදෘශ්‍ය භාවය පිළිබඳවත් එතකොට ප්‍රශ්න එන්නේ නැහැ. ඒ නිසා ඒ පුහුණු වැඩ සටහන්වලදී පවා පළාත් සභා ලේකම් කාර්යාලය හරහා විධිමත් වැඩ සටහන් සකස් කරලා, මම හිතන්නේ විෂයානුබද්ධව විධිමත් කාලසටහනක් හදලා ඒ විධියට අපට දැනුමක්, පුහුණුවක් ලබා දෙනවා නම් ඒක ඉතාමත් වැදගත්.

ඒ කාර්ය මණ්ඩලය ඉතාමත් හොඳින් පුහුණු වැඩ සටහන් ආදිය කරනවා. මේ කටයුතු පළාත් සභා ලේකම් කාර්යාලය හරහා මීට වඩා විධිමත්ව පවත්වාගෙන යනවා නම් එය ඉතා වැදගත් කියලා මම විශ්වාස කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.38]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, ඔබතුමා මූලාසනාරූඪ වුණු අවස්ථාවේදිම මට මේ වැදගත් විෂයය පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. අද තිබෙන්නේ අපේ ආණ්ඩුකාරතුමාගේ කාර්යාලයේත්, ඒ වාගේම ආණ්ඩුකාරතුමා පිළිබඳවත්, ඒ වාගේම බස්නාහිර පළාතේ පළාත් සභාව පිළිබඳවත්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳවත් අපේ අදහස් මේ වැදගත් සභාවට ප්‍රකාශ කරන්නයි. මේ මූලික විෂයයන් තුනේදීම කථා කරනකොට කිසිම මන්ත්‍රීවරයෙකුට ඇඟිල්ල දික් කරලා අඩුවක් පාඩුවක් කියන්න බැහැයි කියලයි මගේ විශ්වාසය. අපේ සුසිල් කිඳෙල්පිටිය මැතිතුමාගේ කථාව වුණත් එතුමා යම් යම් අඩුපාඩු හුවා දක්වන්න උත්සාහ කරලා, ඒ උත්සාහය අසාර්ථක වන කොට එතුමා යළිත් වරක් ආණ්ඩුකාරතුමාගේ ගුණ වර්ණනාව, ඒ වාගේම පළාත් සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ ගුණ වර්ණනාව ඒ සියල්ලම යළිත් වරක් ඉබේම ඉස්මතු කරමින් මේ සභාවට ඉදිරිපත් කළා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හරි දේ හරියි කියන්න ඕනෑ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මේක තමයි යථාර්ථය. හැබැයි මේ දේවල් මේ විධියට ඉෂ්ට සිද්ධ කරන්න අපේ ආණ්ඩුකාර අල්හාජ් අලවි මවුලානා මැතිතුමාගේ නායකත්වය, ඒ වාගේම පළාත් සභාවේ නායකත්වය උසුලන ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වය ඉවහල් වුණයි කියන කාරණාව එතුමාට කියා ගන්න බැරි වුණා. ගරු සභාපතිතුමනි, අල්හාජ් අලවි මවිලානා මැතිතුමා අපේ ආණ්ඩුකාර ධූරයට පත්වීම මම හිතන්නේ බස්නාහිර පළාතට පමණක් නොවෙයි, මුළු මහත් ලංකාවටම ආශිර්වාදයක්. එතුමා උත්පත්තියෙන් මුස්ලිම් ජාතිකයෙක් වුණා විතරක් නොවෙයි, උත්පත්තියෙන්ම භක්තිමත් මුස්ලිම් ජාතිකයෙක්. ඒ විතරක් නොවෙයි එතුමා සිංහල වර්ගයාටත්, ද්‍රවිඩ වර්ගයාටත්, අනිකුත් පොදු සුළු ජාතීන්ටත් සැබෑම විමුක්තිකාමියෙක්. එතුමාත් එක්ක මම වෘත්තීය සමිතිවල වැඩ කරලා තිබෙනවා. මම හරි ආඩම්බරයෙන් කියන්නේ, මම ලංකා ගමනා ගමන මණ්ඩලයේ එවකට සේවය කළා. මම ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවකයෙක් හැටියට වෘත්තීය සමිති ව්‍යාපාරයේ ඉදිරියෙන් ඉන්න අවස්ථාවේදී මගේ නායකයෙක් හැටියට කටයුතු කළේ අල්හාජ් අලවි මවිලානා මැතිතුමා. මම කඩුවෙල ප්‍රාදේශීය සභාවට 1991 හා හා පුරා කියලා තරුණයෙක් හැටියට ඉදිරිපත්වන අවස්ථාවේදී මගේ ජයග්‍රහණය විජයග්‍රහණයක් කරවන්න මුලින්ම ඇප වෙලා කැප වෙලා කටයුතු කළේ එතුමා. අද විපක්ෂය මේ ආණ්ඩුවට දෝෂාරෝපණය කරනවා, ඒකාධිපති පාලනයක් කියලා. මේ අපේ ආණ්ඩුවට නොයෙක් නොයෙක් අසම්මත චෝදනා කරනවා. නමුත් මට මතකයි 1991 දී එදා එවකට තිබුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව අපට අඩම්තේට්ටම් කරලා, අපට හිරබත් කවනකොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂයට දැන් කථා කරන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මේ ආණ්ඩුකාරතුමා ගැන තමයි කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එච්චරයි. එතැනින් එහාට යන්න ඕනෑ නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

එතැනින් තමයි පාර හදා ගන්නේ. මොකද, හොඳට අවබෝධ කර දෙන්න ඕනෑ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතකොට ඔබතුමාට කාලය මදි වෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

විනාඩි 08. ඒ ඇති මට. ඒ ඇති. ඉතින් මම මේ කියන්න ගියේ, ඒ වාගේ ඉතාමත්ම ගුණවත් මනුස්සයෙක් නිසා අපටත් මේ වගේ උත්තරීතර සභාවක් නියෝජනය කරලා මහජන සේවයක් කරන්න පුළුවන් වුණයි කියන කාරණාව ඔබතුමා මාර්ගයෙන් මේ විපක්ෂයට මතක් කර දෙන්නයි.

ගරු සභාපතිතුමනි, අපේ බස්නාහිර පළාතේ පළාත් සභාව පිළිබඳව අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා, එතුමා නවක මන්ත්‍රීවරයෙක් හැටියට මෙලෝ දෙයක් දන්නේ නැහැයි කියලා. මේ පළාත් සභාව පිහිටුවලා දැන් මාස කීයක් වුණාද? ඒකෙන්ම තේරෙනවා එතුමන්ලා මේ නිකන් ආභරණයක් හැටියට පළාත් සභාව නියෝජනය කරනවා මිසක් සැබවින්ම ජනතාවට සේවය කිරීමේ අරමුණින් මේ පිළිබඳව අවබෝධයක් ලබා ගෙන කටයුතු නොකළයි කියන කාරණය තමයි අපට පසක් වෙන්නේ. විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට මම ආණ්ඩුකාරතුමා ඇතුළු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ සමස්ත කාර්ය මණ්ඩලයට ස්තූතිවන්ත වෙනවා. හොඳ ලේකම්වරයෙක් ඉන්නවා. අපේ ලේකම්තුමා, ඒ වාගේම කාර්ය මණ්ඩලය ඉතාම සුවිශේෂී සේවයක් අපට ලබා දෙනවා.

ඒ වාගේම පළාතේ පළාත් සභාව හැටියට පළාත් සභා ලේකම් කාර්යාලය අර එතුමා කියපු දේ මමත් අනුමත කරනවා. අපේ හැම මන්ත්‍රීවරයෙකුටම පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව ඔවුන් සේවය කරනවා. එවැනි සේවක මණ්ඩලයක් පත් කර දීමේ වගකීම කටද තිබෙන්නේ? අපේ ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාට. ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා එතැනදී නියම නායකයෙක් හැටියට ක්‍රියාත්මක වෙනවා. ඔබතුමා එහි සභාපතිත්වය අරගෙන, ආදර්ශමත් සභාපතිවරයෙක් හැටියට ඒ වාගේ පොදුවේ කටයුතු කරන හොඳ නිලධාරී මණ්ඩලයක්, සේවක මණ්ඩලයක් යොදවලා තිබෙනවා. ඒ නිසා ඒ ගරුත්වය ඔබ දෙපළටම එනවා. ඒ නිසා තමයි අද විපක්ෂයෙන් වුණත් හැම වේලාවේම අපේ ආණ්ඩුව ගැන, අපි ගැන නොයෙක් අපෝනාවන් කිව්වත් මෙතැන තිබෙන අඩුපාඩුවක් ගැන ඔවුන්ට කියාගන්න බැරිව යනවා නේ.

ඒ වාගේම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. අපි ඉතාම ආඩම්බරයෙන් කථා කරන්න ඕනෑ. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වර්තමාන ලේකම්තුමිය ඉතාමත්ම කාර්යක්ෂමව, ඉතාමත්ම හොඳ විධායක තත්ත්වයේ ඉන්න නිලධාරිනියක්. ඒ වාගේම හිටපු සභාපතිවරයා වාගේම දැන් වර්තමානයේ පත් වෙලා ඉන්න සභාපතිවරයාත් ඉතාමත්ම කාර්යක්ෂම සභාපතිවරයෙක්. ඒ නිසා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වර්තමාන සභාපතිවරයා, ඒ වාගේම ලේකම්වරිය, ඒ වාගේම අනිකුත් සාමාජික මණ්ඩලය ඉතාමත් යුක්ති සහගත සේවයක් කරනවා. පළාත් රාජ්‍ය සේවා කොමිෂමේ තිබෙන සුවිශේෂත්වය තමයි එතැන දේශපාලනයක් නැහැ. මේ විපක්ෂයේ අය වෙන්න පුළුවන්. අපි වෙන්න පුළුවන්. මොකක්ද කියන කාරණාව. ඒ පිළිබඳව මධ්‍යස්ථව නීතියට අනුගතව, නීති රීතිවලට එකඟව කටයුතු කරනවා. අපි කථා කරනකොට මම සතුටු වෙන්නේ අද මේ වැය ශීර්ෂයේදී මේ පිළිබඳව කිසිම අඩුවක් කථා කරන්න බැරිවීම සුවිශේෂී සිද්ධියක්. අවසාන වශයෙන් මගේ කථාව නිම කරනවා. ඉතාමත්ම හොඳ පරිපාලනයක් තිබෙන මේ ආණ්ඩුකාර ලේකම් කාර්යාලය සහ ආණ්ඩුකාරවරයාගේ නායකත්වය තුළත්, ඒ වාගේම පළාත් සභාව තුළත් ජනතාවට හොඳ සේවයක් කිරීමට ඔබ අපි හැමෝටම පුළුවන් වේවායි කියා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

[පූ.භා. 10.46]

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, පළාත් සභාවක ප්‍රමුඛතම සහ සුවිශේෂම කාර්යභාරය වගකීම පැවරෙන ආයතන ත්‍රිත්වය පිළිබඳව, අද ශීර්ෂ අංක 100, 101 හා 102 වැය ශීර්ෂ පිළිබඳව තමයි කථාබහට ලක් වෙන්නේ. විශේෂයෙන් ආණ්ඩුකාරතුමා පිළිබඳව සුවිශේෂ ගුණයක් කාර්යභාරයක් අපේ පළාත් සභාව තුළ තිබෙනවා. මම මතක් කරන්න ඕනෑ පළාත් සභා 09 ම දැන් අපි පිහිටුවලා අවසන්. අපට වරක චෝදනාවක් තිබුණා, උතුරු පළාත් සභාව පිහිටුවීම සඳහා අපි කටයුතු කරන්නේ නැහැයි කියලා. අපට බලය නොලැබෙන බව දැනගෙන වුණත් අතිගරු ජනාධිපතිතුමා තීන්දු කළා ප්‍රජාතන්ත්‍රවාදය උදෙසාම උතුරු පළාත් සභාවත් පිහිටුවන්න. අද අපි පළාත් සභා 09 ම ආරම්භ කරලා තිබෙනවා. මම මතක් කරන්න ඕනෑ, සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ කථා බහෙන් දැණුනු දෙයක් තමයි මේ පළාත් සභාව තමයි ප්‍රමුඛතම පළාත් සභාව කියලා. ආදායම අතින් බැලුවත් මම හිතන්නේ සමස්ත පළාත් සභා ක්ෂේත්‍රයේ 45% ක් දක්වා විතර ආදායම් බලගනයක් තිබෙනවා. සේවක කාරකාදීන් පිළිබඳව බැලුවත් මම හිතන්නේ 35% කට අධික රාජ්‍ය සේවයක හිමිකම් ලබනවා. ඒ නිසාවෙන් අපේ පළාත් සභාවෙන් මේ රටේ ජනතාවට, සමස්ත ජනතාවගෙන් 29% ක විතර ආවරණයක්, සේවාවක් සැපයෙන ප්‍රධාන ආයතනයක්. විශේෂයෙන්ම මධ්‍යම රජය තිබුණත් පළාත් සභාවට මේ සමගාමී ලැයිස්තුවේ තිබෙන කාරණාවලදී වුණත් සුවිශේෂ කාර්ය භාරයක් පළාත් සභාවට තිබෙනවා. වැඩිම දායකත්වයක්, වැඩිම සේවාවක් සිද්ධ වෙන ප්‍රධාන ආයතනයක් හැටියටයි බස්නාහිර පළාත් සභාව අපි සලකන්නේ. ඒ නිසා මේ වාගේ පළාත් සභාවක ප්‍රධාන වගකීම උසුලන නායකයා, ප්‍රධානියා පිළිබඳව විශේෂ ඇගයීමක්, විශේෂ පිළිගැනීමක් තිබෙනවා. මම මතක් කරන්න ඕනෑ, අපේ ගරු ආණ්ඩුකාරතුමා අල්හාජ් අලව් මව්ලානා මැතිතුමා මේ පළාත් සභාවේ උසස්ම ගෞරවණීය තනතුරට පත් වුණේ. විශේෂයෙන් බස්නාහිර පළාත් සභාවේ නම් වැඩි හරියක්ම සුළු ජාතික විද්වතුන්. ඒ වාගේම ඔවුන් හොඳ සමාජ නායකයෝ. ඔවුන් දේශපාලනය පිළිබඳවම නොවූවත් සමාජ විඥානය පිළිබඳව පරිණත බුද්ධියක්, අවබෝධයක්, අත්දැකීම් බහුල නායකත්වයක් බොහොම විශිෂ්ටතම වූ ගෞරවයකට හිමිකම් කියන නායකයන් තමයි සිටියේ. විශේෂයෙන් අධිකරණ ක්ෂේත්‍රයෙන් වැඩි හරියක් පත් වුණේ. අපට මතකයි, විග්නරාජා ආණ්ඩුකාරතුමාගේ කාලයේ සිට අපි මේ හයවැනි පළාත් සභාවේ ඉන්නේ. මම හිතන්නේ අපේ ගරු මහ ඇමැතිතුමාත්, ගාමිණී තිලකසිරි ගරු සභානායකතුමාත්, ගරු සභාපතිතුමාත් අපි පස්දෙනෙක්, හය දෙනෙක් විතර දැන් ජ්‍යෙෂ්ඨතම පිරිස මේ සභාවේ ඉන්න. ඒ නිසාවෙන් මතක් කරන්නේ අද අපේ නායකත්වය දරන්නේ අල්හාජ් අලව් මව්ලානා ගරු ආණ්ඩුකාරතුමන්. ඉතින් මට දැනෙන හොඳ දෙයක් තිබෙනවා. මොකද මේ කිසියම් විෂයානුගත පරිපාලනමය අත්දැකීම් බහුලතාවය වගේම සමාජ අත්දැකීම් බහුල නායකත්වය. සමහර වේලාවට එතුමාගේ කට හඬින් එතුමා කියනවා, මම ආණ්ඩුකාර සහෝදරයා කියලා. මට ඒකේ ලොකු ගැඹුරක් දැනෙනවා. ඒ තමයි මේ රටේ අහිංසක, තැලෙන, පොඩි වෙන දහසකුත් ගැටලු ප්‍රශ්න තුළ මිරිකෙන කම්කරු ජනතාවගේ වසර 60 ක, දශක 06 ක අත්දැකීම් බහුල නායකයෙක්. ඒ අත්දැකීම් එතුමාට ආශ්‍රය නිශ්රය කරන්නට ලැබිලා, ඒ අත්දැකීම් තුළ තමයි මේ නායකත්වය ගොඩනැඟුනේ. ඒ නිසාවෙන් දේශපාලන අධිකාරී බලය තිබෙන ආයතනයක ප්‍රධානත්වයට මේ වාගේ නායකයන් අවශ්‍ය වෙනවා. මට මතකයි, කම්කරු නායකයෙක් හැටියට එතුමා පහරකෑම් ගණනාවකට ලක් වුණා. ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරවරු මේක දන්නවා. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ ප්‍රහාරයට ලක් වෙලා සෝමපාල සහෝදරයා මිය ගියා. ඒ නිසාවෙන් එතුමා මේ සියලු කම්කරු ජනතාවත් එක්ක පෙරමුණේ සීරුවෙන් හිටගත්ත යහපත් සමාජ නායකයෙක් කියලා මම හය නැතිව කියන්න ඕනෑ. එවැනි නායකයෙක් යටතේ තමයි අපි මේ ඉන්නේ.

මම මතක් කරන්න ඕනෑ. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා මෙතැන නැහැ. එතුමා මතක් කළා, එතුමාට තවම අත්දැකීම් නැති නිසා වෙන්න ඇති. අපි කැමැතියි ආණ්ඩුකාර කාර්යාලයට යන්න. අපි කැමැතියි එතුමාව හම්බ වෙන්න. අපි කැමැතියි එතුමාත් එක්ක සාකච්ඡා කරන්න. මම හිතනවා අපට ලැබුණු ආණ්ඩුකාරවරුන්ගෙන් මෙතරම් මිත්‍රශීලී සුහදශීලී ලෙංගතු ආණ්ඩුකාරවරයෙක් තවත් නැහැ. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගේ අදහස මම එතුමාට මතක් කරනවා. එතුමා හිනාවෙලා කියයි එන්න කියලා. හරිම ආදරෙන් බලාපොරොත්තු වෙනවා. මම ඒක කියන්න ඕනෑ. ඒ වාගේම කාර්ය මණ්ඩලය. එතුමාගේ ලේකම්තුමා, සහකාර ලේකම්තුමා, පෞද්ගලික ලේකම්තුමා සහ කාර්ය මණ්ඩලය ඉතාම මිත්‍රශීලී සහෝදර

[ ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා ]

බැම්මකින් ඒ ආණ්ඩුකාර කාර්යාලය තුළ වැඩ කරනවා. මම දන්නේ නැහැ, මම විශ්වාස කරන්නේ නැහැ, පළාත් සභා කිසිම එහෙක මෙවැනි සුහදශීලී පසුබිමක් තිබෙනවා කියලා. ඒක අපි හොඳින් දන්නවා. ඒක නිසා මම සභා කටයුතු ඇමැතිවරයා හැටියට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගේ වගකීම බොහොම හොඳින් භාර ගන්නවා.

ඒ වාගේම මතක් කරන්න ඕනෑ. ආණ්ඩුකාරතුමාගේ නිල නිවාසය පිළිබඳව කථා කළා. ඔබ සියලුදෙනා සතුටු වෙන්න ඕනෑ. අපේ මේ භූමියේම එහා පැත්තේ ගරු මහ ඇමැතිතුමාගේ ඉල්ලීමට මිලියන 4800 ක් අතිගරු ජනාධිපතිතුමා වෙන් කරලා දුන්නා. ගරු මහ ඇමැතිතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. මහ ඇමැතිකම පැත්තක තියමු කෝ. එතුමා එදා ඉඳලම ඇත්දැකීම් බහුලයි. අපට අලුත් ගොඩනැගිල්ලක් නැහැයි කියලා තිබුණා. අපි පිළිගන්නවා, ඌවට ගියත්, සබරගමුවට ගියත් අලුත් ගොඩනැගිලි තිබෙනවා. ඒ නිසා එතුමා මහ ඇමැති ධූරයට පත් වුණාම අතිගරු ජනාධිපතිතුමාත් එක්ක කථා කළා. ජනාධිපතිතුමා මිලියන 4800 ක ප්‍රතිපාදන සලසා දුන්නා. උපකරණ වාගේ දේවල් එනකොට ඊට වැඩිය යයි. දැන් කඩිනමින් ඉදි වෙනවා. ඒකේ අපි වෙනමම පහසුකම් සලසා තිබෙනවා. ආණ්ඩුකාරතුමාට ඉතාම හොඳ මට්ටමේ කාර්යාලයක් පවත්වන්න. ඒ වාගේම නියෝජ්‍ය සභාපතිතුමා ගරු මන්ත්‍රීවරුන්ගේ අඩුපාඩුකම් ගැන කථා කළා. සියලුම ගරු මන්ත්‍රීවරුන්ට අවශ්‍ය පහසුකම් ඒ තට්ටු 14 ක ගොඩනැගිල්ලේ අපි සලසනවා. ගරු මහ ඇමැතිතුමා මම සභා කටයුතු ඇමැතිවරයා හැටියට මාව වරින් වර මේ සම්බන්ධයෙන් දැනුවත් කරනවා. මම බොහොම අවංකව කියන්න ඕනෑ. මම සභා කටයුතු ඇමැතිවරයා හැටියට පත් වුණාම, මම සභා කටයුතු කාරක සභාවේ වාඩි වුණාම අපේ ලේකම්තුමා දන්නවා. අපේ සභාපතිතුමා දන්නවා. මම ඉල්ලීමක් කළා. මම මේ සභාවේ සභානායක, නියෝජ්‍ය සභාපති තනතුරු හොබවලා ගිය කෙනෙක්. මම දන්නවා හිටපු තැන. කම්කරුවොත් එක්ක ඉඳලා ගරු ආණ්ඩුකාරතුමා කම්කරුවන් ගැන දන්නවා වාගේ. මට ඔබේ යෝජනා අදහස් දෙන්න. නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා ඉදිරිපිටත් මම කිව්වා. දෙන්න. අපි ඉෂ්ට කරනවා. මට කැබිනට් ප්‍රකාශ හදලා දුන්නා. මම ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා භය නැතිව යෝජනා දෙන්න. මේවා මහජන මුදල්. සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා වාගේ ශත පහක්වත් හොරකම් නොකරපු මන්ත්‍රීවරු ඉන්නවා, සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමනි. අපි ශ්‍රී ලංකාකාරයෝ තමයි. හැබැයි **JVP** කාරයින්ටත් වැඩිය සුදුසුකම් අපි ළඟ තිබෙනවා. භය නැතිව ඒවා කියනවා. අපටත් ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා අපි සාධාරණව තමයි මේ වැඩ කරන්නේ. අපිත් ගිහිල්ලා කාගෙන්වත් ශත 50 ක් ඉල්ලගෙන නැහැ. අපි ජනාධිපතිතුමාව දාලා යන්නෙත් නැහැ. ඒ නිසා මතක තියාගන්න ඒ ඉල්ලීම් දෙන්න. ඒ පහසුකම් දෙන්න. (බාධා කිරීම්) මට බාධා කරන්න එපා. මොකද, මාත් සමඟ මිත්‍රශීලීව ඔබතුමන්ලාට කටයුතු කරන්න පුළුවන්. ඒ නිසාවෙන් ඔබේ ඉල්ලීම් දෙන්න. ලබන අවුරුද්දේ වැය ශීර්ෂයෙන් - සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමනි, මම වගකීම භාර ගන්නවා. සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමනි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි වගකීම භාර ගන්නවා. ඔබේ අවශ්‍යතාවයන් දෙන්න. ඔබට තාක්ෂණික මෙවලම් අවශ්‍යද? අපි පුස්තකාලයක් හැදුවා. ගරු මහ ඇමැතිතුමා දන්නවා. ඒ පුස්තකාලයේ තව අඩුපාඩු තිබෙන්න පුළුවන්. පළාත් සභා ලේකම් කාර්යාලයේ. ඒ සියලු දේවල්වලට ප්‍රතිපාදන දෙන්න මට පුළුවන්කම තිබෙනවා. මම ඒ සඳහා ප්‍රතිපාදන ලබා දෙන්න කටයුතු කරනවා.

ඒ වාගේම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. බස්නාහිර පළාත් සභාව හොඳ නායකයෙක් යටතේ පාලනය වෙනවා. ප්‍රසන්න රණතුංග අපේ ගරු මහ ඇමැතිතුමා මේ දෙවැනි සැරේ මහ ඇමැති. මීට කලින් ප්‍රවාහන, මහා මාර්ග ඇමැතිවරයා හැටියට, සෞඛ්‍ය ඇමැතිවරයා හැටියට අත්දැකීම් බහුල කෙනෙක්. ඒ නිසාවෙන් එතුමා කාර්යක්ෂම, දක්ෂතම ප්‍රධාන අමාත්‍යවරයෙක් හැටියට එතුමා කටයුතු කරනවා. අද ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ යටතේ පාලනය වෙන්නේ. ප්‍රධාන ලේකම්තුමිය ඉතාමත් අත්දැකීම් බහුල ලේකම්තුමියක්. ඇය දීර්ඝ කාලයක් පළාත් සභාවේ කටයුතු කළා. අධ්‍යාපන ලේකම්වරිය හැටියට. ඒ වාගේම තවත් තනතුරු කිහිපයක් හොබවපු ප්‍රධාන ලේකම්තුමිය සහ අනෙකුත් අපේ අමාත්‍යාංශවල ලේකම්තුමන්ලා හොඳ කාර්යභාරයක් කළා. විශේෂයෙන්ම අපේ සැලසුම් අංශය, මූල්‍ය අංශය, ඉංජිනේරු කාර්යංශය, ඒ වාගේම ආදායම් බදු දෙපාර්තමේන්තුව මේ සියලු අංශ - සැලසුම් අංශයෙන් විශාල කාර්ය භාරයක් පළාත් සභාවට කෙරෙනවා. මේ සියලු කටයුතු මැද අද පළාත් සභාව හොඳින් පවත්වාගෙන යනවා. පළාත් සභා අභිමානය, ගෞරවයට, පළාත් සභාවේ පරිපාලනය නිවැරදි

තැනක අද තිබෙනවා. සාමාජීය වශයෙන් අපට යම් යම් දේවල්වලට මුහුණ දෙන්න පුළුවන්. නමුත් හොඳ තැනක ඉන්නවා. ඒ නිසා මම බොහොම අවංකව කියන්න ඕනෑ.

ඒ නිසා මට තව මතක් කරන්න දෙයක් තිබෙනවා. විශේෂයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. දැන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් විශාල කාර්ය භාරයක් තිබෙනවා. අපි තීන්දුවක් ගත්තා, මේ රටේ උපාධිධාරීන්ට රැකියා දෙන්න. ජනාධිපතිතුමා උපාධිධාරීන් 40,000 කට රැකියා දෙනකොට ඊට සමගාමීව රැකියා දෙන්න ඕනෑය කියලා අපි තීන්දුවක් ගත්තා. ඒ තීන්දුව තුළ අපි බස්නාහිර පළාතේ සියලුම උපාධිධාරීන්ට රැකියා දෙන්න තීන්දුවක් ගත්තා. දැනට 2012 දෙසැම්බර් 31 දක්වා උපාධිය සමත් වෙලා තිබෙන අයට අපි රැකියා ලබා දීමට කටයුතු කරලා තිබෙනවා. දැනට කොහේ හරි ඉතිරි වෙලා තිබෙනවා නම්, අපි දැන් අයදුම්පත්‍ර කැඳවලා තිබෙනවා. මම හිතන්නේ, මේ දෙසැම්බර් මාසේ අග ගුරු විභාග තිබෙනවා. ඒ වාගේම සංවර්ධන නිලධාරීන් සඳහා, සියලු පැතිවලින් අපි හොඳ පසුබිමක් හදලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ නිසා මම මේ ඉතුරු විනාඩි දෙකත් මතක් කරන්න ඕනෑ ගරු සභාපතිතුමනි, පළාත් සභාවක වගකීම තිබෙන හොඳ පසුබිමක් තමයි මේ බස්නාහිර පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය සහ සභාව. මමත් මේ මූලාසනයේ කාලයක් සිටියා. මම අද බොහොම අවංකව කියනවා. කවුරුත් අමනාප නොවේවි. අපේ නවක ගරු මන්ත්‍රීතුමන්ලා මීට වඩා හොඳ විනයක් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අහන්න කෙනෙක් නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අහන්න කෙනෙක් නැති එකත් විනයේ ප්‍රශ්නයක් තමයි. ජනතා නියෝජිතයෝ හැටියට ඇහුම්කන් දෙන්න පුරුදු වෙන්න ඕනෑ. ඒක අවශ්‍යයි. ජනතාව බලාපොරොත්තු වෙනවා, ඡන්දය දීලා මේ සභාවට එව්වාම අඩු වශයෙන් මේ සභාවේ ඉන්න එකවත්. සභාවේ ඉන්නවද කියලවත් බලනවා. අද එහෙම එකක් නැහැ. විනය අඩුයි. සභාවේ ගණ පූරණය නැති වෙන්නේ ඒ නිසා. සභාපතිතුමා සභා ගර්භයට ඇතුළු වන විටත් අපි තැන් තැන්වල කසු කුසු දානවා. මේ තත්ත්වය මතක තියාගන්න. මමත් මූලාසනයේ සිටිද්දී මටත් විවිධ චෝදනා ආවා. සැර වැඩියි. ටිකක් නපුරට කටයුතු කරනවා කියලා. ඒ ඔක්කෝම කළේ මගේ පුද්ගලික දෙයකට නොවෙයි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විනය පිරිහුණත් අපි උත්සාහ කළා බස්නාහිර පළාත් සභාවේ ගෞරවය සහ අභිමානය ආරක්ෂා කරන්න කියන එක ගරු සභාපතිතුමා මාර්ගයෙන් මතක් කරනවා. එහෙමනම් මේ වේලාවේ අවසාන වශයෙන් අපේ ආණ්ඩුකාර තැන්පත් අල්හාජ් අලවි මව්ලානා මැතිතුමන්ට නිදුක් නිරෝගී සම්පත, දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරනවා. ඉදිරියටත් මේ රටේ බස්නාහිර පළාත් සභාවට හොඳ නායකත්වයක් දෙමින් යහපාලනය තුළ එතුමාට කටයුතු කරන්න ශක්තිය, ධෛර්යය ලැබේවා. එතුමාගේ කාර්ය මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ගරු මහ ඇමැතිතුමා ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ කාර්යක්ෂම පාලනය තුළ තව ඉදිරි කාලය තුළත් අපට එතුමාගේ නායකත්වය තුළ හොඳින් මේ මහජන සේවාව කරන්න ඉඩ ප්‍රස්ථාව ලැබේවා. ඒ වාගේම ගරු සභාපතිතුමා ඇතුළු, ලේකම්තුමා ඇතුළු අපේ පළාත් සභාවේ කාර්ය මණ්ඩලයට, ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාටත් සුභ පතමින් මම නිහඬ වෙනවා.

***ඊට අනුකූලව පූ.භා.11.00 ට, අංක 100, 101 හා 102 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසන් විය.***

*Accordingly discussion on the Expenditure Head Nos 100, 101 and 102 was concluded at 11.00 a.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශීර්ෂ අංක 100 ආණ්ඩුකාරවරයා, ශීර්ෂ අංක 101 බස්නාහිර පළාත් සභාව, ශීර්ෂ අංක 102 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය මෙයින් අවසන් වෙනවා. සම්ප්‍රදායානුකූලව මෙම ශීර්ෂයන් පිළිබඳව ඡන්ද විමසීමක් අපි සිදු කරන්නේ නැහැ. ඒ අනුව එකී වැය ශීර්ෂයන් සභා සම්මත වූ වැය ශීර්ෂයන් ලෙස මම මේ අවස්ථාවේදී සභාවට ප්‍රකාශ කර සිටිනවා.

**ශීර්ෂ අංක 104** - **ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, මිනිස්බල හා රැකී රක්ෂා සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය**

**ශීර්ෂ අංක 109** - **ප්‍රධාන ලේකම් කාර්යාලය**

**ශීර්ෂ අංක 110** - **ඉංජිනේරු කාර්යාංශය**

**ශීර්ෂ අංක 111** - **ආදායම් දෙපාර්තමේන්තුව**

**ශීර්ෂ අංක 112** - **ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

**ශීර්ෂ අංක 113** - **අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ශීර්ෂ අංක 114** - **පළාත් පාලන දෙපාර්තමේන්තුව**

**ශීර්ෂ අංක 115** - **ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව**

Head No. 104 - Ministry of Land, Education, Local Government, Manpower and Employment and Information

Head No. 109 - Chief Secretary's Office

Head No. 110 - Engineering Organization

Head No. 111 - Department of Revenue

Head No. 112 - Department of Registration of Business Names

Head No. 113 - Department of Education

Head No. 114 - Department of Local Government

Head No. 115 - Department of Commissioner of Lands

***[සංකේත කපා හැරීම]***
*[Symbolic write-off]*

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, *"ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයන්ගෙන් රු.10/- ක් කපා හරින ලෙස"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂය වෙනුවෙන් විවාදයට සම්බන්ධ වීමට මම නැවතත් ඔබතුමාට ගෞරවයෙන් ආරාධනා කරනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.02]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමාගේ අමාත්‍යාංශය යටතේ මේ වසරේ වැඩිම මුදල් ප්‍රමාණයක් යොදවමින් පළාතේ සංවර්ධනයට විශාල සේවාවක් ලබා දීම සඳහා එතුමා මූල්‍ය ප්‍රතිපාදන යොදවන්න කටයුතු ක්‍රියාත්මක කිරීමට සලස්වා තිබීම පිළිබඳව අපි මුලින්ම එතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ අමාත්‍යාංශය යටතේ අපි දැක්කා, එතුමා වැඩියෙන්ම වියදම් කරන්න තිබෙන මුදල් ප්‍රමාණය වන්නේ, ඇස්තමේන්තු කරලා, සැලසුම් සකස් කරලා තිබෙන්නේ අධ්‍යාපන වැඩ සටහන් සඳහා. ඒ අධ්‍යාපන වැඩ සටහන් පිළිබඳව අපි කථා කරනකොට අපි පසුගිය දවස්වල දැක්කා ගරු සභාපතිතුමනි, ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම සඳහා බස්නාහිර පළාත් සභාවේ කලාප කාර්යාලය මඟින් ක්‍රියාත්මක වුණු වැඩ පිළිවෙළේ අඩුපාඩු රාශියක් තියෙනවා. ගුරුවරුන්ගෙන් කලාප කාර්යාල වලින් ප්‍රශ්න පත්‍ර යෙදවීම් ක්‍රියාත්මක කිරීම මේ ගමන කරලා තිබෙනවා. ව්‍යාපාර හා ගිණුම්කරණ ප්‍රශ්න පත්‍රය. මේ ප්‍රශ්න පත්‍රය කළුතර දිස්ත්‍රික්කයේ ගුරුවරයෙකුගෙන් අරගෙන මුද්‍රණය කරන්න ගියාම එතුමිය පුද්ගලික අංශයේ උගන්වපු ප්‍රශ්න 200 න් 40 ක්ම මේ ප්‍රශ්න පත්‍රයට ඇතුළත් කරලා තමයි මුද්‍රණය කරලා තිබෙන්නේ. කළුතර කලාප කාර්යාලයට දිගින් දිගටම මේ ප්‍රශ්නය පිළිබඳව පැමිණිලි ආවා. මේ ප්‍රශ්නවලට උත්තර ලියපු දරුවන්ගේ දෙමව්පියන් ඒ ගුරුවරියගෙන් අහලා තිබෙනවා, ඔබතුමිය උගන්වපු ප්‍රශ්න 40 ක්ම ඇයි මේකට ඇතුළත් වුණේ කියලා. බලනකොට මේ ගුරු උපදේශකවරුන් ගෙනල්ලා මේ ප්‍රශ්න පත්‍ර හදන්න ඕනෑ අවස්ථාවල්වලදී ඒ අයගෙන් අඩුපාඩුකම් රාශියක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ ප්‍රශ්න පත්‍රයට එතුමියගේ ප්‍රශ්න 40 ම ඇතුළත් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් කළුතර කලාප කාර්යාලයෙන් මේ පිළිබඳව විමසා බලලා මේක විශාල වශයෙන් රූපවාහිනියෙත්, පුවත්පත්වල සඳහන් වුණු කරුණක්. මේ පිළිබඳව සොයා බලලා මෙය ඉදිරියටත් නොවෙන ආකාරයට වැඩ කටයුතු කරන්නය කියන එක ඔබතුමාගේ මාර්ගයෙන් එතුමාට පෙන්නුම් කරන්න කැමැතියි.

ඊළඟට අපි දකිනවා, තවත් අසාධාරණ රාශියක් ගුරුභවතුන්ට මේ කලාප කාර්යාලවලින් සිද්ධ වෙනවා. එක ගුරුවරියකට ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම පෙත්සම් කාරක සභාවටත් මේක යොමු කරලා තිබෙනවා. එතුමියගේ පඩියට, මම හිතන්නේ බැංකුවට යවන පඩියට කලාප කාර්යාලයෙන් රුපියල් ලක්ෂ දෙකක් විතර වැඩිපුර එකතු වෙලා තිබෙනවා. ඒ ගුරුවරිය මේක අරගෙන. මේ පරීක්ෂණය කළාම ආපසු ඒක ගෙවලා. ඊට පස්සේ මේ ගුරුවරියට වැටුපෙන් සම්පූර්ණයෙන් කපන්න කියලා කිව්වාම ඔබතුමා ළඟට ඇවිල්ලා මම හිතන්නේ, සියයට ගණනක් කපලා කොහොම හරි මේක ගෙවලා ඉවර වුණාම මේ කලාප කාර්යාලය ඇතුළේ ඇති වුණු ප්‍රශ්න මත අද ඒ ගුරුතුමියට වෙලා තිබෙන්නේ තැනින් තැන මාරු වෙන්න. වැඩ තහනම් කරන්න කියන චෝදනා ඉදිරිපත් කරමින් මානසික වශයෙන් පීඩා කරනවා. යම් යම් ප්‍රශ්නවලට එතුමියව අසු කරනවා. මේ අධ්‍යාපන වැඩ පිළිවෙළ දේශපාලනීකරණයකට යොමු වීම තුළ ඒ අසාධාරණයක් වෙලා තිබෙනවා කියන එකත් මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, අද මේ වැය ශීර්ෂයන් දිහා අරගෙන බැලුවාම -

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government and Provincial Administration, Manpower and Employment, Engineering Services, Information and Trade Affairs)

එතුමිය -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒ ගුරුතුමිය එක්සත් ජාතික පක්ෂයේ රාජ්‍ය වෘත්තීය සමිතියේ ඉන්නවා. ඒ වෘත්තීය සමිතියේ ප්‍රශ්න ගෙනැල්ලා කථා කරන්න ගියාම ඒක දේශපාලනයකට හරවාගෙන තියෙනවා. මම හිතන්නේ, ඔබතුමාට ඒ ප්‍රදේශයේ ඇමැතිතුමෙකුත් යොමු කළා, ඒ ප්‍රශ්නය. ඔබතුමා ළඟට එන්න ඇති. මම ඒක පස්සේ කථා කරන්නම්. ඒ වාගේ දේශපාලනීකරණය තුළින් මේ ගුරුවරුන්ගේ මානසිකත්වය කඩාකප්පල් කිරීමට කටයුතු කරන්න එපා කියන එක තමයි කියන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

දැන් විස්තර -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔව්. මම ඒ පිළිබඳව ඔබතුමා එක්ක පස්සේ කථා කරන්නම්. ගරු සභාපතිතුමනි, ඒ වාගේම පළාත් පාලන ආයතන පිළිබඳව අපි කථා කරනවා නම්, විශාල ප්‍රශ්න ගණනාවක් තියෙනවා. බස්නාහිර පළාත තුළ අපේ පළාත් පාලන ආයතන මම හිතන්නේ 48 ක් විතර තිබෙනවා. මේ පළාත් පාලන ආයතනවල දැවැන්ත ප්‍රශ්න අද ඇති වෙලා තිබෙනවා. සභාපතිවරුන් විසින් අයථා පාලනයක් ක්‍රියාත්මක කරන නිසා. ඊයේ පෙරෙයිදා අගලවත්ත පාලින්ද නුවර ප්‍රාදේශීය සභාවේ අයවැය සභාවට ඉදිරිපත් කළා. අයවැය ඉදිරිපත් කළාම, අයවැය විවාද කරලා අවසානයේදී ඡන්ද විමසීමකට යොමු වෙන කොට තමන්ගේම සභාපතිවරයාට විරුද්ධව තමන්ගේම පක්ෂයෙන් උපසභාපතිවරුයි තවත් මන්ත්‍රීවරු හතර පස් දෙනෙකුයි එකතු වෙලා අයවැය පරාද කළා. අයවැය පරාද කිරීම පිළිබඳව මම අපේ ගරු මන්ත්‍රීතුමන්ලාත් එක්ක සාකච්ඡාවක් කළා. මේ කරුණ මොකක්ද කියලා මම ඇහුවා. මේ කරුණු සොයා බැලුවාම මේ සභාපතිවරුන් ක්‍රියාත්මක කරන තනි ඒකාධිපති පාලනයක්. මේ සල්ලි ජනතාවගෙන් අය කරගෙන, නැවත ඒ සල්ලි බෙදා හැරීම් ක්‍රියාත්මක කිරීම් පිළිබඳව මෙතුමන්ලා දූෂණය පෙන්නුම් කළා. වංචාවල් සිදුවන ආකාරය පෙන්නුම් කළා. දේශපාලනීකරණය මත තීරණ අරගෙන වැඩ කටයුතු කිරීම පෙන්නුම් කළා. මේ ඔක්කෝම කරුණු කාරණා අරගෙන බැලුවාම අද ජනතාවත් එයට පෙළගස්සවා ගනිමින් ජනතාව ඉතාමත් අපහසුතාවයකින් පත් වෙනවා. අපෙන් එකතු කරපු බදු සල්ලි මේ ගොල්ලෝ සංවර්ධනයට යොදවලා තිබෙන ආකාරය පිළිබඳව. දැවැන්ත ප්‍රශ්න බස්නාහිර පළාතේ මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා ඇතුළේ සිදු වෙනවා කියන එකත් මම ඔබතුමාගේ මාර්ගයෙන් පෙන්වා දෙනවා. මේ මුලා ප්‍රතිපාදන නිදහස් කිරීම්, වෙන් කිරීම් ක්‍රියාත්මක කරවීමේ වැඩ පිළිවෙළේ දූෂණ ක්‍රියා ඇති බව මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරන්න කැමැතියි.

[ ගරු කිත්සිරි කහටපිටිය ]

ඊළඟට ඔබතුමා ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති දිහා අරගෙන බැලුවාම අපි ඉතාමත් සතුටු වෙනවා, මේ පන්සල්, පල්ලි, කෝවිල් පූජනීය ස්ථානවලට මම හිතන්නේ, ගිය වසරේත් මේ වසරේත් ලක්ෂ 2000 කට ආසන්න මුලා ප්‍රතිපාදනයක් මේ සභාවෙන් අරගෙන මේවාට බෙදා දෙන්න කටයුතු කරලා තිබෙනවා. මේ සල්ලි අපි ගත්තේ, මම දැක්කා ඊයේ පෙරෙයිදා අපි සම්මත කරපු පරිපූරක ඇස්තමේන්තුව - මම මෙතුමාගෙන් ඇහුවා, මේ අවුරුද්දේ මේ කාලයේ එකතු කරගෙන මේ සල්ලි ප්‍රමාණය කොහොමද මේ මාස තුන ඇතුළත අපි වියදම් කරන්නේ කියලා. එතුමා කිව්වා, මේ මුදල් සංවර්ධනය මග නැවතුණු නොයෙකුත් ව්‍යාපෘතිවලට යොදවන්න ඕනෑ කියලා. ගරු සභාපතිතුමනි, අපි ඔබතුමාගේ මාර්ගයෙන් මෙතුමාට මතක් කරන්න කැමැතියි. ඒ මූලා ප්‍රතිපාදන මෙතුමා යොදවන්න කටයුතු කරලා තිබෙන ආකාරය බොහොම හොඳ වුණාට, ඒවා වියදම් වෙලා ජනතාවට ඒවායින් ලැබෙන ප්‍රයෝජනය අරගෙන බැලුවාම වැඩියෙන්ම නාස්තියට, දූෂණයට, වංචාවට ඉමහත්ව අසු වෙලා මේකෙන් වැඩක් වෙන්නේ නැහැයි කියන එක මම මේ අවස්ථාවේදී ඔබතුමාට මතක් කරලා දෙන්න ඕනෑ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා ඒ කියන්නේ, ආගමික ස්ථානවලින් දූෂණය කරනවා කියලද?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ. ආගමික ස්ථාවලින් විතරක් නොවෙයි. හැම අංශයෙන්ම. ඊළඟට මෙතුමා අධ්‍යාපනය පිළිබඳව විශේෂ ව්‍යාපෘතියක් කළා. ඒ අධ්‍යාපනය පිළිබඳව ක්‍රියාත්මක කරපු ව්‍යාපෘතිය ***"අපේ දැතින් අපේ පාසල සුරකිමු"*** කියන ව්‍යාපෘතිය යටතේ මම මතක් කරලා දෙන්න ඕනෑ. නම ව්‍යාපෘතියට හොඳයි. අදහසත් හොඳයි. හැබැයි, මේක ක්‍රියාත්මක වනකොට ඒකෙත් තිබෙන්නේ, අර දූෂණ, වංචා සහ අක්‍රමිකතා බව කියන එක අපි මතක් කරලා දෙන්න ඕනෑ. විශේෂයෙන්ම පාසල්වල දෙමව්පියන් මට කිව්වා, ඔබතුමාගෙන් ප්‍රශ්න කරලා අහන්න. මෙතුමා සහ අනිකුත් ප්‍රචාරක කටයුතු සඳහා රුපියල් 3000/- ක්ද, බැනර් එක සඳහා රුපියල් 3500/- ක්ද දෙමව්පියන්ගෙන් එකතු කරලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බොරු. බොරු.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මම දන්නේ නැහැ. හැබැයි, හැම පාසලකම මේකත් තිබෙනවා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ඒක ඇත්ත. ඒක අපි කියන්න ඕනෑ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එතකොට ඒක වියදම් කළේ එහෙමනම් කොයි මුදල් වැය ශීර්ෂය යටතේද කියන එක අපට ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

බැනර් එක අපි ගැහුවේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒ කියන්නේ මන්ත්‍රීවරුන්ගේ මුදල් ප්‍රතිපාදන වලින් -

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

නැහැ. මගේ සාක්කුවෙන් අරන් ගැහුවේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමාගේ පෞද්ගලික මුදල් වලින්. ප්‍රශ්නයක් නැහැ. එහෙමනම් මේ මන්ත්‍රීතුමන්ලා, එතුමන්ලා භාර ගන්නවා එතුමන්ලාගේ මුදල්වලින් ගැහුවා කියලා. මම හිතන්නේ, මෙතුමා නම් ඒ විධියේ වැඩ කරන්න ඇති. අනික් අයගේ චෝදනාවක් තිබෙනවා, දෙමව්පියන්ගෙන් එකතු කරලා තමයි ඒ අය ගැහුවේ කියන එක. එහෙමනම් මේ මුළු බස්නාහිර පළාතේම මෙන්න මේ වාගේ ප්‍රශ්න අද ජනතාව තුළ තිබෙනවා. එහෙමනම් මෙන්න මේ ප්‍රශ්නවලට අපි වැඩ කටයුතු ක්‍රියාත්මක කරවීමේදී මේ පළාත් සභාව මීට වැඩිය විධිමත් වැඩ පිළිවෙළකට යොමු කරවාගෙන කටයුතු කරන්න ඕනෑය කියලා කියනවා.

ගරු සභාපතිතුමනි, තව විනාඩියක් දෙන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමා මුදල් විෂයය භාර අමාත්‍යවරයා හැටියට අපි එතුමාගෙන් දිගින් දිගටම ප්‍රශ්න කරන්න කරුණු කාරණා කිහිපයක් තිබෙනවා. එතුමා මේ මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමේ වැඩ සැලැස්ම අනුව අපි මතක් කර දෙන්න ඕනෑ. අද පළාත් සභාවට අයිති විෂයයන් පිළිබඳව මධ්‍යම ආණ්ඩුව මූල්‍ය ප්‍රතිපාදන යොදවලා ව්‍යාපෘති ගණනාවක් මේ පළාත ඇතුළත ක්‍රියාත්මක කරනවා. මේ පළාතේ ව්‍යාපෘතිවල ගිවිසුම් අත්සන් කරන්නේ - පළාත් සභාවේ උපාලි ගරු ඇමැතිතුමා ඉන්නවා නම් හොඳයි. ඒක අපේ පාරක් කියලා සඳහන් වෙනවා නම්, පළාත් පාලන ආයතනවල ව්‍යවස්ථාවෙන් අපට ඒ බලතල දීලා පළාත් පාලන ආයතන අපේ යටතේ අධීක්ෂණය වෙනවා නම් කොළඹ ඉන්න කොම්පැණිකාරයෝ මේ පාලම් ව්‍යාපෘතිය, පාරවල් සෑදීම පිළිබඳ කෝටි ගණනක ව්‍යාපෘති ගණනාවක් කළුතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වෙනවා. අපි ගිහිල්ලා ප්‍රශ්න කළාම පළාත් සභාව දන්නෙත් නැහැ. පළාත් පාලන ආයතන දන්නෙත් නැහැ. කොළඹින්, ඒ අමාත්‍යාංශවලින් අත්සන් කරගෙන ගමේ ඇවිල්ලා හදලා නඩත්තුව මේ ආයතනවලට භාර දෙනවා. ප්‍රමිතිය මොකක්ද කියන එක ප්‍රශ්නයක් බවට පත් වෙනවා. එක වතුර පාරයි ආවේ. පාලම ගැලවිලා ඇළට වැටිලා තිබෙනවා. මේ ව්‍යාපෘතියෙන් හදපුවා. දැන් ප්‍රාදේශීය සභාවට ඔක්කෝම බණිනවා. එහෙමනම් අන්න ඒ කරුණු කාරණා අවබෝධ කරමින්, කාලය ලබා දීම පිළිබඳවත් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[පූ.භා. 11.14]

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ ප්‍රථමයෙන්ම කථා කිරීමට ලැබීම ගැන මම ඉතාමත්ම සතුටු වෙනවා. මගේ අමාත්‍යාංශයක් නොතිබුණත් සෑම අවස්ථාවකම මගේ ප්‍රතිපාදනවලින් වැඩි හරියක් වෙන් කෙරෙන්නේ අධ්‍යාපනය වෙනුවෙන්. ගරු සභාපතිතුමනි, අවුරුදු 10 ක් තිස්සේ රුපියල් ලක්ෂ 10 ක් වෙන් කරමින් හෝමගම අධ්‍යාපන කලාපය තුළ ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ, සාමාන්‍ය පෙළ සම්මන්ත්‍රණ, ඒ වාගේම ශිෂ්‍යත්ව සමත් දරුවන්ට සිංහල ඉංග්‍රීසි ශබ්දකෝෂ ලබා දෙමින් රුපියල් ලක්ෂ 10 ක ප්‍රතිපාදනයක් වාර්ෂිකව අධ්‍යාපනය වෙනුවෙන් මම වෙන් කරනවා. මම හිතන්නේ ලංකාවේ කොහේවත් ඒක මෙපමණ කාලයක් කරපු කෙනෙක් නැතිව ඇති. සමහර උදවිය කරනවා, සාමාන්‍යයෙන් මැතිවරණයක් ළං වුණාම. මම මේ අධ්‍යාපනය ගැන කථා කරනකොට මේ රටේ අධ්‍යාපන විෂයය භාරව මහ ඇමැතිවරු අපේ බස්නාහිර පළාත් සභාව තුළ කිහිප දෙනෙක්ම සිටියා. කිහිප දෙනෙක් යටතේම ඒ රාජකාරී කටයුතු කරන්න මන්ත්‍රීවරයෙක් හැටියට අපට ඉඩ ලැබුණා. නමුත් මම අනික් අයව අඩු තක්සේරුවට ලක් කරනවා නොවෙයි. වර්තමාන අපේ බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා, එතුමාගේ විෂයයන් සියල්ලම එක හා සමානව, ඒ ඒ විෂයයන්වලට ලබා දීමට නියමිත සියලු පහසුකම්, සියලු දේවල් ලබා දෙමින් එතුමාගේ අමාත්‍යාංශය ඉතාමත්ම කාර්යක්ෂමව කරගෙන යනවයි කියන එක මම සඳහන් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම පළමුවැනි විෂයය තමයි අධ්‍යාපනය. අධ්‍යාපනය ගැන කථා කරනකොට කියන්න කැමැතියි. ඉස්සර තිබුණේ, එක් එක් මන්ත්‍රීවරුන් තමන්ට උවමනා ආකාරයෙන් යම් යම් හිතවත්කම්වලට හෝ විවිධකාරයේ ක්‍රමවලින් ඒ අධ්‍යාපන අමාත්‍යාංශය තුළ වැඩ කරවා ගැනීමයි. අද වර්තමානයේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ විෂයය භාරගත්තු දවසේ සිට එතුමා කරපු පළමුවැනිම වැදගත්ම කාර්යය වනුයේ, අධ්‍යාපනය උදෙසා කලාපයන් තුළ කෙරෙන සේවාවන්, අවශ්‍යතාවයන් හැම දෙයක්ම ව්‍යූහ කමිටුවක් තුළින් ඒ කලාපය තුළ සිටින සියලුම මන්ත්‍රීවරුන්ට පක්ෂ පාට භේදයකින් තොරව ඒ අවශ්‍ය කරන සියලුම සම්පත් ලබා ගැනීම සඳහා එතුමා සියලුම මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබා දීලා කටයුතු කළයි කියන එක මම සඳහන් කරන්න ඕනෑ. අද ව්‍යූහ කමිටුවක් කියන්නේ පක්ෂ පාට භේදයකින් තොරව සියලුම මන්ත්‍රීවරුන් කලාප කාර්යාලය තුළ, කලාප අධ්‍යක්ෂකතුමා ඇතුළු සියලුදෙනාගේම ප්‍රධානත්වයෙන් අපි රැස්වීම් පවත්වනවා. ඒ කලාපය තුළ මොන ආකාරයෙන්ද වැඩ කටයුතු කෙරෙන්න ඕනෑය කියන එක අපි සියලුම දෙනා ඒකමතිකව තීන්දු අරගෙන අවශ්‍යතාවයන් වෙනුවෙන් ඒ කරුණු ඉෂ්ට කරන්නට අපි ව්‍යූහ කමිටු තුළින් ඒ කටයුතු කරනවයි කියන එක සඳහන් කරන්න ඕනෑ. ඒ ව්‍යූහ කමිටු ක්‍රමය ආරම්භ කළේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා. මෙහෙම දෙයක් ඉස්සර තිබුණේ නැහැ. ඒ නිසා ව්‍යූහ කමිටුව පිළිබඳව අපි විශේෂයෙන්ම අගය කරන්න ඕනෑ. මන්ත්‍රීවරු තමයි දන්නේ තමන්ගේ කලාපය තුළ, අවශ්‍යතාවයන් මොනවාද? කියන එක. ඒවා තෝරා බේරාගෙන අපි

[ ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා ]

අධ්‍යාපනය නංවන්නට ව්‍යූහ කමිටු තුළින් විශාල වැඩ කොටසක් කරනවයි කියන එක මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමනි, මම දැනුම් දෙන්න ඕනෑ.

විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, පසුගිය කාලපරිච්ඡේදය තුළ ගරු ප්‍රධාන අමාත්‍යතුමා උපාධිධාරීන් 10,089 ක් මේ මොහොත වන විට බඳවා ගැනීමට කටයුතු කර තිබෙනවයි කියන එක අපට විශාල සතුටක්. අපි දන්නවා, ගුරුවරුන්ගේ යම් යම් හිඟකම් මේ මොහොතේත් තිබෙනවා. ඒ නිසා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, එතුමාගේ අයවැය ලේඛනය ඉදිරිපත් කරපු වේලාවේ එතුමා දැනුම් දීමක් කළා ගුරු පුරප්පාඩු සඳහා ගුරු සහායකයින් 50,000 ක් ඉදිරි වර්ෂයේදී බඳවා ගන්නා ලෙසට. ඒ වාගේම ඒ අය සඳහා රුපියල් 9500/- ක දීමනාවක් ලබා දීමටත් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා. අපි ඒ පිළිබඳව ජනාධිපතිතුමාව අගය කළ යුතුයි. ගරු සභාපතිතුමනි, පසුගිය කාලපරිච්ඡේදය තුළ අධ්‍යාපනයට සම්බන්ධ දේවල් පෙර පාසල් ක්‍රමය - පෙර පාසල් කියන දේවල් පිළිබඳව හැම දෙනෙකුගේම වැඩි අවධානයක් යොමු වෙලා තිබුණේ නැහැ. මේ රාජ්‍ය නායකයින්ගේ. ප්‍රථම වතාවට පෙර පාසල් වෙනුවෙන් පෙර පාසල්වල ඉගැන්වීම් කටයුතු කරන මේ ගුරු මහත්මීන්ට රුපියල් 2500/- ක දීමනාවක් ලබා දීමට අපේ රජය කටයුතු කරලා තිබෙනවයි කියන එකත් මම මේ අවස්ථාවේදී ගෞරවයෙන් සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම ශිෂ්‍යත්ව ආධාර ගරු සභාපතිතුමනි, බොහොම සොච්චමක්. ශිෂ්‍යත්ව ආධාරය ලැබුණේ, රුපියල් 500/- යි. ආර්ථික අතින් කිසිම ශක්තියක් නැති ඒ දෙමව්පියන්ට තමයි රුපියල් 500/- ක ශිෂ්‍යත්ව දීමනාව දරුවන් වෙනුවෙන් ලැබුණේ. ජනාධිපතිතුමාට පිං සිද්ධ වෙන්න ශිෂ්‍යත්ව ආධාර මුදල ලබන වර්ෂයේ සිට රුපියල් 1500/- දක්වා වැඩි කරන්නට කටයුතු කරලා තිබෙනවයි කියන එක මම මේ අවස්ථාවේදී ඉතාමත් ගෞරව පූර්වකව සඳහන් කරනවා. ගරු සභාපතිතුමනි, එදා රුපියල් 500/- අඩු ආදායම් ලාභියෙකුට පමණයි ලැබුණේ. ඒ රුපියල් 500/- ගන්න ග්‍රාමසේවක ගාවට ගිහිල්ලා, ප්‍රාදේශීය ලේකම් ගාවට ගිහිල්ලා අත්සන් කරගෙන තමයි ඒ රුපියල් 500/- ගන්න ලැබුණේ. අද අඩු ආදායම් ලාභී කියන කැල්ල කපා හැරලා රාජ්‍ය සේවයේ දෙමව්පියෙකුගේ දරුවෙකුට වුණත් රුපියල් 1500/- ක දීමනාවක් ලබා දීමට අතිගරු ජනාධිපතිතුමා කටයුතු කළයි කියන එක සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම මහ පොළ ශිෂ්‍යත්ව ක්‍රමය එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් ආරම්භ කළා. අපි දන්නවා, ලලිත් ඇතුලත්මුදලි ඇමැතිතුමා ආරම්භ කරපු මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය මේ රටේ අතිගරු ජනාධිපතිතුමා පසුගිය අයවැය ලේඛනයේදී එම දීමනාව රුපියල් 4000/- දක්වා වැඩි කිරීමට එතුමා කටයුතු කළයි කියන එකත් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. මම අධ්‍යාපනය ගැන තමයි විශේෂයෙන්ම කථා කළේ ගරු මන්ත්‍රීවරුනි. ඒ නිසා මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ ආර්ථික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා මේ ප්‍රාථමික පාසල් 418 කට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රතිපාදන ලබා දුන්නා. එක පාසලකට රුපියල් ලක්ෂ 05 ගණනේ. ඒ ලක්ෂ 05 ලබාදීපු මුදලින් ඒ පාසලට අවශ්‍ය කරන ඕනෑම කටයුත්තක් කර ගැනීමට අවශ්‍ය පහසුකම් සලසලා තමයි ඒ රුපියල් ලක්ෂ 05 ක දීමනාවක් ලබා දීමට කටයුතු කළේ. ඒ නිසා මේ බස්නාහිර පළාත් සභාව තුළ නිරන්තරයෙන්ම අධ්‍යාපනය වෙනුවෙන් කටයුතු කරන අවස්ථාවේදී අපි විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, මට ප්‍රථම කථා කරපු අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා යම් යම් අඩුපාඩු පිළිබඳව සඳහන් කළා. මම හිතන්නේ ඒවාට අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා උත්තර දෙයි. මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ.

*"අපේ පාසල අපේ දෑතින් සුරකිමු"* වැඩ සටහන. ගරු සභාපතිතුමනි, ඉස්සර මේවා තිබුණේ නැහැ. සෑම පාසලකම ඉගෙන ගන්න දරුවෙක් දෙසැම්බර් මාසයේ ගෙදර ගිහිල්ලා ජනවාරි මාසයේ ඇවිල්ලා නැවත වතාවක් පාසලට එනකොට ඒ පාසල තිබුණු තත්ත්වයෙන්ම තිබුණාම මේ දරුවාට අලුත් තැනකට එනවා කියන හැඟීමක් ඇති වුණේ නැහැ. ඒ නිසා පාසල් පිරිසිදු කිරීමේ වැඩ සටහන තුළ විවිධාකාරයෙන් රුපියල් එක් ලක්ෂ පනස් දාහක මුදලක් සියලුම පාසල්වලට ලබා දීලා අපේ පාසල අපේ දෑතින් සුරකිමු කියන වැඩ සටහන මම හිතන්නේ රුපියල් ලක්ෂයක් දුන්නාම රුපියල් ලක්ෂ හතරක වැඩ දෙමව්පියන් සියල්ල එකතු වෙලා ඉෂ්ට කළයි කියන එක මම කියනවා. ඒ සම්බන්ධයෙන් පාසල් සංවර්ධන සමිතිවලටත් අපේ ගෞරවය මේ අවස්ථාවේදී හිමි කළ යුතුයි. ඉස්සර එහෙම නොවෙයි.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කළ යුතු කාරණාවක් තිබෙනවා. හෝමගම අධ්‍යාපන කලාපය තුළ, හෝමගම මැතිවරණ කොට්ඨාශයේ පාසල් 37 ක් තිබෙනවා. ගරු සභාපතිතුමනි පාලගම කණිෂ්ඨ විද්‍යාලය, සොයිසා විද්‍යාලය කියලා පාසල් දෙකක් තිබෙනවා. පසුගිය කාලපරිච්ඡේදය තුළ ද්විතියික පාසල්කරණය කිරීමේදී මේ පාසල්වල ඉගෙන ගන්න දරුවන්ටත් ද්විතියික පාසල්වලට යන්න සිද්ධ වුණා. ඒ ක්‍රමය අපි අගය කරනවා. නමුත් ගරු සභාපතිතුමනි, ඒ ක්‍රමය තුළ සමහර පාසල්වලට යම් යම් පොඩි ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. අද බලන්න පාලගම කණිෂ්ඨ විද්‍යාලය. මම හිතන්නේ ගරු මහ ඇමැතිතුමා පසුගිය දවස්වල මුණගැහෙන්න ඇති. සියලුම දෙමව්පියන් කියනවා, අපට තවත් ඈත ප්‍රදේශයකට යන්න පුළුවන්කමක් නැහැ. අපේ දරුවෝ සියලු දෙනාම ඉතාමත්ම දුක්ඛිත තත්ත්වයකින් ජීවත්වන දෙමව්පියන්ගේ දරුවෝ. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, දීර්ඝව මම ඒක විස්තර කරන්න යන්නේ නැහැ. මේ පාසල් දෙකේ ඉන්න දරුවන්, අපේ මැතිවරණ කොට්ඨාශයේ කෙලවරේ ඉන්න ඒ දරුවන්ට තවත් තැන්වලට යන්න පුළුන්කමක් නැහැ. පසුගිය කාලපරිච්ඡේදය තුළ සියලුම දෙමව්පියන් අත්සන් කරලා ලිපි ගෙනාවා, ලබන වර්ෂයේ සිට අපට මේ පාසල පරණ තිබුණු විධියටම කටයුතු කරගන්න අවස්ථාව ලබා දෙන්නය කියලා. ඒ පිළිබඳව ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් කියනවා. ගරු මහ ඇමැතිතුමනි, මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න. කලාප කාර්යාලයෙන් නිර්දේශ ලබාගෙන ඒ පාසල් දෙක කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන්නයි කියන කාරුණික ඉල්ලීම මම මේ අවස්ථාවේදී කර සිටිනවා.

විශේෂයෙන්ම දහම් පාසල් ගැන. අපි දන්නවා මේ රටේ සියලුම දහම් පාසල්වලට - සියලුම ආගමික ස්ථානවල දහම් පාසල්වලට ප්‍රතිපාදන ලබා දුන්නා. ඒ නිසා මම හිතන්නේ දහම් පාසල් පිළිබඳව ඒවා කාටවක්වත් වැරැදි අවබෝධතා මිනිස්සුන්ට දෙන්න පුළුවන්කමක් නැහැ. ඒ සියල්ලම බස්නාහිර - මම දන්නවා ගරු සභාපතිතුමනි, සමහර අවස්ථාවල මේ රාජ්‍ය නායකයන් ඉන්න පුළුවන්. රාජ්‍ය නායකයන් සියල්ලම ගත්තොත් ඩී.එස්. සේනානායකගෙන් පටන් ගත්තාම මේ රාජ්‍ය නායකයා ළඟට එන උදවිය හැම කෙනෙක්ම විශ්ව විද්‍යාලයට ගිහිල්ලා නැහැ. බණ්ඩාරනායක මහත්මයා විශ්ව විද්‍යාලයට යන්න ඇති. අපේ ප්‍රධාන අමාත්‍යතුමා විශ්ව විද්‍යාලවලට ගිහිල්ලා නැහැ. නමුත් විශ්ව විද්‍යාලවලට නොගිය අයටත් වඩා වැඩ කොටසක් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ පළාත් සභාව තුළ කරනවාය කියන එකත් මම මේ අවස්ථාවේදී ඉතාමත්ම ගෞරවයෙන් සඳහන් කරන්න ඕනෑ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ බස්නාහිර පළාත් සභාව තුළ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ කර ගෙන යන වැඩ පිළිවෙළ මම හිතන්නේ, එම්.ඒ. , පී.එච්.ඩී. නොවෙයි, ලන්ඩන් පී.එච්.ඩී ගත්ත විශ්ව විද්‍යාලයේ කෙනෙකුටත් වඩා ඉතාමත්ම සාර්ථකව මුළු රටේම තිබෙන පළාත් සභා අතුරෙන් ප්‍රධානතම පළාත් සභාව හැටියටත්, වැඩිම පිරිසක් නියෝජනය කරන පළාත් සභාව හැටියටත්, ප්‍රධාන අමාත්‍ය ධුරයේ වැඩ කටයුතු පිළිබඳව අනික් අයටත් අවධානය යොමු කර, ගුරුහරුකම් ගන්නත් අවස්ථාව උදා වෙලා තිබෙනවාය කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.25]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, බස්නාහිර පළාතේ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන අමාත්‍යාංශයට අදාළව අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම සම්බන්ධව. විශේෂයෙන්ම අපි දේශපාලන පිටියේදී මොන වාගේ මතවාද තිබුණත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමා බස්නාහිර පළාතේ අධ්‍යාපනය දියුණු කරන්න ගන්නා උත්සාහය අපි අගය කරන්න ඕනෑ. හැබැයි, ඒ අතරවාරයේදී විවේචනාත්මක සහයෝගයකුත් ලබා දීම විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ කාර්යභාරය කියලා මම විශ්වාස කරනවා. ඒක ද්වේශ සහගතව කරන චෝදනාවක් නොවෙයි. අපි මුළු රටටම ආදර්ශයක් ලබා දිය යුතු පළාත් සභාවක් හැටියට බස්නාහිර පළාතේ විශේෂයෙන්ම මහ ඇමතිතුමාගේ අමාත්‍යාංශය වපසරිය තුළ විශාල කාර්යභාරයක් තිබෙනවා.

අපට පෙනෙනවා, දැන් ආණ්ඩුවේ අයවැය විවාදය දැක්කාම පාර්ලිමේන්තුවේ අපට පෙනෙනවා, මධ්‍යම ආණ්ඩුවේ අයවැය තුළ ජනාධිපතිතුමාගේ අමාත්‍යාංශවලට 45% කට ආසන්න මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙද්දී අපේ පළාත් සභාව තුළත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට 70.22% ක ප්‍රතිශතයක් වෙන් කරලා තිබෙනවා. ඒක අඩු ද

[ ගරු එස්.එම්. මරික්කාර් ]

වැඩි ද කියන එක සම්බන්ධව මට තවම හරියට නවක මන්ත්‍රීවරයෙක් හැටියට තේරුම් ගන්න අමාරුයි. හැබැයි, අධ්‍යාපන විෂය තුළ විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කළ යුතුයි කියන එක මම පැහැදිලිවම පිළිගන්නවා. හැබැයි, ඒ අතරවාරයේදී අපි කියන්න ඕනෑ. විශේෂයෙන්ම අධ්‍යාපනය ගැන කථා කරද්දී දැන් දහම් පාසල් සඳහා රුපියල් ලක්ෂයක මුදලක් ලබා දීම අතිශයින්ම අගය කළ යුතු යෝජනාවක්. හැබැයි, ඒ සම්බන්ධව අපට විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට ගැටළුවක් තිබෙනවා. දැන් මේ දහම් පාසල් අධ්‍යාපනය දියුණු කරන්න, දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්යය කරන්න ඕනෑය කියන මතයේ ඉන්න මන්ත්‍රීවරයෙක් හැටියට මම මේක අගය කරන අතරවාරයේදී, මේක දේශපාලන ව්‍යාපෘතියක් බවට, ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට දේශපාලන ව්‍යාපෘතියක් බවට පත්වීම පිළිබඳව මගේ කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ. දැන් උදාහරණයක් හැටියට පසුගිය කාලයේ ආණ්ඩුවේ සමහර පළාත් සභා මන්ත්‍රීවරු දහම් පාසලට ගිහිල්ලා, රුපියල් ලක්ෂය ඔවුන්ගේ අතින් ලබා දෙනවා වාගේ පෙන්නමින් ඒ තුළින් ආණ්ඩුවේ දේශපාලන ව්‍යාපෘතියක් කිරීම පිළිබඳව මම එකඟ වෙන්නේ නැහැ. (බාධා කිරීම්) මොකද හේතුව, මේ මුදල් තමන්ගේ පුද්ගලික මුදල් නොවෙයි. (බාධා කිරීම්) මේක ඇවිල්ලා තමන්ගේ පෞද්ගලික ආධාරයක් ලෙස දෙන මුදලක් නොවෙයි. ඒ නිසා පළාත් සභාවෙන් ලබා දෙන මුදල් ආණ්ඩුවේ දේශපාලන ව්‍යාපෘතිවලට පාවිච්චි කිරීම අපි හෙළා දකිනවා. මොකද, හේතුව ඒ උතුම් අරමුණට ඒකෙන් කැළලක් ඇති වෙනවා. මේ උතුම් අරමුණට කැළලක් ඇති වෙනවා, දේශපාලන ව්‍යාපෘතියක් බවට පත් කිරීමෙන්. ඒ නිසා මම විශේෂයෙන්ම -

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

නැහැ. අපි පළාත් සභාවේ ඔක්කෝටම පින් සිද්ධ වෙන්න කියලා කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මයික්‍රෆෝනය off කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මේ ඉඳලා හිටලා පළාත් සභාවට එනවා. ඇවිල්ලා පිස්සු කියවනවා. ගරු සභාපතිතුමනි, ඒ වාගේම කියන්න ඕනෑ පසුගිය සභා වාරයකදීත් මේ ගැටළුව මතු වුණා. මම දහම් පාසල් අධ්‍යාපනය ගැන කථා කරද්දී - නැවත වතාවක් මතක් කරන්න ඕනෑ, මගේ යෝජනාව තවමත් න්‍යාය පුස්තකයේ තිබෙනවා. ඒකෙන් දේශපාලන වාසියක් ලබා ගැනීමට මගේ කිසිම අරමුණක් නැහැ. මහ ඇමතිතුමාගෙන් මම නැවත ඉල්ලා සිටිනවා, එය ප්‍රායෝගිකව බිම් මට්ටමේ ක්‍රියාත්මක වන විධියට අඩුම තරමින් ලබන ජනවාරි මස සිටවත් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් කරන්නය කියලා. (බාධා කිරීම්)

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මෙය කළින් ඉදිරිපත් කරපු යෝජනාවක්.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඒ වුණාට තවම ක්‍රියාත්මක වෙලා නැහැ ගරු මන්ත්‍රීතුමා. මම කියන්නේ, දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කරලා, 9 වසර දක්වා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඉරිදා උදය වරුවේ පෞද්ගලික උපකාරක පන්ති පැවැත්වීම තහනම් කරන ලෙස මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ සඳහා අවශ්‍ය සහයෝගය අපි ලබා දෙන්න සූදානම්. මොකද හේතුව, අද තාක්ෂණයේ දියුණුවත් එක්ක අපි දැක්කා, Google සෙවීම ඔස්සේ ලිංගිකත්වය සොයා යන තරුණ කොටස් වැඩිම ප්‍රමාණයක් ඉන්න ලෝකයේම ප්‍රධාන නගරය බවට බස්නාහිර පළාතේ කොළඹ පත් වෙලා තිබෙන්නේ. අපි දැක්කා, පසුගිය දවස්වල ප්‍රධාන පුවත්පත්වල තිබුණා, ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම ශ්‍රී ලංකාව තුළ ඉතාමත්ම වේගයෙන් පැතිරෙනවා කියලා. මම හිතන්නේ, අපිට ගහලා බැණලා පාලනය කරන්න පුළුවන් දරු පිරිසක් නොවෙයි ඉන්නේ. ඒ නිසා මේ දරුවන් තුළින් ස්වයං වාරණයක්, ස්වයං විනයක් සහිත දරු පරපුරක් බිහි කරන්න නම් අනිවාර්යයෙන්ම තාක්ෂණය භාවිතයේදී වැරදි මාර්ගවලට නොගිහිල්ලා, ඔවුන්ව හරි පැත්තට ගන්න නම් ඒ ස්වයං විනය දහම් පාසල තුළින්, ආගමික අධ්‍යාපනය තුළින් පමණක් ලබා දෙන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. අන්න ඒ අර්ථයෙන් තමයි ඒ යෝජනාව ගෙනාවේ. ඒ අර්ථයෙන් තමයි ඒ යෝජනාව ප්‍රායෝගිකව, බිම් මට්ටමේ ක්‍රියාත්මක කිරීම සඳහා අපි උත්සාහ ගන්නේ. නැතිව දේශපාලන වාසි ලබා ගැනීම සඳහා නොවෙයි.

ඒ එක්කම අපි කථා කරන්න ඕනෑ, විශේෂයෙන්ම අපේ ගාමිණී තිලකසිරි ගරු සභානායකතුමා කිව්වා, දහම් පාසල් ගුරුවරුන්ට රු. 2500/- ක් ලබා දෙනවා කියලා. රු. 2500/- ක හරි දීමනාවක් ලබා දීම හොඳයි. (බාධා කිරීම්) දහම් පාසල් ගුරුවරුන්ටත් රු. 2500/ - ක් ද කොහේද දෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නැහැ. පෙර පාසල් ගුරුවරුන්ට.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මම ගියා ළඟදී දහම් පාසලකට. මගේ විමධ්‍යගත අරමුදලින් රුපියල් ලක්ෂයකට අදාළ ආධාර ලබා දෙන්න. එතකොට මම ඒ ගුරුවරුත් එක්ක කථා කරන කොට දැක්කා, ඒ දහම් පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දෙමව්පියන්ට ඒ දරුවන් දහම් පාසලට පැමිණීම නිසා රු. 500/- ක දීමනාවක් ඒ දහම් පාසලට ලබා දෙන්න වෙලා තිබෙනවා. මොකද හේතුව, ඒ ගුරුවරුන්ගේ විය හියදම් සඳහා කියලා. ඒ නිසා අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, දහම් පාසලකට රුපියල් ලක්ෂයක් ලබා දෙන වැඩ පිළිවෙළ ඉදිරිපත් කළා වාගේම මේ දහම් පාසල් ගුරුවරුන්ගේ දීමනාවත් වැඩි කරලා, දුප්පත් දෙමව්පියන්ගේ දරුවන්ට නොමිලයේ දහම් පාසල් අධ්‍යාපනය ලබා දීම සඳහා පහසුකම් ලබා දෙන්නය කියලා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒ සමස්ත ගුරුවරුන්ටම කරපු අපහාසයක්. ගරු මන්ත්‍රීතුමා, දහම් පාසල් ගුරුවරු සල්ලි ගන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දිගින් දිගටම බාධා කිරීම් කරන්න එපා. ඔබතුමාටත් අවස්ථාව ලබා දීලා තිබෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඒ වාගේම මහ ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් "නෙතට අරුණැල්ලක්" යටතේ දැන් ඇස් කණ්නාඩි බෙදලා දෙනවා. ඒක එතුමාගේ විෂය පථය නොවෙයි නේ? සෞඛ්‍ය ඇමතිතුමාගේ විෂය පථයට තිබෙන එකක්. ඒ නිසා ඒ සල්ලි මේවාට යොමු කරන්නය කියලා අපි ඉල්ලා සිටිනවා. මොකද, මෙතුමාගේ අමාත්‍යාංශයේ විෂය පථයට අදාළව දහම් පාසල් ගුරුවරුන්ගේ -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ආර්ථික ප්‍රවර්ධන කාර්යයන් යටතේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

දැන් ඒක සෘජුවම සෞඛ්‍යට සම්බන්ධයි. දැන් කර්මාන්ත කිව්වාම, ත්‍රීවීල්වලට මීටර් ලබා දීමත් කර්මාන්ත බවට පත් කරන්න පුළුවන්. දැන් ත්‍රීවීල් එකක් අරන් දෙනවා නම්, ස්වයං රැකියා කර්මාන්තයක්. මීටර් ලබා දීම කර්මාන්තයක් වෙන්නේ නැහැ. එහෙම කරපු අමාත්‍යවරුත් ඉන්නවා මේකේ. ඉතින් ඒ අතරවාරයේදී තමයි අපි කියන්නේ, නෙතට අරුණැල්ලක් කියන එක සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කරන්න පුළුවන්. ඉතින් ඒ මුදල් සෞඛ්‍ය අමාත්‍යාංශයේ විෂයට දාන්නේ නැතිව, ඔබතුමාගේ අමාත්‍යාංශයේ විෂයයන්ටම යොදන්නය කියලා අපි ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අපි තවදුරටත් ඉල්ලා සිටින්න කැමැතියි. විශේෂයෙන්ම කොළොන්නාව මැතිවරණ කොට්ඨාශය ගත්තොත්, කොළොන්නාව මැතිවරණ කොට්ඨාශයේ සිංහල, දෙමළ, මුස්ලිම් සියලු දෙනා එකට සමඟි සම්පන්නව ජීවත් වෙනවා. ඒ ජනගහනයෙන් 30% කට වඩා වැඩි ප්‍රමාණයක් දෙමළ කථා කරන ජනතාවක් කොළොන්නාව මැතිවරණ කොට්ඨාශය තුළ ඉන්නවා. මම මීට පෙරත් ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට යොමු කළා, කොළොන්නාව මැතිවරණ කොට්ඨාශය සඳහා දෙමළ කථා කරන ජනතාව වෙනුවෙන් දෙමළ මාධ්‍ය පාසලක් ලබා දීමට ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියලා. පාසලක් ලබා දීමේ කාර්යයට යම්කිසි කාලයක් ගත වෙනවා නම්, දැනට අඩු ගුරුවරුන් සිටින, අඩු ළමයින් ප්‍රමාණයක් සිටින පාසලක දෙමළ මාධ්‍ය ඒකකයක් හෝ ඒ දරුවන්ට ලබා දෙන්නය කියලා මම ඉල්ලා සිටිනවා. මොකද හේතුව, මේ දරුවන්ට සිද්ධ වෙලා තිබෙනවා, කොළොන්නාවේ සිට සමහර වෙලාවට කොළඹ නගරයේ තිබෙන පාසල්වලට එන්න. ඒ පැමිණීමත් එක්ක දරුවන්ගේ ප්‍රවාහන ගාස්තු, දෙමව්පියන්ගේ විය හියදම් වැඩි වන නිසා ඒ සම්බන්ධයෙන්

[ ගරු එස්.එම්. මරික්කාර් ]

ඔබතුමාගේ කඩිනම් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. මම හිතනවා, අධ්‍යාපන උපදේශක කාරක සභාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා යම්කිසි එකඟතාවයක් පළ කළා, පාසලක් පටන් ගන්න තෙක් දෙමළ මාධ්‍ය ඒකකයක් දැනට පවතින පාසලක ආරම්භ කරනවා කියලා. මම ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒක ඉතාම කඩිනම් කරලා ඒ අහිංසක දෙමව්පියන්ගේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීමේ අවස්ථාව, ඉඩ ප්‍රස්තාව තවදුරටත් සනාථ කරලා දෙන්නය කියලා.

ඒ එක්කම දැන් ගරු මහ ඇමතිතුමාගේ විෂය පථයට තමයි පළාත් පාලනය, අපද්‍රව්‍ය කළමනාකරණය අයිති වෙන්නේ. අපද්‍රව්‍ය අධිකාරියකුත් මේ ළඟදී ස්ථාපිත කරනවා කියලා ඔබතුමා කිව්වා. දැන් අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ. අද කොළොන්නාව නගර සීමාවේ තිබෙන විශාලම ගැටළුව තමයි අධ්‍යාපනයට, සෞඛ්‍යට, ජන ජීවිතයට, හැම එකකටම කොළොන්නාවේ කුණු කන්ද බලපාන එක. දැන් අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ, කොළොන්නාව නගර සීමාවේ හෝ ප්‍රාදේශීය සභා සීමාවේ ජනතාවගේ කුණු නොවෙයි, මේ කුණු කන්දට ගෙනෙන්නේ. මේ ගේන්නේ කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයෙන්. කඩුවෙල මහ නගර සභා ප්‍රදේශයෙන්. මට ආරංචියක් ලැබුණා, කැස්බෑව නගර සභාවෙනුත් කුණු ගෙනැල්ලා කොළොන්නාව නගර සභා බල ප්‍රදේශයට දානවා කියලා. මම හිතන්නේ, මේක ඉතාම අසාධාරණයක්. හරියට අපේ ගෙදර වත්තට අල්ලපු ගෙදර කෙනා ගෙනැල්ලා කුණු දානවා වාගේ වැඩක් වෙලා තිබෙන්නේ. ඒ හරහා දරුවන්ගේ අධ්‍යාපනය, දරුවන්ගේ සෞඛ්‍ය, ජනතාවගේ සාමාන්‍ය ජීවිතය සම්පූර්ණයෙන්ම කඩා වැටුණු ආකාරයකට ලක් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. එහි තිබෙන නීරසම පැත්ත තමයි මේ සම්බන්ධව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ තමන්ට විරුද්ධත්වය ප්‍රකාශ කරන්න තිබෙන අවස්ථාව පාවිච්චි කරලා, ජනතාව ඒකට විරෝධතාවය ප්‍රකාශ කළාම ඔවුන්ට හමුදාව සහ පොලීසිය දාලා ප්‍රහාර එල්ල කරන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේක අද සමහර පුද්ගලයන්ට මුදල් ගැරීමේ ව්‍යාපාරයක් බවට පත් වෙලා තිබෙනවා. අන්න ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ. අපට වාර්තා වෙනවා, මේ මොහොත වන කොට රතුපස්වල ප්‍රදේශයේ කර්මාන්ත ශාලාවල තිබෙන විෂ බීජ මේ කුණු කන්දට ගෙනැල්ලා දානවා කියලා. ඒවා කොළොන්නාව ප්‍රදේශයේ ජලය බැහැරව යන මාර්ග පද්ධතියට මේ විෂ බීජ එකතු කරලා තිබෙනවාලු. ඉතින් මේ ආකාරයට ගියොත් අපට තව අවුරුදු තුන හතරක් යන කොට කොළොන්නාව ප්‍රදේශයෙන් අංග විකල දරුවන් බිහි වන එක වැළැක්වීමේ හැකියාවක් නැහැයි කියන එක ප්‍රකාශ කරන්න ඕනෑ. අන්න ඒ නිසා මම ඔබතුමාගෙන් සෘජු මැදිහත්වීමක් බලාපොරොත්තු වෙනවා. මේ හරහා දුක් විඳින්නේ, එක්සත් ජාතික පාක්ෂිකයෝ නොවෙයි. මේ කොළොන්නාව ප්‍රදේශයේ ඉන්න සියලුම පක්ෂවල ඉන්න පුරවැසියන් තමයි මේකෙන් දුක් විඳින්නේ. අද ඒ පළාතකට යන්න බැහැ. වැස්ස දවසකට ගියාම වර්ග කිලෝ මීටර් තුනක වාගේ ප්‍රමාණයක් යන තෙක් මේ කුණු ගඳ ගහනවා. ඒ ජනතාවගේ ජීවිතය නගා සිටුවන්න, විශේෂයෙන්ම පක්ෂ පාට භේදයෙන් තොරව ස්වාමීන් වහන්සේලා, සිවිල් සංවිධාන නැගිටලා ඉන්නවා. ඔවුන්ට ප්‍රහාර එල්ල කිරීම ආණ්ඩුවට නතර කරන්නය කියලා. ඔබතුමාගේ බලපෑම ඒ සඳහා මැදිහත්වීම යොමු කරලා, ඒ සඳහා ක්‍රියා කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ එක්කම අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, අපි මේ ලබා දුන්නේ විවේචනාත්මක සහයෝගයක් මිසක්, දේශපාලනිකව ඔබතුමාට ප්‍රහාර එල්ල කිරීමේ අරමුණක් නොවෙයි. හැබැයි, මේ වැරදි නිවැරදි කර ගෙන ගියේ නැත්නම් අපි පළාත් සභාවක් හැටියට මේක තුළ හිර වෙනවාය කියන එකත් අපි පැහැදිලිව කියන්න ඕනෑ. අවසාන වශයෙන් ඔබතුමාට මම ස්තූතිවන්ත වෙනවා. ගාමිණී තිලකසිරි ගරු සභා නායකතුමා කිව්වා වාගේ, ඔබතුමා ව්‍යුහ කමිටුවලට විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාටත් අවස්ථාවක් ලබා දීලා තියෙනවා. තමන්ගේ පළාතේ අධ්‍යාපනය දියුණු කරන්න, ඒ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් එක්ක සාකච්ඡා කරන්න, ඒ වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න විපක්ෂයේ මන්ත්‍රීවරුන් සම්බන්ධ කර ගෙන ඔවුන්ගේ අදහස්වලටත් අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තූති වන අතර, අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, අපි ලබා දුන් විවේචනාත්මක සහයෝගයන් සම්බන්ධව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න කියමින්, එහි ධනාත්මක පැත්ත අරගෙන මේ පළාත් සභාව ආදර්ශවත් පළාත් සභාවක් බවටත්, ඒ වාගේම අධ්‍යාපනයෙන් ඉහළ ගිය, විනයවත් පරපුරක් බිහි වන පළාත් සභාවක් බවට පත් කරන්න. විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට විශාල වගකීමක් තිබෙනවා, එතුමාට හිමි වෙලා තිබෙන අමාත්‍යාංශයේ කාර්යභාරයත් එක්ක. ඒ නිසා අවසාන වශයෙන් අපි එතුමාට නැවතත්

ස්තුතිවන්ත වෙමින් මේක පිළිගන්න කියලා ඉල්ලා සිටිනවා. ස්තුතියි.

[පූ.භා. 11.38]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම බස්නාහිර පළාත් සභාවේ 27 වැනි අයවැයට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අධ්‍යාපන වැය ශීර්ෂය යටතේ කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ප්‍රථමයෙන්ම කියන්න ඕනෑ, ඊයේ පොදු සාකච්ඡාවේදීත් අපේ මරික්කාර් ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදීත් පැහැදිලි කළා, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයට 71% ක් වෙන් වෙලා තිබෙනවා කියලා. ඒක වැරදියි.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

70.22% යි. ගණන වරද්දන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මුළු අයවැය තිබෙන්නේ මිලියන හතලිස් අටයි පන්සිය දහ තුනයි. ඒ වාගේම මේ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් හා සේවකයන් හැටියට ඉන්නවා, 77,000 ක්. අධ්‍යාපන අමාත්‍යාංශයේත්, ඒ වාගේම පළාත් පාලන දෙපාර්තමේන්තුව හා පළාත් පාලන ආයතන ගත්තොත් 56,800 ක් ඉන්නේ එතුමාගේ අමාත්‍යාංශයේ සේවකයන් හැටියට. ඒ නිසා මුදල් හැටියට ගත්තොත් පඩි නඩි වෙනුවෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට මිලියන 17,000 ක් වෙන් වෙනවා. දා හත් දහස් තිස් හතයි දශම තුනක්. ඒ වාගේම පළාත් පාලන ආයතනයේ වැටුප්වලට මිලියන 5670.9 ක් වෙන් වෙනවා. ඒ වාගේම පළාත් පාලන ආයතනවලට නැවත මුද්දර ආදායම හැටියට, උසාවි දඩ මුදල් ආපසු ගෙවීම් හැටියට මිලියන 5350 ක් වෙන් වෙනවා. ඒ අනුව මිලියන තිස් හතර දහස් හැට අටක් තමයි ප්‍රධාන අමාත්‍යතුමාට වෙන් වෙලා තිබෙන්නේ. ඒකෙන් මිලියන විසි අට දහස් පනස් අටයි දශම දෙකක් වෙන් වෙන්නේ පඩි නඩිවලට. ඒ නිසා පොදු සාකච්ඡාවේදීත්, පැහැදිලිව කියන්න ඕනෑ, එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමාටත් දැන ගන්න. මේකේ වැඩි බහුතරයක්, මිලියන තිස් හතර දහස් හැට අටක් වෙන් වෙන්නේ පඩි නඩිවලට සහ පළාත් පාලන ආයතනවල උසාවි දඩ මුදල්වලට කියන එක.

ඒ වාගේම ඊයේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාත් පොදු සාකච්ඡාවේදී කිව්වා, ළමුන් ඇතුළත් කිරීම සම්බන්ධව විශාල අර්බුදයක් තිබෙනවාය කියලා. අපි පැහැදිලිව කියනවා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා හැටියට 2009 වසරේ අධ්‍යාපන අමාත්‍යාංශය භාර ගත්ත දා ඉඳලා ඊට ඉහත කාල සීමාව අපට මතකයි. ළමයි 47 ට වැඩි වුණාම ඒක සම කරන්න කියලා ළමයි සංඛ්‍යාවක් දැම්මා. 2009 වසරේ සිට මේ දක්වා 42 සීමාව, 45 සීමාවට වැඩියට ළමයි ඇතුළත් කරන්න කවදාවත් අනුමැතිය ලබා දීලා නැහැ. එක වසරේ ඇතුළත් වෙන කොට ජනප්‍රිය පාසල් හැරෙන්න, ඒ වාගේම අනෙක් පාසල්වල 42 සීමාවේ තබලා තිබෙනවා. ඒ වාගේම ක්‍රියාන්විත ළමුන් ඇතුළත් කිරීමේ ලේඛනය ආවාට පස්සේ ඉතිරි වුණා නම්, ඒක ලකුණු පදනම් කර ගෙන, ආසන්නතාවය පදනම් කර ගෙන ඒ ඉල්ලීම් අනුව ළමුන් ඇතුළත් කිරීමට අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ වාගේම සෑම කොට්ඨාශයකම, බස්නාහිර පළාතේ කොට්ඨාශ 38 ක් තිබෙනවා. 38 තුළ එක පාසලක් විතරයි 45 සීමාවේ තියාගෙන ඉඳලා තිබෙන්නේ. අනික් හැම පාසලක්ම 42 සීමාවේ තිබෙනවාය කියන එක අපට ආඩම්බරයෙන් කියන්න පුළුවන්. ඒ නිසා ළමුන් ඇතුළත් කිරීමේදී එහෙම ගැටළු ඇති වෙලා නැහැයි කියන එක අපට භය නැතිව පැහැදිලිව කියන්න පුළුවන්.

ඒ වාගේම තමයි, ගුරුවරුන් හැටියට බඳවා ගැනීම්වලදී අපට තිබෙන ලොකුම ප්‍රශ්නය. පාසල්වල ගැටළු තිබෙන්න පුළුවන්. අපි ගම්පහ දිස්ත්‍රික්කය ගත්තොත්, මීගමුව කලාපයේ තමයි වැඩිම ගුරු පුරප්පාඩු ගණනාවක් තිබුණේ. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදී ඉල්ලීම් කරලා, මේ වන කොට 2008 සිට 2011 දක්වා විභාගවලින් උපාධිධාරීන් බඳවා ගෙන තිබෙනවා 8364 ක්. ඒ වාගේම අධ්‍යාපනවේදී උපාධිධාරීන් හැටියට 184 දෙනෙක් බඳවා ගෙන තිබෙනවා. ඒ වාගේම අන්තර් පළාත්වල සහ පළාත් සභා පාසල්වලින් ලබා ගත් 1087 ක් ඉන්නවා. ඒ වාගේම 2014 ගණිතය, තොරතුරු තාක්ෂණය, චිත්‍ර සහ සංගීත හැටියට 538 දෙනෙක් බඳවා ගෙන මේ වන කොට පළාත් සභාවට ගුරුවරු 10,089 ක් බඳවා ගෙන තිබෙනවා. අපි දැක්කා, ඒ කාලයේ සාමාන්‍යයෙන් මාසයකට ගුරුවරු 60 කට වැඩිය විශ්‍රාම යනවා. පහේ ශිෂ්‍යත්වය කරන දරුවෙකුගේ පන්තියක ගුරුවරයෙක්, සාමාන්‍ය පෙළ උගන්වන ගුරුවරයෙක්, උසස් පෙළ උගන්වන ගුරුවරයෙක් විශ්‍රාම ගියොත් මාස හයක්, හතක්, අටක් වන තෙක් ගුරුවරයෙක්

[ ගරු මෙරිල් පෙරේරා ]

නැතිව ඒ පාසල කර ගෙන යන්න බැරි අවස්ථාවල් අපි දැක්කා. අද ඒ තත්ත්වයට පත් වෙලා නැහැ. සෑම කොට්ඨාශයකම, සෑම කලාපයකට අපේ ගාමිණී තිලකසිරි ගරු සභා නායකතුමා කිව්වා වාගේ, එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ව්‍යුහ කමිටුවල කථා කරලා, සාකච්ඡා කරලා, ගුරුවරුන්ගේ අඩුපාඩු බලලා, ඒවා උපදේශක කාරක සභාවට ගෙනැල්ලා පෙන්නුම් කරලා, අද සෑම පාසලක්ම පවත්වාගෙන යන්න පුළුවන් අවශ්‍ය ගුරු ප්‍රමාණය ලබා දීලා තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ද්‍රවිඩ පාසල්වල නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ද්‍රවිඩ අයත් බඳවා ගන්න අපි ලබා දීලා තිබෙනවා. ඒ නිසා අපි කියන්න ඕනෑ, අද ගුරුවරුන් බඳවා ගැනීම තුළ ඒ අවශ්‍ය පහසුකම් ටික ලබා දීලා තිබෙනවා. අද ඒ පාසල් පවත්වාගෙන යන්න පුළුවන් අවස්ථාව ලැබිලා තිබෙනවා.

ඒ වාගේම තමයි අපට, ගරු ප්‍රධාන අමාත්‍යතුමාට තවත් ලොකු ප්‍රශ්නයක් තිබුණා. බස්නාහිර පළාතේ ප්‍රාථමික පුහුණු ගුරුවරුන් හැටියට හිටියේ 46% යි. අනික් පළාත් එක්ක ගත්තාම 65% ක් , 70% ක් හිටියා. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමා අධ්‍යාපන ඇමතිවරයා හැටියට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය තුළ අධ්‍යාපන අමාත්‍යාංශයේ රැස්වීම් තියන කොට ඉල්ලීමක් කළා, ප්‍රාථමික ගුරුවරු පුහුණු කරන්න මුදල් ලබා දුන්නොත්, අපට පළාත් වැඩ සටහන් ක්‍රියාත්මක කරලා, ප්‍රාථමික ගුරුවරු පත් කරන්න පුළුවන් කියලා. ඒ අනුව, 2013 අයවැයෙන් පළාත් නවයට මිලියන 900 ක් වෙන් කළා. ඒ අනුව අපට, බස්නාහිර පළාතට මිලියන 185 ක් වෙන් වෙලා තිබෙනවා. ඒකෙන් මිලියන 103.3 ක් වියදම් කරලා ප්‍රාථමික නුපුහුණුව හිටපු ගුරුවරුන්වත්, නවක උපාධිධාරීන් හැටියට පත් වුණු අයටත් ප්‍රාථමික ගුරු පුහුණුව ලබා දීලා තිබෙනවා. මේ වන කොට ගුරුවරු 7435 කට පුහුණුව ලබා දී තිබෙනවා. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ, අපි අද වන කොට 100% ක් ප්‍රාථමික ගුරුවරුන් පත් කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම තමයි භෞතික සම්පත් ලබා දීමේදී අපේ ගාමිණී තිලකිරි ගරු සභා නායකතුමාත් කිව්වා. ඉතිහාසයේ අපි දැක්කා. මහ ඇමතිතුමාට හිතවත් නම් මුදල් වෙන් කර ගන්න පුළුවන්. විදුහල්පතිතුමිය කොට්ඨාශයේ, කලාපයේ, අමාත්‍යාංශයේ, දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හිතවත් නම් මුදල් වෙන් කර ගන්න පුළුවන්. නමුත් කවදාවත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා හැටියට ප්‍රසන්න රණතුංග මැතිතුමා කලාප 11 ම කොට්ඨාශ 38 ම සිසු අනුපාතය අනුව තමයි අමාත්‍යාංශයේ මුදල් බෙදා හැරියේ. කවදාවත් තමන්ට හිතවත්කමට මුදල් ලබා දුන්නේ නැහැ. එක් එක් කලාපයට මුදල් වෙන් කරලා, කලාපයට උපදෙස් ලබා දුන්නා, කොට්ඨාශයේ ඉන්න සිසු අනුපාතය අනුව මුදල් වෙන් කරන්නය කියලා. ඒ අනුව තමයි, හැම අවුරුද්දකම මුදල් ටික වෙන් කරලා කටයුතු කරන්න පුළුවන්කම ලැබුණේ.

ඒ වාගේම "*අපේ දැතින් අපේ පාසල සුරකිමු*" කියන වැඩ සටහන යටතේ අපි දැක්කා, 2009 වසරේ පාසල්වලට 370 යි තෝරා ගත්තේ. 2010 වසරේ 613 යි. 2012 වසරේ ඉඳලා සෑම අවුරුදු හතරක් එක දිගටම පාසලකට ලබා දුන්නා. 2011 දී 1268 යි. 2012 දී 1272 යි. 2013 දී 1277 යි. 2014 දී 1277 යි. හැම පාසලකටම. එදා තිබුණු ලොකුම චෝදනාව තමයි, වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න අවුරුද්ද අන්තිමට මුදල් එකතු කරනවාය කියලා. ඒ වාගේම තවත් පැත්තකින් චෝදනාවක් තිබුණා පළමුවැනි වසරට ළමුන් ගන්න කොට ළමයින්ගෙන් මුදල් එකතු කරනවාය කියලා. ඒ මුදල් එකතු කිරීමේදී පාසල්වල විදුහල්පතිවරුන්ට, පාසල් සංවර්ධන සමිතියට පැහැදිලිව උපදෙස් ලබා දුන්නා, මුදල් එකතු කරන්න එපාය කියලා. මුදල් එකතු කරන්න එපා නම් යම්කිසි මුදලක් පාසලට දෙන්න ඕනෑ නිසා තමයි ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා පාසල පාවිච්චි කරන කොට යම් කිසි අලුත් වැඩියාවන් සහ තීන්ත ආලේප කරන්න මුදල් ලබා දෙන්න ඕනෑ. දෙමව්පියන්ගෙන් මුදල් එකතු නොකර තමුන්ගේ පාසලේ වැඩ කටයුතු කරන්න, සුළු අළුත්වැඩියාවන් කරන්න මුදල් ලබා දීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න පටන් අරන් මේ වන කොට අවුරුදු හතරක් නොකඩවා සිසු අනුපාතය අනුව රු. 50,000 ක්, 100,000 ක් සහ 150,000 ක චෙක්පත් ලබා දුන්නා. කිත්සිරි කටහපිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා, සරුදම් අරුණැල්ල වෙන්න පුළුවන්, අපේ දැතින් අපේ පාසල සුරකිමු වෙන්න පුළුවන්, ඒ වැඩ සටහන පළාත් සභා මන්ත්‍රීවරු සියලු දෙනාටම ප්‍රචාරණය කරන වැඩ සටහනක් විදියට නොවෙයි, ප්‍රතිඵල සංවර්ධනය කරන්න -

ආපස්සට ගිහිල්ලා අවුරුදු පහක ප්‍රතිඵ. බලන්න, ඒ වාගේම දරුවන්ගේ අඩුපාඩුකම්, පාසලේ අඩුපාඩුකම් බලන්න. ඒ වාගේම මුදල් ටික ලබා දෙන්න දෙමව්පියන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් හැටියට තමයි අවුරුදු හතරම මේක ක්‍රියාත්මක කළේ. මොකද, අපි පාසලට, ගියාම දැක්කා දෙමව්පියෝ දැනුවත් කරන්නේ නැතිව පාසල දියුණු කරන්න පුළුවන්කමක් නැහැ විදුහල්පති ගුරුවරුන් මහන්සි වුණාට දෙමව්පියන්ගේ දායකත්වයක් නැත්නම් ප්‍රතිඵල සංවර්ධනය කරන්න පුළුවන්කමක් නැහැ. ඒ දායකත්වය ලබා ගන්න නම් අපි වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න ඕනැ. මේකේ දැනුවත් කිරීම කරන්න ඕනැ. බස්නාහිර පළාත හැටියට ප්‍රධාන අමාත්‍යතුමා, අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට, ප්‍රාදේශීය මන්ත්‍රීවරු හැටියට, මහජන නියෝජිතයන් හැටියට අපි පළාත් සභාවෙන් කරන දේ දෙමව්පියන්ට දැනුවත් කරන්න ඕනැ. ඒ නිසා තමයි ඒ වැඩ සටහන ක්‍රියාත්මක කරන්න මේ අවුරුදු හතරම ක්‍රියාත්මක කළේ.

ඒ වාගේම තමයි, අපි තවත් පැත්තකින් බලනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අද විශාල වශයෙන් යෝජනාවක් ගේනවා. මේ ශිෂ්‍යත්ව ප්‍රතිඵල, සාමාන්‍ය පෙළ ප්‍රතිඵල, උසස් පෙළ ප්‍රතිඵල සංවර්ධනය කරන්න නම් වැඩ සටහන් රාශියක් අපි ක්‍රියාත්මක කරන්න ඕනැ. මොකද, අපි දැක්කා, ප්‍රාථමික අංශයේ 1 සිට 5 දක්වා අවධි තුනක් තිබෙනවා. මේ අවදි තුනේදී 2 ශ්‍රේණියේ 1 වන අවදිය හැටියට ගුරුවරු නිපුණතා 40 ක් සම්පූර්ණ කරන්න ඕනැ. ඒ වාගේම දෙවැනි අවධිය හැටියට 4 වන ශ්‍රේණියේදී නිපුණතා 52 ක් සම්පූර්ණ කරන්න ඕනැ. ඒ වාගේම තුන්වැනි අවදිය හැටියට 5 වන ශ්‍රේණියේදී නිපුණතා 55 ක් සම්පූර්ණ කරන්න ඕනැ. ඒ නිසා අපි දැකපු දේ තමයි මේ නිපුණතා සම්පූර්ණ නොකිරීමෙන් - එක පැත්තකින් මට මතකයි ජනතා විමුක්ති පෙරමුණේ හිටපු අපේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා ඒ කාලයේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ උපදේශක කාරක සභාවට යෝජනාවක් ගෙනාවා. සාක්ෂරතාවය අඩු ළමයි ඉන්නවා කියලා. ඒ වාගේම තවත් අපි දැක්ක දෙයක් තමයි. පහේ නිපුණතා සම්පූර්ණ නොකරන දරුවා හය වසරට සුදුසුකම් තිබෙන දරුවෙක් නොවෙනවාය කියලා කිව්වා. ඒ අනුව තමයි සාමාන්‍ය පෙළ විභාගය අසමත් වෙන්නේ. අපි සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල ගත්තාම දෙසැම්බර් මාසයේ විභාගයට පෙනී සිටින දරුවන්ගෙන් වැඩි බහුතරයක් අසමත් වෙන්නේ - අර සාක්ෂරතාවය නැති, ඒ වාගේම නිපුණතා සම්පූර්ණ නොකරපු ළමයින් සංඛ්‍යාවක් පහ වසරේ තියාගන්නේ නැහැ. කවදාවත්. හය වසරට සමත් කරලා යවනවා. ඒ නිසා ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අපි ඉල්ලීමක් කළා. මොකද, අපි දැක්කා, ඒක අපට අද ජා -ඇළ කොට්ඨාශයෙන් කියන්න පුළුවන්. මේ වන කොට ජා -ඇළ කොට්ඨාශයේ 2240 ක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටියා. 214 දෙනෙක් විභාගයෙන් සමත් වුණා. ජා-ඇළ කොට්ඨාශයෙන් 9.55% අපි සමත් කරලා තිබෙනවා. අපි පළාතක් හැටියට ගත්තොත් 10.71% තිබෙන්නේ. ඒ නිසා අපි කරපු එකම දේ තමයි ප්‍රතිඵල සංවර්ධනය කර ගන්න පාසල් මට්ටමේ තිබෙන ප්‍රාථමික පාසල් එකතු කර ගත්තා. මොකද, අපි දන්නවා, කොට්ඨාශ මට්ටමින් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් කලාපවලින් හදලා තිබෙනවා ප්‍රධාන පවුල් පාසල් කියලා. ප්‍රධාන පවුල් පාසල් තිබෙන්නේ, විදුහල්පතිවරු වැඩි දෙනා අවධානය යොමු කරන්නේ, සාමාන්‍ය පෙළ සහ උසස් පෙළට. ශිෂ්‍යත්ව ප්‍රතිඵලවලට වැඩිය අවධානය යොමු කරන්නේ නැහැ. ඒ නිසා අපි කොට්ඨාශ මට්ටමින් ප්‍රාථමික පවුල් පාසල් කියලා වෙනම එකක් හැදුවා. හැබැයි, අපට කලාපයට වෙන් වන මුදල කලාප මට්ටමින් වෙන් නොකර ඒක කොට්ඨාශ ක්‍රමයට බෙදලා, කොට්ඨාශ මට්ටමින් වැඩ සටහන් ක්‍රියාත්මක කරලා, ප්‍රාථමික පවුල් පාසල්වලට වගකීම භාර දීලා ක්‍රියාත්මක කරපු නිසා තමයි අපට ශිෂ්‍යත්ව ප්‍රතිඵල 9.55% දක්වා වැඩි කරන්න අවස්ථාව ලැබුණේ. ඒ නිසා අපි ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා, කලාපවලට දැනුවත් කරලා, ප්‍රාථමිකය ශක්තිමත් කරන්න විෂය අධ්‍යක්ෂවරයා සහ ප්‍රාථමික ගුරු උපදේශක සංඛ්‍යාව කොට්ඨාශ මට්ටමින් වැඩි කරන්න ඕනැය කියලා. ඒ අධීක්ෂණය කෙරුවොත් පමණයි මේ නිපුණතා සම්පූර්ණ කරන්න, මේ ප්‍රතිඵල සංවර්ධනය කරන්න පුළුවන් වෙන්නේ. නමුත් ඊට වැඩිය අපි බලාපොරොත්තු වෙන්නේ සියයට වැඩි ප්‍රමාණය වැඩි කරන්නයි. අද අපි දන්නවා, සියයට වැඩි ප්‍රමාණය වැඩි කරන කොට ජා-ඇළ කොට්ඨාශයේ අද 41% තිබුණු එක 60.63% දක්වා වැඩි කර ගෙන තිබෙනවා. ඒ එක් එක් වැඩ සටහන් ක්‍රියාත්මක කරලා. පළාතක් හැටියට, අපි ප්‍රාථමික අංශයේ ලකුණු 100 ට වැඩිය ගන්න ළමයින් සංඛ්‍යාව වැඩි කළොත් අපට සාක්ෂරතාවය අඩු කරලා, අර හය වන වසරට සම්පූර්ණ දරුවෙක් ඇතුළත් කරන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ ගැන අවධානය යොමු කරන්නය කියලා.

[ ගරු මෙරිල් පෙරේරා ]

ඒ වාගේම තමයි සාමාන්‍ය පෙළ. සාමාන්‍ය පෙළ විභාගය කාලයට තමයි සම්මන්ත්‍රණ පවත්වන්නේ. 11 වසරට ළමුන්ගේ සංඛ්‍යාව බලලා පළමු වැනි වාරයේ, දෙවැනි වාරයේ ලකුණු අඩු නම් තුන් වන වාරයේ අපි ඉක්මණට සම්මන්ත්‍රණ හදන්න පටන් ගන්නවා. අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ 2014 වසරේ තුන් වැනි වාරයේ විභාගයෙන් ලකුණු විෂයන් අනුව වෙන් කර ගෙන, 00 - 40 දක්වා ගත්ත දරුවන් ටික ජනවාරි මාසයේම හඳුනාගෙන 6, 7, 8, 9, 10 දරුවන්ට මේ ලබන අවුරුද්දේ 2015 ජනවාරි සිට වැඩ සටහන් ටික ක්‍රියාත්මක කළොත් 2015 වසරේ දෙසැම්බර් මාසය වන කොට හැම අංශයකින්ම දරුවන්ව අපට වැඩි දියුණු කරන්න පුළුවන්. ඔවුන්ගේ ප්‍රතිඵල සංවර්ධනය කරන්න පුළුවන්. ඒ වැඩ සටහන ක්‍රියාත්මක කරන්න ඕනෑ. අමතර පන්ති කරනවා. සෙනසුරාදා පන්ති කරනවා. නමුත් අපි පාසලට ගිහිල්ලා අධීක්ෂණය කරලා බැලුවා. උගන්වන්න ඕනෑ දරුවා, ලකුණු අඩු දරුවා පාසලේ නැහැ. එයා ගෙදර ගිහිල්ලා. ලකුණු වැඩි දරුවා පමණයි අමතර පන්තියේ සහ සෙනසුරාදා පන්තියේ ඉන්නේ. ඒ නිසා තමයි අපි කියන්නේ, 0 – 40 කියලා වෙන් කරලා, ඒ දරුවන් හඳුනාගෙන, ළමයින් 25 ක් එක ගුරුවරයෙකුට භාර දීලා, ඒ අවුරුද්ද පුරා වැඩ සටහන් ක්‍රියාත්මක කළොත් අපට අවුරුදු තුනක්, හතරක් යන කොට සාමාන්‍ය පෙළ ප්‍රතිඵල සංවර්ධනය කරන්න පුළුවන්.

ඒ වාගේම තමයි උසස් පෙළ ගත්තත්, අපි දන්නවා, කඳානේ ඩී. මැසනට් විද්‍යාලය. ඒ වාගේම මීගමුවේ නිව්ස්ටඩ් බාලිකා විද්‍යාලය. ගම්පහින් ගත්තොත් හෝලි ක්‍රොස් බාලිකා විද්‍යාලය. මේ පැත්තෙන් ගත්තොත් රත්නාවලී බාලිකා විද්‍යාලය. හොඳම දරුවන් ටික පෞද්ගලික පාසල් සහ ජාතික පාසල්වලට යනවා. ඒ නිසා අපේ උසස් පෙළ ප්‍රතිඵල සංවර්ධනය කරලා, විශ්ව විද්‍යාලයට සුදුසුකම් ලබන දරුවන් සංඛ්‍යාව අඩු වෙනවා. මේකට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා. කලාපයකට හෝ කොට්ඨාශයකට සාමාන්‍ය පෙළ සුදුසුකම් ලබලා උසස් පෙළට පාස් වන දරුවන්ට එක පාසලක් හෝ නගා සිටුවන්න කියලා. ඒකට අවශ්‍ය පහසුකම් ටික ලබා දීලා, ගුරුවරුන් ටික ලබා දීලා, එක පාසලක් එක කොට්ඨාශයක නගා සිටෙව්වොත් අර පෞද්ගලික පාසල්වලට සහ ජාතික පාසල්වලට යන දරුවන් සංඛ්‍යාව නතර කරන්න පුළුවන්. එහෙම නැත්නම් හැමදාම වෙන්නේ පළාත් සභා පාසල්වල උසස් පෙළ ප්‍රතිශතය අඩු වෙනවා. ඒ වාගේම අනික් පැත්තෙන් බැලුවොත් ජාතික පාසල් සහ පෞද්ගලික පාසල්වල ප්‍රතිශතය වැඩි වෙනවා. ඒක ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කරලා තිබෙන පොතේම පැහැදිලිව තිබෙනවා. උසස් පෙළ විභාගය අනුව 2011 වසරේ 45.87 යි. 2012 වසරේ 55.18 යි. 2013 වසරේ 46% යි. මෙහෙම අඩු වෙලා තිබෙන්නේ අපි දන්නවා, කඳාන ද මැසනට් විද්‍යාලයේ ජා-ඇළ කොට්ඨාශයේ ඉන්න A සාමාර්ථ 9 ක්, 8 ක් ගන්න හොඳම දරුවා පමණයි ද මැසනට් විද්‍යාලයට ගන්නේ. ගම්පහ හෝලි ක්‍රොස් එකට ගන්නේ A 8 ක් සහ A 9 ක් තිබෙන දරුවා විතරයි. රත්නාවලී බාලිකා එකට ගන්නේ A 8 ක් සහ A 9 ක් තිබෙන දරුවා විතරයි. අනික් දරුවෝ ගන්නේ නැහැ. ඒ නිසා හොඳම දරුවෝ ටික හොඳම පාසලට යන කොට අපේ පළාත් සභා පාසල්වලට ඉතිරි වෙන්නේ ලකුණු අඩුවෙන් ගත් දරුවන් සංඛ්‍යාවයි. ඒ නිසා අපි එක පාසලක් නම් කරලා, අවශ්‍ය පහසුකම් ටික ලබා දුන්නොත් අපට උසස් පෙළ ප්‍රතිඵලත් සංවර්ධනය කරන්න පුළුවන් කියලා අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යෝජනා කරනවා.

ඒ වාගේම අපි මේ වෙලාවේ පෙර පාසල් සම්බන්ධව ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් පැහැදිලිව ඉල්ලීමක් කරනවා. අපේ ගරු සභානායකතුමාත් කිව්වා. අපට බස්නාහිර පළාතේ පෙර පාසල් 3359 ක් තිබෙනවා. දෙදහස් හත්සිය ගණනයි ලියාපදිංචි වෙලා තිබෙන්නේ. මේ ලියාපදිංචි සංඛ්‍යාවෙන් අද එක්තරා ප්‍රමාණයක් අපි වැඩි කර ගෙන තිබෙනවා, අවුරුද්දෙන් අවුරුද්ද. වසරෙන් වසර. අද අපට පෙර පාසල් ගැන අවධානය යොමු කරන්න වෙනවා. මොකද, බස්නාහිර පළාතේ පාසල්වලට වඩා තුන් ගුණයක් තිබෙනවා. පාසල් තිබෙන්නේ 1269 යි. ඒ වාගේම අනෙක් පැත්තෙන් ගත්තොත් පෙර පාසල් 3359 ක් තිබෙනවා. ඒ නිසා අපි ප්‍රධාන වශයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ලබන වසරේ ඉඳලා එක පැත්තකින් අපි "අපේ පාසල අපේ දෑතින් සුරකිමු" වැඩ සටහනේදී මුදල් ලබා දෙනවා වාගේම, සරුදම් අරුණැල්ලේ මුදල් ලබා දෙනවා වාගේම පෙර පාසල්වලටත් අඩුපාඩු සකසන්න, සෑම අවුරුද්දකම මුදල් - පෙර පාසල් අයිති පළාත් සභාවට. ඒ නිසා පළාත් සභාවට අයිති විෂයයක් නිසා මේ ගැන විශේෂයෙන් අවධානය යොමු කරලා, මුදල් වෙන් කිරීමක් කරලා, ලබන අවුරුදු පහේදී ඒකටත් මුදල් වෙන් කළොත්

අපට පෙර පාසල් සංවර්ධනය කරන්න පුළුවන්. මොකද, ඒක අපට අයිති විෂයයක් නිසා. ඒ නිසා ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

එක පැත්තකින් අද අමාත්‍යාංශයන් විපක්ෂයට විවේචනය කරන්න බැරි වෙලා තිබෙනවා. විවේචන ඉදිරිපත් කරන්න බැරි වෙලා තිබෙනවා. මොකද, සමස්තයක් හැටියට මුළු බස්නාහිර පළාතේ සියලු පාසල්වලට, සියලු දහම් පාසල්වලට මුදල් වෙන් කරලා වැඩ කටයුතු කරන නිසා තමයි අද විවේචනය කරන්න බැරි වෙලා තිබෙන්නේ. එක් එක් වශයෙන් තෝරා ගෙන අද උදව් උපකාර කරලා නැහැ. මොකද, එතුමා උත්සවවලට සහභාගී වෙන්නේ නැහැ. උත්සවවලට ගිහිල්ලා මුදල් දෙනවාය කියලා පොරොන්දු වෙන්නේ නැහැ. ඒ සෑම කෙනෙකුටම පොරොන්දු වෙලා තිබෙන්නේ, තමන්ගේ කලාපයට එන මුදල්වලින් වෙන් කර ගෙන වැඩ සටහන් ක්‍රියාත්මක කරන්නය කියලා. ඒ නිසා අපි මේ යෝජනා ටික ඉදිරිපත් කරමින්, ඒ වාගේම අපි එතුමාගෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා. විශේෂයෙන්ම අනෙක් අමාත්‍යාංශවලත් මුදල් වෙන් කිරීමේදී පොදු වැඩවලට මුදල් වෙන් කරලා, පළාත් සභාවක් හැටියට දිස්ත්‍රික්ක තුනටම බෙදා හැරලා වැඩ සටහන් ක්‍රියාත්මක කළොත් මේ පළාත් සභාව තුළ අපට වැඩි කාර්යයක් කරන්න අවස්ථාව ලබා ගන්න පුළුවන් කියලා. අපි බලාපොරොත්තු වන අරමුණ කරා අපට යන්න පුළුවන් කියලා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක් තිබෙනවා.

[පූ.භා. 11.55]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, -

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම ඊයේ සභාවේ නොසිටි අවස්ථාවේ මගේ නම සඳහන් කරලා, විශේෂයෙන් විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කිහිපයක් කරලා තිබුණා. මම ඒ පිළිබඳව යම් පැහැදිලි කිරීමක් කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නය මට කෙටියෙන් පැහැදිලි කරන්න.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මම ලංකා සම සමාජ පක්ෂයේ සාමාජිකයෙක්. ඒ වාගේම ඒ පක්ෂයේ භාණ්ඩාගාරික. ඒ පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙක්. අපේ පක්ෂය ආරම්භ කරපු පුරෝගාමී නායක ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා ඇතුළු සියලු දෙනාගේම අදහස වුණේ, පක්ෂය පිළිගත් අදහස වුණේ, විශේෂයෙන්ම පසුගිය පක්ෂ සම්මේලනයේදී අනුමත කරන්නට යෙදුණු දේශපාලන යෝජනාවේත් පිළිගත් කාරණාව වුණේ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න ඕනෑය කියන කාරණාවයි. ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය මට කෙටියෙන් ඉදිරිපත් කළොත් හොඳයි.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ඒ නිසා අපි විධායක ජනාධිපති ක්‍රමයට සෑම අවස්ථාවක අපේ විරෝධත්වය තිබුණා. මේක වෙනස් කරන්න ඕනෑය කියන මතය තිබුණා. ඒ වෙනුවෙන් පසුගිය කාලය තුළ උත්සාහයක් ගත්තේ නැහැ. තිබුණු 2/3 බලය පාවිච්චි වුණේ වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී තැනකට යන්න නොවෙයි. වඩාත් බලය තමන් අතට නතු කර ගැනීම වෙනුවෙනුයි පාවිච්චි කළේ. ඒ නිසා අපට මේකට එකඟතාවයක් වෙන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒ නිසා අපි තීන්දු කළා, අපට මතයකට එන්න සිද්ධ වුණා, මේ මැතිවරණයේදී පොදු අපේක්ෂකයා හැටියට ඉදිරිපත් වන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මට ඔබතුමාට කාලය ලබා දෙන්න බැහැ. ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි. ඒ නිසා -

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ පිළිබඳව එතුමාගේ වැඩ පිළිවෙළ තුළ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න, ඒ වාගේම ඒ ඡන්ද ක්‍රමය වෙනස් කරන්න, 17 වන සංශෝධනය නැවත බලාත්මක කරන්න, වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී වූ යහපාලන ක්‍රමයක් ඇති කරන්න එතුමාගෙන් ඉදිරිපත් වෙලා තිබෙන වැඩ පිළිවෙළත් එක්ක අනුගත වෙන්න කල්පනා කරපු නිසා මම ඇතුළු වමේ පක්ෂවල අය, ඒ වාගේම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මට ඔබතුමාට දිගින් දිගටම කාලය ලබා දෙන්න බැහැ. ඔබතුමා මගෙන් අවසර ඉල්ලුවේ 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න. ඔබතුමා වෙන ප්‍රකාශයක් කරන්නේ. මූලාසනයට හැටියට මට ඉඩ දෙන්න බැහැ ඔබතුමාට දිගින් දිගටම පැහැදිලි කිරීම කරන්න.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ඊයේ අත්සන් කරපු පොදු එකඟතා වැඩ පිළිවෙළට අපිත් අත්සන් කරන්නට යෙදුණු බව සඳහන් කරන්න. එසේ වුණත් පළාත් සභාව තුළ එක්සත් ජනතා නිදහස් සන්ධානය තුළ මම සාමාජිකයෙක් හැටියට ඉන්නවා. මම පළාත් සභාව තුළ ආණ්ඩු පක්ෂයත් එක්ක රැඳී සිටිමින් මම කටයුතු කරනවාය කියන එක විශේෂයෙන්ම සඳහන් කරනවා. මට මේ කියන්න තිබෙන කාරණාව මම ලිඛිතව ඉදිරිපත් කරනවා. සභාගත කරනවා.

[පූ.භා. 11.58]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයන් යටතේ විශේෂයෙන් අධ්‍යාපනය හා එතුමාට සම්බන්ධ විෂයයන් සම්බන්ධව කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව තුළ කොළඹ කලාපය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට පසුගිය කාලය පුරාම මේ සභාවේදී අපි එතුමාට පෙන්වලා දුන්නා, කොළඹ කලාපය තුළ විශේෂයෙන්ම කොළඹ නගරය ඇතුළේ ජීවත් වන අඩු ආදායම්ලාභී පවුල්වල ළමයින් යන පාසල්වල එහෙම ගුණාත්මක වර්ධනයක් අපට දක්නට ලැබුණේ නැහැයි කියලා. දැන් අපි මේ කොළඹ නගරය දිහා බැලුවාම කොළඹ නගරයේ ජීවත් වන ජනතාව වෙනුවෙන් ඉතාම ජනප්‍රිය පාසල් තිබෙනවා. අපි දන්නවා. කොළඹ නගරයේ සුපිරි පාසල් තිබෙනවා. ඩී.එස්. සේනානායක විද්‍යාලය, ආනන්ද විද්‍යාලය, ඒ වාගේම රාජකීය විද්‍යාලය. මේ පාසල් කොළඹ නගරයේ තිබුණාට, කොළඹ නගරයේ ජීවත් වන ඒ ළමයින් වෙනුවෙන්, කොළඹ නගරයේ ඉන්න ජනතාවගේ ළමයින් වෙනුවෙන් මේ පාසල්වල ලැබෙන ඉඩකඩ ප්‍රමාණය ඉතාම සීමිත ප්‍රමාණයක් තමයි තිබෙන්නේ. ඒක ඉතාම කනගාටුදායකයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපේ පළාත් සභාවට අයත් පාසල් කිහිපයක් තිබෙනවා. ඒ පාසල්වලින් අසෝක විද්‍යාලය, ඒ වාගේම සංඝමිත්තා විද්‍යාලය, යශෝධරා බාලිකාව. ඒ වාගේ පාසල් කිහිපයක් තිබෙනවා. ඉහළ පෙළේ පාසල්. ඒ පාසල්වලත් අපි බැලුවාම කොළඹ නගරයේ ජීවත් වන අඩු ආදායම්ලාභී පවුල්වල ළමයින්ට යන්න අවස්ථාව ලැබෙන්නේ ඉතාම සීමිත ප්‍රමාණයක් තමයි. එතකොට කොළඹ කලාපය තුළ ඉන්න, විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී පවුලවල ළමයින් යන්නේ තමන්ගේ ගෙවල් ඉස්සරහා තිබෙන පාසලට. තමන්ගේ ගෙදරට යාබද පාසලට තමයි යන්නේ. නමුත් ගරු මහ ඇමතිතුමනි, පසුගිය කාලය පුරා තමුන්නාන්සේ කියන විධියට යටිතල පහසුකම්වල වර්ධනයක්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා යම් යම් දේවල් සිද්ධ වුණු කථාව ඇත්ත. නමුත් පාසලක් හැටියට ඒ පාසල අංගසම්පූර්ණ පාසලක් හැටියට දියුණු වීමේ සහ ගුණාත්මක අධ්‍යාපනයේ වර්ධනයක් වීමේ එකක් එහෙම අපට පසුගිය කාලයේදී දක්නට ලැබුණේ නැහැ, කොළඹ කලාපය ඇතුළත තිබෙන අඩු ආදායම්ලාභී ළමයි යන පාසල් දිහා බැලුවාම. තවම ගුරු හිඟය තිබෙනවා. විශේෂයෙන්ම ප්‍රාථමික අංශය ගිහිල්ලා බැලුවාම සිංහල මාධ්‍ය හිඟය තවම ඒ හැම පාසලකම තිබෙනවා. ගුරුවරු අඩුයි. ඒ ගුරුවරු නැහැ. සමහර පාසල්වල පරිපාලනය බිඳ වැටිලා තිබෙන්නේ. සමහර පාසල්වල විදුහල්පතිවරු ඉන්නවා. දෙවැනි ශ්‍රේණියට, තුන් වැනි ශ්‍රේණියට ගුරුවරු ආවේ නැත්නම් ළමයින්ව නැවත වතාවක් ගෙදර යවනවා. ළමයින්ට එන්න එපා කියන පාසල් තවම තිබෙනවා. මෙන්න මේ වාගේ ඉතාම හද්දා පිටිසර, ගම්බද පාසල්වලට තිබෙන, පහසුකම් පවා තවම මේ කොළඹ නගරය ඇතුළේ, අපි මේ සුපිරි නගරයක් කරන්න යන මේ කොළඹ නගරය ඇතුළේ ඉන්න ළමයින්

යන ඒ පාසල්වල තිබෙන අඩුපාඩුකම් රාශියක් හා අධ්‍යාපනය අතින් ගුණාත්මක භාවය තවම නගා සිටුවන්න බැරි වී තිබෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම අවධානය යොමු කරන්න කැමැතියි. මේ පාසල්වලට පළමු වසරට ළමුන් ඇතුළත් කිරීමේ ප්‍රතිපත්තිය. ඒ ප්‍රතිපත්තිය මේ නගරයේ ඉන්න ළමයින්ට ඉතාම අසාධාරණ විධියට ක්‍රියාත්මක වෙන්නේ. නගරයේ ඉන්න ළමයින්ට මේ නගරයේ තිබෙන සුපිරි පාසල් ලැබෙන්නේ නැහැ. අඩුම ගණනේ මේ පළාත් සභාවේ තිබෙන අසෝක විද්‍යාලයට මරදානේ ඉන්න ළමයාට අද යන්න බැහැ. ඒ වාගේම සංඝමිත්තා එකට යන්න බැහැ, පුංචි බොරැල්ලේ ඉන්න ළමයාට. තමුන්නාන්සේලා අරගෙන බැලුවොත් ඒ ලැයිස්තු ටික, අද අසෝක විද්‍යාලය ළඟට ගිහිල්ලා, සංඝමිත්තා එක ළඟට දවල්ට ගිහිල්ලා බැලුවොත් ඔක්කොම බස් තිබෙන්නේ, ගම්පහ. කිරිල්ලවල. කඩවත. හෝමාගම. මහරගම ඒ ප්‍රදේශවලින් එන ළමයින් තමයි ඉන්නේ. කොළඹ නගරයේ ඉන්නේ ළමයි පස් දෙනයි. දහ දෙනයි. ඒ නිසා මේ පවතින ළමුන් ඇතුළත් කිරීමේ ප්‍රතිපත්තිය ඉතාම අසාධාරණ විධියට කොළඹ නගරයේ ඉන්න ළමයින්ට තමන් ජීවත් වන නගරය ඇතුළේ තිබෙන සුපිරි පාසල් ලැබෙන්නේ නැහැ. ඒක ඉතාම කනගාටුදායකයි. ඒ ළමයි යන පාසල වැස්සක් වැස්සාම පන්ති කාමරය තෙමෙනවා. වැස්සක් වැස්සාම පන්ති කාමරයට යන්න බැහැ. මේස නැහැ. පුටු නැහැ. ගුරු හිඟය ඉතාම අධිකයි. ඒ පාසල්වලට තමයි මේ නගරයේ ඉන්න ළමයි යන්නේ. නමුත් මේ නගරයේ තිබෙන සුපිරි පාසල් ටික මේ ළමයින්ට ලැබෙන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි. ගරු සභාපතිතුමනි, මම පසුගිය කාලය පුරාම, උපදේශක කාරක සභාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටියා, යම් යාන්ත්‍රණයක් හදන්න. මේ නගරය ඇතුළේ ජීවත් වන ළමයින් වෙනුවෙන් අපි ඒකට කියනවා, discrimination එහෙම නැත්නම් ඒ ළමයින්ට වන අසාධාරණයට විරුද්ධව යම් පැමිණිල්ලක් භාර දෙන්න පුළුවන් කමිටුවක් හදන්න කියලා. පළමු වැනි වසරට ළමයින් තෝරා ගැනීමේදී විශේෂයෙන්ම තමන්ගේ ජාතිය මත, තමන්ගේ කුලය මත, තමන්ගේ ආගම මත ළමයින් රාශියකට ඒ පාසල් ලැබෙන්නේ නැතිව, පළමුවැනි Interview එකේදීම ඒ ළමයින් ඒ පාසල්වලින් -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

අපට ඒ පාසල් කිහිපයක් නම් කළා නම් දැන ගන්න පුළුවන්.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

පාසල් කිහිපයක් මට නම් කරන්න පුළුවන්. නමුත් මම ඒක කරන්නේ නැතිව ඔබතුමාට ඕනෑ නම් මම ඒක ලිඛිතව භාර දෙන්නම්. ඒ පාසල්වල සමහර විදුහල්පතිවරු ගරු මහ ඇමතිතුමනි, ළමයින් අම්මාත් එක්ක පළමු වැනි ශ්‍රේණියට ඇතුළත් වෙන්න Interview එකට ගියාම කියනවා, මේ ඇඳුම ඇඳගෙන එන්න බැහැ. මේ ඇඳුම ඇඳගෙන එනවා නම් ළමයා පාසලට ගන්න බැහැයි කියලා ලිඛිතව ඉල්ලනවා. ඊළඟට කියනවා, මේ පාසලේ ඉස්ලාම් ආගම උගන්වන්නේ නැහැ. ඔයගොල්ලෝ කැමැති නම් බෞද්ධ ආගම ඉගෙන ගන්න ඕනෑ. එහෙම කැමැති නම් අපි ළමයාව ගන්නම් කියලා. එහෙම කියන විදුහල්පතිවරු ඉන්නවා. මේ කොළඹ නගරයේ තිබෙන සුපිරි පාසල්වල. ඉතාම කනගාටුදායකයි. ඉතින් මම කියන්නේ, මේක නැති කරන්න ඕනෑ. තමුන්නාන්සේගේ අධීක්ෂණය යටතේ මේ පැමිණිලි විභාග කරන්න යම් කමිටුවක් දාන්න. සමහර පාසල් තිබෙනවා, ආගමික පදනම මත ළමයින් ගන්නේ නැහැ. නමුත් රජයේ පාසල් ආගමික පදනම මත තිබෙන පාසල්වලටත් ලකුණු කපනවා. ගරු මහ ඇමතිතුමනි, මරදානේ ඉඳන් මුස්ලිම් ළමයෙක් අසෝක විද්‍යාලයට දැම්මාම ආනන්ද විද්‍යාලයට ලකුණු පහක් කපනවා. ආනන්ද විද්‍යාලය කියන්නේ ආගමික පදනම මත පාසලක්. ඒකට ලකුණු කපන්න බැහැ. චක්‍රලේඛයේ තිබෙනවා ඒකට ලකුණු කපන්න බැහැයි කියලා. නමුත් ඒ වාගේ ප්‍රශ්න රාශියක් මේ නගරය ඇතුළේ අද ජීවත් වන ඒ අහිංසක අම්මලා තාත්තලාගේ ළමයින්ට අසාධාරණකම් සිද්ධ වෙනවා. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා, වහාම මේ පිළිබඳව ඔබතුමා මැදිහත් වෙන්න. යම් කමිටුවක් හදන්න. මේ පැමිණිලි විභාග කරන්න. මොකද, අද පළමු වැනි ශ්‍රේණියට ළමයින් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන්නේ, විදුහල්පතිතුමිය ඇතුළු පාසලේ සංවර්ධන සමිතියයි. අපි ආයාචනයක් ඉදිරිපත් කළත්, Appeal එකක් දැම්මත් නැවතත් ඒක පරීක්ෂා කරන්නෙත් ඒගොල්ලෝ තමයි. ඒ නිසා ඒ අසාධාරණයට ලක් වුණු අයට කිසිම සාධාරණත්වයක් ඔවුන්ගෙන් ලැබෙන්නේ නැහැ. ඒ නිසා අපි ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලනවා, ඒකට සාධාරණත්වය ඉෂ්ට කරන්න කියලා.

[ ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන් ]

ඊළඟට ගරු සභාපතිතුමනි, මේ ජාත්‍යන්තර පාසල් ගැන. මේ සාකච්ඡාවේදී හුඟාක් මන්ත්‍රීවරු මේ ගැන කථා කරන්නේ නැහැ. තමුන්නාන්සේලා අපි කියනවා, අධ්‍යාපනය වෙනුවෙන් මෙපමණ මුදලක් වැය කරනවාය කියලා. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, අද බස්නාහිර පළාත් සභාවේ තමුන්නාන්සේගේ යටතේ තිබෙන වෙළඳ ආයතන ලියාපදිංචි කරන දෙපාර්තමේන්තුව යටතේ ජාත්‍යන්තර පාසල් දාහකට වැඩිය බස්නාහිර පළාත් සභාව තුළ අද පවත්වාගෙන යනවා. තමුන්නාන්සේ දන්නවාද අපි දන්නේ නැහැ. ලංකාවේ නීතිය අනුව, 1961 පාසල් පවරා ගැනීමේ පනත අනුව ලංකාවේ පෞද්ගලික පාසල් පටන් ගන්න බැහැ. නීතියෙන් තහනම්. නමුත් බස්නාහිර පළාත් සභාව ඇතුළේ පාසල් තිබෙනවා. මේ ගැන රජය නිහඬයි. මේ ගැන ඔබතුමා නිහඬයි. ඔබතුමා මේ ගැන කථා කරන්නේ නැහැ. ඒ නිසා එක පැත්තකින් අපට සැකයක් තිබෙනවා, ආණ්ඩුව පාසල් පෞද්ගලිකකරණයේ ප්‍රතිපත්තිය අනුගමනය කරනවාද? ඒක පිළිගන්නවාද? කියලා. එහෙම නැත්නම් මේ ජාවාරම, මේ පෞද්ගලික පාසල් පටන් ගැනීම, මේ කළු කඩ මුදලාලිලාගේ ව්‍යාපාරය නවත්වන්නේ නැත්තේ ඇයි කියලා. මේක ඉතාමත්ම ශෝකජනක තත්ත්වයක්. අද කොළඹ නගරයේ විතරක් ළමයින් 3000 කට වැඩි ප්‍රමාණයක් මේ පාසල්වල ඉගෙන ගන්නවා. හැම හන්දියක් පාසාම ජාත්‍යන්තර පාසල් ඇරලා තිබෙනවා. කිසිම ප්‍රමිතියක් නැහැ. කිසිම නීතියක් නැහැ. ඕනෑම කෙනෙකුට පාසලක් අරින්න පුළුවන්. නමුත් ඔවුන් ඔබතුමාගේ ඔය තියෙන වෙළඳ ආයතන ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඒගොල්ලෝ Private Tuition Classes පටන් ගන්නවාය කියලා ලියාපදිංචි වෙලා අද පෞද්ගලික පාසල් පටන් අරන් තිබෙනවා. නමුත් ඒවා නවත්වන්න තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළක් නැහැ. පසුගිය කාලය පුරාම අපි මේවා පෙන්වලා දුන්නා. මේ සභාවේ අනන්ත අප්‍රමාණ ප්‍රශ්නය අපි මතු කළා. නමුත් මධ්‍යම ආණ්ඩුවත් මේ ප්‍රශ්නයේදී නිහඬයි. පළාත් සභාවත් නිහඬයි.

ඒ නිසා ගරු මහ ඇමතිතුමනි, මේ අපරාධය කරන්න එපා. මේ ජාත්‍යන්තර පාසල් ඉතාම කූඨ ලෙස මේ රටේ ජනතාවගේ ඉතා අහිංසක දූ දරුවන්ගේ අධ්‍යාපනය විනාශ කරන්න, ඔවුන්ව ඉතාම අඳුරු යුගයකට යන්න පුළුවන් මේ පාසල් ක්‍රමය වහාම නවත්වන්න ඔබතුමන්ලා මැදිහත් වෙන්න. එහි ප්‍රධාන වගකීම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට තිබෙනවා. මොකද, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තමයි ඒ ටික ලියාපදිංචි වෙන්නේ. හොරට ලියාපදිංචි වෙලා, හොර පාසල් අද පටන් අරගෙන ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා ඔබතුමා වහාම මේකට මැදිහත් වෙලා, මේකට යම්කිසි ආකාරයේ විසඳුමක් දිය යුතුයි. නැත්නම් ඒ පාප කර්මයට ඔබතුමාත් වගකියන්න ඕනෑය කියලා මම කියන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, ඊළඟට මේ පාසල්වල මුදල් අය කිරීම ගැන. හුඟක් අය කිව්වා, මුදල් අය කරන්නේ නැහැයි කියලා. අද අහලා බලන්න. අද මුදල් අය කරනවා. ගරු සභාපතිතුමනි, සභාවට ඉදිරිපත් කරන්න මම ඒක ගේන්න හිටියා. ඒක ගේන්න බැරි වුණා. 50% කින්. එක පාරටම ජනවාරිවල ඉඳලා 50% කින් මුදල් ගාස්තු වැඩි කරලා තිබෙනවා. මම දන්නේ නැහැ, මේකට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා දුන්නාද ඒ පාසල්වලට එහෙම වැඩි කරන්න. නමුත් සමහර පාසල් තිබෙනවා. උත්සව තියලා, අවුරුද්දකට ලක්ෂ ගණන් මුදල් හම්බ කරන පාසල් තිබෙනවා. එක්කෝ ජනාධිපතිතුමාගේ ආර්යාව ගේනවා. එක්කෝ ජනාධිපතිතුමාව ගේනවා. එහෙම කියලා උත්සව තියලා අවසාන වාර විභාගවලට ළමයින්ට පන්තිවලට යන්න දෙන්නේ නැහැ. දැන් සමහර පාසල් අමතර පන්ති දාලා ළමයින්ට උගන්වනවා. ශිෂ්‍යත්ව පන්ති. ඇයි? පසුගිය කාලයේම, පසුගිය මාස එකහාමාර තුළ ජනාධිපතිතුමාව ගේන්න, ජනාධිපතිතුමාගේ ආර්යාව ගේන්න උත්සව තියන්න ළමයින්ව පාසල් වෙලාවේ පන්ති කාමරවලින් එළියට අරගෙන එක එක නැටුම් ගැයුම්වලට ඒ ළමයින්ව යොදවලා දැන් හවස පන්ති පවත්වනවා. ළමයින්ට උගන්වන්න, ශිෂ්‍යත්වයට යන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ශිෂ්‍යත්වය ඉවරයි නේ?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

හරි. මේ පරිපාලනය බිඳ වැටිලා තිබෙනවා. මේ තරම් ප්‍රමාණයට පොතක් ගහනවා Advertisements එකතු කරලා. මේ තරම් ප්‍රමාණයක පොතක් ගහනවා. හැම ළමයාම, ඒ ගන්න ඇඳුම්වලට රුපියල් 2500, 3000 ගෙවන්න ඕනෑ. මේ විධියට අද මුදල් එකතු කරලා ව්‍යාපාර පවත්වාගෙන යනවා. (බාධා කිරීම්)

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ශිෂ්‍යත්වය කොහේද?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ශිෂ්‍යත්ව පන්තිය.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ශිෂ්‍යත්වය ඉවරයි නේ?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

නැහැ. නැහැ. පහේ පන්තියේ ළමයින්ගෙන් මේ යන්නේ. පහේ පන්තියේ ළමයින්ව ඉස්කෝලේ වෙලාවේ නවත්වලා අමතර දේවල්වලට අරගෙන දැන් විෂය නිර්දේශය කවර් කරන්න අමතර පන්ති තියනවා. තේරුම් ගන්න කියන දේ. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, මේ විවේචන අහගෙන ඉන්න. මේවා අසත්‍ය නම් මේවා සොයලා බලන්න. අපි මේවා නිකම් කථා කරනවා නොවෙයි. කරුණු සොයාගෙන ඇවිල්ලා මේ කියන්නේ.

ගරු සභාපතිතුමනි, ඊළඟට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ විෂයයන් යටතේ තිබෙනවා, නීතිය හා සාමය. ගරු මහ ඇමතිතුමා මේ පොතේ නීතිය හා සාමය පිළිබඳව කිසිම කථාවක් කරලා නැහැ. එතුමාට අයිති විෂයක්. සමහර විට එතුමා පිළිගන්නවාද දන්නේ නැහැ බස්නාහිර පළාතේ නීතිය හා සාමය නැහැයි කියලා. ඒ හින්දා මෙතුමා ඒ ගැන කථා කරලා නැද්ද දන්නේ නැහැ. එතුමාගේ පොතේ. ගරු සභාපතිතුමනි, නීතිය බිඳ වැටීම තිබෙනවා. අපි දැක්කා, පසුගිය කාලයේ බේරුවල, අලුත්ගම ප්‍රදේශයේ නීතියේ ආධිපත්‍ය රකින්න බැරි වුණා. විශාල පාඩුවක් වුණා. ජනාධිපතිතුමා කිව්වා, ජනාධිපති කොමිසමක් පත් කරලා ඒ ගැන හොයනවා කියලා. ඒක වුණේ නැහැ. අඩුම ගණනේ ඒ දේපළ හානිවලට සිදු වුණු දෙයට වන්දියක් පවා අද ගෙවන්න බැරි වුණා. ගරු සභාපතිතුමනි, ඒ නිසා අද නීතිය හා සාමය පිළිබඳව මීට වඩා - මහ ඇමතිතුමාගේ විෂයයක්. එයට මහ ඇමතිතුමා මැදිහත් වෙන්න ඕනැ. පළාත් සභාවේ 13 වැනි සංශෝධනය යටතේ පිහිටුවා තිබෙනවා. එතුමාට ඉඩම් බලතල පවරලා තිබෙනවා. අපි එතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ තිබෙන බලතලවලට පළාත් සභාවලට අඩුම ගණනේ පනතක් හරි ඉදිරිපත් කරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතන්නේ, ඒ සම්බන්ධව එතුමාට බලතල නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඒ බලතල ක්‍රියාත්මක කරන්නය කියලා අපි මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

[ අ.භා. 12.11 ]

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ වසර 26 ක අතීතයක් තිබෙන පළාත් සභාවක් හැටියට හය වන පළාත් සභාවේ ප්‍රථම අයවැය සඳහා අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, මිනිස් බල හා රැකී රක්ෂා සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා.

අපි දන්නවා, පසුගිය වර්ෂ 26 ක පළාත් සභා ඉතිහාසය තුළ පළාත් සභාවක් හැටියට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පමණක් නොවෙයි - එදා පළාත් සභාව සුදු අලියෙක් ලෙස හංවඩු ගහපු කාල පරිච්ඡේදයක්, ඉතිහාසයක් තිබෙන අද පළාත් සභාවේ පළාත් සභා මන්ත්‍රීවරුන් විධියට අපට අභිමානයකින් යුක්තව මහජනතාවට සේවය කිරීමේ අවකාශය සැලසිලා තිබෙනවා. අපි දකිනවා. අධ්‍යාපන

[ ගරු ප්‍රදීප් උඳුගොඩ ]

ක්ෂේත්‍රය ගැන කථා කරන කොට අද අධ්‍යාපන ක්ෂේත්‍රයේ පමණක් නොවෙයි, මේ රටේ ජනතාවට අවශ්‍ය කරන සෞඛ්‍ය, සංස්කෘතිමය සහ අනෙකුත් ක්ෂේත්‍රයන් තුළත් රටේ ජනතාවට දැනෙන්නට වැඩක් කරන්නට පුළුවන් ක්‍රමවේදයක් පළාත් සභාව තුළ තිබෙනවා. මේ පළාත් අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන අපි කථා කරන කොට අද පළාත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ මම මුලින්ම කථා කරන්නට කැමැතියි, පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳව. මේ පූර්ව ළමා විය සංවර්ධනය කියන්නේ, දරුවෙක් තමාගේ දෙමව්පියන්ගෙන් වෙන් වෙලා මුලින්ම සමාජගත වන අවස්ථාව තමයි පූර්ව ළමාවිය සංවර්ධනය කියලා කියන්නේ. අපි දියුණු වෙමින් පවතින රටක් හැටියට, දියුණු වුණු රටවල් හා සංසන්දනය කරන කොට අද දියුණු රටවල්වල ප්‍රධානත්වය ලබා දෙන්නේ, මේ පූර්ව ළමාවිය සංවර්ධනය සඳහා. ඒ අනුව මේ පූර්ව ළමා විය සංවර්ධනය කරන අපේ පෙර පාසල් පිළිබඳව අපි විශේෂ අවධානයක් යොමු කරන්නට ඕනෑ.

අද අපේ බස්නාහිර පළාත තුළ පෙර පාසල් 3359 ක් තිබෙනවා. මේ පෙර පාසල් 3359 අතරින් ලියාපදිංචි වූ පෙර පාසල් ප්‍රමාණය 2917 යි. තවත් පෙර පාසල් 442 ක් ලියාපදිංචි නොමැතිව මේ දූවා දරුවන්ගේ අනාගතය වෙනුවෙන් ඒ ඉගැන්වීමේ කටයුතු කරන්නට පෙළඹිලා තිබෙනවා. අපි පෙර පාසල් ප්‍රඥප්තියක් හැදුවා. මේ පෙර පාසල් ප්‍රඥප්තිය තුළ අපි නිර්දේශ කළා, පෙර පාසලක් පවත්වාගෙන යාමට අවශ්‍ය කරන සාධක, නිර්ණායක මොනවාද කියලා. පෙර පාසල් ප්‍රඥප්තිය තුළින් අපි එය නිර්දේශ කරලා තිබෙනවා. නමුත් මේ පෙර පාසල් තුළින් කරන ඒ මූලික සංවර්ධනය, මූලික අධ්‍යාපනය ලබා දෙන්නට මේ පෙර පාසල් පවත්වාගෙන යන ගුරුවරුන්ගේ තිබෙන අධ්‍යාපන මට්ටම කුමක්ද කියන එක අද අපට අභියෝගයක්ව පැවතිලා තිබෙනවා. පෙර පාසල් 442 ක ඉගෙන ගන්න දූවා දරුවන්ගේ වගකීම් භාර ගන්නේ කවුද? මේ පෙර පාසල් 442 ක ඉගෙන ගනු ලබන ඒ දූවා දරුවන්ගේ අනාගතය වෙනුවෙන් බස්නාහිර පළාතේ පළාත් සභා මන්ත්‍රීවරු විධියට අපි අභියෝගය ඒ වගකීම භාර ගන්නට ඕනෑ. ඒ නිසා මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉතා ගරුත්වයෙන් ඉල්ලා සිටිනවා. මේ පෙර පාසල් පිළිබඳව අපි විශේෂ අවධානයක් යොමු කරලා, 2015 ජාතික අයවැයේදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, පූර්ව ළමා විය සංවර්ධනය හා ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා 100% ක් දරුවන් ලියාපදිංචි කරවීම සඳහා ප්‍රතිපාදන අද වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම අපේ පාසල් ක්ෂේත්‍රය තුළ ඒ අධ්‍යාපන කටයුතු සංවර්ධනය සඳහා දේශපාලන නායකත්වයන් මැදිහත් වෙලා අධ්‍යාපන ක්ෂේත්‍රයේ අපේ ඉන්න දූවා දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් කටයුතු කරන්න පුළුවන් වටාපිටාව අද ගරු ප්‍රධාන අමාත්‍යතුමා අපට සකසලා දීලා තිබෙනවා.

විශේෂයෙන්ම ව්‍යුහ කමිටු තුළින් අපේ පළාතේ අපේ ප්‍රදේශය තුළ පාසල්වල භෞතිකමය සහ මානව සංවර්ධනය වෙනුවෙන් කටයුතු කරන්න පුළුවන් වටාපිටාව අද සකසලා දීලා තිබෙනවා. ඒ වාගේම තමයි අපි දකිනවා, පාසල් සංවර්ධනය තුළ භෞතික සම්පත් සංවර්ධනය වෙනුවෙන් මහින්දෝදය විද්‍යාගාර, ඒ වාගේම මහින්දෝදය තාක්ෂණ පීඨ - අද බස්නාහිර පළාත තුළ පමණක් මහින්දෝදය විද්‍යාගාර 134 ක් අද නිර්මාණය කරලා දීලා තිබෙනවා. විශේෂයෙන්ම අද සිටින දූවා දරුවන් මේ තාක්ෂණ විෂය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්නට ඕනෑ. අපි දියුණු වෙමින් පවතින රටක් හැටියට අපේ දූවා දරුවන් මේ රට ආසියාවේ ආශ්චර්ය බවට පත් වන කොට තාක්ෂණය සහ ඒ වාගේම තොරතුරු තාක්ෂණය පිළිබඳව අනෙකුත් රටවල් හා ගැටෙන්නට පුළුවන්, අනාගත අභියෝග භාර ගන්නට පුළුවන් දූවා දරුවන් පිරිසක් බවට පත් කරන වගකීම අද රජයක් හැටියට අපට තිබෙනවා. ඒ සඳහා අපි විද්‍යාගාර 134 ක්, ඒ වාගේම තාක්ෂණ පීඨ 53 ක් අද නිර්මාණය කරලා, අපේ දූවා දරුවන්ගේ අනාගතය සුබිත මුදිත කරන්නට පුළුවන් වටා පිටාව නිර්මාණය කරමින් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ රජයත්, ඒ වාගේම පළාත් සභාව හැටියට අපටත් අභිමානයකින් යුක්තව අද කථා කරන්න පුළුවන් හැකියාව තිබෙනවා.

ඒ වාගේම තමයි අපි දකිනවා. බස්නාහිර පළාත තුළ පාසල් 1269 ක් තිබෙනවා. ඒ වාගේම පාසල් 1269 තුළ පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව 721,565 ක් ඉන්නවා. මේ සඳහා ගුරු සංඛ්‍යාව 33,648 ක්. මේ ගුරු සංඛ්‍යාවට ගුරු සිසු අනුපාතය බස්නාහිර පළාත තුළ පවතින දිස්ත්‍රික්ක තුන ඇතුළත 1.2 සිට 1.22 අතර තත්ත්වයක පවත්වාගෙන යන්න පුළුවන් හැකියාව අද අපට ලැබිලා තිබෙනවා.

ඒ වාගේම තමයි අපේ ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා එතුමාගේ නිර්මාණයන් තුළින් අද

පාසල්වල භෞතිකමය වශයෙන් සහ මානව වශයෙන් සංවර්ධනය කිරීමේ වැඩ සටහන් නිර්මාණය කරලා තිබෙනවා. එයින් එකක් තමයි, "අපේ පාසල අපේ දෑතින් සුරකිමු" කියන වැඩ සටහන යටතේ අපේ පාසල් තුළ ආකර්ෂනීය පෙනුමක් ඇති කරන ආකාරයෙන්, පාසල් තුළ තම දූවා දරුවන්ට ඉගෙන ගැනීමට ආසාවක් ඇති වන පරිසරයක් නිර්මාණය කිරීම තුළින් මේ වැඩ සටහන යටතේ අද පාසල් තුළ විශාල සංවර්ධනයක් ඇති කරලා තිබෙනවා.

ඒ වාගේම තමයි සුපසන් නිම්තෙර වැඩ සටහන. අපි කථා කරන්නට ඕනෑ. 5S සංකල්පය අද පාසල් තුළට හඳුන්වා දීලා, අද පාසල් තුළ යම්කිසි ප්‍රමිතියකට අනුව වැඩ කටයුතු කරන වටාපිටාව ඇති කර දීමෙන් අපේ ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා.

ඒ වාගේම තමයි මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා, ඇත්තෙන්ම අපේ පළාත් සභාව තුළ අපේ කලාප සහ කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ඉන්නවා. අපේ පළාතේ තිබෙන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට අද ප්‍රවාහන පහසුකම් තිබුණත්, අපේ කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරු අද විශාල ප්‍රවාහන අපහසුතාවයන්වලට මුහුණ පාලා සිටිනවා. කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරු තමයි පාසල්වලට ගිහිල්ලා පාසල්වල තිබෙන සංවර්ධන කටයුතු, පාසල්වල තිබෙන අවශ්‍යතාවයන් පිළිබඳව සොයා බලන්නේ. ඒ නිසා මා ඉතාමත් ගෞරවයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට තිබෙන ඒ ප්‍රවාහන පහසුකම් කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ටත් ලබා දෙන්නය කියලා. මෙය ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම තමයි අපේ උගත්, බුද්ධිමත් රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ඉල්ලීමක් කළා, අපේ මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට විදේශ සංචාර තුළින් මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ තිබෙන ඒ අධ්‍යාපන දැනුම වැඩි දියුණු කර ගන්නට පුළුවන් වටා පිටාව සකසලා දෙන්නය කියලා. අපි සෑම වර්ෂයක් පාසාම අධ්‍යාපන චාරිකා සඳහා විදේශ සංචාරවලට යොමු වුණා. නමුත් මේ වසර තුළ පසුගිය පළාත් සභාව කාලය තුළදී අපේ ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර මන්ත්‍රීවරුන් මේ සඳහා අකමැත්ත ප්‍රකාශ කළ නිසා මේ වර්ෂය තුළ අපි සියලුම ප්‍රතිපාදන සංවර්ධන කටයුතු සඳහා යොමු කරලා තිබෙනවා. ඒ නිසා එතුමා ඉල්ලීමක් කරනවා නම් අපි කැමැතියි, මේ අපේ තිබෙන සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ තම හැකියාවන්, අනෙකුත් රටවල සිද්ධ වෙන දේවල් බලලා, ඒ තුළින් මේ රටට අපි යම්කිසි බුද්ධිමය ආයෝජනයක් කරන්න පුළුවන් නම් ඒ සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 12.21 ]

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම අපේ ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමා මා වෙනුවෙන් කියපු ඒ කථාව. සමාවෙන්න ඕනෑ. මගේ ඉල්ලීමක් නොවෙයි. මම හිතන්නේ වෙන මන්ත්‍රීවරයෙක් ඉල්ලන්න ඇති. විදේශ සංචාර. එලෙස මම ඉල්ලීමක් කළේ නැහැ. ඒ නිසා එය හැන්සාඩ් එකෙන් ඉවත් කරන්නය කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊයේත් මම මගේ කථාව ආරම්භ කරමින් කිව්වා, අපි අයවැය පිළියෙල කරන කොට, අයවැය සාකච්ඡා සඳහා අවශ්‍ය කරන පසුබිම නිර්මාණය කර ගන්න කොට අපි මේ සඳහා නියැදි ලෙස යොදා ගන්නේ, මේ සඳහා අවශ්‍ය කරන පසුබිම හදා ගන්නේ, මේ පොත්වල තිබෙන යම් යම් දත්තයන් උකහා ගෙන තමයි කියලා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, - ගරු ප්‍රධාන අමාත්‍යතුමා මෙතැන නැහැ. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට යොමු කළා. එතුමා 2013 දී කරපු 2014 අයවැය කථාවත්, ඒ වාගේම 2015 වෙනුවෙන් මෙවර කරපු කථාවේත් සංඛ්‍යාමය ගැටළුවක් තිබෙනවාය කියලා, මම ඊයේ මේ දෙකේ වරදක් පෙන්නුවාම අද තවත් එකක ඒකම කරලා තිබෙනවා. සංවර්ධන ප්‍රගතිය සහ ඉලක්ක. අද අමාත්‍යවරයෙක්වත් නැහැ, කවුරුවත් නැහැ අපි මේ කියන ඒවා අහගන්න. මම හිතන්නේ, ඔබතුමා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මූලාසනයට කථා කරන්න. මේවා හැන්සාඩ් ගත වෙනවා.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සාමාන්‍ය පෙළ සමත් වීමේ හැකියාව මේ තැන් තුනක සඳහන් වෙලා තිබෙන්නේ තුන්

[ ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර් ]

ආකාරයට. එතකොට අපට මේ දත්තයන් ඇසුරු කර ගෙන යම් යම් දේවල් කථා කරන්න ගියාම අපි ගැටළුවකට පත් වෙනවා කවුද ඇත්ත කියන්නේ කියලා. මේ පොතද හරි. එහෙම නැත්නම් ගිය අවුරුද්දේ ප්‍රධාන අමාත්‍යතුමා කථා කරපු පොතද හරි. එහෙම නැත්නම් මේකද කියලා. මේ බොරු සංඛ්‍යා ලේඛන ප්‍රමාණයක් මේකට අන්තර්ගත කරලා තිබෙන්නේ. ඒ නිසා මම අතිශයින්ම කනගාටුවට පත් වෙනවා. අපේ වැය ශීර්ෂය කථා කරන්නේ - ඔබතුමාත් කාලයක් ගුරුවරයෙක් හැටියට හිටියා. මම වසර 25 කට ආසන්න කාලයක් ගුරු වෘත්තියේ නියැලිලා ඉන්නවා. ටියුෂන් පිළිබඳව වැරදි අර්ථ කථනයක් සහ මේක වැරදියි කියලා කථා කරන්නට උත්සාහ දැරූ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාත් ඉස්සර හිටියේ ටියුෂන් ක්ෂේත්‍රයේ. ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක අපේ සිසිර ජයකොඩි මැතිතුමාත් ඉතාම ජනප්‍රිය තර්ක ශාස්ත්‍රය ගුරුවරයෙක්. ඒ නිසා මේක හරියට අපි පිළිබඳව කථා කරන්නාවූ, අපේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරනවා වාගේ දෙයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම නැවත වතාවක් කියන්නේ, මේ දත්තයන් ඇසුරු කර ගෙන අපට කථා කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේක තැන් තුනක තුන් ආකාරයෙන් තියෙනවා කියලා කියන්නේ, මන්ත්‍රීවරුන් සියලු දෙනාම නිකම් අනාථ කරලා තිබෙන්නේ. ඒක වැරදි දෙයක්. ඒ කියන්නේ තැන් තුනක සංඛ්‍යා ලේඛන වැරදි ආකාරයට එනවා නම්, එකක් පුළුවන් ඕනෑ නම් මුද්‍රණ දෝෂයක් කියන්න. තැන් තුනක සංඛ්‍යා ලේඛන එක එක ආකාරයකින් එනවා නම් එක්කෝ නිලධාරී මණ්ඩලය හෝ සියල්ල එකතු වෙලා අපිව අන්දනවා, එහෙම නැත්නම් මහ ඇමතිතුමා අපිව අන්දනවා. මේවා සොයා බැලීමක් කරන්නේ නැතිව. ඒ නිසා දෙපැත්තම අපිව අන්දනවා. ඔබතුමන්ලාත් ඇත්තටම දන්නේ නැහැ. කවුරුත් දන්නේ නැහැ. මේක සොයා බැලීමක් කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපනය සඳහා ප්‍රධාන වියදම්වලින් 38% ක මුදල් ප්‍රමාණයක් වෙන් කර ගැනීම පිළිබඳව අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලිලා ඉන්න තැනැත්තෙක් හැටියට මම ඉතාමත් සතුටට පත් වෙනවා. නමුත් මේ 38% ක මුදල් ප්‍රමාණයක් වෙන් කර ගත්තත්, මේ ක්ෂේත්‍රය තුළ කිසියම් ආකාරයක සර්ව සුභවාදී ආකාරයට සිදු වෙනවාය කියලා අපට හිතා ගන්න බැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහ ඇමතිතුමා හිටියා නම් හොඳයි. මම මහ ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා, මෙතෙක් පාසල්වල මීට පෙර තිබුණු පාසල් හා සංසන්දනය කරන කොට වසර ගණනාවකට පෙර එක් පාසලක් ගත්තොත් එහෙම ඒ පාසල සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ දක්වා ඉතාමත් දීප්තිමත් ආකාරයෙන් ගිය යුගයක් තිබුණා. නමුත් මේ පෝෂිත පාසල් ක්‍රමය නිසා සමහර පාසල් මම හිතන්නේ, ඔබතුමන්ලාගේම ගරු මන්ත්‍රීවරයෙකුත් කිව්වා, මේ පෝෂිත පාසල් බිහි කිරීමත් සමගම සමහර ප්‍රදේශවල තිබෙන පාසල් දරුවන්ට ඉගෙන ගැනීමේ කාලය යොමු වෙලා තිබෙන්නේ හය වැනි ශ්‍රේණිය දක්වා පමණයි. ඒ නිසා හය වැනි ශ්‍රේණිය දක්වා ඉගෙන ගත්තාට පස්සේ එයින් එහාට යන්න - ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඔබතුමාට මම ඊයේ කියපු කරුණම අද කියන්න සිදු වෙනවා. ඔබතුමාගේ අදාළ අංශවලින් මේ සංවර්ධනය ප්‍රගතිය සහ ඉලක්ක කියන පොතේ සාමාන්‍ය පෙළ සමත් සංඛ්‍යාව හැටියට 2012 සඳහන් කරලා තිබෙන්නේ, 55.65% යි.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, මට පිටු අංකය කියන්න.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

පිටු අංක 15. ඒ වාගේම 2014 ඔබතුමාගේ කථාවේ 09 වන පිටුව. ඒකේ සඳහන් කරලා තිබෙන්නේ, සාමාන්‍ය පෙළ සමත් සංඛ්‍යාව 2012 දී 69% යි. එතකොට ප්‍රගතිය ලබා ගෙන තිබෙන්නේ, මේකේ සඳහන් කරනවා, 56.65% යි. එතකොට ඔබතුමා මෙවර ප්‍රකාශ කරන්නේ, 2012 දී 66.72% ක ප්‍රමාණයක් කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, අපි මේ ගත්තේ පළාත් පාසල් විතරයි.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

එතකොට මේ සමස්තය හැටියට ඒක සඳහන් කිරීමක් කරලා නැහැ. සොයා ගැනීමේදී අපට අපහසුවක් ඇති වෙනවා. (බාධා කිරීම්) එහෙම නම් ඔබතුමන්ලා කියන්න

මේ දෙකේ යන්නේ කොහොමද එහෙම නම්? මේකේ එතකොට කොහොමද වෙන්නේ?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඊයේ එක හරි. නමුත් අද දක්වන කරුණු දක්වා ඇති ආකාරය නිවැරැදියි.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

හරි. ඔබතුමා මේක වැරදියි කියන එක නිවැරදි කරනවා. එහෙම නම් කොහොමද මේ දෙක -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඊයේ ඔබතුමා කියපු කාරණාව පිළිගන්නවා.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒක තමයි. (බාධා කිරීම්) ගුරුවරයෙක් හැටියට ඇත්තටම අපි ඉතාමත් සතුටට පත් වෙනවා. ඔබතුමා වැනි මහාමාත්‍යවරයෙක් ඇත්තටම අධ්‍යාපනය වෙනුවෙන් විශාල කැප කිරීමක් කරනවා. අද පළාත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල පිබිදීමක් වෙලා තිබෙනවා. මේක ඔබතුමාට ආවැඩීමක් නොවෙයි. ගුරුවරයෙක් හැටියට මා දකින්නා වූ එක්තරා දෙයක්. නමුත් ඔබතුමා ඒ දක්වන ආකල්පය ඒ සඳහා පමණයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, අධ්‍යාපනය සඳහා පමණයි ඇත්තටම ඔබතුමාගේ අවධානය යොමු කිරීම සිදු කරන්නේ. ඒ වාගේම තමයි දැනුත් අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, එතුමා තමයි කාරක සභාවලදීත් අඩුම තරමින් කථා කරන්නේ. ප්‍රදේශයකට තවත් පළාත් පාසලක් ඇති කර ගෙන ඒක දියුණු කරන්න කියලා. හැබැයි, මම හිතන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මෙහෙම එක ප්‍රදේශයක එක පාසලක් පමණක් දියුණු කරන්න ගියොත් එහෙම සම්පත් බෙදීයාමකින් තොරව නැවත වතාවක් ඊට වඩා වැඩි ප්‍රමාණයක් - එහෙම නම් අපේ ප්‍රදේශවල තිබෙනවා, විශේෂයෙන් මහරගම කලාපය ගත්තොත් එහෙම මහරගම කලාපයේ තිබෙන සමහර පාසල් එදා ඉතාමත්ම දියුණු ලෙස තිබුණා. විශේෂයෙන් පමුණුව පොල්වත්ත මහා විද්‍යාලය. පමුණුව පොල්වත්ත මහා විද්‍යාලය කියන්නේ, උසස් පෙළ දක්වා ගිය පාසලක්. ඒවා කැඩිලා ගිහිල්ලා අද අපේ පළාත් සභාවේ ක්‍රීඩා පාසල බවට පත් කරලා තිබෙනවා. ඒ ආසන්නයේම තිබෙන අග්‍රාමාත්‍ය විද්‍යාලය. අග්‍රාමාත්‍ය විද්‍යාලයත් එපමණ දීප්තිමත්ව තිබුණු පාසල දැන් හය වැනි ශ්‍රේණිය දක්වා පමණයි තිබෙන්නේ. ඊට එහා පැත්තේ කිලෝ මීටර් බාගයක් යන්න ඉස්සෙල්ලා තිබෙනවා, දෙපානම ධර්මපාල කනිෂ්ටය. දෙපානම ධර්මපාල කනිෂ්ටය මේ අවුරුද්දේ නැත්නම් ලබන අවුරුද්දේ වන කොට හය වැනි ශ්‍රේණිය දක්වා යනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ප්‍රදේශවල ඉන්න ජනතාව ගත්තොත් එහෙම, මේ සමස්ත කොළඹ ප්‍රමාණයට වඩා ඔය ගම්බද ප්‍රදේශවල බහුතරයක් ඉන්නේ දෛනිකව යම් ආදායමක් ලබා ගෙන ජීවත් වන්නා වූ පිරිස්. එතකොට දැන් එක පාසලක් සංවර්ධනය කිරීමත් සමඟම ඒ පාසලට එකතු වන්නා වූ ප්‍රමාණය ගත්තොත් එහෙම - මහ ඇමතිතුමාට දෙන්න කියලා ලිපියක් තිබුණා. මම ඔබතුමාට කමිටු රැස්වීමේදී දෙන්නම්. දැන් ගත්තොත් වැතර මහා විද්‍යාලය. ඒ ආසන්නයේ තිබෙන සියලු පාසල් හය වන ශ්‍රේණිය දක්වා අඩු කරලා වැතර මහා විද්‍යාලයට ඒක එකතු කරලා තිබෙනවාලු. එතකොට දැන් වැතර මහා විද්‍යාලයට ඇතුළත් කර ගන්නා වූ ශිෂ්‍ය සංඛ්‍යාව අඩුයි. එතකොට අර ගම්බද පළාත්වල ඉන්න ළමයි, එතකොට අඩු දැනුමක් තිබෙන, බුද්ධි මට්ටමක් නැති දෙමව්පියන්ගේ දරුවෝ සමහර අවස්ථාවලදී හය වන ශ්‍රේණියෙන් එහා ඇතට යන්න උත්සාහයක් දරන්නේ නැහැ. ඒ නිසා අර තිබෙන පාසල නැවත වතාවක් දියුණු කරලා ඉවර වෙලා ඒක සමෘද්ධිමත් පාසලක් බවට පත් කරනවා නම්, මම හිතන්නේ ඒක වඩාත් සුදුසුයි කියලා. ඒ නිසා ඔබතුමාගේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියක කාලයක් ඔබතුමාට ලබා දෙන්න පුළුවන්.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඊයේ සිද්ධ වුණු දේම තමයි ගරු සභාපතිතුමනි. මම මහ ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. ගරු මහ ඇමතිතුමනි, මොන අධ්‍යාපනය ලබා දුන්නත් අපේ සියලුම අධ්‍යාපන කටයුතුවලින් අපි බලාපොරොත්තු වෙන්නේ, අපේ දරුවන්ගේ අනාගතය. අපි මාධ්‍ය ක්ෂේත්‍රය තුළ මම

[ ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර් ]

හිතන්නේ මම ගුරුවරයෙක් හැටියට භාෂා තුන පිළිබඳව, எனக்கு நன்றாக தமிழில் கதைக்க இயலும் ஆனால் Fluwent இல்லை. I can talk in English also. මට භාෂා තුන හසුරවන්න පුළුවන්. ඒ නිසා මම දන්නවා මට කොළඹ ඉන්න உங்களுக்கு கொஞ்சம் தான் தெரியும், எனக்கு நன்றாகத் தெரியும், அப்படிதான். එතකොට මට දැන් යාපනයට ගියාම ඇත්තටම මට භාෂා ගැටළුව ඇති වෙන්නේ නැහැ. ඒ නිසා මම ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මොන බස තිබුණත් වැඩක් නැහැ ජාත්‍යන්තරයත් එක්ක හැප්පෙන්න - අද මම පුද්ගලික ක්ෂේත්‍රයේ ඉංග්‍රීසි උගන්වන ගුරුවරයෙක් හැටියට, ව්‍යාපාර අධ්‍යයනය උගන්වන ගුරුවරයෙක් හැටියට සුවිශාල ළමයි සංඛ්‍යාවක් මා අසළ ඉන්නවා. ඒ සියල්ලම ඉන්නේ, උසස් පෙළ සහ සාමාන්‍ය පෙළ පිට වුණාට පස්සේ - දැන් උපාධිධාරීන්ට රැකියා ලබා දෙනවා. නමුත් සාමාන්‍ය පෙළ සමත් සහ සාමාන්‍ය පෙළ අසමත්, උසස් පෙළ - විශ්ව විද්‍යාල සඳහා යන්න බැරි වුණු ළමයින්ට රැකියා සඳහා අවස්ථාවක් ලබා දෙන්නේ නැහැ. ඒ නිසා ගරු මහ ඇමතිතුමනි, ඒ සඳහා අවධානය යොමු කරනවා නම් පාසල් පදනමින් හරි මේ දරුවන්ගේ ඉංග්‍රීසි අධ්‍යාපනය - විශේෂයෙන්ම ඉංග්‍රීසි කථා කරන සහ අකුරු ලිවීමේ හැකියාව පිළිබඳව වැඩි අවධානයක් යොමු කරනවා නම් මම හිතන්නේ, ඒ ළමයින්ට රැකියා සොයා ගැනීමේ අවස්ථාව පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්න පුළුවන්.

ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උපාධිධාරී ඉංග්‍රීසි ගුරුවරුන් බොහෝ විට අඩු වැටුපකට මේ ක්ෂේත්‍රයේ නියැලිලා ඉන්නේ නැහැ. මොකද, ඊට වඩා රු. 70,000/- ක් 80,000/- ක් ගන්න පුළුවන්කමක් තිබෙන්නා වූ පැතිකඩ තිබෙද්දී මේකේ රැඳිලා ඉන්නේ නැහැ. ඒ නිසා මේ පිළිබඳව අවධානය යොමු කරන්නය කියලා ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම මම හිතන්නේ මේ අලුතෙන් එන සභායක රු. 9,500 ක වාගේ පඩියකින් සාරි ටිකවත් ගන්න මදී.

ඒ නිසා අවසාන වශයෙන් මට කථා කරන්න තිබෙන්නේ. මම කථා කරන්න සිටියා ඔබතුමා යටතේ තිබෙන පළාත් පාලන ආයතන පිළිබඳව. ගරු මහ ඇමතිතුමනි, පළාත් පාලන ආයතන තිබෙනවා. මහරගම නගර සභාව සහ ඒ ආසන්නයේ තිබෙන්නා වූ සියලු දේවල් පිළිබඳව කථා කරන්න විශාල වුවමනාවක් තිබෙනවා. නමුත් කරන්න පුළුවන්කමක් නැහැ. ගරු මහ ඇමතිතුමනි, ගිය සතිය වන කොට මහරගම නගර සභාවේ සභාපතිවරිය නැහැ. උප සභාපතිවරයා නැහැ. මන්ත්‍රීවරු නැහැ. වෙන එකක් තියා විපක්ෂ නායකතුමාත්. මේ සියලු දෙනාම චීනයේ ගිහිල්ලා. කිසිම කෙනෙක් නැහැ. මේ පිළිබඳව සොයා බලන්න.

ගරු මහ ඇමතිතුමනි, අවසාන වශයෙන් මේ තිබෙන්නේ මහරගම නගර සභාවේ පොළ හදන්න, තට්ටු 05 ක ගොඩනැගිල්ල හදන්න යෝජිත පොත. එකක් මම මේ කියන්නේ. මම ඔබතුමාගේ අධ්‍යාපන රැස්වීමේදී කියන්නම්. මේ සඳහා වියදම් කරලා තිබෙනවා, රුපියල් හතලිස් දාහකට කිට්ටු වෙන්න වාගේ. දැන් මේ සියල්ලම නතර කරලා, (බාධා කිරීම්) අධ්‍යාපනය නොවෙයි. මේ පළාත් පාලන තිබෙනවා නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒ නිසා ගරු මහ ඇමතිතුමනි, දැන් ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍යාංශයෙන් ඒ සියල්ලම අයින් කරලා පොළක් හදනවා. මම ඊයෙත් කිව්වා, ඔබතුමා අධ්‍යාපනය වෙනුවෙන් විශාල කැප කිරීමක් කරනවා. නමුත් අනික් දේවල් පිළිබඳව අධීක්ෂණය කරන්නේ නැහැ. අද පළාත් පාලන ආයතනයකට ඇතුළු වුණු ගමන් ඉඳන් ඉහළට යන කල්ම සූරා කෑමේ තත්ත්වයට පත්වෙලා තිබෙන්නේ. මේ අවස්ථාව ලබා දීම ගැන ස්තූතියි.

[ අ.භා. 12.35 ]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉතාමත්ම ආඩම්බර වෙනවා මගේ පළාත් සභා ජීවිතයේ හය වැනි අයවැය විවාදයට සම්බන්ධ වෙන්න ලැබීම පිළිබඳව. මම මුලින්ම සතුටට පත් වෙනවා. ඒ වාගේම අද මම බොහොම ආදරය කරන, ගරු කරන කළුතර දිස්ත්‍රික්කය වෙනුවෙන් දැවැන්ත කැපවීමක් කරපු ගරු අමාත්‍යවරයකුගේ විෂය පිළිබඳව කථා කරන්න ලැබීම පිළිබඳවත් ඉතාමත්ම ආඩම්බර වෙනවා. මෙහිදී මම විශේෂයෙන්ම අධ්‍යාපන විෂය පිළිබඳවත්, පළාත් පාලන විෂය පිළිබඳවත් කථා කරන්න

බලාපොරොත්තු වෙනවා. ඊට ප්‍රථම මම හිතන්නේ, අපේ හිතවත් විරුද්ධ පක්ෂයේ එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමාත්, ඒ වාගේම මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාත් පිළිබඳව මම ඉතාමත්ම කනගාටු වෙනවා. ඔවුන් කරපු ප්‍රකාශයන් පිළිබඳව. ඒ ප්‍රකාශයන්වලදී විශේෂයෙන්ම මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා බේරුවල ආසනයේ ඇති වුණු අවාසනාවන්ත තත්ත්වය පිළිබඳව බොහොම වැරදි ප්‍රකාශයක් ඉදිරිපත් කළා. ඒ නිසා මම එතුමාට මගේ විරෝධතාවය, බේරුවල ආසනයේ ජනතාව වෙනුවෙන්, සිංහල - මුස්ලිම් ජනතාව වෙනුවෙන් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම දහම් පාසල් ගුරුවරුන් මේ දරුවන්ට දැනුම, කුසලතා, ආකල්ප බෙදලා දීලා ස්වේච්ඡාවෙන් සියලු කැපවීම් කරන ගුරුවරුන් පිළිබඳව අපේ එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශය පිළිබඳවත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා. මොකද, මෙවැනි අසත්‍ය ප්‍රකාශ හා අභූත චෝදනා ඉදිරිපත් කිරීම සම්බන්ධව -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මොකක්ද අසත්‍ය?

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු මහ ඇමතිතුමනි, ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා මට ඔබතුමාගේ අවධානයට යොමු කරන්න අවශ්‍යතාවයකුත් තිබෙනවා. මොකද, අපි මේ පළාත් සභාවේ විවිධ මන්ත්‍රීවරු දකිනවා. මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු අතර අපි මල් වත්තේ සර්පයන් දකිනවා. උඩින් හරි සුන්දරයි. යටින් ඉතාමත්ම භයානකයි. අන්න එවැනි මට්ටමේ සර්පයන්ව මේ විවාදය තුළ අපට දක්නට ලැබෙනවා. ඒ නිසා ඉතාමත්ම ප්‍රවේසමෙන් මේ අයගෙන් ප්‍රවේසම් වෙලා ඉන්න ඕනෑ කාල වකවානුව ඇවිල්ලයි කියලයි මගේ නම් අදහස.

අද අපි කළුතර දිස්ත්‍රික්කය දිහා අරගෙන බැලුවාට පස්සේ, අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තාට පස්සේ කළුතර දිස්ත්‍රික්කයේ අපේ පාසල් 389 ක් තිබෙනවා. දරුවන් එක් ලක්ෂ හැට නව දහස් අටසිය අනූ හතක් මේ පාසල් තුළ අධ්‍යාපනය ලබනවා. ඒ නිසා අපි පැහැදිලිවම දන්නවා. ඒ පාසල් පද්ධතිය තුළ ඉතාමත්ම දැවැන්ත සංවර්ධනයක් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම ඒ දරුවන්ගේ ඉහළ ප්‍රතිඵල ලබා දීමට මම හිතන්නේ, අපි ගරු ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමාගේ මේ කාල වකවානුව තුළ හැකියාව ලැබිලා තිබෙනවා. එහිදී මම එක උදාහරණයක් කියනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ පාසල අපේ දෑතින් සුරකිමු කියන වැඩ සටහන හරහා මිලියන 160.97 ක් කළුතර දිස්ත්‍රික්කයට වියදම් කරලා තිබෙනවා. ඒ නිසා අපි දන්නවා. අපේ පාසල අපේ දෑතින් සුරකිමු කියන වැඩ සටහන පිළිබඳව අපේ ගරු මන්ත්‍රීවරු, මම හිතන්නේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු ඉතාමත්ම හොඳ සාර්ථකව ඒ වැඩ සටහන පිළිබඳව ප්‍රකාශයන් කරනවා.

ඒ වාගේම තමයි අද අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි මේ කාලයක් තිස්සේ තිබුණු, 1977 සිට අපේ සදාචාරය, ඒ වාගේම අපේ පාසල් පද්ධතියේ තිබුණු විනය මේ සියල්ල මම හිතන්නේ මේ පාසල් පද්ධතිය තුළ ඈත් වෙලා තිබුණා. ඒ නිසා සරුදම් අරුණැල්ල කියන වැඩ සටහන හරහා දහම් පාසල්වලට, මේ සරුදම් අරුණැල්ලෙන් මුදල් ලබා දීලා ගරු ප්‍රධාන අමාත්‍යතුමා මම හිතන්නේ, ඉතාමත්ම හොඳ පුණ්‍යකර්මයක් කර ගත්තාය කියලයි මගේ අදහස. මම ඒකට පුංචි උදාහරණයක් කියන්නම්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද වන කොට ලංකාවේ වැඩිහිටි නිවාස සංඛ්‍යාව 8470 ට වඩා ඉහළ ගිහිල්ලා තිබෙනවා. මේ වැඩිහිටි නිවාසවල ඉන්නේ දරුවන් නිර්මාණය කරපු ආදරණීය රත්තරන් අම්මලා තාත්තලා. අද ඒ අම්මලා තාත්තලා ඉතාමත්ම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපි එක වැඩිහිටි නිවාසයක අම්මලා තාත්තලා දහ දෙනෙක් ගත්තොත් 8470 වැඩි කිරීම 10 මොන තරම් සංඛ්‍යාවක් ලියාපදිංචි වැඩිහිටි නිවාසවල අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවාද? ඒ වාගේම සුපිරි විධියට ජීවත් වන නිවාසවල දරුවන්ගේ එක කාමරයක් ඒ අහිංසක අම්මා තාත්තාට වෙන් වෙලා වැඩිහිටි නිවාසයක් වෙලා තිබෙන ඒ කාමර සංඛ්‍යා කීයක් තියෙනවාද? ඒ විධියට ගත්තාට පස්සේ අද අපේ පාසල් පද්ධතිය තුළ විතරක් නොවෙයි, අද අපි තුළින් මෙන්න මේ සදාචාරය, ඒ වාගේම ආදරය කරුණාව දයාව මේ සියල්ලම ඈත් වෙලා තිබෙන යුගයක තමයි සරුදම් අරුණැල්ල කියන වැඩ සටහන නිර්මාණය කරන්නේ. ඒ තුළින් ගරු ප්‍රධාන අමාත්‍යතුමා බලාපොරොත්තු වෙන්නේ ඉතාමත්ම හොඳ සත්කාර්යයක්. මම හිතන්නේ, ඒ කාර්ය තුළ අපට පුළුවන් වෙනවා, තවත් වැඩිහිටි නිවාසයක් ඇති වන එක වළක්වලා මේ දරුවන්ට දහම් අධ්‍යාපනය පිළිබඳව වඩාත් හොඳ අවබෝධයක් ලබා

[ ගරු පියල් නිශාන්ත ]

දීලා, මේ ක්ෂේත්‍රය තුළ හොඳ ප්‍රගතියක් ඇති කර ගන්න වාගේම ඉතාමත්ම හොඳින් මේ කටයුතු පිළිබඳව දරුවන්ට අවබෝධ කරලා දෙන්න.

ඊළඟට මම විශේෂයෙන්ම කථා කරන්න බලාපොරොත්තු වෙනවා, අපි ගත්තාට පස්සේ දැනට කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රතිඵලත් එක්ක බලන කොට අද දරුවෝ ශිෂ්‍යත්ව ප්‍රතිඵල, සාමාන්‍ය පෙළ ප්‍රතිඵල, ඒ වාගේම උසස් පෙළ ප්‍රතිඵල මම හිතන්නේ ඉහළ මට්ටමට අරන් ගිහිල්ලා තිබෙනවා. එයට මම හිතන්නේ ලොකු කැපවීමක් කළා. මොකද, මේ දරුවන්ට භෞතික සම්පත විතරක් ලබා දීලා මදි. මේ දරුවන්ට ගුරු සම්පතත් ලබා දෙන්න ඕනෑ. ඒ නිසා භෞතික සම්පත් ලබා දෙනවා වාගේම පාසල් තුළට ගුරු සම්පත වැඩි වශයෙන් ලබා දුන්නා. ඒ නිසා මම ආඩම්බර වෙනවා. බේරුවල ආසනය කියන්නේ, අධ්‍යාපන කොට්ඨාශ මට්ටමෙන් ගත්තාට පස්සේ පසුබටම අධ්‍යාපන කොට්ඨාශයක් හැටියට තිබුණේ. අද ඉහළ ප්‍රතිඵල ලබා දෙන්න අපේ බේරුවල ආසනයට හැකියාව ලැබිලා තිබෙනවා. ඒ අතර ළමයින් 243 ට සීමා වුණු ඤානිස්සර රාජකීය විද්‍යාලය, ඉතිහාසයේ මහා දැවැන්ත පාසලක් බවට මුළු ලංකාවේම ප්‍රසිද්ධියට පත් වුණු පාසල අවසානයේ ළමයි 243 කට කඩා වැටුණා. නමුත් අද වන කොට ළමයින් 3000 කට වැඩි සංඛ්‍යාවක් ඒ පාසල තුළ ඉන්නවා. ඉතාමත්ම ඉහළ ප්‍රතිඵල ලබනවා. වැහෙන්න ගියපු බේරුවල ආසනයේ මහ ගම්මැද්ද පාසල. ඒ වාගේම වේරගල පාසල. ඒ වාගේම දූවේගොඩ පාසල. මෙවැනි පාසල් නගා සිටුවලා ඒවාට අවශ්‍ය කරන ගුරු සම්පත, භෞතික සම්පත ලබා දීලා අද ඉතා විශාල දරුවෝ පිරිසක් අධ්‍යාපනය ලබන පාසල් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි පැහැදිලිවම දන්නවා, මෙවැනි ආකාරයෙන් තමයි අපේ අධ්‍යාපන අමාත්‍යතුමා සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉන්න නිලධාරීන් කටයුතු කළේ. ඒ නිසා අපි බේරුවල ආසනය ප්‍රමුඛ කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවගේ සහ ඒ පාසල් පද්ධතියේ ඉන්න සියලු දෙනාගේ ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ වාගේම විභාග ගැන ගත්තාට පස්සේ, ශිෂ්‍යත්ව විභාගය පිළිබඳව මගේ පෞද්ගලික කැමැත්ත තමයි මේ විභාගය මම හිතන්නේ ඉතා ඉක්මණින් අවසන් කරන්න ඕනෑ කාලය ඇවිල්ලා තිබෙනවා. මේ ශිෂ්‍යත්ව විභාගය නිසා දරුවන්ගේ ළමා කාලය අද නැත්තට නැති වෙලා තිබෙනවා. දරුවන්ගේ ළමා කාලය අද දරුවන්ට අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා මේ ශිෂ්‍යත්ව විභාගය පිළිබඳව මම හිතන්නේ හොඳ අවබෝධයකින් කටයුතු කරලා, මේ විභාගයේ සංශෝධනත් එක්ක මම හිතන්නේ, ශ්‍රේණි වෙනසක් ඇති කරලා, මේ විභාගය පවත්වනවා නම් ඒකට උපදෙස් මම හිතන්නේ, අපේ පළාත් සභාව තුළින් මහ ආණ්ඩුවට ලබා දෙනවා නම් එය ඉතාමත්ම හොඳයි කියලයි මගේ අදහස වන්නේ.

ඒ වාගේම අද වන කොට ඉතාමත්ම අසරණ තත්ත්වයේ හිටපු වැඩ බලන විදුහල්පතිවරු ස්ථිර කරන්න අතිගරු ජනාධිපතිතුමා ගත්ත ඒ වැයම, එයට ශක්තිය දුන්න මහ ඇමතිතුමා පිළිබඳව කළුතර දිස්ත්‍රික්කයේ අපේ වැඩ බලන විදුහල්පතිවරු වෙනුවෙන් මගේ ප්‍රණාමය අපි මේ අවස්ථාවේදී පුද කර සිටිනවා. ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තවමත් මම ගුරුවරයකු හැටියට තමයි මගේ සේවය ලබා දෙන්නේ. මොකද, මම වෘත්තීය ගුරුවරයෙක් හැටියට තවමත් ගුරු වෘත්තියෙන් අයින් වෙලා නැහැ. ඒකට හේතු කිහිපයක් තිබෙනවා. මේ අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා දක්වන සහයෝගයට විශේෂයෙන්ම ගුරුවරු වෙනුවෙන්, දරුවන් වෙනුවෙන්, දෙමව්පියන් වෙනුවෙන් මගේ ගෞරවනීය ප්‍රණාමය, ස්තූතිය පුද කර සිටිමින් විශේෂයෙන්ම මම නැවතත් කියනවා. මේ මල් වත්තේ සර්පයින්ගෙන් අපට ප්‍රවේසම් වෙන්න ඕනෑ කාලය ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා අපි මේ අවස්ථාවේදී කියා සිටිනවා, මේ බස්නාහිර පළාත් සභාවේ ශක්තිය මෙවර මැතිවරණයේදී අතිගරු ජනාධිපතිතුමාට ලබා දීලා, මේ රට තුළ අති දැවැන්ත ජයග්‍රහණයක් ලබා දීමට අපි කටයුතු කරනවාය කියන එකත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[ අ.භා. 12.46 ]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හය වන පළාත් සභාවේ අධ්‍යාපන, පළාත් පාලන ඇතුළු වැය ශීර්ෂ සම්බන්ධව අයවැය විවාදයේදී කථා කරන්න ලැබීම මම භාග්‍යයක් කොට සලකනවා. මම පළාත් සභාවේ ගත කළ කාල සීමාව තුළදීම මේ විෂය සම්බන්ධව හැම වර්ෂයකදීම මම කථා කරලා තිබෙනවා. ඇත්තටම අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව අපි කථා කරනවා නම්, අපට ගොඩක් දේවල් කථා කරන්න පුළුවන්. කැලණිය, බියගම, මහර, වත්තල කියන පළාතටම

ඉන්න එකම විපක්ෂ මන්ත්‍රීවරයා වශයෙන්, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයා වශයෙන් ව්‍යුහ කමිටු රැස්වීම්වලට මම වසර ගණනේ මාස ගණනේ සහභාගී වන මන්ත්‍රීවරයෙක්. මොන තරම් බාධක තිබුණත්, මොන තරම් පහසුකම් අපට නොදුන්නත්, ප්‍රතිපාදන නොදුන්නත් ඒ අධ්‍යාපන ක්ෂේත්‍රයට තිබෙන ආදරය නිසා ගුරු පවුලකින් එන පුතෙක් වශයෙන් මම සහභාගී වෙන්නේ ඉතාම සන්තෝෂයෙන්. ඒ වාගේම උපදේශක කාරක සභාවටත් ඒ ආකාරයෙන්මයි.

කෙසේ වෙතත් අද බස්නාහිර පළාත් සභාවේ පාලනය වන අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ කථා කරද්දී, ශිෂ්‍යත්ව ප්‍රතිඵල බැලුවොත්, අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල බැලුවොත්, අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල බැලුවොත් අද බස්නාහිර පළාත කියන්නේ, ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම ජනතාවක් ඉන්න නාගරික ප්‍රදේශයක් වුවත්, අපි යම්කිසි උසස් මට්ටමක නැති බව මේ වෙලාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. කෙසේ වෙතත් ඒකට පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා යම් යම් නම්වලින් කියපු ආකාරයට, "අපේ පාසල අපේ දෑතින් සුරකිමු" වාගේ යම් යම් නම් දාගෙන දේවල් කළත්, යම් යම් නිලධාරීන්ගේ තිබෙන වැරදි නිසා තමයි මේ දේ වෙන්නේ කියන එක මම කිසිම හයක් සැකක් නැතිව කියනවා. මේක හය වෙන්න ප්‍රශ්නයක් නොවෙයි. අද අධ්‍යාපන ක්ෂේත්‍රයේ කඩා වැටීමට හේතුව මොකක්ද? යම් යම් උදවිය වැඩ බලන නිලධාරීන් බවට පත් වෙලා, සමහර අය මීනුවන්ගොඩ කලාපවලින් එළවලා, කැලණියේ ගුරුකුල විද්‍යාලයෙන් එළවලා, ඒ වාගේම තර්ස්ටන් විද්‍යාලයෙන් ගහලා එළවලා, ඒ විතරක් නොවෙයි, ඒ තිබෙන පරිගණක යන්ත්‍ර පවා ගලවා ගෙන ගිය උදවිය අද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක තනතුර පවා දරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මම දන්නේ නැහැ ගරු සභාපතිතුමනි, ඒක ස්ථිර පත්වීමක් ද කියලා ගරු මහ ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි. කෙසේ වෙතත් ඒ තනතුරේ තිබෙන නම්බුව අනුව, ඒ විනය, යම්කිසි ක්‍රියා පිළිවෙත අනුව තමයි මේ ඔක්කොම දේවල් කඩා වැටීම බවට පත් වෙන්නේ. මේ නිසා තමයි මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට එක නීතියක්. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට තව නීතියක්. ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේක පෞද්ගලිකව දන්නවා. කෙසේ වෙතත් මේ අයවැය විවාදයේදී මම එදත් කිව්වා, මේ සම්බන්ධව කථා කරනවා කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපනය කියන්නේ හරිම වටිනා දෙයක්. ඒ නිසා තමයි අපි ඒ පළාත් සභා ප්‍රතිපාදනවලින් වැඩි ප්‍රතිශතයක් අපට පුළුවන් ශක්තිය අනුව මම විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් අධ්‍යාපනයට වෙන් කරන්නේ. කෙසේ වෙතත් අපට යම් යම් තැන්වලින් කුඩම්මාගේ සැලකිලි දක්වන ආකාරය අපි කාලයක ඉඳන් දැක්කා. ඒත් මේ වසරේදී අපි කියන්න ඕනෑ. ශිෂ්‍යත්ව වැඩ පිළිවෙළ තුළ පෙරහුරු වැඩ සටහන්, ඇගයීම් වැඩ සටහන් පවත්වන මන්ත්‍රීවරයෙක් වශයෙන් වසර ගණනාවක්, වසර 15 ක කාලයක සිට මුදල් වෙන් කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් මේ වසරේදී මට ලැබුණු අත්දැකීම් මේ සභාවේදී මම බෙදා ගන්න කැමැතියි. මම විශාල මුදල් ප්‍රමාණයක් මේකට වෙන් කරනවා. කෙසේ වෙතත් අන්තිමට මේ වසරේදී මගේ ශිෂ්‍යත්ව පෙරහුරු පොත විභාගයට සුමාන දෙකකට, තුනකට ඉස්සෙල්ලාවත් නිර්මාණය කර ගන්න බැරි තත්ත්වයට පත් වුණා. මම කලාප අධ්‍යක්ෂතුමියටවත්, උපදේශක මණ්ඩලයටවත්, නැත්නම් ගුරු උපදේශකවරුන්ටත්, නැත්නම් කොට්ඨාශ අධ්‍යක්ෂවරුන්ටවත් දෝෂාරෝපණය කරන්නේ නැහැ. මම කෙළින්ම දෝෂාරෝපණය කරන්නේ විමල් ගුණරත්න කියන පළාත් අධ්‍යක්ෂතුමාට. මම ජරාවල් අතේ ගා ගත් මන්ත්‍රීවරයකු නොවෙයි. මම චරිතය සවුත්තු කර ගත් මන්ත්‍රීවරයකු නොවෙයි. මම කෙළින් කථා කරන්න පුළුවන් මන්ත්‍රීවරයෙක්. ඒ කෙසේ වෙතත් මට ඒ අවස්ථාව කර ගෙන යන්න බැරි වෙන කොට මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කථා කළා. මට මේ දේ කර ගන්න බැරිව යනවා. මම හොඳ දෙයක් කරන්නේ. මේ පළාතේ ශිෂ්‍යත්ව ප්‍රතිඵල නංවන්න කරන ප්‍රතිඵලයක් වශයෙන් මේ දේ කරන්නේ. ඒත් එතුමා මට දුන්න උත්තරය මොකක්ද? ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාගේ ඡායාරූප දාන්න බැහැ. මම කිව්වා, මට ඡායාරූප දාන්න ඕනෑ නැහැ. මට පොත ගහලා දෙන්න කියලා. පොත නිර්මාණය කරලා දෙන්න. මගේ ප්‍රතිපාදන කියලා ඕනෑ නම් නම විතරක් දාන්න. අන්තිම මොහොතේ කොහොම හරි මගේ වසර 15 ක පමණ සිට තිබුණු ඡායාරූප නැති කරලා, අන්තිම මොහොතේ ඒ පොත නිර්මාණය කරලා දුන්නා. මම බෙදුවා. ඒත් මට එක නීතියක්. මේ උදවියට තව නීතියක්. මේවා කාගේද? මේ ඊයේ පෙරෙයිදා වුණු දේවල්. මේ අධ්‍යක්ෂතුමා දැන ගන්න. එක එක හැන්දෙන් බෙදන්න එපා, මේ වාගේ දේවල්වලට. මේක මම මෙතුමාට කරන්නේ නැහැ. මේ කරන්නේ පළාත් අධ්‍යක්ෂතුමාට. ඒ අය අධ්‍යාපනය නොවෙයි, දේශපාලනය කරන්නේ. පෞද්ගලිකව මේක කියවලා බලන්න. පළාත් සභා ප්‍රතිපාදන කියලා තිබෙනවා. පළාත් සභා ප්‍රතිපාදන කියලා

[ ගරු යූ. ජෝර්ජ් පෙරේරා ]

කෙළින්ම තිබෙනවා. මේ විධියට වෙනවා නම්, අපි දකිනවා ඉදිරියට මොකක්ද මේකේ වෙන්නේ? අපි පළාත් පාලන ක්ෂේත්‍රයේ බැලුවාම (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව අවසන් කරන්න. තව විනාඩියක්, දෙකක් දෙන්න පුළුවන්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දැක්කා, පළාත් පාලන මන්ත්‍රීවරුන්ට මෝටර් සයිකල් දෙන්නය කියලා චක්‍රලේඛයක් ආවා. ඒත් ආණ්ඩු පක්ෂයේ උදවියට දුන්නා. අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට ඒ දේ හම්බ වුණේ නැහැ. මේ දේ තුළින් අපි දකින්නේ, මේ ඒකාධිපති පාලනයක් යන්නේ. ඒකාධිපති ක්‍රමයක් ගෙනි යන්නේ. ඒකට විරුද්ධව තමයි අද මෛත්‍රී පාලනයක් ඇවිල්ලා තිබෙන්නේ. චන්ද්‍රිකා මැතිනිය, මෛත්‍රීපාල සිරිසේන, රනිල් වික්‍රමසිංහ, සරත් ෆොන්සේකා මැතිතුමා, අර්ජුන රණතුංග, මනෝ ගනේෂන්, ඉදිරියට එන අපේ උදය ගම්මන්පිල මැතිතුමා ඇතුළු සියලු දෙනා ඇවිල්ලා මේ මෛත්‍රී පාලනයක් කරන වෙලාවේදී මම තමුන්නාසේලාටත් ආරාධනා කරනවා -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඇයි? ටී.එන්.ඒ. එකත් ඉන්නවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

මේ වාගේ නැතිව (බාධා කිරීම්) මින් ඉදිරියටත් මේ පළාත් සභාවේත් මෛත්‍රී පාලනයක් කරන්න තමුන්නාන්සේලාගේ සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරමින් මම නිහඩ වෙනවා.

[ අ.භා. 12.54 ]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශීර්ෂ අංක 104, 109 සිට 115 දක්වා වූ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයන් යටතේ කථා කිරීමට, අදහස් ප්‍රකාශ කිරීමට කාල වේලාව වෙන් කර දීම සම්බන්ධව මම ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම වැය ශීර්ෂය නැවත කථා කිරීමට අදහස් කළේ විශේෂයෙන්ම අධ්‍යාපනය පිළිබඳව වූ වැය ශීර්ෂයන් යටතේ, ශීර්ෂ අංක 111 යටතේ. මම එසේ අදහස් කරන්න හේතුව වුණේ, පසුගිය දවස්වල මම අධ්‍යාපන අමාත්‍යාංශයේ විවිධ වූ විෂය ධාරාවන් පිළිබඳව කළ අධ්‍යයනයන් අනුව අනාගතයේදී මෙම පළාත් සභාව තුළ කෙරෙන ක්‍රියාවලියේදී අප විසින් ව්‍යුහ කමිටු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරන තොරතුරු සම්පාදනය කර ගැනීම සහ එම ව්‍යුහ කමිටු තුළින් අපේක්ෂා කරන අරමුණු ජයග්‍රහණය කර ගැනීමට කළ යුතු කාර්යභාරය පිළිබඳව යම් පැහැදිලි කිරීමක් කිරීමේ අපේක්ෂාවෙන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය දවස්වල අපට දක්නට ලැබුණු කාරණාවක් තමයි, බස්නාහිර පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන විධිමත් පාසල් සංඛ්‍යාව 1269 ක්. මේ පාසල් අතර නිතර මතු වුණු කාරණාව තමයි පාසල්වල සීමාවන් පිළිබඳව මතු වුණු ගැටළුව. අද වන කොට අපට විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. පාසල්වලට අයත් ඉඩකඩම් පිළිබඳව, මේ ඉඩකඩම්වල සීමාවන් පිළිබඳව, සීමාවන් නිර්ණය කර ගැනීමේ නොහැකියාව තුළ විදුහල්පතිවරුන්, ආචාර්ය මණ්ඩලය සහ ගම්මුන් අතර ඇති වෙලා තිබෙන යම් යම් ප්‍රශ්න. මේ ප්‍රශ්න නිරාකරණය කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක නොවීම නිසා ඇති වෙලා තිබෙන අර්බුදකාරී තත්ත්වයන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සාමාන්‍යයෙන් අපි පවුලක් වුණාම පවුලකට සීමා වුණු ඉඩකඩ ප්‍රමාණයක් භූමියේ තිබෙනවා. එය පර්චස් 10 ක් වෙන්න පුළුවන්. 5 ක් වෙන්න පුළුවන්. ඒ පර්චස් 10 සීමාවේ යම් කෙනෙක් වැරදි විධියට පරිහරණය කරනවාය කියලා අල්ලපු ඉඩම් හිමියා දැක්කොත් එහෙම ඉතාම තදින් හදවතට වේදනාවක් ඇති වෙනවා. අපි ඒ පිළිබඳව තමන්ගේ බලය ප්‍රකාශ කරලා, එය නිවැරදි කර ගන්න උත්සාහ කරනවා. බැරි වුණොත් පොලීසියට යනවා. එහෙමත් බැරි වුණොත් අධිකරණය ඉදිරියට යනවා. තමන්ගේ සීමාව නිරවුල් කර ගන්න. ඇයි එහෙම කරන්නේ? සමහර අය අහනවා, ඔය බිම් අඟලට දඟලන්නේ පෙට්ටියේ දාගෙන යන්නද කියලා. නමුත් ඒ අම්මාට තාත්තාට හැඟීමක් තිබෙනවා. මගේ දරුවන්ට මේ භූමිය හිමියි. මගේ පරපුරට මේ භූමිය හිමියි.

මේ පරපුරේ අර නිදහස් නිවහල් දරුවකු හැටියට මගේ දරුවා ජීවත් වෙන්න නම් මේ භූමියේ සීමාව නිරවුල් කරලා දිය යුතුයි කියන අදහස අපි කාගේත් යටි සිතේ තිබෙනවා. ඒ නිසා ඒ සඳහා ඉදිරිපත් වෙනවා.

ඒ වාගේම මේ පාසලේ සීමාවත් නිර්ණය කිරීම ඉතාමත් වැදගත් කාරණාවක්. මම කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ, පසුගිය දවස්වල පානදුර දියමන්ති ජුබිලිය විද්‍යාලයේ, මේ පාසලේ භූමි සීමාව පිළිබඳව ඇති වුණු ගැටළුවක් නිසා ඒ විදුහල්පතිනියට විරුද්ධව මහා පිකටිං ව්‍යාපාරයක් ක්‍රියාත්මක වුණා. විශාල අර්බුදයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ළඟට වෙන කල් මේ ප්‍රශ්නය ආවා. අවසානයේ ඒ භූමියේ සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කරලා අද වන කොට මේ සීමාව නිරවුල් කර ගෙන තිබෙනවා. මෙය විදුහල්පතිවරුන් විසින්ම කළ යුතු කාරණාවක් නොවෙයි. අප විසින් මේ සඳහා මැදිහත් විය යුතුයි. පෞද්ගලික අංශයේ ආධාර උපකාරත් ඇතිව. අපි හඳුනාගෙන තිබෙන අපේ පාසල් පද්ධතියේ පාසල් 1269 ක් වූ පාසල්වල සීමාවන් පිළිබඳව නිර්ණයක් කරලා එය නිරවුල්භාවයට පත් කිරීම ඉතා වැදගත් කාරණාවක් හැටියට මා පෙන්වා දෙන්න කැමැතියි.

ඒ වාගේම අපි සියලු දෙනාටම අද දවසේ තිබෙන වැදගත් කාරණයක් තමයි මේ පාසල් පද්ධතියේ භෞතික සම්පත් සම්පාදනය. අපි විවිධ ආකාරයෙන් මුදල් ප්‍රතිපාදන මේ සඳහා යොමු කෙරෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පාසලක් වුණාම අපි මේ සම්පත් ඉල්ලා සිටීමේදී යම් ප්‍රමිතියක් තිබෙන්නට ඕනෑ. පාසලේ කොපමණ භූමි ප්‍රමාණයක් තිබෙනවාද? පාසලේ කොපමණ ගොඩනැගිලි ප්‍රමාණයක් තිබෙනවාද? මේ ගොඩනැගිලි ප්‍රමාණය තුළ කොපමණ වර්ග අඩි ප්‍රමාණයක් තිබෙනවාද? ඒ වර්ග අඩි ප්‍රමාණයෙන් කොපමණ ප්‍රමාණයක් විදුහල්පතිවරයාගේ කාර්යාලය සඳහා අවශ්‍යද? ගුරු විවේකාගාරය සඳහා අවශ්‍යද? එහෙම නැත්නම් පුස්තකාලය සඳහා කොපමණ අවශ්‍යද? වෙනත් වෙනත් විවිධ ක්‍රියාකාරකම් සඳහා කොපමණ වර්ග අඩි ප්‍රමාණයක් අවශ්‍යද? ඉන් අනතුරුව පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද? ශිෂ්‍ය සංඛ්‍යාවට අනුව යුනිසෙෆ් ආයතනය මගින් දැනට නිර්ණය කර ඇති එක් දරුවෙකු සඳහා අවශ්‍ය කරන වර්ග අඩි ප්‍රමාණය වර්ග අඩි 10 ක්. ඒ ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම තුළ මේ වර්ග අඩි ප්‍රමාණය මේ පාසල තුළ තිබෙනවාද? මේ පිළිබඳව පැහැදිලි අධීක්ෂණයක්, නිරීක්ෂණයක් නැතිව තමයි අද දවස වන කොට අපි මේ පාසල්වල භෞතික සම්පත් සඳහා කටයුතු කිරීමේදී ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා ප්‍රමිතියකට අනුව දැන් බස්නාහිර පළාතේ උදාහරණයක් ගත්තොත් එහෙම අපේ පාසල් 1269 හි ශිෂ්‍යයන් ඉන්නවා, 721,655 ක්. 721,655 ක් වූ ශිෂ්‍යයින් සඳහා බස්නාහිර පළාතේ අපේ පාසල් පද්ධතිය තුළ අපට අවශ්‍යව තිබෙනවා, වර්ග අඩි හැත්තෑ දෙලක්ෂ දහසය දහස් පන්සිය පනහක්. සමහර විට මේක කළමනාකාරීත්වය තුළ ප්‍රශ්නය තිබෙනවා. සමහර ග්‍රාමීය පාසල් පද්ධතියේ ගොඩනැගිලි වර්ග අඩි ප්‍රමාණය විශාල ප්‍රමාණයක් තිබෙනවා. දරුවෝ නැහැ. සමහර නාගරික පරිසරය තුළ වර්ග අඩි ප්‍රමාණය ප්‍රමාණවත් නැහැ. ශිෂ්‍ය සංඛ්‍යාව වැඩියි. දැනට ක්‍රියාත්මක වන ද්විතියික පාසල් සංකල්පය තුළ මෙය ඉතාමත් හොඳින් කළමනාකරණය කළ හැකි ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. උදාහරණයක් වශයෙන් අපේ ප්‍රදේශවලත් පසුගිය දවස්වල ආරම්භ කරපු පාසල්, උදාහරණයක් වශයෙන් ගත්තොත් එහෙම පිංවත්ත කනිෂ්ට විද්‍යාලය. නල්ලූරුව ගුණවර්ධන විද්‍යාලය. පළමු වැනි පන්තියට, එක පන්තියකට දරුවෝ සොයා ගන්න බැරි වුණු පාසල්වල අද දරුවන්ගෙන් පිරී ඉතිරී ගිහිල්ලා. අද දෙමව්පියන්ගෙන් වැඩි ඉල්ලීමක් ලැබිලා තිබෙනවා. ඇයි? අපි ඒ සඳහා ක්‍රමෝපායන් භාවිතා කරපු නිසා. ඒ නිසා අද අපි මේ ප්‍රාථමික පාසල් පද්ධතිය සංවර්ධනය කිරීමේදී විධිමත් පිළිවෙතක් කරන්න ඕනෑ. පාසලේ භූමි ප්‍රමාණය කොපමණ තිබෙනවාද කියලා පැහැදිලි අධ්‍යයනයක් ඇතිව, ඒ පාසලේ දැනට තිබෙන වර්ග අඩි ප්‍රමාණය පිළිබඳව අධ්‍යයනයක් කරලා, අබලි ගොඩනැගිලි හැටියට ඉවත් කළ යුතු ගොඩනැගිලි සංඛ්‍යාව පිළිබඳව අධ්‍යයනයක් කරලා, එහෙම නැත්නම් ස්ථාවර වශයෙන් තවත් අවුරුදු 25 ක් ඉදිරියට මේ පාසල් පද්ධතියේ පසුගිය කාලයත් එක්ක සංසන්දනාත්මකව සංවර්ධනය කළ යුතු ක්‍රියා පිළිවෙත පිළිබඳව යම්කිසි අධ්‍යයනයක යෙදිලා මේ කටයුත්ත ඉතාමත් යහපත් විධියට ක්‍රියාත්මක කළ යුතුයි. ඉතින් අපි අවශ්‍යතා එකින් එක බැලුවොත්, විදුහල්පතිතුමාගේ කාර්යාල කාමරයට අවශ්‍ය කරන අංගෝපාංග මොනවාද? එතුමාගේ කාර්යාලය ඉතාමත් සංවිධානාත්මක ව්‍යුහයක තිබෙන්නට ඕනෑ. ඔහුට ඒ ස්ථානයේ අනික් අය කාටත් වඩා හොඳ අසුනක් තිබෙන්නට ඕනෑ. මොකද හේතුව, ඔහු එහි නායකයා. නායකයාගේ පෞරුෂය ආරක්ෂා කර ගැනීමට ගැළපෙන පරිසරයක් විදුහල්පතිවරයාගේ කාර්යාල කාමරය තුළ නිර්මාණය කරන්න අවශ්‍යයි. දැන් අපේ

[ ගරු ජගත් අංගගේ ]

සමහර තැන්වල තිබෙනවා ගුරු විවේකාගාර. ගුරු විවේකාගාරයට ගියාම සාමාන්‍යයෙන් පරණ ස්ටෝරු කාමරයක් වාගේ. ගුරුවරයාගේ පෞරුෂ වර්ධනයක් ඇති කරන්න පුළුවන් පරිසරයක් ඒ තුළ තිබෙන්නට ඕනෑ. තොරතුරු තාක්ෂණය පිළිබඳව අපි කථා කරනවා. විෂය බද්ධ තොරතුරු තාක්ෂණය තුළින් යමක් අධ්‍යයනය කරන්න පුළුවන් කම්පියුටර් දෙකක් වත් අඩුම ගණනේ ගුරු විවේකාගාරයක් තුළ තිබෙන්නට ඕනෑ. එහෙම නැත්නම් මේ පවතින තත්ත්වය තුළ දරුවාත් එක්ක හැප්පෙන්න ගුරුවරයාට පුළුවන්කමක් නැහැ. ඉතින් මේ නවීන තත්ත්වයන් තුළ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා 2020 වර්ෂය වන කොට තමන් මේ අධ්‍යාපන චාරිකාව ගිහිල්ලා නතර වන තැන පැහැදිලි කිරීම් කරලා තිබෙනවා. දරුවන් එක්ක ගෙන යන්න ඕනෑ. විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබලා, අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට ලක්ෂ තුනක් පමණ සහභාගී වෙනවා. මේකෙන් 25,000 ක් 30,000 ක් අතර සංඛ්‍යාවක් තමයි විශ්ව විද්‍යාලවලට ඇතුළත් වෙන්නේ. එතුමා පැහැදිලිව කියනවා, 2020 වන කොට විශ්ව විද්‍යාලවලට ඇතුළත් වන ශිෂ්‍ය සංඛ්‍යාව ලක්ෂය දක්වා වැඩි කරන්න ඕනෑය කියලා. පැහැදිලි ඉලක්කයක් දීලා තිබෙනවා. මේ ඉලක්කය කරා ගමන් කරන්න නම් අපි අද වන කොට පළාත් සභාව කියලා නොවෙයි, එහෙම නැත්නම් රේඛීය අමාත්‍යාංශයේ මහ ආණ්ඩුව කියලා නොවෙයි, අපි සියලු දෙනාම මේ රටේ ජනතාවට වගකියන ව්‍යවස්ථාපිත ආයතන හැටියට මේ විෂය බද්ධ කාරණාව, මේ ඉලක්ක සපුරාලීමට අපේ වැඩ පිළිවෙළ උදෙසා දැන් දැන් සංවිධානය වෙන්න ඕනෑ. මේක තමයි අවශ්‍යතාවය. එහෙම නැත්නම් අපි එකිනෙකාට ඇඟිල්ල දික් කර ගනිමින් අපේ මූලික අරමුණෙන් ඉවත් වීම නොවෙයි අපේ වගකීම. අදත් ද්විතියික පාසල් හැදෙන කොට ඒ ද්විතියික පාසල් වටේ තිබෙන තවත් පාසල් පහකට හයකට අඩු ගණනේ ඒ සමාන වරප්‍රසාද ලබා දෙන්න අවශ්‍ය පසුබිම අපි සකස් කරන්න ඕනෑ.

අතිගරු ජනාධිපතිතුමා පැහැදිලිව කිව්වා. එතුමා මේ අයවැය විවාදයේදී පැහැදිලි ප්‍රකාශයක් කළා. එතුමා පැහැදිලිව කිව්වා, අපේ රටේ මූලික ආදායම අද වන විට විදේශ ශ්‍රමිකයන් විසින් උපයන ආදායම. ඒක තමයි ශ්‍රී ලංකාවේ විදේශ විනිමය උපයන ප්‍රධාන ආදායම් මාර්ගය. නමුත් ඔවුන් කරන්නේ මොනවාද? පිටරටුන්ගේ වළං හෝදනවා. ඇඳුම් හෝදනවා. වැසිකිළි හෝදනවා. කැසිකිළි හෝදනවා. වැඩිහිටියෝ බලා ගන්නවා. දරුවෝ බලා ගන්නවා. කම්කරුවන් හැටියට දස දහස් ගණනක්, ලක්ෂ ගණනක් ගිහිල්ලා ඉන්නවා. 95% ක් මෙවැනි ඉතාමත් කුලී හේවායන්ගේ සේවාවන් කරලා තමයි ආදායම් උපද්දන්නේ. ඒ තත්ත්වය වළක්වලා 2020 වන කොට තාක්ෂණාගාර දහසක් මේ අධ්‍යාපන ක්ෂේත්‍රයට එකතු කරලා, විද්‍යාගාර සමූහයක් එකතු කරලා, දැනුමෙන් පෝෂණය වුණු දරු පරපුරක් විදේශ ගත කරලා, ගෞරවනීය රැකියාවන් කරලා මේ රටට විදේශ විනිමය උපයන්න ඕනෑය කියන මානසිකත්වය තුළ තමයි එතුමා මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්නේ. ඒ නිසා ඒකට සහයෝගය දෙන පළාත් සභාවක් හැටියට අපේ වැඩමුළු ක්‍රියාත්මක කිරීමේදී අපේ ප්‍රධාන අමාත්‍යතුමා දරන වෑයම මල්ඵල ගන්වන්න, එතුමා පැහැදිලිවම මේ මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් කරලා තිබෙන කාරණාවලට ඉදිරියේදී ළං වෙන්න පුළුවන් ඉලක්ක සපුරා ගැනීමට මහා දැවැන්ත උත්සාහයක් දරනවා. ප්‍රතිඵල විශ්ලේෂණ වාර්තා අතට අරගෙන, වර්ෂයෙන් වර්ෂය එක එක විෂය ධාරාවන් තුළ ප්‍රතිඵල විශ්ලේෂණය කරමින් දරුවා ඉහළ මට්ටමට අරන් යන්න පුළුවන් පරිසරයක් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ නිර්මාණය කිරීමට මේ දරන වෙහෙස මහන්සිය මල්ඵල ගන්වන්න අපි කවුරුත් උදව් කරන්න ඕනෑ. ඒක තමයි අද දවසේ අපේ වගකීම.

ඒ නිසා අපි විවිධ ක්ෂේත්‍ර මත්තේ දරුවාගේ අධ්‍යාපනය ලබන මේ විද්‍යාපීඨය ඉතාමත් ආකර්ෂණීය ස්ථානයක් බවට පත් කර ගන්න විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා. ලක්ෂ ගණන් මිලියන ගණන් අපි මුදල් ආයෝජනය කරනවා. මේ සියල්ල තුළ මහා දැවැන්ත බලාපොරොත්තුවක් තිබෙනවා. එකම දේ අපට අහිමි වුණු ලෝකයේ අපේ දරුවා රජ කිරීම. ගහෙන් ගෙඩියක් කඩන කෙනෙක් වෙන්න පුළුවන්. කම්කරු වෘත්තියේ යෙදිලා ඉන්න කෙනෙක් වෙන්න පුළුවන්. ඒ සියලු අම්මලා තාත්තලා බලාපොරොත්තු වෙනවා, ආනන්ද, නාලන්ද, රෝයල්, තෝමියන්, තර්ස්ටන්, ඉසිපතන වාගේ මේ සුපිරි ගණයේ කියලා හඳුන්වා ගත්ත පාසල්වල තිබෙන පහසුකම් ගමේ ගොඩේ වාද්දුවේ, එහෙම නැත්නම් මීනුවන්ගොඩ, එහෙම නැත්නම් අවිස්සාවේල්ල ගම්මානවල ජීවත් වන දරුවන්ටත් අධ්‍යාපනයේ සමාන අවස්ථා ලබා දෙන්න පුළුවන් ක්‍රමවේදයකට මේ අධ්‍යාපනය එක තුලනාත්මක තත්ත්වයකට පත් කරන්න. ඒක තමයි අවශ්‍යතාවය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අපට සිද්ධ වෙලා තිබෙනවා කන්නන්ගර මැතිතුමාව සිහිපත් කරලා - මම පෙරදා කිව්වා වාගේම අද අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, බන්දුල ගුණවර්ධන අමාත්‍යවරයා හරහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අධ්‍යාපනයේ ඉලක්ක ගත ස්ථාන කරා රැගෙන යාම සඳහා විධිමත් සහ විද්‍යානුකූල පදනමක් මත මේ ක්ෂේත්‍රය ඉහළ නංවන්න. මේක අපි පෞද්ගලිකව කාගේවත් - මේක එක්සත් ජාතික පක්ෂයේ අධ්‍යාපනය නොවෙයි. මේක ජනතා විමුක්ති පෙරමුණේ අධ්‍යාපනය නොවෙයි. මේක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අධ්‍යාපනය නොවෙයි. මේක මේ රටේ ජීවත් වන සමස්ත ජනතාවගේ දරුවන් විසි එක්වන ශත වර්ෂයේ අභියෝගවලට මුහුණ දෙන්න පුළුවන් මට්ටමට රැගෙන යන දැවැන්ත අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් බවට පත් කරන්න, අපි සියලු දෙනාම අපේ කැපවීම් කළ යුතුව පවතිනවා. එය ඔබේත් මගේත් සමස්ත වැඩිහිටි පුරවැසියන්ගේත් වගකීම. ඒක තමයි අපි කාගේත් පූර්ණ වගකීම. මේ වගකීමෙන් කිසි කෙනෙකුට පක්ෂවලට ඇඟිල්ල දික් කරලා නිදහස් වෙන්න බැහැ. විවිධ අඩුපාඩුකම් සහ විවිධ තරාතිරම්වල නොගැලපීම් පිළිබඳව සාකච්ඡා කරමින් ක්‍රියාත්මක වෙන්න බැහැ. අපි එක අරමුණක් තුළ සමස්ත රටේ දරු පරපුර වෙනුවෙන් මේ සඳහා කැප විය යුතුයි කියන චෝදනාව මම ඉතාමත් පැහැදිලිව මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අපි මේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ කාරණා පිළිබඳව සාකච්ඡා කරනවා. නමුත් අපට පාසල් පද්ධතියේ මේ වන කොට විදුහල්පතිවරුන් සංඛ්‍යාව - අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ අවස්ථාව වන කොට අපේ වැඩ බලන විදුහල්පතිවරුන්ට පත්වීම් ලබා දීම සඳහා යෝජනා කිරීම සම්බන්ධව. බස්නාහිර පළාතේ මේ වන කොට විදුහල්පතිවරුන්ගේ ඌණතාවය. සමස්ථ විදුහල්පතිවරුන් සංඛ්‍යාවෙන් 650 ක් පමණ විදුහල්පතිවරු අඩුයි. පාසල් පද්ධතියට. ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන්ගේ දැවැන්ත හිඟයක් මේ පළාත් සභාව තුළ තිබෙනවා. පරිපාලන ශ්‍රේණියේ නිලධාරීන්ගේ 72 ක ගේ හිඟයක් තිබෙනවා. මේ යාන්ත්‍රණය ඉතාමත් සක්‍රීයව ක්‍රියාත්මක කිරීමට අපට විවිධ වූ ගැටළු මතු වීමට තිබෙන ඉඩකඩ ප්‍රමාණය වැඩි නිසා මේවා පියවා ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග අපි කඩිනමින් ගත යුතුව පවතිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මම මගේ ගරුත්වය, ප්‍රණාමය, ගරු ප්‍රධාන අමාත්‍යතුමාට පුද කරනවා. මොකද හේතුව, එතුමා නිවැරදි නායකයෙක් හැටියට, පළාතේ ජනතාවගේ අවශ්‍යතාවයන් හඳුනාගෙන ඔවුන්ට නිවැරදි නායකත්වයක් දීමට ඉදිරිපත් වන කෙනෙකු හැටියට මම ඔහුට ගරු කරනවා. මොකද, අතිගරු ජනාධිපතිතුමා වෙන්න පුළුවන්. ප්‍රධාන අමාත්‍යතුමා වෙන්න පුළුවන්. එක විෂයයක් පිළිබඳව නිපුණතාවයක් දක්වන කෙනෙක්. එක්කෝ නීතිඥයෙක් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් පරිසර විද්‍යාඥයෙක් වෙන්න පුළුවන්. එහෙමත් නැත්නම් ගුරුවරයෙක් වෙන්න පුළුවන්. නමුත් රටේ තිබෙන විවිධ ක්ෂේත්‍රවල හැම කටයුත්තකටම නායකත්වය දෙන්න ඕනෑ.

මේ පළාතේ තිබෙන හැම කටයුත්තකටම ගරු ප්‍රධාන අමාත්‍යතුමා නායකත්වය දෙන්න ඕනෑ. එතකොට සිද්ධ වෙනවා විවිධ ක්ෂේත්‍රවල ඉන්න විද්වතුන්, උගතුන් සහ යම් ක්ෂේත්‍ර කෙරෙහි අධ්‍යනයක යෙදුණු අයගේ අදහස් උපදෙස් සහ ඔවුන්ගේ යම්කිසි දේවල් පිළිබඳව අධ්‍යයනයක් කරන්න. ඒ අධ්‍යයනය තුළින් නිවැරදි දේ තෝරා ගෙන ඉතාමත් නිහතමානීව මේ ප්‍රදේශය සංවර්ධනය සඳහා ඒ අදහස් හා යෝජනා රැගෙන ඉස්සරහාට යන්න කැමැති නායකයෙක් ඉන්නවා නම්, ඔහු අංග සම්පූර්ණ නායකයෙක් බවට පත් වෙනවා. ඒ නිසා මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඉතිහාසය තුළ එතුමා එවැනි දේ ආදර්ශයෙන්ම ඉදිරිපත් කරලා තිබෙනවා. අනාගතය තුළ ගරු ප්‍රධාන අමාත්‍යවරයකුගේ කාර්යභාරය තුළ මේ පළාතේ ජනතාවට දෙන්න පුළුවන් උපරිම ශක්තිය සහ ඔවුන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියා කරන්න එතුමාට ශක්තිය, ධෛර්යය ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී මෙම පූර්ණ කාරක සභාව දිවා විවේකය සඳහා තාවකාලිකව අත්හිටුවනවා.

***ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 02.20 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා ] ගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***

*Accordingly the Committee of the Whole Council, Suspended and it resumed at 02.20 p.m with with Hon. Chairman [Mr. Sunil Wijeratne] in the Chair.*

[ අ.භා. 02.22 ]

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමනි, මුදල් ප්‍රකාශය පිළිබඳව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ මහ ඇමතිතුමාටත්, ඒ වාගේම කැබිනට් මණ්ඩලයටත්, ඒ වාගේම ප්‍රධාන ලේකම්තුමිය ප්‍රධාන ගණකාධිකාරීතුමා ඇතුළු ගිණුම් අංශයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ, මේ මුදල් ප්‍රකාශය ඉතාමත් ඵලදායී විධියට සකස් කිරීම පිළිබඳව. මගේ ස්තුතිය, ගෞරවය මුලින්ම ඔවුන් සඳහා මම ප්‍රකාශ කරනවා.

විශේෂයෙන්ම 113 ශීර්ෂය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. මෙහෙවර පිළිබඳව මගේ මුලින්ම අදහස් දැක්වීම. පළාතේ දරුවන්ගේ ආකල්ප සමාජ කුසලතා හා පෞරුෂය ගති ලක්ෂණ ඇතුළත් අධ්‍යාපන සංවර්ධනය ඔවුන්ට ලබා දීම උදෙසා අධ්‍යාපන හා (බාධා කිරීමක්) සම්පත හා භෞතික සම්පත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස යෙදවීම උදෙසා එම ක්‍රියාවලිය සැලසුම් කිරීම, මෙහෙයවීම, සංවිධානය, ක්‍රියාත්මක කිරීම, නියාමනය හා මූල්‍ය පාලනය කියන මෙහෙවරත්, ප්‍රධාන කාර්යයන් හැටියට අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම උදෙසා සිසුන්, විදුහල්පතිවරු සහ සෙසු කාර්ය මණ්ඩලයට අදාළ සියලු කාර්යයන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම. උසස් පෙළ දක්වා දරුවන්ගේ අධ්‍යාපනය, පාසල් හැර යන දරුවන්ට නොවිධිමත් අධ්‍යාපනය, පහසුකම් හා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම. පළාතේ පෙර පාසල් විධිමත් කිරීම. විශේෂ අවශ්‍යතා ඇති ආබාධිත දරුවන් වෙනුවෙන් අධ්‍යාපන පහසුකම් සැලසීම. ක්‍රීඩා, සෞන්දර්ය වැනි විෂය බාහිර ක්‍රියාකාරකම් වෙනුවෙන් කටයුතු සැලසීම. මේ ඉහත කාරණා සම්බන්ධව අපට රජයේ ප්‍රධාන සහ ආදායම්වලින් පුනරාවර්ථන වියදම් හැටියට 2013 දී මිලියන 15,188 ක් වෙන් කරලා දීලා තිබෙනවා. ඒ වාගේම 2014 දී මිලියන 17,175 ක්. 2015 දී මිලියන 17,799 ක් ඇස්තමේන්තු කරලා තිබෙනවා. ඒ වාගේම ආයතනික ප්‍රාග්ධන යෙදවුම් සඳහා මිලියන 60 ක්, 12 ක්, 4 ක් වශයෙන් යොදවලා මේ සියල්ලේම එකතුව හැටියට තමයි 2013 අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙනුවෙන් සත්‍ය වියදම හැටියට රුපියල් මිලියන 15,248 ක් වෙන් කරලා තිබෙන්නේ. ඒ වාගේම 2014 දී ඇස්තමේන්තු වියදම රුපියල් මිලියන 17,187 කුත්, එයට සාපේක්ෂව 2015 දී රුපියල් මිලියන 17,803 කුත් වෙන් කරලා තිබෙන්නේ. මේක අපි ප්‍රතිශතයක් හැටියට බලන කොට 2013 වර්ෂයේ සත්‍ය වියදමට සාපේක්ෂව 2015 දී ඇස්තමේන්තුව 17% කින් වැඩි කරලා තිබෙනවා.

ඒ වාගේම 2014 ට සාපේක්ෂව 2015 දී 4% කින් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම 2015 ඒ සමස්ත රුපියල් මිලියන 48,513 න් රුපියල් මිලියන 17,803 ක්ම වෙන් කරලා තිබෙන්නේ අධ්‍යාපන අංශයට. එය මුළු ප්‍රතිශතය හැටියට අයවැයෙන් ගත්තාම 38% ක් හැටියට සඳහන් වෙලා තිබෙනවා.

ඒ වාගේම විශේෂයෙන්ම මේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව වැඩ සටහන් හතරකින් තමයි ප්‍රතිපාදන වෙන් කෙරෙන්නේ. ඒ සාමාන්‍ය පරිපාලන හා ආයතන සේවා, ප්‍රාථමික අධ්‍යාපනය, ද්විතියික අධ්‍යාපනය සහ අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගීත්ව වර්ධනය. මේකේ පුනරාවර්ථන වියදම් හැටියට සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා කියන එක යටතේ මිලියන 577 ක් වෙන් කරලා තිබෙනවා. ප්‍රාග්ධන වියදම්වලට මිලියන 3 කුත්, එකතුව සම්පූර්ණයෙන් 580 ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ප්‍රාථමික අංශයටත් එහෙමයි. රුපියල් මිලියන 5727 ක් පුනරාවර්ථන වියදම් හැටියට වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි ප්‍රාග්ධන වියදම් හැටියට රුපියල් මිලියන 90 ක් වෙන් කරලා තිබෙනවා. මුළු එකතුව 5727 යි. ද්විතියික අධ්‍යාපනය සඳහා තමයි වැඩිම මුදල් ප්‍රමාණය වෙන් කරලා තිබෙන්නේ. මහ ඇමතිතුමාට අපේ විශේෂ ස්තුතිය පුද කරනවා. ඒකයි මම කිව්වේ. රුපියල් මිලියන 11,409 ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපන ප්‍රවේශය හා සහභාගීත්ව වර්ධනය සඳහා මිලියන 85 ක් වෙන් කරලා තිබෙනවා. මේ ආකාරයෙන් තමයි රුපියල් මිලියන 17,803 සකස් වෙන්නේ. විශේෂයෙන්ම මේ වැඩ සටහන් හතර පිළිබඳව කෙටියෙන් සඳහන් කළොත් සාමාන්‍ය පරිපාලන හා ආයතනික සේවාවලට මුළු අයවැයෙන් 1.2% ක් වෙන් වෙලා තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපන වියදමින් මේ අයවැය තුළ 2013 සත්‍ය වියදම රුපියල් මිලියන 555 ක් වෙන් වෙලා තිබෙනවා. ඒ වාගේම 2014 ඇස්තමේන්තු වියදමින් රුපියල් මිලියන 473 ක් වෙන් වෙලා තිබෙනවා. ඒ වාගේම 2015 දී රුපියල් මිලියන 581 ක් වෙන් කරලා තිබෙනවා සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා කියන වැඩ සටහනට. 2013 ට සාපේක්ෂව, සත්‍ය වියදමට සාපේක්ෂව 2015 දී 5% කින් වැඩි වීම. ඒ වාගේම 2014 ට සාපේක්ෂව

23% කින් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපන දෙපාර්තමේන්තුවට වෙන් කරලා තිබෙන මුළු මුදලින් 3% ක් හැටියට සඳහන් කරලා තිබෙනවා.

ඒ වාගේම දෙවැනි වැඩ සටහන. ප්‍රාථමික අධ්‍යාපනය. මේක කොටස් දෙකක්. ප්‍රාථමික අධ්‍යාපනය සහ පෙර පාසල් අධ්‍යාපනය. ප්‍රාථමික අධ්‍යාපනයට මුළු අයවැයෙන් 12.2% ක් වෙන් වෙලා තිබෙනවා. ඒ වාගේම ප්‍රාථමික අධ්‍යාපනය සඳහා රුපියල් මිලියන 5716 ක් වෙන් කරලා තිබෙනවා. මේක 2015 අධ්‍යාපන වියදමින් 32% ක් හැටියට සටහන් කරලා තිබෙනවා. ඒ වාගේම පෙර පාසල් අධ්‍යාපනය සඳහා මුළු අයවැයෙන් රුපියල් මිලියන 0.02% ක් වෙන් කරලා තිබෙනවා. ඒකට 2013 දී සත පහක්වත් වෙන් වෙලා තිබිලා නැහැ. 2011 දී මිලියන 11 ක් වෙන් වෙලා තිබෙනවා. නමුත් 2015 දීත් මිලියන 11 ක් වෙන් කරන්න කටයුතු කරලා තිබෙනවා. මේක 2015 මුළු අධ්‍යාපන වියදම එක්ක සසඳද්දී රුපියල් මිලියන 0.6 ක් බවට සටහන් වෙලා තිබෙනවා.

ඒ වාගේම ද්විතියික අධ්‍යාපනය. මේ සඳහා තමයි වැඩිම මුදල අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් වෙන් වෙලා තිබෙන්නේ. මේ සඳහා මුළු අයවැයෙන් 23.5% ක් වෙන් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ වැඩ සටහන යටතේ 2013 දී වෙන් වෙලා තිබුණේ රුපියල් මිලියන 8599 යි. 2014 දී රුපියල් මිලියන 9998 යි. නමුත් 2015 දී රුපියල් මිලියන 11,409 ක් වෙන් කරන්න මහ ඇමතිතුමා කටයුතු කරලා තිබෙනවා. ඒක 2013 වර්ෂය එක්ක සත්‍ය වියදමට සාපේක්ෂව බලද්දී 2015 දී 33% ක වැඩි වීමක් හැටියට සටහන් වෙලා තිබෙනවා. ඒ වාගේම 2014 ඇස්තමේන්තු වියදමට සාපේක්ෂව බලද්දී 14% කින් වැඩි වීමක් හැටියට සටහන් වෙලා තිබෙනවා. මේ 2015 සමස්ත අධ්‍යාපන වියදමින් 65% ක් ම වෙන් වෙලා තිබෙන්නේ, ද්විතියික අධ්‍යාපනය සඳහා. ඒ වාගේම විශේෂ අධ්‍යාපන හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා මුළු අයවැයෙන් 0.2% ක් වෙන් වෙලා තිබෙනවා. එහි 2013 දී වෙන් වෙලා තිබෙන්නේ රුපියල් මිලියන 71 ක් විතරයි. 2014 දී රුපියල් මිලියන 81 ක් වෙන් වෙලා තිබෙනවා. 2015 දී රුපියල් මිලියන 85 ක් වෙන් කරන්න කටයුතු කරලා තිබෙනවා. 2013 සත්‍ය වියදමට සාපේක්ෂව 2015 ඇස්තමේන්තුව 20% කින් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම 2014 ඇස්තමේන්තුවට සාපේක්ෂව 2015 දී 5% කින් වැඩි කරලා තිබෙනවා. මේ මුළු අධ්‍යාපන වියදම 0.5% ක් හැටියට වෙන් කරලා තිබෙනවා. ඒ නිසා 2013 සත්‍ය වියදමට වඩා, 2014 ඇස්තමේන්තු වියදමට වඩා 2015 අති විශාල මුදල් සම්භාරයක් මේ ද්විතියික අධ්‍යාපනයටත්, ප්‍රාථමික අධ්‍යාපනයටත් ඒ වැඩ සටහන් අතරට වෙන් කරන්නට කටයුතු කිරීම පිළිබඳව මම විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම අපි මේ ද්විතියික අධ්‍යාපනය දියුණු කිරීමෙන් සාමාන්‍ය පෙළ, උසස් පෙළ දරුවන් විභාග සමත් කරන අලුත් යුගයක් කරා පිය නගන්නට තමයි මේ මුදල් වෙන් කරලා තිබෙන්නේ. අපි දන්නවා, මේ විභාගවලින් දරුවෝ සමත් වුණොත් තමයි අනාගත දරු පරපුර වාසනාවන්ත දරු පරපුරක් හැටියට මේ සමාජයට අපට ලබා දෙන්නට පුළුවන්කම ලැබෙන්නේ. ඒ සඳහා වැඩි මුදලක් වෙන් කිරීම පිළිබඳව මගේ ස්තුතිය, ගෞරවය පුද කරනවා. ඒ වාගේම අපි දන්නවා. උපදේශක කාරක සභාවල කථා වුණා. මොකද, අමතර පන්ති ආලා දරුවන්ගේ විභාග සමත් කරන්න උත්සාහ කරන අපේ ගුරුවරු සඳහා ගෙවීමක් කරන්න මහ ඇමතිතුමා කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඉංග්‍රීසි කථා කරන දරුවන් මේ පාසල්වලින් බිහි කරන්න වැඩ සටහනක් මහ ඇමතිතුමා සකස් කරලා තිබෙනවා. අද මහර කොට්ඨාශයේ එය ආරම්භ කරලා තිබෙනවා. ඒ පිළිබඳව මගේ ස්තුතිය, ගෞරවය පුද කරන්න කැමැතියි. ඒ වාගේම ගුරුවරු පුහුණු කිරීම සඳහා රුපියල් මිලියන 100 ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම පළාතේ වැඩ අවසන් නොවූ ගොඩනැගිලි සම්පූර්ණ කරන්න රුපියල් මිලියන 450 ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම පසුගිය කාලය තුළ ප්‍රාථමික ගුරුවරු මේ වන කොට පුහුණු කරලා අවසන් කරලා තිබෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම අපි මතක් කරන්නට ඕනෑ, අපේ විපක්ෂයෙන් චෝදනා කළා, සරුදම් අරුණැල්ලේ මුදල් ගසා කනවාය කියලා. මොකද, අපි දන්නවා. ස්වාමීන් වහන්සේලා, පියතුමන්ලාගේ සහ මවුලවිතුමන්ලාගේ අනුශාසකත්වයෙන් තිබෙන දහම් පාසල්වලට තමයි මේ මුදල් ලබා දෙන්නේ. එහෙම නම් ඔබතුමන්ලා කියන්නේ, මේ අපේ ස්වාමීන් වහන්සේලා, පියතුමන්ලා, මවුලවිතුමන්ලා මුදල් ගසා කනවාය කියන එකද? එහෙම දෙයක් සිද්ධ වෙන්නේ නැහැ. මොකද, මේ සඳහා උපදේශක මණ්ඩලයක් පත් කරලා, ඒ තුළින් තමයි මේ දහම් පාසල් සඳහා සරුදම් අරුණැල්ලෙන් කටයුතු කරන්නේ.

[ ගරු සහන් ප්‍රදීප් විතාන ]

විශේෂයෙන්ම පළාත් පාලන විෂය සම්බන්ධව තව ස්තූතියක් පුද කරන්නට ඕනෑ. විශේෂයෙන්ම අපේ මහ ඇමතිතුමා පත් වුණාට පස්සේ ප්‍රඥප්තිය වෙනස් කළා. අපේ නීති නිලධාරී පාලිත මහත්මයාත් මෙතැන ඉන්නවා. වෙනස් කරලා මුද්දර ගාස්තු පළාත් පාලන ආයතනවලට ලබා දුන්නා. ඒ නිසා සම්පූර්ණයෙන්ම මුද්දර ගාස්තු ටික අද ලැබිලා තිබෙනවා. ඒ වාගේම දුරකථන බිල්පත්වලට රු. 2500/- ක් දුන්නා. දුරකථනයක් ලබා දුන්නා. ඒ වාගේම ගමන් වියදම්වලට රු. 2500/- ක් දුන්නා. ඒ වාගේම කම්ටු දීමනා ලබා දෙන්න කටයුතු කළා. කවදාවත් නොවුණු සිද්ධියක්. ඒ වාගේම I Pad පවා අපි පළාත් පාලන ආයතනවලට ලබා දෙන්න මහ ඇමතිතුමා කටයුතු කළා. ඒ වාගේම අද වන කොට අපේ අතිගරු ජනාධිපතිතුමා රුපියල් පන්දාහට තිබුණු දීමනාව පහළොස්දාහ කරලා තිබෙනවා. ඒ වාගේම සභාපතිවරුන්ට රු. 25,000/- ක්, උප සභාපතිවරුන්ට රු. 20,000/- ගණනේ මෝටර් බයිසිකල් ටික දීලා තිබෙනවා. ඊට අමතරව කියන්න සතුටුයි, අපේ සියලුම ප්‍රාදේශීය සභා සභාපතිවරු, උපසභාපතිවරු හා මන්ත්‍රීවරුන් සඳහා රක්ෂණයක් ලබා දෙන්නට කටයුතු කරන්න අද සියලු කරුණු කාරණා උපදේශක කාරක සභාවේ සාකච්ඡා කරලා ඉවරයි. ඒ නිසා විශේෂයෙන්ම මේ අධ්‍යාපන විෂය වෙනුවෙන් මහ ඇමතිතුමාත්, අපේ උපදේශක කාරක සභාවත් ගන්නා වූ තීන්දු තීරණ පිළිබඳව ස්තූතිය පළ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[ අ.භා. 02.33 ]

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ගරු සභාපතිතුමනි, පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට පත් වෙලා සහභාගී වන ප්‍රථම අයවැය. එමෙන්ම අපේ ශ්‍රී කාවේ පළාත් සභා අතුරින් වැදගත්ම පළාත් සභාව කියලා සලකන අපේ බස්නාහිර පළාත් සභාවේ වඩාත්ම වැදගත් අමාත්‍යාංශය. මොකද, ඕනෑම රටක අධ්‍යාපනය, නීතිය හා සාමය වාගේ විෂයයන් සලකා බලලා තමයි ඒ රටේ දියුණු තත්ත්වය සලකා බලන්නේ. ඒ අනුවත්, මෙම අයවැයෙන් 70% ක් වැය කරලා තිබෙන්නේත් මෙම අමාත්‍යාංශය සඳහා.

ඉතින් ඒ අයවැයේ කාරණාව ආරම්භ කරන්න ඉස්සෙල්ලා මම එක දෙයක් මේ සභාවට මතක් කළ යුතු වෙනවා. මේ සභාවත් නියෝජනය කරපු, මන්ත්‍රීවරයෙක්, හිටපු ඇමතිවරයෙක්, මා නියෝජනය කරන ආසනයේ ඉන්න අතුල නිමලසිරි ජයසිංහ මැතිතුමා අභාවප්‍රාප්ත වෙලා තිබෙනවා. ඒ නිසා මේ සභාවත් නියෝජනය කළ මන්ත්‍රීවරයෙක් හැටියට එතුමාට ඒ ශෝකය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ඔබතුමාට ශෝක පණිවුඩ ගේන්න බැහැ. ශෝක ප්‍රකාශ යෝජනාවක් වෙනම අපි ගේනවා. එහිදී ඔබතුමාට අවස්ථාව ලබා දෙන්නම්.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

සමාවෙන්න. ගරු සභාපතිතුමනි, ඊයේත්, පොදු සාකච්ඡාවේදී අපි සාකච්ඡා කරන්න සූදානම් වෙලා හිටියත්, ඊයේ සවස සභාවේ ගණ පූරණය පිළිබඳ ප්‍රශ්නයක් ඇති වුණා. මම මුලින්ම අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. 70% ක් ම මේ අධ්‍යාපන අමාත්‍යාංශය ප්‍රමුඛ අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙන වෙලාවක ඒකෙනුත් 38% ක් අධ්‍යාපනයට වෙන් කරලා තිබෙන මොහොතක්. ප්‍රථමයෙන්ම මේ අපේ පළාත් සභාවේ ඉන්න මම ද ඇතුළු නවක මන්ත්‍රීවරුන් නොදන්නා කරුණු කාරණා ගොඩක් තිබෙනවා. ඒ අනන්තය හෝටලයේ පැවති පුහුණුව සාර්ථක පුහුණුවක්. හැබැයි, එතැනදී අපි දැක්ක යම් යම් අඩුපාඩු තිබුණා. උදාහරණයකට ධම්ම දිසානායක මහත්මයා ඇවිල්ලා සාකච්ඡාවක් පැවැත්වුවා. පැයක් දෙකක් පමණ කථා කළා. හැබැයි, ඒ වුණාට අපට වටිනවා අපේ හේමන්ත සමරකෝන් සභා ලේකම්තුමා කරපු ඒ පැයක පමණ දේ. ඒ වාගේ අපි නොදන්න දේවල් සැහෙන්න තිබෙනවා ගරු සභාපතිතුමනි. මේ පළාත් සභාවේ ගුණාත්මකභාවය රැකගෙන වැදගත් විධියට වැඩ කරන්න මේ නවක මන්ත්‍රීවරුන් තවත් දැනුවත් විය යුතුයි. ඉතින් මම ඉල්ලා සිටිනවා. හැකිනම් ඉදිරියේදී ඒ පිළිබඳව නේවාසික නැති වුණත් දිනයක පුහුණුවක් හරි මේ නවක මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න. ඒ පිළිබඳව අපි නොදන්නා දේවල් නිසා තමයි ඊයේ ගණ පූරණය ප්‍රශ්නය පවා ඇති වුණේ.

ඒ වාගේම අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා එතුමාගේ අයවැය ප්‍රකාශයේ සටහන් කරනවා, පාසලක භෞතික තත්ත්වය, දරුවෙකුගේ ගුණාත්මක දැනුම, ගුරුවරුන්ගේ

හැකියාවන් පිළිබඳ වර්ෂ 10 කට පෙර තත්ත්වය, වර්තමාන තත්ත්වය සමඟ සන්සන්දනය කර බලා සිදු වී ඇති වෙනස අව්‍යාජව දකින්න කියලා. ඇත්තටම ගරු සභාපතිතුමනි, ව්‍යාජයන් මැද අතරමං වී ඇති රටක අව්‍යාජ ප්‍රතිඵල දකින්නේ කෙලෙසදැයි මම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රමුඛ මේ සභාවෙන් ප්‍රශ්න කරන්න කැමැතියි.

දැන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා කියපු විධියට ඒ දියුණුව ගැන කථා කරනවා නම්, ඇත්තටම අද පත්තර බැලුවාම ගරු සභාපතිතුමනි, පත්තරවල ප්‍රවෘත්තිවල මොනවාද තිබෙන්නේ? ගුරුවරුන් අතින් දරුවන් අපයෝජනය වීම. පාසල් දරුවන් සිය දිවි නසා ගැනීම. මත්කුඩු, මත්ද්‍රව්‍ය, මත් පෙති වාගේ දේවල්වලට ඇබ්බැහි වීම. ඒ වාගේම දරුවෙකුගේ යම්කිසි වරදකට ගුරුවරයෙක් පහරක් ගැහුවොත්, එහෙමත් නැත්නම් උස් හඬින් තරවටු කළොත් ඒ පිළිබඳව දැවැන්ත ප්‍රශ්න ඇති වෙනවා. ඒ පිළිබඳව ගුටි කෑම්, අන්තිමට ගුරුවරයාට ගහන තත්ත්වයක් පවා ඇති වෙනවා. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මැණියන් අපි කවුරුත් ගරු කරන ගුරුවරියක්. එතුමා අධ්‍යාපනයට සම්බන්ධ පවුලකින් පැවත එන කෙනෙක්. ඉතින් අපේ සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා සංඛ්‍යා ලේඛන ගැන කථා කළා. මෙතැනදී ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මගේ පෞද්ගලික මතය මේ සංඛ්‍යා ලේඛනවලින් වැඩි කිරීමත් සමඟම අපේ ගුණාත්මක භාවය, දරුවන්ගේ මනස හැදීමේ කටයුත්තට වැඩි අවධානයක් යොමු කළ යුතුයි. ඔබතුමාගේ ප්‍රකාශය මම දැක්කා. එක්තරා ප්‍රශ්නයකට උත්තර දීමේදී ඔබතුමා සඳහන් කරලා තිබුණා, ළමයින් එන්නේ නැති එකට හේතුව නිවාසවල ප්‍රශ්න කියලා. පෞද්ගලික ප්‍රශ්න ආදිය ගැන සටහන් වෙනවා. ඉතින් මේ පිළිබඳව විදේශ රටවල්වල නම් තිබෙනවා මානසිකව ඒ අයගේ ප්‍රශ්න කථා කරන්න පුළුවන් consultations.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

Not consultations. Counseling

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

Counseling. ඒ වාගේ දෙයක් අපි හඳුන්වා දීම සුදුසුයි. මම දන්නේ නැහැ. මේ වන කොටත් එවැනි ක්‍රියාමාර්ගයක් ඔබතුමා අරගෙන තිබෙනවා වෙන්නත් පුළුවන්. එසේ තිබෙනවා නම්, ඒවා අපි තවදුරටත් වැඩි කරමු කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම තමයි ගුරුවරුන්ගේ පාර්ශවයෙන් බැලුවත්. ගුරුවරුන්ටත් මේ පුහුණුවත් සමඟ ඒ අයව හුරු කරන්න ඕනෑ, කොහොමද දරුවෙකුගේ ප්‍රශ්නයකට මුහුණ දෙන්නේ කියලා. මොකද, ගෙවල්වලත් ප්‍රශ්න තියාගෙන ආවට පස්සේ තමයි ගුරුවරුන්ගෙනුත් මේ වාගේ ප්‍රශ්න ඇති වෙන්නේ. ඒ සඳහා අපි ක්‍රමවත් දෙයක් කරමුයි කියලා මම යෝජනා කරනවා. ඒ වාගේම තමයි අද වන කොට මේ පළාත තුළ ඔබතුමාගේ යටතේ පාසල් කිහිපයක් වැසී තිබෙනවා. ඒවායෙන් සමහර පාසල් මම විශ්වාස කරනවා, ඉදිරියටත් අපට ගෙන යාමට හැකියාවක් තිබුණා නම් හොඳයි කියලා. අපි දන්නේ නැහැ. යම් යම් හේතු තිබෙන්න ඇති. නමුත් තවදුරටත් අපි සොයා බලා කටයුතු කිරීම සුදුසු යැයි මම යෝජනා කරනවා. එමෙන්ම තමයි මහින්දෝදය පාසල් ක්‍රමය යටතේත්, බස්නාහිර පළාත් සභාව මගිනුත් මුදල් වෙන් කිරීම් සිදු කරපු සමහර පාසල් ඒ තුළින් නිසි ප්‍රයෝජන අරගෙන නැහැ. අපට උදාහරණ කියනවා නම්, අනන්තවත් කියන්න පුළුවන්. ඒ වාගේම සමහර පාසල් තිබෙනවා, අවුරුදු ගණනකින් ඒ පාසල්වලට ප්‍රතිපාදන කිසිම දෙයක් වෙන් නොවුණු පාසල් තිබෙනවා. සමහර විට ඒ විදුහල්පතිවරුන් කැමැතියි බොහෝ දේවල් කරන්න. ඉතින් අපි ඉදිරියේදී ඒ දේවල් සොයලා බලලා ඉදිරිපත් කරන්නම්. ඔබතුමා ඒ පිළිබඳව අවධානය යොමු කරයි කියලා බලාපොරොත්තු වෙනවා.

ඊළඟ කාරණාව තමයි ජාත්‍යන්තර පාසල්. අද වන කොට බස්නාහිර පළාත තුළ විශේෂයෙන්ම හතු පිපෙනවා වාගේ ජාත්‍යන්තර පාසල් ආරම්භ වෙනවා. පවතිනවා. ඉතින් මේ ජාත්‍යන්තර පාසල්වල ගුණාත්මක භාවය කුමක්ද කියලා අපි සොයා බලන්න ඕනෑ. ඒ වාගේම තමයි විභාග ප්‍රතිඵලවලින් එහෙමත් නැත්නම් අපි පළාත් සභාව හරහා හෝ මහ ආණ්ඩුව හරහා වෙන් කරන මුදල්වලින් පමණක් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වැඩි කිරීමට නොහැකියි කියලා මම ප්‍රකාශ කරනවා. මම දැක්කා, යම්කිසි කාරණාවක්. නෙත් fm නාලිකාව ඒ දරුවන්ගෙන් ප්‍රශ්න අහනවා. මේ නෙත් fm නාලිකාවෙන් පාසල් දරුවන්ගෙන් අහන්නේ, ජාතික වීරයන්. අපේ රටේ ජාතික වීරයන් පිළිබඳව ප්‍රශ්න කරනවා. ඉතාමත් කියන්න කනගාටුයි. ගරු සභාපතිතුමනි, ඒ දරුවන් අනගාරික ධර්මපාලතුමා, මද්දුම බණ්ඩාර, වීර පුරන්අප්පු වාගේ චරිත ගැන දන්නේ නැහැ. සමහර දරුවෝ උත්තර දෙනවා, ජාතික වීරයෝ

[ ගරු ඉන්දික මහීෂ බණ්ඩාර ]

කවුද කියලා ඇහුවාම, ෂාරුක් ඛාන් කියලා එක්කෙනෙක් කියනවා. තව කෙනෙක් කියනවා බෙන් ටෙන් කියලා. ටිං ටිං කියලත් එක්කෙනෙක් කියනවා. ඉතින් මේ වාගේ අපේ දරුවන්ගේ අධ්‍යාපන මට්ටම - මේ බස්නාහිර පළාත තුළ මේක කරලා තිබෙන්නේ. ඕනෑ කෙනෙකුට අන්තර් ජාලයෙන් මේක බලා ගන්න පුළුවන්. නෙත් fm නාලිකාවෙන්. ඉතින් මේ පිළිබඳව අපි මීන් එහා දෙයක් කිරීමට හැකි නම්, මම හිතන්නේ එය කිරීම සුදුසුයි කියලා මම මේ වෙලාවේ කියන්න කැමැතියි.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, මම මේ සියලු වෙනස ගැන දකින්නේ මෙන්න මෙහෙමයි. එදා 2005 අවුරුද්දේ නොවැම්බර් මාසේ 19 වැනිදා මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා බවට පත් වෙන කොට මේ රටේ මිනිස්සු හිතුවා, ගමේ මිනිහෙක්. අපේ දුක දන්න, දහඩිය සුවඳ හඳුනන පුද්ගලයෙක් අපේ රටේ නායකත්වයට පත් වෙලා කියලා සන්තෝෂ වුණා. හැබැයි, මේ කුරිරු යුද්ධයෙන් පස්සේ නිදහස්, නිවහල්, සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් ගොඩ නැඟීමට ස්වර්ණමය අවස්ථාවක් තිබුණත්, පාලකයා යොමු වුණේ ප්‍රජාතන්ත්‍රවාදය පාගා දාලා, ජනතාව මර්දනය කරලා තමන්ගේ ඥාති හිතවතුන්ගේ බලය තහවුරු කර ගැනීමට පමණයි කටයුතු සිද්ධ වුණේ. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා දේශපාලන නායකත්වය දැරුවා වාගේම හමුදා නායකත්වය දරපු ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමාව සිර ගත කළා. ඒ සිර ගත කරලා එතුමාගේ ඡන්ද අයිතිය පවා මේ වන කොට අහෝසි කරලා තිබෙනවා. අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, මේවා නිවැරදි කරන්නය කියලා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් බිලි බා ගත්තා. අන්තිමට වුණේ ආණ්ඩු පක්ෂයේ මහ ලේකම්වරයා මේ පැත්තට ආවා. ඒ වෙනුවට අපේ අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමා වාගේ මන්ත්‍රීවරුන් තමයි ගන්න පුළුවන් වුණේ. ඉතින් ඊයේ එතුමා අපේ නායකතුමාට දැඩි අපහාස සිදු කළා. අපි ඒ සියල්ල ප්‍රතික්ෂේප කරනවා.

අවසාන වශයෙන් මට එක දෙයක් මතක් වෙනවා. අර කතන්දරයක් තිබෙනවා. එක්තරා කාලයක රජ කෙනෙක් හිටියාලු. මේ රජ්ජුරුවෝ බලා ගන්න හිටියාලු වඳුරෙක්.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

රජතුමාට තිබෙන ආදරයට ගරු සභාපතිතුමනි, මේ මෝඩ වඳුරා රජතුමාගේ බෙල්ලේ මැස්සෙක් වැහුවාම රජතුමාගේ බෙල්ලට කෙටුවාලු. මැස්සා පන්නන්න. ඉතින් ඒ වාගේ දෙයක් තමයි මේ සිදු වී ගෙන යන්නේ. අපි මේ වැරදි නිවැරදි කර ගන්නය කියලා ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරපු රීති විරෝධී ප්‍රකාශ හැන්සාඩ් එකෙන් ඉවත් කරනවා. මීළඟට සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[ අ.භා. 02.45 ]

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ 27 වැනි මුදල් ප්‍රකාශය සහ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයන් යටතේ නවක මන්ත්‍රීවරයකු වශයෙන් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම බස්නාහිර පළාත් සභාව අනෙකුත් පළාත් සභාවලට වඩා සුවිශේෂී පළාත් සභාවක්. විශේෂයෙන්ම සමස්ත භූමි ප්‍රමාණයෙන් 5% ක් ද, ඒ වාගේම මුළු ජනගහනයෙන් 28% ක් ද ජාතික ආදායමෙන් 46% ක් ද ලබා දෙනවා අපි පළාත් සභාව තුළින්. ඒ වාගේම ප්‍රධාන ආර්ථික පරිපාලන මධ්‍යස්ථාන සියල්ලම අප පළාත් සභාව තුළ පිහිටා තිබෙනවා. කර්මාන්ත අංශයෙන් 33% ක් ද, සමස්ත නිෂ්පාදනයෙන් 77% ක් ද එකතු කර දෙන්නේ අපේ පළාත් සභාව තුළිනුයි. තවත් සුවිශේෂී කරුණක් මේ අයවැය තුළින් අපට දැක ගන්න පුළුවන්. විශේෂයෙන්ම අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුගත වෙමින් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යයක් කරා යන ගමනට අනුගත වෙමින්, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මේ වැඩ පිළිවෙළට අපේ පළාත් සභාව තුළින් එතුමා විශාල දායකත්වයක් ලබා දී තිබෙනවා. මේ අයවැය තුළින් අපට පැහැදිලිව ඒ කරුණු දැක ගන්න පුළුවන්. ඒ වාගේම එතුමා උපාය මාර්ගික සංවර්ධන සැලසුම් හඳුනාගෙන, පස් අවුරුදු සැලැස්මක් සකස් කරලා, මේ අයවැය තුළින් ඒ සඳහා ප්‍රමුඛතාවයක් ලබා දීලා නියමිත මුදල් ඒ දිස්ත්‍රික්කවලට සමාන ආකාරයෙන් බෙදී යන ආකාරයට කටයුතු කර තිබීම සුවිශේෂී ලක්ෂණයක්

වශයෙන් අපට එතුමාගේ වැය ශීර්ෂය යටතේ කථා කරන්න පුළුවන්. ඒ වාගේම මේ රටේ ප්‍රමුඛතම සම්පත, මානව සම්පත. මානව සම්පත සුරක්ෂිත කරන්න අපි සියලු දෙනා බැඳිලා සිටිනවා. ඒ අත්‍යවශ්‍ය කාර්ය පිළිබඳව එතුමා හොඳින් හඳුනාගෙන මානව සම්පත, මනාව කළමනාකරණය කරන්න මේ අයවැය ලේඛනය තුළින් අපට දැක ගත හැකි කාර්යයක්.

ඒ වාගේම විශේෂයෙන්ම අධ්‍යාපනය වෙනුවෙන් එතුමා රුපියල් දස ලක්ෂ දහ අට දහස් හයසිය හැත්තෑවක මුදලක් වෙන් කරලා තිබෙනවා. එය සමස්ත වියදමින් 38% ක මුදලක්. අපට සතුටු වෙන්න පුළුවන්. එය අනාගත ආයෝජනයක්. ඒ වාගේම දැනුම, ආකල්ප, කුසලතා පදනම් කර ගත් කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයකට අප පළාත් සභාව පරිවර්තනය වේගෙන යනවා. අපි ඒ සඳහා අපේ ඉලක්කගත කරුණුවලට යන්නට මේ අයවැය ලේඛනය අපට ප්‍රයෝජනවත් වෙනවා. ඒ තුළින් මානව සම්පත් දියුණු කිරීම ප්‍රමුඛතම කාර්යයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම එදා නගරයේ එක පාසලක් හෝ දෙකක් පමණයි දියුණු තත්ත්වයට පත් වෙලා තිබුණේ. අද මුළු බස්නාහිර පළාත් සභාව තුළ සෑම පාසලක්ම එකම ආකාරයේ භෞතික සම්පත්, මානව සම්පත් ආදී සියලු සම්පත් ඒ පාසල්වලට ලැබිලා තිබෙනවා. ඒ නිසා අද අපට සතුටු වෙන්න පුළුවන්. අද ගුරු හිඟය සම්පූර්ණයෙන්ම අවසන් කරලා තිබෙනවා. ඒ වාගේම ඔබතුමාට හැකි වී තිබෙනවා, පසුගිය වර්ෂ තුන තුළ ගුරුවරුන් 10,089 ක් අලුතෙන් මේ සේවයට බඳවා ගැනීමට හැකි වීම අප ලත් ජයග්‍රහණයක් වශයෙන් හඳුන්වන්න පුළුවන්.

ඒ වාගේම 2015 වර්ෂයේ මේ ගුරු පුහුණු කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 100 ක් වෙන් කිරීම ද, ඒ වාගේම අපේ පාසල අපේ දැතින් සුරකිමු වැඩ සටහන අද ඉතා ජනප්‍රියව, විශේෂයෙන්ම අපේ කළුතර අධ්‍යාපන කලාප කාර්යාලය ඉතා සාර්ථක ලෙස ඔබතුමාගේ උපදෙස් පරිදි පානදුර අධ්‍යාපන කොට්ඨාශයේ අපි ඒ කාර්යය කළා. ඒ වාගේම අද අපට සතුටු වෙන්න පුළුවන් පානදුර අධ්‍යාපන කොට්ඨාශය තුළ කිසිදු ගුරුවරයෙකුගේ කිසිදු හිඟයක් නැහැ. භෞතික සම්පත්වලින් සියලුම පාසල් ආඪ්‍ය වෙලා තිබෙන්නේ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා, අපේ නිම නොකළ ගොඩනැගිලි සියල්ලටම මෙම වර්ෂය තුළ මුදල් ලබා දුන්නා. ඒ පිළිබඳව අපි ස්තූතිවන්ත වෙනවා. ලබන වර්ෂයේ අපට ඉතා කුඩාම මුදලක්, පොඩි මුදලක් අවශ්‍ය වෙන්නේ. පානදුර කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය තුළ අපේ භෞතික සම්පත් දියුණු කර ගන්න. ඒ වාගේම අධ්‍යාපනය වෙනුවෙන් විශාල මුදලක් වෙන් කිරීම ගැන මම ස්තූතිවන්ත වෙනවා.

ඒ වාගේම ඊළඟ කාරණය ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් අපි කළුතර අධ්‍යාපන කලාපයේ ව්‍යුහ කමිටුව තුළ සාකච්ඡා කළා, ඒ කලාප අධ්‍යක්ෂවරු, කොට්ඨාශ අධ්‍යක්ෂවරු ගෙනැල්ලා ඒ කාර්යය නියමිත පරිදි ඉටු කරන්න. පාසලෙන් පසුවත් ඒ දරුවන්ට අධ්‍යාපනය ලබා දීමට කටයුතු කර ගෙන යනවා. ප්‍රතිඵල ඉහළ නැංවීමේ ඒ වැඩ සටහන ඉතාම සාර්ථකව අපේ කලාපය තුළ සිද්ධ වෙනවා. අපේ දිස්ත්‍රික්කය තුළ සිද්ධ වෙනවා.

එමෙන්ම ආර්ථික විද්‍යාත්මක මූලධර්ම මත රටක සංවර්ධනය මනින මූලික ඒකකයක් අධ්‍යාපනය. නැත්නම් සාක්ෂරතාවය. සාක්ෂරතාවය 98% ක් දක්වා නැංවීමටත්, ඒ වාගේම 1 – 11 ශ්‍රේණිවල සිසුන් රඳවා ගැනීමටත්, ශිෂ්‍යත්ව ප්‍රතිඵල සහ අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ හා උසස් පෙළ ප්‍රතිඵල ඉහළ නැංවීමටත්, විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ප්‍රවේශ වන දරුවන්ගේ සංඛ්‍යාව ඉහළ නැංවීමටත් මේ බස්නාහිර පළාත් සභාව තුළින් විශේෂ වැඩ පිළිවෙළක් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා කර ගෙන යනවා. ඒ වාගේම පළාත් පාලනය. පළාත් පාලන ආයතනයක වසර 09 ක් පානදුර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරපු පුද්ගලයෙක් වශයෙන් පළාත් පාලන ක්ෂේත්‍රයේ ගැටළු පිළිබඳව මනා අවබෝධයක් සහ අත්දැකීමක් මට තිබෙනවා. ඒ වාගේම මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ස්තූතිවන්ත වෙනවා. 2015 වර්ෂයේ පළාත් පාලන ආයතනවල පුනරාවර්තන වියදම් දැරීම සඳහා ඔබතුමා රුපියල් දස ලක්ෂ 5671 ක මුදලකුත්, එයිනුත් පළාත් පාලන ආයතනවල මාර්ග පද්ධතිය සඳහා මිලියන 155 ක් වෙන් කර තිබීම ඉතා සතුටට කාරණයක්. ඒ වාගේම දුෂ්කර ග්‍රාමීය මාර්ග, සති පොළ සංවර්ධනය, ප්‍රජා ජල ව්‍යාපෘති ආදී ඒ සියල්ල සඳහා මිලියන 39 ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අයවැය ලේඛනයට සම්පූර්ණ සහයෝගය ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[ අ.භා. 02.50 ]

**ගරු ෆායිස් මොහොමඩ්**
Hon. Mohamed Faiz

ගරු සභාපතිතුමනි, මේ අධ්‍යාපනය වෙනුවෙන් ගරු මහ ඇමතිතුමා විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ තුළින් උතුරු කොළඹ, මැද කොළඹ මුස්ලිම් පාසල්වලට ගොඩනැගිලි ලබා දීලා, ඒ වාගේම භෞතික සම්පත් ලබා දීලා සංවර්ධනය කරන්නට අපට පසුගිය වකවානුව තුළදී අවස්ථාව ලැබුණා. මම හිතන විධියට, පසුගිය වකවානුව තුළදී විශාල මුදල් කන්දරාවක් කොළඹ කලාපය විසින් අපට ලබා දීලා, ඒ මුදල් නිසි ආකාරයට පරිපාලනය කරලා, පාසල් සංවර්ධනය කරන, ඒ කළමනාකරණය කරන ඒ අයගෙන් අපි විශාල මුදලක් ලබා ගෙන ඒ පාසල් සංවර්ධනය කරන්නට අපට අවස්ථාව ලැබුණා. ඒ වාගේම රාසික් ෆරීඩ් විදුහලට අපට ගොඩනැගිල්ලක් ලබා දෙන්නටත්, ඒ වාගේම අල් හික්මා විදුහලට ගොඩනැගිල්ලක් ලබා දෙන්නටත්, ඒ වාගේම ශාන්ත අන්තෝනි දෙමළ විදුහලට අලුත් ගොඩනැගිල්ලක් ලබා දෙන්නටත්, ඒ වාගේම ශාන්ත ජෝන් විදුහලට ගොඩනැගිල්ලක් ලබා දෙන්නටත් අපට ඒ මුදල්වලින් විශාල වශයෙන් අවස්ථාව ලැබුණා.

අපි ඉස්සර පාසල්වලට යන කොට අපට විදුහල්පතිවරුන් කියන්නේ, දෙමව්පියන් කියන්නේ ගුරුවරුන් නැහැයි කියලා. ඒ වාගේම මේ වකවානුව තුළදී මුස්ලිම් පාසල්වලට, දෙමළ පාසල්වලට ගුරුවරුන් බඳවා ගැනීමට අපට හැකි වුණා. ඒ නිසා හොඳ අධ්‍යාපනයක් උතුරු කොළඹ පළාත තුළ දැන් සිදු කෙරෙනවා. අපට දැන් ඒ ළමයි වෙනුවෙන්, ඒ අඩු ආදායම්ලාභී පවුල්වල ජීවත් වන දුප්පත් දුවා දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් කටයුතු කරන්න හැකි වෙලා තිබෙනවා. මම හිතන විධියට උතුරු කොළඹ, මැද කොළඹ සිංහල, දෙමළ මුස්ලිම් පාසල්වල හොඳ අධ්‍යාපනයක් කර ගෙන යන්නට අපට ඒ අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒ වාගේම මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා කිව්වා, පාසල්වල පරිපාලනය කඩා ගෙන වැටිලා, ඒ පාසල් හරියාකාරව අධ්‍යාපනයක් ලබා දෙන්නේ නැහැයි කියලා. මම හිතනවා, ඒක වැරදි මතයක්. දැන් ඉන්න සියලුම විදුහල්පතිවරුන් ඒ පාසල්වල හොඳ පරිපාලනයක් කර ගෙන යනවා. අපට ඉස්සර වාගේ පාසල්වලට ගියොත් අඩුපාඩු තමයි අපට වැඩියෙන්ම කියන්නේ. නමුත් දැන් ඒ තත්ත්වය නැහැ. මම හිතන විධියට ඕනෑම පාසලකට ඕනෑම දරුවෙකු ඇතුළත් කරන්නට ඒ අවකාශය අපට ලැබිලා තිබෙනවා. ඒ වාගේම මම හිතන විධියට උතුරු කොළඹ, මැද කොළඹ පාසල්වලට කිසිම මුදල් අය කිරීමකින් තොරව අපට පාසල්වලට ළමයින් ඇතුළත් කර ගන්නට අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒ වාගේම ඉස්සර අපට ගුරුවරුන්ගේ අඩුපාඩුවක් තිබුණත් ගරු මහ ඇමතිතුමා විසින් අද අපට ඒක නැති කරලා දීලා තිබෙනවා. ඒ වාගේම අපි මහ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ අවස්ථාව අපට ලබා දීම සම්බන්ධයෙන්. ඒ වාගේම පසුගිය වකවානුව තුළදී ගරු මහ ඇමතිතුමාගේ උපදේශක කාරක සභාවේදී අපි කොලොන්නාව ප්‍රදේශයට මුස්ලිම් පාසලක් ඉල්ලා තිබුණා. නමුත් මේ 2015 වසරේදී ගරු මහ ඇමතිතුමා පන්ති දෙකක් පටන් ගන්න අපට අවසර ලබා දීලා තිබෙනවා. ඒ, කොලොන්නාව ප්‍රදේශයේ මුස්ලිම්, දෙමළ මාධ්‍යයෙන් ඉගෙන ගන්නා ඒ දරුවන්ට ඒ අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මුස්ලිම් ජනතාව වෙනුවෙන් අපි ස්තුතිවන්ත වෙනවා. ගරු මහ ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම උතුරු කොළඹට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. මේ පාසල් සංවර්ධනය කරන්න.

පසුගිය වකවානුව තුළදී අපි එහෙට යනවා මෙහෙට යනවා කියලා කට කතා පැතිරෙමින් යනවා. ඒ නිසා කවදාවත් එවැනි තත්ත්වයකට අපි පත් වෙන්නේ නැහැ. අපි යන්නේ නැහැ. පක්ෂය, අපි තවම කාටවත් තීරණය කරලා නැහැ. (බාධා කිරීම්) ඒ නිසා අපි පවතින රජයත් එක්ක - මම හිතන විධියට කවුරුත් දන්න විධියට අපි කවදාවත් සල්ලිවලට ඔතැනට එන්නේ නැහැ. මේ සංවර්ධන කටයුතු කර ගෙන යන්නට අපට මහ ඇමතිතුමා ඕනෑ තරම් මුදල් ලබා දීලා තිබෙනවා. ඒ නිසා මේ මුදල්වලට අපි කවදාවත් යටත් වෙන්නේ නැහැ. ඔබතුමන්ලාට වෙන ක්‍රමයකින් යන්න පුළුවන්. ඒ නිසා අපව මුදල්වලට ගන්න බැහැ. අපි පළාත් සභාවේදී කවදාවත් එහාට යන මිනිස්සු නොවෙයි. පළාත් සභාව ශක්තිමත් කරන්නට අපි මේ පක්ෂයත් එක්ක ඉඳගෙන ඇතුළේදී සටන් කරලා අපි ජයග්‍රහණය කරනවා කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 02.56 ]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අයවැය සම්බන්ධයෙන් සාකච්ඡාවට

සහභාගී වෙද්දී, ඔබ කවුරුත් දන්නවා, පසුගිය කාලය පුරාම දිගින් දිගටම, පසුගිය මාස අටක් පුරා අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබෙන විවිධ ගැටළු සම්බන්ධයෙන් මම මේ සභාවේ ප්‍රශ්න කළා. ඒ වාගේම කල් තැබීමේ යෝජනා ඉදිරිපත් කළා. එවැනි වට පිටාවක් තුළ නැවතත් මෙම අයවැය විවාදයට එක් වෙමින් මට මතු කරන්න තිබෙන්නේ, මම ඒ පසුගිය කාලය පුරාම, දිගටම අරගල කරපු සමහර කාරණා සම්බන්ධයෙන් තවදුරටත් ඒ විවේචන ඒ විධියටම අපට ඉතිරි වෙලා තිබෙනවා කියන එකයි.

විශේෂයෙන්ම මේ අයවැයේ හත් වැනි පිටුවේ එතුමා කියනවා, අයවැය සඳහා 4.09% ක වැඩි වීමක් සිදු කරලා තිබෙනවා, ගිය අවුරුද්දට වඩා කියලා. මුදලින් වැඩි වෙලා තිබෙනවා. හැබැයි, ප්‍රතිශතයක් විධියට ගත්තාට පස්සේ ගිය අවුරුද්දේ 41% ක් වෙන් කළා. රුපියල් මිලියන 43,707 ක්. ඒකෙන් 17,936 ක්. හැබැයි, මේ වසරේ වෙන් කරලා තිබෙන්නේ, 38% යි. මිලියන 48,513 න් 18,670 ක් විතරයි. ඒ නිසා ප්‍රතිශතාත්මකව ගත්තාට පස්සේ වැඩි වීමක් නැහැ. මේකේ තිබෙන්නේ, පැහැදිලිවම අඩු වීමක්. ඒ විතරක් නොවෙයි. රජයේ අයවැයෙන් රුපියල් බිලියන 310 ක් වෙන් කරලා, 4.1% ක් වෙන් කළා කියලා ඔබතුමා අයවැය කථාවේ සඳහන් කරලා තිබෙනවා. ඒකත් සම්පූර්ණ අසත්‍යයක්. මොකද, අපි දිගින් දිගටම මේ රටේ වෘත්තීය සමිති වෙන්න පුළුවන්, එහෙම නැත්නම් මේ රටේ අධ්‍යාපනඥයින් වෙන්න පුළුවන්. විශ්ව විද්‍යාල වෘත්තීය සමිති සම්මේලනය වෙන්න පුළුවන්. විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ වෘත්තීය සමිති සම්මේලනය වෙන්න පුළුවන්. මේ සියලු දෙනා ඉල්ලා සිටියේ, සමස්ත දළ ජාතික අධ්‍යාපනයෙන් 6% ක් අධ්‍යාපනයට වෙන් කරන්න. ඒ හරහා පමණයි මේ රටේ නිදහස් අධ්‍යාපනය සැබෑවටම අර්ථවත් කරන්න පුළුවන්. නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කරන්න පුළුවන්. නමුත් මේ වෙන් කිරීම, 4.1% යි කියන්නේ, බිලියන 310 යි කියලා කියන්නේ, දෙමව්පියන්ගේ පාසල් උපකාරක පන්තිවලට යන ගාස්තු, පාසල් වෑන් රථවලට යොදවන ගාස්තු මේ සියල්ල එකතු කරලයි. ඒ නිසා ඒක 4.1% ක් ලෙස අපට පිළිගන්න පුළුවන්කමක් නැහැ. 6% ක් කියලා මේ රටේ සටන් පාඨයක් ලෙස, 6% ව්‍යාපාරයක් කියලා නිර්මාණය වුණේ වෙන කිසිවක් නිසා නොවෙයි. මුළු දළ ජාතික නිෂ්පාදිතයෙන් 6% ක් අධ්‍යාපනයට වෙන් කරන්නය කියන කාරණ යයි. ඒ වාගේම මේ වසරේ අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා අධ්‍යාපන වැය ශීර්ෂයෙන් වෙන් කරලා තිබෙන්නේ, රුපියල් බිලියන 88.70 යි. ඒක 310 ක් ලෙස අර්ථ ගැන්වීම සම්පූර්ණ වැරැද්දක් කියලා මට මේ අවස්ථාවේ පෙන්වා දෙන්න වෙනවා.

ඒ විතරක් නොවෙයි, දැන් මේ වන කොට ඔබතුමා අපට ලබා දුන්නා, සංවර්ධන ප්‍රගති සහ ඉලක්ක - 2015 කියලා. එතකොට මේ සටහනේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ තිබෙන සංඛ්‍යා ලේඛන අතර බරපතළ පරස්පරයක් තිබෙනවා. අපි දන්නේ නැහැ, කෝකද නිවැරදි කියලා. 2012 අගට ඔබතුමා මෙහි සඳහන් කරනවා, 1 AB පාසල් 101 ක් තිබෙනවා කියලා. මේ පොතේ සඳහන් වෙන්නේ එහෙමයි. හැබැයි, අධ්‍යාපන අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන සඳහන් වෙනවා 1 AB පාසල් 162 ක් තිබෙනවාය කියලා. එතකොට 101 ක් තිබෙන තැන. දැන් මේ පළාතේ බරපතළ ලෙස විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්නයක් තිබෙනවා. විදුහල්පතිවරු පත් කිරීම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. එතකොට මේ අධ්‍යාපන අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛනවල සඳහන් වෙනවා, බස්නාහිර පළාතේ අධ්‍යාපන පරිපාලන සේවයේ 140 ක් ඉන්නවා කියලා. ඒ වාගේම විදුහල්පති සේවයේ පළමුවැනි පන්තියේ 294 ක් ඉන්නවාය කියලා සඳහන් වෙනවා. එතකොට එවැනි වට පිටාවක් තුළ ඇයි මේ 1 AB පාසල් 101 ට විදුහල්පතිවරු පත් කරන්න බැරි. එතකොට බස්නාහිර පළාත තුළ විදුහල්පතිවරු පත් කිරීමේ බරපතළ ගැටළුවක් මතු වෙලා තිබෙනවා. කල්පනා කරලා බලන්න. මම දිගින් දිගටම පසුගිය කාලයේ ප්‍රශ්න කළා. විශේෂයෙන්ම අසෝක විද්‍යාලයේ ප්‍රශ්නයක් මතු වුණා. එය තවදුරටත් නිරාකරණය නොවුණු ප්‍රශ්නයක් විධියට තිබෙනවා. හේනේගම මධ්‍ය මහා විද්‍යාලයේ ප්‍රශ්නයක් මතු වුණා. ඒ ප්‍රශ්නයට උත්තර දෙද්දී ඔබතුමා කිව්වා, විමර්ශනය කරලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරනවාය කියලා. හැබැයි, මම ප්‍රශ්නය මතු කරලා මාස දෙකකට වැඩියි. අද වන තෙක් ඒ විදුහල්පතිවරයා තවදුරටත් ඒ පාසලේ වැඩ කරමින් ඉන්නවා. දැන් මේ වන කොට පාසල් ගණනාවක ගැටළු මතු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මම කලින් සඳහන් කළා වාගේ අසෝක විද්‍යාලය. ඒ වාගේම හේනේගම විද්‍යාලය. දැන් විද්‍යාකර බාලිකා විද්‍යාලය - මහරගම. ඒ වාගේම යක්කල අනුර මහා විද්‍යාලය. මේ පාසල්වලට අදාළව දෙමව්පියන් ඒ වාගේම ගුරුවරුන් ඔබතුමා වෙත සහ අනෙකුත් අධ්‍යාපන බලධාරීන් වෙත යොමු කරන ලද ලිපි මා සතුව තිබෙනවා. නමුත් මේ කිසිවකට විධිමත් ලෙස පරීක්ෂණ කරලා, විමර්ශනය කරලා කටයුතු කරලා නැහැ. අපි කියන්නේ

[ ගරු මහින්ද ජයසිංහ ]

නැහැ මේ ලිපිවල තිබෙන සියලු කරුණු ඒ විධියටම අපි ගෙඩි පිටින් භාර ගන්නවාය කියලා. හැබැයි, මේ කරුණු සම්බන්ධයෙන් විමර්ශනයක් කරන එක, මේ කරුණු සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කරන එක මහ ඇමතිතුමා ප්‍රමුඛ මේ පළාතේ අධ්‍යාපන බලධාරීන්ගේ වගකීමක්. මේ මා සතුව තිබෙන්නේ, බත්තරමුල්ල විද්‍යාලෝක විද්‍යාලය සම්බන්ධයෙන් ඒ ගුරුවරුන් පිරිසක් යොමු කරපු ලිපිය. ඒ වාගේම යක්කල අනුර විද්‍යාලය සම්බන්ධයෙන් ගුරුවරුන් යොමු කරපු ලිපියක් මා සතුව තිබෙනවා. මේ තිබෙන්නේ යක්කල අනුර විද්‍යාලය. ඒ යොමු කරලා තිබෙන්නේ ඔබතුමාට. එකොළොස් වැනි මාසේ විසි වැනිදා මේ ලිපිය යොමු කරලා තිබෙනවා. මේ මොහොතේ මම අහන්න කැමැතියි. කුමක්ද මේ සම්බන්ධයෙන් ගත්ත පියවර. මේ කරුණු ඇත්තද? නැත්තද? මේවා නිවැරදි ද? මේවා සාවද්‍ය කරුණු නම් මේ සභාවට, ඒ වාගේම මේ අදාළ පුද්ගලයින්ට දැන්වීමට සිදු වන්නේ, විමර්ශනයක් මගින් පමණයි.

ඒ විතරක් නොවෙයි. මා සතුව තිබෙනවා, ඔබතුමා ඊයේ සභාගත කළා විද්‍යාලෝක විදුහල - මහරගම, විදුහල්පති බඳවා ගැනීම සම්බන්ධ ලේඛනය. ප්‍රශ්නවලට උත්තර දීලා තිබුණා. ඔබතුමාම ප්‍රශ්නවලට උත්තර දෙද්දී සඳහන් කරනවා මේ විදුහල්පතිවරු බඳවා ගැනීමේදී අදාළ වන්නේ, 1998/23 කියන චක්‍රලේඛය, 1998.07.06 දිනැති චක්‍රලේඛය කියලා. හැබැයි, ඒ චක්‍රලේඛය අනුව මොකක්ද කියන්නේ? මහරගම විද්‍යාලෝක විද්‍යාලය කියලා කියන්නේ, විද්‍යාකර බාලිකාව කියන්නේ, 1 AB පාසලක්. 1 AB පාසලකට කාවද? පත් කරන්න ඕනෑ. ඔබතුමාම මේකේ කියනවා. 1 AB පාසලකට පත් කරන්න ඕනෑ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් හා විදුහල්පති පළමු ශ්‍රේණියේ නිලධාරීන් කියලා.

ගරු සභාපතිතුමනි, මා සතුව තිබෙනවා, ගරු මහ ඇමතිතුමා සභාගත කරපු සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලේඛනය. එතකොට මේ ලකුණු ලේඛනයේ කාවද පත් කරලා තිබෙන්නේ? මේකේ ඉන්නවා අධ්‍යාපන පරිපාලන සේවයේ - මේ පාසල සඳහා අයදුම් කරපු අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් පස් දෙනෙක් ඉන්නවා. නිලධාරිනියන් පස් දෙනෙක් ඉන්නවා. ඒ පස් දෙනා ඉන්දැද්දී විදුහල්පති සේවයේ 2/II ශ්‍රේණියේ කෙනෙක් තමයි පත් කරලා තිබෙන්නේ. අඩුම තරමේ මේ විදුහල්පති සේවයේ 2/II හි - ගරු මහ ඇමතිතුමනි, 2/II අඩුම තරමින් Interview කරන්නවත් බැහැ. ඇයි? මේ පාසලට සුදුසුකම් ලබන්න ඕනෑ, අධ්‍යාපන පරිපාලන සේවයේ අය සහ, විදුහල්පති සේවයේ 1 වන ශ්‍රේණියේ අය. එතකොට විදුහල්පති සේවයේ 2/II අය කොහොමද සම්මුඛ පරීක්ෂණවලට කැඳෙව්වේ? සම්පූර්ණයෙන් වැරදියි. වැරදි ක්‍රමවේදයක් අනුගමනය කරලා තිබෙන්නේ. එවැනි ක්‍රමවේදයන් හදලා, මම අහනවා කොහොමද පළාතේ අධ්‍යාපනය දියුණු කරන්නේ? මෙහෙමද පළාතේ අධ්‍යාපනය දියුණු කරන්නේ? වැරදි ක්‍රමවේදයන් අනුගමනය කරලා, වැරදි පුද්ගලයින් පාසල්වලට පත් කරලා, ඒ පාසල් කාබාසිනියා වෙන්න ඉඩ ඇරලා කොහොමද පළාතේ අධ්‍යාපනය නගා සිටුවන්නේ? ඒ නිසා සම්පූර්ණයෙන්ම වැරදි ක්‍රමවේදයක් අනුගමනය කරමින් තිබෙනවා. පාසල් තුළ බරපතළ ගැටළු ගණනාවක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා මම කැමැතියි, මේ අයවැය විවාදයේදී ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න. වහාම මේ පාසල් පද්ධතිය දේශපාලනීකරණයෙන් මුදවා ගත යුතුයි. දේශපාලනීකරණය කරමින් මේ පාසල් තුළ අද ගෙනියන මේ ව්‍යාපෘති සම්පූර්ණයෙන්ම නතර කරන්න කටයුතු කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, කල්පනා කරලා බලන්න. අපි පාසල්වලට මුදල් වෙන් කරනවාට විරුද්ධ නැහැ. රුපියල් පනස් දාහ, ලක්ෂය, ලක්ෂ එකහාමාර ගණනේ මුදල් වෙන් කළා. ඒකට අපි විරුද්ධ නැහැ. හැබැයි, මොකක්ද අද සිදු වෙන්නේ? වෙන කවර වසරකවත් නොමැති විධියට ඉතාම පැහැදිලිව ජනාධිපතිවරණය ඉලක්ක කර ගනිමින් මොකක්ද? කරමින් තිබෙන්නේ. මේ රජයේ මුදල්. මේ මුදල් මහ ඇමතිතුමාගේ අතින් දෙන මුදල් නොවෙයි. මේ මුදල් පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ අතින් දෙන මුදල් නොවෙයි. මේ රජයේ මුදල් යොදා ගනිමින්, ඒ රජයේ මුදල් පාසල්වලට බෙදා දෙමින්. බෙදා දෙන්න මොකක්ද? කරන්න ඕනෑ. උත්සව තියන්න ඕනෑ. මන්ත්‍රීවරු ගෙනැල්ලා උත්සව තියන්න ඕනෑ. එතකොට උත්සව තියන එකට එකක් බැනර් එක දාන්න ඕනෑ. බැනර් එකට අර කලිනුත් උදෙත් කථා කළා. රුපියල් භාර පන්දාහක් යනවා බැනර් එකට. කොහෙන්ද සල්ලි. පාසල් සංවර්ධන අරමුදලින් සල්ලි ගන්න ඕනෑ. එහෙම තමයි නියෝග කරලා තිබෙන්නේ. අතින් දෙන කිහිප දෙනෙක් ඇති. ඒක වෙනම කථාවක්. නමුත් අද රු. 50,000/- ක්

දෙනවා. රු. 5000/- යි බැනර් එකට. උත්සවයට 5000/- යි. රු. 40,000/- ක් වත් ඉතිරි වෙන්නේ නැහැ, පාසලේ තීන්ත ගාන්න. ඉතින් එවැනි වටපිටාවක් නිර්මාණය වෙලා තිබෙන්නේ. මේක සම්පූර්ණ දේශපාලන ව්‍යාපෘතියක් බවට පත් කර ගෙන තිබෙනවා. අපි සම්පූර්ණයෙන්ම ඒකට විරෝධය පළ කරනවා. ඒ විතරක් නොවෙයි. දැන් මා සතුව තිබෙනවා, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙක් යවපු ලිපිය. මේ ව්‍යාපෘතිය ඉවර වෙලත් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඕක එදත් කිව්වා නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එදා කිව්වේ නැහැ. අලුත් එකක් මේක. මේ තිබෙන්නේ මේක ඉවර වෙලා, වැඩ සටහන අවසන් වෙලා, ෆොටෝ ගහලා, බැනරය සහිත ඡායාරූපයක්. සහභාගී වූ දෙමව්පියන්ගේ ඡායාරූපයක්. චෙක්පත් ප්‍රදානය කරන ආකාරය දැක්වෙන ඡායාරූපයක්. පුහුණු ගුරු භවතුන්ට සහතික ලබා දීමේ හෝ පහ ශිෂ්‍යත්වය විභාගයෙන් ලකුණු 100 ට වැඩියෙන් ලබා ගන්නා ලද සිසුන්ට සහතික ප්‍රදානය කිරීමේ ඡායාරූපයක්. ඒ සියල්ල එක්ක වාර්තාවක් එවන්න ඕනෑ. මොකක්ද මේ? හරි පැහැදිලියි. මේක ඉතාම පැහැදිලිව දේශපාලන ව්‍යාපෘතියක්. ඒ නිසා අපි කියනවා. මුදල් දුන්නාට කමක් නැහැ. හැබැයි -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්ත්‍රීතුමා, කවුද? ඔය ලිපිය යවලා තිබෙන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ ලිපිය යවලා තිබෙන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඔය ලිපි ටික ඔක්කොම සභාගත කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - මීනුවන්ගොඩ, නෝනිස් මැතිතුමා තමයි මේක යවලා තිබෙන්නේ. දැන් එතුමා කියන්නේ, මේ එතුමාගේ උවමනාවට නොවෙයි නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාවෙන් පස්සේ ඒ සියලුම ලිපි සභාගත කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. මම සභාගත කරනවා. එතකොට මේ එතුමාගේ කැමැත්ත නොවෙයි නේ? මේ ඉහළින් එන නියෝග. ඒ නිසා තමයි එතුමන්ලාට මේ විධියට කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. අද පළාතේ ගුරුමාරු. ගුරුමාරුවලට මොකද වෙලා තිබෙන්නේ? 2008.12.31 න් පස්සේ ගුරු මාරු කරද්දී, විශේෂයෙන්ම මේ ගුරුමාරු වීම් කරද්දී, මීගමුව, කැලණිය, මීනුවන්ගොඩ කලාපවලට අයත් පත් වීම් - ඒ කියන්නේ, 2008.12.31 න් පස්සේ පත්වීම් ගත් අයව මාරු කරන්න බැහැයි කියලා ඔබතුමන්ලා පළාත් මාරු මණ්ඩලයේදී යම් එකඟතාවයකට ආවා. පළාත් අමාත්‍යාංශ ලේකම්තුමාත් එක්ක ගිය වසරේ මාරු වීම් කරද්දී 2008.12.31 න් පස්සේ මේ පළාතට පත්වීම් ගත් අයව මාරු කරන්න බැහැයි කියලා එකඟතාවයකට ආවා. දැන් වන කොට තිබෙන එකඟතාවය තමයි 2009.12.31 න් පස්සේ පත්වීම් ලැබූ අයගේ ස්ථාන මාරුවීම් කරන්න බැහැ. හැබැයි, ඇත්තටම මොකක්ද? වෙලා තිබෙන්නේ. මීගමුව, කැලණිය, මීනුවන්ගොඩ කලාපවල ඒ කියන්නේ, 2008.12.31 න් පස්සේ පත් වීම් ගත්ත සීයකට වැඩිය ස්ථාන මාරුවීම් කරලා තිබෙනවා. කාගේ උවමනාවටද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

2011 වන තෙක් පත් වීම් ගත් අය පුළුවන් ගරු මන්ත්‍රීතුමා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම ඔබතුමාට කියන්නේ මාරු මණ්ඩලයේ ආපු එකඟතාවය. ලේකම්තුමාත් ඉන්නවා. ලේකම්තුමාගේත් සහභාගීත්වය ඇතිව ආපු එකඟතාවය තමයි ගිය වසරේ මාරුවීම් කරද්දී, 2008.12.31 න් පස්සේ පත් වීම් ගත් අය මාරු කරන්න බැහැයි කියන තීන්දුව. හැබැයි, මොකද වෙලා තිබෙන්නේ? 100 කට වැඩි ප්‍රමාණයක් ස්ථාන මාරු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ජාතික පාසල්වලට - ඔබතුමා මට උත්තරයක් දුන්නා. ජාතික

[ ගරු මහින්ද ජයසිංහ ]

පාසල්වලට ස්ථානමාරු වීම් කරන එක නවත්වලා තිබෙනවාය කියලා. හැබැයි, තිහකට වැඩිය ජාතික පාසල්වලට ස්ථාන මාරු වීම් ලබා තිබෙනවා, මාරු මණ්ඩල ක්‍රියාවලියෙන් බැහැරව. මාරු මණ්ඩල 2004/20 චක්‍රලේඛයෙන් බැහැරව ස්ථාන මාරුවීම් ලබලා තිබෙනවා. මේක තමයි අද පළාතේ අධ්‍යාපන ක්ෂේත්‍රයට අත් වෙලා තිබෙන ඉරණම.

ඒ විතරක් නොවෙයි. දැන් ප්‍රශ්න පත්‍ර ගැටළුව. ප්‍රශ්න පත්‍ර ගැටළුව ගත්තාට පස්සේ අද බස්නාහිර පළාතේ විශාල බරපතළ ප්‍රශ්නයක් ලෙස තිබෙනවා. පසුගිය වාරයේ ප්‍රශ්න පත්‍ර පිට වීම සම්බන්ධයෙන් මම මේ සභාවේත් කථා කළා. පිළියන්දල ප්‍රශ්න පත්‍ර පිට වුණා. කවුද සම්බන්ධ? දේශපාලඥයකුගේ හිතවතෙක්. දේශපාලන පදනමක හිතවතෙක් තමයි ඒකට සම්බන්ධ. ඒ විතරක් නොවෙයි, දැන් මේ අවුරුද්දේ ගණිතය ප්‍රශ්න පත්‍රය පිට වුණා. මීගමුවයි, මිනුවන්ගොඩ කලාපවල. කවුද සම්බන්ධ? ගොඩිගමුව මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා. ඒ විදුහල්පතිවරයා කියන්නේ කවුද? ගිය පළාත් සභා ඡන්දයට කලින් හිටපු විදුහල්පතිවරයා ස්ථාන මාරු කරලා, වැඩ බලන්න ආපු කෙනා තමයි මේ සිද්ධියට සම්බන්ධ. මේ සිද්ධියට සම්බන්ධ වෙලා තිබෙන්නේ, වැඩ බලන්න ආපු කෙනාව. ඒ විතරක් නොවෙයි. සියලු ප්‍රශ්න පත්‍ර කලින් - දැන් මේ වතාවේ කළේ සියලු ප්‍රශ්න පත්‍ර එකට මිටි බැඳලා ඉස්කෝලවලට යැව්වා. ඒ නිසා මේවා පිට වෙන්න පටන් ගත්තා. ඒ කියන්නේ ඉස්සරහාට තියෙන එකත් යවනවා. මීට කලින් දින දෙකක වාගේ ප්‍රශ්න පත්‍ර තමයි ඉස්කෝලවලට ලබා දුන්නේ. හැබැයි, ඊට පස්සේ 6, 9 ශ්‍රේණිවල විභාගය පවත්වද්දී මොකක්ද කළේ? 6, 9 ශ්‍රේණිවල විභාගය පවත්වද්දී එදා උදේ ඇවිල්ලා ප්‍රශ්න පත්‍රය ගෙනියන්න කියලා නියෝගයක් දුන්නා. මේක අර පය බරවායට පිටිකර බෙහෙත් බඳිනවා වාගේ වැඩක්. එදා උදේ ඇවිල්ලා ගෙනියන්න ඕනෑ. තිනියාවල විද්‍යාලය, මතුගම කලාපය. කිලෝ මීටර් 52 ක් තිබෙනවා මතුගම කොට්ඨාශ කාර්යාලයට. යාමට ඒමට කිලෝ මීටර් 104 යි. 7.30 ට ඉස්කෝලේ පටන් ගෙන කොහොමද උදේ 8.00 ට ඇවිල්ලා අරගෙන ගිහින් විභාගය තියන්නේ? ඒ විතරක් නොවෙයි. හොරණ කලාපයේ සමහර ඉස්කෝල තිබෙනවා. කිලෝ මීටර් 30 ක් 35 ක් - කිලෝ මීටර් 70 ක් up and down තිබෙනවා. යන්න එන්න තිබෙනවා. ඉතින් එවැනි දුරක් ගෙවා ගෙන ඇවිල්ලා උදේ පාන්දර ප්‍රශ්න පත්‍ර ගෙනිහිල්ලා කොහොමද විභාග පවත්වන්නේ? ඒ නිසා මේ මිනිස්සු ප්‍රායෝගිකත්වයක් නැති -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මට තව ටිකක් වෙලාව දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වෙලාව දෙන්න අමාරුයි. මොකද, කාලය මදි. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මගේ කාලයෙන් එතුමාට දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමාට තව වැඩිපුර විනාඩි 05 ක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි. ඒ නිසා විභාග ප්‍රශ්න පත්‍ර සම්බන්ධයෙන්, විභාග පැවැත්වීම සම්බන්ධයෙන් එවැනි බරපතළ ගැටළුවක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. දැන් මේ මා සතුව තිබෙනවා. මට ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගෙනුත් හම්බ වුණා, අර ඉස්සෙල්ලා කියපු දෙක. නමුත් ඒ සම්බන්ධයෙන් මම වැඩිය කථා කරන්නේ නැහැ. හැබැයි, ඒ ප්‍රශ්න පත්‍රවල මම කියන්න කැමැතියි, කවුද අපේ සුසාර මන්ත්‍රීතුමාට. ඔබ විසින් ලබා දී තිබෙන - මේවා මම හදිස්සියේ පෙරළලා බැලුවා. ඔබේ ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රවල බරපතළ දෝෂ තිබෙනවා. ඉංග්‍රීසිවල වැරදි තිබෙනවා. ඒ නිසා සම්පූර්ණයෙන් දැන් මේ පිළිබඳව බරපතළ ගැටළුවක් තිබෙනවා. මන්ත්‍රීවරු විසින් මේ ලබා දෙන ප්‍රශ්න පත්‍ර, මේ ලබා දෙන සම්මන්ත්‍රණ සම්බන්ධයෙන් බරපතළ ගැටළුවක් තිබෙනවා. මා සතුව තිබෙන්නේ, මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ උපේක්ෂා ස්වර්ණමාලි නොහොත් පබා මහත්මිය විසින් බෙදා හරින ලද ප්‍රශ්න පත්‍ර දෙකක්.

මේ ප්‍රශ්න පත්‍රවලත් බරපතළ දෝෂ තිබෙනවා. දැන් මේවා සම්බන්ධයෙන් වගකියන්න ඕනෑ. අධ්‍යාපනය සම්බන්ධයෙන් වගකියනවා නම්, මේවා ගැනත් සොයා බලන්න ඕනෑ. එතකොට මේ දේවල් කරන්න කියලා නැවත වතාවක් කලාප අධ්‍යක්ෂවරයා ලිඛිතවත් දැනුම් දීලා තිබෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔය ප්‍රශ්න පත්‍ර දෙක සම්මන්ත්‍රණවල බෙදා හැරලා ද? වෙනම බෙදා හැරලාද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ. පාසල් තුළ සම්මන්ත්‍රණ කරලා. මේ කරන්න - (බාධා කිරීමක්) මම මේ ලිපියත් සභාගත කරනවා. මෙහි තිබෙනවා සිංහල, ගණිතය, විද්‍යාව, බුද්ධාගම, ඉතිහාසය හා ඉංග්‍රීසි යන විෂයයන් සම්බන්ධයෙන් ප්‍රවීණ සම්පත්දායකයින් සහභාගී වේ කියලා තමයි තිබෙන්නේ. ඉස්කෝලත් තිබෙනවා. වේවැල්දෙනිය මහා විද්‍යාලය. හේනේපොල කනිෂ්ට විද්‍යාලය, මීනුවන්ගොඩ සිරි මිහිඳු මහා විද්‍යාලය යන ආදී විදුහල්වල කියලා තිබෙනවා. මේ විදුහල් ටිකත් තිබෙනවා. එතකොට ප්‍රශ්නය තිබෙන්නේ. මේවායේ කියනවා ප්‍රවීණ සම්පත්දායකයින් -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔය ලිපිය කාගේද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ ලිපිය මීනුවන්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා තමයි යොමු කරලා තිබෙන්නේ. ඔබතුමාගේ ආසනය. ඔබතුමාගේ ආසනයේ තමයි මේ සියල්ල වෙලා තිබෙන්නේ. ඔබතුමාගේ සම්බන්ධයක් නැහැයි කියලත් කියන්න බැහැ. ඒ නිසා -

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ඒක හැම ආසනයකම වුණේ නැහැ ගරු මන්ත්‍රීතුමා

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. මට බාධා කරන්න එපා. මගේ වෙලාව ඉතාම සීමිතයි. ඒ නිසා දැන් මේ ප්‍රශ්නය තිබෙන්නේ, මේ ප්‍රශ්න පත්‍රවල බරපතළ දෝෂ තිබෙනවා. පළමුවැනි කාරණාව. මේ ෆොටෝ එක ඉස්සරහාට දාගෙන රූප රාජිනියක් වාගේ ඉන්නවා, පබා. ඊළඟට මේකේ අන්තිමට කියනවා. මේ මා සතුව තිබෙන්නේ ලබා දුන් ගණිතය - සිංහල එකේ විශාල ප්‍රමාණයක් දෝෂ තිබෙනවා. ඒ වාගේම මේ ගණිතය එකේ, මේකේ අවසානයට කියනවා. මෙවර සාමාන්‍ය පෙළ විභාගයේ විශිෂ්ට ජයග්‍රහණයට ශක්තිය, ධෛර්යය නොඅඩුව ලැබේවා. මේක ගහපු කෙනා ප්‍රාර්ථනා කරන්නේ. ගණිතයට, විද්‍යාවට ආදරය කරන දූ පුතුන්ගේ ආඩම්බරකාර තාත්තා මමයි. මේකේ තාත්තාගේ ටෙලිෆෝන් නොම්මරයත් දාලා තිබෙනවා. ආඩම්බරකාර තාත්තාගේ ටෙලිෆෝන් නොම්මරයත් දාලා. මොකක්ද මේ? වෙන මොකක්වත් නොවෙයි. තමන්ගේ ටියුෂන් එක සංවර්ධනය කර ගන්න, පෝෂණය කර ගන්න කරන වැඩක් මේක. වෙන මොකක්වත් නොවෙයි. මම සොයලා බැලුවා. කිසිදු සුදුසුකමක් නැති පුද්ගලයෙක් තමයි මේක මේ කරලා තිබෙන්නේ. නම් කියන්නේ නැහැ. නමුත් ගණිතය, විද්‍යාව උගන්වන්න කිසිදු සුදුසුකමක් නැති කෙනෙක් තමයි මේවා බෙදා හරිමින් මේ කටයුතු කරලා තිබෙන්නේ. ඒ නිසා මේක තමයි අද පළාතේ අධ්‍යාපනයට අත් වෙලා තිබෙන ඉරණම.

ඒ විතරක් නොවෙයි. දැන් කල්පනා කරලා බලන්න. ස්වේච්ඡා ගුරුවරු. ස්වේච්ඡා ගුරුවරු බඳවා ගැනීමට අදාළ කාරණය ගත්තොත් එහෙම එකක් තමයි ගරු මහ ඇමතිතුමනි, උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීම සඳහා තරඟ විභාගයක් තිබුණා. ඒක හොඳයි. එයින් ගුරුවරුන් විශාල ප්‍රමාණයක් බඳවා ගත්තා. ඒක හොඳයි. හැබැයි, දැන් ඉතිරි වෙලා ඉන්න සමහර ගුරුවරුන් 300 කට වැඩි ප්‍රමාණයකට කියනවා, ඔබ ගිහිල්ලා ස්වේච්ඡාවෙන් වැඩ කරන්න. ස්වේච්ඡාවෙන් වැඩ කරන්න. සමහර උපාධිධාරීන් ඉන්නවා දැනට විවිධ පෞද්ගලික ආයතනවල සේවය කරනවා. එතකොට ඒගොල්ලෝ ගුරු පත්වීමක් ගන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. හැබැයි, එසේ සේවය කරද්දී කොහොමද ස්වේච්ඡාවෙන් ගිහිල්ලා වැඩ කරන්නේ. ඇයි ඒගොල්ලන්ට පත්වීම් දෙන්නේ නැත්තේ? පත්වීම් දෙන්නේ නැතිව කියනවා, ස්වේච්ඡාවෙන් වැඩ කරන්නය කියලා. ඒ විතරක් නොවෙයි. දැන්

[ ගරු මහින්ද ජයසිංහ ]

ජනාධිපතිතුමා අයවැය කථාවේදී - මා සතුව තිබෙනවා, අයවැය කථාව. ඒකේදී සඳහන් කරනවා. ග්‍රාමීය පාසල්වලට ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව, තොරතුරු තාක්ෂණය, සෞන්දර්යය හා ක්‍රීඩා විෂයයන්වලට අදාළව ගුරු සහායකයින් 50,000 ක් බඳවා ගන්නවාය කියලා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ. මේක පාවිච්චි කරමින් දැන් මේ වන කොට බස්නාහිර පළාතේ පාසල්වලට ස්වේච්ඡාවෙන් ගුරුවරු ඇතුළත් කරමින් තිබෙනවා. මේ මා සතුව තිබෙන්නේ, ජයවර්ධනපුර කලාපයේ එක පාසලකට යවපු ලිපියක්. බස්නාහිර පළාත් පාසල්වල ස්වේච්ඡාවෙන් සේවයේ යෙදවීම කියලා උක්ත කරුණට අදාළව අහවල් මහත්මිය කිසිදු දීමනාවක් ලබා නොගැනීමේ පදනම මත ස්වේච්ඡාවෙන් කටයුතු කරන්න දෙන්නය කියලා ශ්‍රී ජයවර්ධනපුර කලාපයේ අධ්‍යක්ෂවරයාට යවන ලිපියක්. කවුද අත්සන් කරලා තිබෙන්නේ. රාජකරුණා - සහකාර ලේකම්. අත්සන් කළේ කියලා තිබෙනවා, ලේකම්තුමාගේ, දයා සෙනරත් මැතිතුමාගේ නම. මොකක්ද මේ? මේ ගුරුවරු 50,000 බඳවා ගන්න තීරණය කළේ, ග්‍රාමීය පාසල්වලට.

මා සතුව තිබෙනවා, පසුගිය ඔක්තෝබර් මස 23 වන දින ආණ්ඩුවෙන් නිකුත් කරපු ගැසට් නිවේදනය. ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව. ඔක්තෝබර් 23 අති විශේෂ ගැසට් පත්‍රය. මොකක්ද ඒක? 1885/38 නමැති ඔක්තෝබර් 23 ගැසට් එක. මේ ගැසට් එකේ තිබෙනවා, ගුරුවරු බඳවා ගැනීම සම්බන්ධයෙන්. ගුරුවරු බඳවා ගන්නේ කොහොමද? සේවයට බඳවා ගැනීම 7.2.4.1 හි සඳහන් පරිදි ලිඛිත තරඟ විභාගය සහ 7.2.4.4.1 හි සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ ඊළඟට ප්‍රායෝගික පරීක්ෂණය. මේ ගුරුවරු බඳවා ගනිද්දී ලිඛිත තරඟ විභාගයක් තියන්න ඕනෑ. ලිඛිත තරඟ විභාගයට තියෙන්නේ මොනවාද කියලා තිබෙනවා. ඊළඟට සම්මුඛ පරීක්ෂණයක් තියන්න ඕනෑ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක්. ඊළඟට තිබෙනවා, ප්‍රායෝගික පරීක්ෂණයක්. මේ සියල්ලෙන් අනතුරුව තමයි ගුරුවරයෙක් බඳවා ගන්න පුළුවන්. හැබැයි, මොකද? කරන්නේ. දැන් 50,000 ක් බඳවා ගන්න, පෝලිමේ එනවා. ඡන්දයත් ඉලක්ක කර ගෙන යවනවා, ස්වේච්ඡාවෙන් තමන්ගේ දේශපාලන හිතවතුන්. බස්නාහිර පළාතේ අධ්‍යාපනය නගා සිටුවන්නේ මෙහෙමද? ඒ නිසා මේවා සම්පූර්ණයෙන් වැරදියි. ඒ විතරක් නොවෙයි.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, ඒ කියන්නේ ගුරු විභාගයට පෙනී සිටින්නේ නැති අයට -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ බාධා කිරීම්වලට යන කාලය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. කාලය -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. පැහැදිලි කරන්න. ගුරු විභාගවලට පෙනී සිටින්නේ නැති අයව ස්වේච්ඡාවෙන් ගන්නද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පැහැදිලිව. මේ අය කවුද එහෙම නම්?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගුරු විභාගයට පෙනී සිටපු අය එකසිය ගණනක් -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගුරු විභාගවලට පෙනී සිටපු අයට දැන් ස්වේච්ඡා පත්වීම් දීලා හරි යන්නේ නැහැ නේ ගරු මහ ඇමතිතුමනි? ඇයි?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒගොල්ලන්ගේ කැමැත්තෙන් -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ. ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා ස්වේච්ඡාවෙන් යන්න කියනවා. ස්වේච්ඡාවෙන් යන්න කිව්වාම ගියේ නැති වුණාම පත් වීම ලැබෙන්නේ නැති වෙයි කියලා ඒගොල්ලන්ට සැකයක් තිබෙනවා. හැබැයි, මේ පිරිසේ ඉන්නවා, පෞද්ගලික ආයතනවල සේවය කරන අය.

දැනටමත්. ඒගොල්ලෝ ගුරු පත්වීමක් ගන්න කැමැත්තෙන් ඉන්නවා. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ, ස්වේච්ඡාවෙන් සේවය කරන්න, ඒගොල්ලන්ට දැන් කරන රස්සාව දාලා යන්න බැහැ. එතකොට ඒගොල්ලන්ට ජීවන මාර්ගයක් නැතිව යනවා. එතකොට දැන් හරි පැහැදිලියි. දැන් මේ වන කොට ඔබතුමා තව ලිපියක් යවලා තිබෙනවා. ප්‍රදීප් විජේසේකර මැතිතුමා තමයි මේ ලිපියට අත්සන් කරලා තිබෙන්නේ. ගුරුවරුන්ගේ මොනවා හරි ගැටළු තිබෙනවා නම්, දීමනා ගෙවීම් මොනවා හරි තිබෙනවා නම්, ගෙවලා නැති ඒවා කෙළින්ම සාමාන්‍ය තැපෑලෙන් තමන්ට එවන්නය කියලා කියනවා. විද්‍යුත්පති මගින් එවීම අවශ්‍ය නැත. අපි කවුරුත් දන්නවා. රජයේ සේවය කරන අය දන්නවා. ඒ වාගේම මෙතැන ඉන්න රාජ්‍ය සේවය ගැන යම් අදහසක් තිබෙනවා නම් ගරු සභාපතිතුමනි, යම්කිසි ලිපියක්, රාජකාරී ලිපියක් ලියනවා නම්, ආයතන ප්‍රධානියා මගින් ලිවිය යුතුයි. ඒක තමයි කොන්දේසිය. හැබැයි, ඔබතුමා යවනවා ලිපියක්. ඔබතුමාගේ ලිපි ශීර්ෂය යටතේ. සාමාන්‍ය තැපෑලෙන් එවන්න. මේවා සාමාන්‍ය තැපෑලෙන් එවීමේදී අතරමගදී නැති වුණොත් කවුද වගකියන්නේ? මේ ගෙවීම්. මොනවාද? සියලුම ගුරුවරුන්ගේ මුදල් ගැටළු දෙසැම්බර් 31 ට පෙර මේවා එවන්න. දැන් මේ සියල්ල ඉතාම පැහැදිලියි. ජනවාරි 08 වැනිදා මැතිවරණයක් එනවා. මැතිවරණය ඉලක්ක කර ගෙන කරන දේවල් මිසක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මගේ කාලයෙන් විනාඩි 02 ක් ලබා දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තව විනාඩි දෙකක් ගරු විපක්ෂ නායකතුමාගේ කාලයෙන් ලබා දෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තූතියි. මේ සියල්ල ඉතාම පැහැදිලිව දැන් මැතිවරණය ඉලක්ක කර ගෙන සිදු කරමින් තිබෙන්නේ. පසුගිය ඔක්තෝබර් මස 25 වැනිදා සහ 26 වැනිදා රටේ ජාතික පුවත්පත්වල දැම්මා දැන්වීමක්. මා සතුව මේ තිබෙන්නේ ඒ දැන්වීම. මේ දැන්වීමේ මොකක්ද කියන්නේ? ගුරුවරුන්ගේ සියලු උසස් වීම් 2008.07.01 සිට ක්‍රියාත්මක වෙනවා. මේ උසස් වීම්වලට අදාළව -

ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මගේ කාලයෙනුත් විනාඩි 02 ක් ලබා දෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමාගෙනුත් විනාඩි 02 ක් දෙනවා නේ? බොහොම ස්තූතියි. ජේනවා නේ? මහ ඇමතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි 04 ක් තිබෙනවා. හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගෙන් විනාඩි දෙකයි. විපක්ෂ නායකතුමාගෙන් විනාඩි 02 යි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තූතියි. ජය වේවා. ඒ නිසා මේ තිබෙන්නේ, පසුගිය ඔක්තෝබර් මස 25 වැනිදා සහ 26 වැනිදා මේ රටේ සියලු ජාතික පුවත්පත්වල දාපු දැන්වීම. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ දාපු දැන්වීම. මොකක්ද කියන්නේ? 2008.07.01 ඉඳලා ගුරුවරුන්ගේ සියලු උසස්වීම් ක්‍රියාත්මක වෙනවා. විදුහල්පතිවරුන්ගේ සියලු උසස්වීම් ක්‍රියාත්මක වෙනවා. හිඟ වැටුප් දෙනවා. හිඟ වැටුප් දෙනවාය කියලා කියනවා. දැන් මම අහන්න කැමැතියි. මේකේ ඊළඟට කියනවා, අධ්‍යාපන අමාත්‍යාංශයේ, රේඛීය අමාත්‍යාංශයේ විශේෂ ඒකකයක් ස්ථාපිත කරලා තිබෙනවා. ඒ වාගේම සියලුම පළාත් සභාවන් සමඟ එක්ව වැඩ සටහන් ක්‍රියාවට නගනවා. දැන් මේ බස්නාහිර පළාතේ. බස්නාහිර පළාතේ ඇමතිතුමාට අනුව නම් ගුරුවරු 33,648 ක් ඉන්නවා. බන්දුල ගුණවර්ධනට අනුව ගුරුවරු 42,539 ක් ඉන්නවා. අපි දන්නේ නැහැ කෝකද? නිවැරදි කියලා. එතකොට මේ පළාතේ ළමුන් ඉන්නවා. අපේ මහ ඇමතිතුමාට අනුව 721,565 ක්. බන්දුල ගුණවර්ධනට අනුව 938,340 ක්

[ ගරු මහින්ද ජයසිංහ ]

ඉන්නවා. කෝකද? නිවැරදි කියලා අපි දන්නේ නැහැ. 216,785 ක වෙනසක්. ගුරුවරුන් 8881 ක -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජාතික පාසල්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ. ජාතික පාසල් නොවෙයි. පළාතේ සියලු ගුරුවරු.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජාත්‍යන්තර පාසල්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ජාත්‍යන්තර පාසල්. 8881 ක ගුරුවරුන්ගේ පරතරයක් තිබෙනවා. ඒ නිසා මම අහන්න කැමැතියි, මේ සියලු ගුරුවරුන්ගේ, අපි හිතමු 33,648 යි කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, ජාතික පාසල් ඇර අපි කියන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ. ජාතික පාසල්වල 8881 ක් ගුරුවරු නැහැ. මම හිතන විධියට. මේ පළාතේම එහෙම නැහැ. ජාතික පාසල් තිබෙන්නේත් 71 යි නේ? එතකොට ගුරුවරු 33,648 ක් ඉන්නවා. මේ 33,648 ක් වුණු ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරු එක් දහස් ගණනක් වූ මේ සියලු දෙනාගේ උසස්වීම් සහ හිඟ වැටුප් දෙසැම්බර් 31 වැනිදාට කලින් ගෙවන්න ඔබතුමන්ලා සූදානම්ද? මේක බොරුවක්. ඒ විතරක් නොවෙයි. අධ්‍යාපන අමාත්‍යාංශයේ මේ දාපු මේ නිවේදනය. මේ නිවේදනයේ කියනවා, 2008.07.01 සිට හිඟ වැටුප් සහ උසස්වීම් දෙනවාය කියලා. හැබැයි, මා සතුව මේ තිබෙන්නේ ගැසට් එක. මේ ගහපු ගැසට් එක ඔක්තෝබර් මාසේ 23. මේක දානවා 25. ගැසට් එක 23. මේක හැබැයි එළියට ආවේ 26. මේකේ මොකක්ද? කියන්නේ. 2011.01.01 සිට තමයි මේකේ හිඟ වැටුප් ගෙවන්නේ. මේ රටේ ගුරුවරු රවටනවා. මේ රටේ විදුහල්පතිවරු රවටනවා. මැතිවරණයක් එනවා. මැතිවරණය කට උඩ තියා ගෙන 225,000 කට වැඩි විදුහල්පතිවරු සහ ගුරුවරු රැවටීමට මේ ලක් කරමින් තිබෙන්නේ. ගැසට් එකේ තිබෙනවා, හිඟ වැටුප් සහ උසස්වීම් 2011.01.01 සිට දෙනවාය කියලා. මොකද, පත්තර දැන්වීම නේ ගුරුවරු සහ විදුහල්පතිවරු බලන්නේ. කියවන්නේ. මේකේ තිබෙනවා, 2008.07.01 සිට කියලා. මාස 30 ක් උසස් වීම්වලට අදාළ හිඟ වැටුප් කප්පාදු කරලා තිබෙනවා. උදුරාගෙන තිබෙනවා. කොල්ල කාලා තිබෙනවා. ඒ නිසා අද මේ රැවටීමට ලක් කරන්න උත්සාහ අරගෙන තිබෙනවා. බස්නාහිර පළාතේ අයවැය තුළත් අපි දකින්නේ මෙන්න මේ රැවටීම තවදුරටත් ඉදිරියට ගෙනියන්න උත්සාහ කරමින් තිබෙන ආකාරයයි. ඒ නිසා අපි ඉතාම පැහැදිලිව කියන්න කැමැතියි. මැතිවරණයක් අභිමුව තියාගෙන, අධ්‍යාපන අමාත්‍යාංශය, ආණ්ඩුව මෙවර අයවැයේදී මේ රටේ ගුරුවරු සහ විදුහල්පතිවරු රවටන්න උත්සාහ කළා වාගේ දැන් මේ බස්නාහිර පළාත් අයවැය තුළත් ඒ දේම තමයි සිදු වෙමින් තිබෙන්නේ. ඊට වඩා යමක්, ඊට වඩා වැඩි දෙයක් නොවෙයි සිදු වෙමින් තිබෙන්නේ.

ඒ නිසා ඉතාම පැහැදිලිව දැන් මේ අයවැය තුළ මේ අඩංගු කාරණා සම්බන්ධයෙන් මම අර කලින් කිව්වා වාගේ බරපතළ ගැටළුවක් තිබෙනවා. සංඛ්‍යා ලේඛන විජ්ජාවක් ලෙස තමයි අපට මේක හඳුන්වන්න තිබෙන්නේ. සංඛ්‍යා ලේඛන විජ්ජාවක් හරහා මේ රටේ, විශේෂයෙන් බස්නාහිර පළාතේ ගුරුවරු සහ විදුහල්පතිවරු මුලා කරන්න උත්සාහ කරමින් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මම ඉතාම ඕනෑකමින් ඉල්ලනවා. මේ විවාදයට එක් වෙමින්. මේ වන විට පාසල් තුළ නිර්මාණය වෙලා තිබෙන, මා මතු කරපු මේ කාරණාත්, ඊට අමතරව තවත් විශාල ප්‍රමාණයක් ගැටළු තිබෙනවා. මේ ගැටළු නිරාකරණය කරමින් බස්නාහිර පළාතේ අධ්‍යාපනය දේශපාලනීකරණයෙන් මුදවා ගත යුතුයි. අධ්‍යාපනයට දේශපාලනය අත ගැහුවොත් රටක අනාගතයක් ඉතිරි වෙන්නේ නැහැ. ඒක හොඳට මතක තියා ගන්න. අධ්‍යාපනයට දේශපාලනය අත ගැහුවොත්, නීතියට දේශපාලනය අත ගැහුවොත් රටක අනාගතයක් ඉතිරි වෙන්නේ නැහැ. ඒ කියන කාරණයත් අවධාරණය කරමින්, මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඉතාමත්ම කාරුණිකව සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩු පක්ෂයෙන් විනාඩි හය වාගේ වෙන් කරලා තිබෙන්නේ. අනික් පැත්තත් ඒ වාගේ. විනාඩි 07 යි 08 යි තිබෙන්නේ. ඒ නිසා නියමිත වේලාවට කථාව අවසන් කරන්න. නැත්නම් මූලාසනය අපහසුතාවයට පත් වෙනවා. මොකද, ප.ව. 5.00 ට අපි විවාදය අවසන් කරන්න ඕනෑ. ඡන්දයකට යන්න තිබෙනවා. ඒ නිසා ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, නියමිත වේලාවට කථාව අවසන් කරන්න.

[ අ.භා. 03.20 ]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna sanjeeva

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීවරුනි, බස්නාහිර පළාතේ හය වන පළාත් සභාව පිහිටුවා ගැනීමෙන් පසුව සාකච්ඡාවට භාජනය වන පළමු අයවැය. ඒ වාගේම වසර 13 ක පමණ සමාජ දේශපාලන අත්දැකීම් ලබා ගනිමින් බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයකු ලෙස පත් වූ මා සහභාගී වන පළමු අයවැය. ඒ වාගේම විසර්ජන ප්‍රඥප්තිය වෙනුවෙන් සහභාගී වීමට මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම මා තමුන්නාන්සේට සතුට පළ කරනවා. අපි ඕනෑම විටක පවත්නා වර්ෂයට වඩා නව වර්ෂයකට නිර්මාණාත්මක සැලසුම් ඉදිරිපත් කරමින් ඒ අයවැය තුළින් බලාපොරොත්තු වන්නේ, සමස්ත රටේ සංවර්ධන ක්‍රියාවලිය දියත් කරන්නයි. ඒ වාගේම යම්කිසි යෝජනාවක අරමුණ විය යුත්තේ, එයින් ලැබිය හැකි ඒ ප්‍රතිඵලය, එම අරමුණ ඉටු වීමට පරමාර්ථයක් අනිවාර්යයෙන්ම තිබීමයි. ඒ සඳහා අවශ්‍යම කරන ප්‍රධානතම මෙවලම තමයි ගරු සභාපතිතුමනි, මානව සම්පත. රැකියාවක් ලබා දෙනවාය කියන්නේ, ඒක මානව සම්පත ආරක්ෂා වීමයි. ආර්ථිකය ශක්තිමත් වෙනවා. එය මා අත්දැකීමෙන් දන්නා වූ කාරණයක් බවට පත් වෙනවා.

ගරු සභාපතිතුමනි, අද වන කොට බස්නාහිර පළාත් සභාව තුළ නවක මන්ත්‍රීවරයෙක් වශයෙන් අද තමුන්නාන්සේලාත් එක්ක එකතු වෙලා, අපි මේ ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ සාකච්ඡාවට භාජනය වන කොට ගරු ප්‍රධාන අමාත්‍යතුමා අධ්‍යාපනය වෙනුවෙන් මහා දැවැන්ත විෂයභාරයක් කර ගෙන කටයුතු කරන්න අපට අවස්ථාව ලබා දීලා තිබෙනවා. අද ඒ වාගේම මේ කථා කරන කොට අපි දැන ගන්නවා, තමුන්නාන්සේලා හැම දෙනාම වාද විවාදවලදී අඩුපාඩුකම් පෙන්වා දෙමින්, මේ අයවැය තුළින් ඊළඟ වර්ෂය තුළ ක්‍රියාත්මක වන වැඩ සටහන් තුළ අපි මොනවාද? කරන්නේ කියන එක, අද මොනවාද? අපි කථා කරන්නේ කියන එක පිළිබඳව අපි දැන හඳුනා ගන්නවා. ඇත්ත වශයෙන්ම අපි සන්තෝෂ වෙනවා. නවක මන්ත්‍රීවරයෙක් වශයෙන් මේ පළාත් සභාව තුළට ඇවිල්ලා මේ පළාත් සභාව තුළ ඒ ගෙන යන මංගල අයවැය තුළින් අදහස් අරගෙන ඉදිරි වර්ෂය තුළට ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ කොයි ආකාරයෙන්ද කරන්නේ කියන එක අපි අධ්‍යයනය කරමින් යන මොහොතක තමයි අපි අද මේ ඉන්නේ. අපි සන්තෝෂ වෙන්නේ. මේ විෂය භාරව කටයුතු කරන අමාත්‍යවරයා අද මහා දැවැන්ත වැඩ පිළිවෙළක් මේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ දියත් කරලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාගේ අයවැයෙන් 2015 වසර සඳහා විශාල සහනාධාර ලබා දීලා කටයුතු කරන්න, මම හිතන්නේ මහා දැවැන්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ වාගේම අද ගරු ප්‍රධාන අමාත්‍යතුමා පළාත් සභාවේ පළාත් පාසල් සංවර්ධනය කිරීම පිළිබඳව මහා දැවැන්ත මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම දරුවන්ගේ අධ්‍යාපනය ප්‍රවිෂ්ට කිරීමට, එය රඳවා ගැනීමට මම හිතන්නේ, මහා දැවැන්ත වැඩ පිළිවෙළක් මේ අවස්ථාව වන කොට දියත් කරලා තිබෙනවා.

අධ්‍යාපනය සඳහා මානව සම්පත් ලබා දීම පිළිබඳව මහා දැවැන්ත ක්‍රියාදාමයක් තුළින් මහා වැඩ පිළිවෙළක් මේ වන කොට අපි වෙනුවෙන් දියත් කරලා තිබෙනවා. ඒ වාගේම ප්‍රාථමික අංශය වැඩි දියුණු කරන්න, ගුරු පුහුණු ලබා දෙන්න, ඒ ගුරුවරුන්ට අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන්න මේ වන කොට මම හිතන්නේ අද සමස්ත බස්නාහිර පළාත තුළම වැඩ පිළිවෙළක් දියත් කරලා තිබෙනවා. ඊට අමතරව ප්‍රාථමික හා ද්විතියික පාසල් සංවර්ධනය කිරීමට විශාල මුදලක් මම හිතන්නේ මේ වන කොට අද ප්‍රධාන අමාත්‍යතුමා වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ළමා මිතුරු පාසල් සංවර්ධනය, ඒ වාගේම ද්විතියික අධ්‍යාපනය වැඩි දියුණු කිරීම, සිසුන් 50 කට අඩු පාසල් සංවර්ධනය කරන්න මේ වන කොට බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රධාන මේ අමාත්‍ය මණ්ඩලය සහ මේ සියලු දෙනාම එකතු වෙලා වැඩ කටයුතු කරන්න අද වැඩ පිළිවෙළක් දියත් කරලා තිබෙනවා.

[ ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

ඒ වාගේම විශේෂ අධ්‍යාපන වැඩ සටහන්, නොවිධිමත් අධ්‍යාපනය වෙනුවෙන් ඒ දැවැන්ත සංවර්ධන ක්‍රියාදාමයන් ක්‍රියාත්මක කරන්න මේ අයවැය තුළින් අද අපි අධ්‍යයනය කරලා තිබෙනවා. මම හිතන්නේ, ඉදිරි වර්ෂය සඳහා ක්‍රියාත්මක කරන්න. ඒ වාගේම තමයි අද මේ වන කොට පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අද එන්න එන්නම වැඩිහිටි නිවාස ඇරිලා. ආදරණීය අම්මා තාත්තා වැඩිහිටි නිවාසයට ඇතුළත් වෙලා ඉන්න හේතුව වෙලා තිබෙන්නේ, මම හිතන්නේ අද මේ දහම් අධ්‍යාපනය හරියාකාරව ක්‍රියාත්මක නොවන නිසා තමයි. අද ඒකට අවශ්‍ය කරන සරුදම් අරුණැල්ල කියන මේ වැඩ සටහන තුළින් මම හිතන්නේ, අද සියලුම ආගමික ස්ථානවලට අවශ්‍ය කරන මුදල් ටික වෙන් කරලා, ඒ අවශ්‍ය කරන ප්‍රතිපාදන ටික වෙන් කරලා මම හිතන්නේ දරුවෝ දහම් අධ්‍යාපනයට වැඩි වැඩියෙන් යොමු කරලා, ඔහුගේ මානසික පැත්ත හරියාකාරව ක්‍රියාත්මක කරන්න මම හිතන්නේ අද මේ පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ කාර්යභාරය වෙලා තිබෙනවා. අපි දකිනවා පළාත් පාලන ආයතනයක් තුළ හිටපු සභාපතිවරයෙක් වශයෙන් ඒ කාලය තුළ එතුමාගේ නායකත්වය තුළින් ඒ පළාත් පාලන ආයතනය වැඩි දියුණු කර ගෙන යන්න ඒ වාගේම ඒ පළාත් පාලනයේ තිබෙන අඩුපාඩු සියල්ල හරියාකාරව දියත් කරන්න, ඒ පළාත් පාලන ආයතනවල නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය වැඩි කරන්න, යහ පාලනය හරියාකාරව ක්‍රියාත්මක කරන්න මම හිතන්නේ, අපට ලබා දුන් උපදෙස් හා ඒ හැම දේටම මම හදවතින්ම ස්තූතිවන්ත වෙනවා.

ඒ නිසා තමයි ගරු සභාපතිතුමනි, බේරුවල ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා හැටියට අද ඒ කාලේ අපි අයවැයක් ඉදිරිපත් කරන කොට එක්සත් ජාතික පක්ෂයත්, ජනතා විමුක්ති පෙරමුණත් ඒ අයවැයේදී අත උස්සලා අපට සහයෝගය ලබා දුන්නේ. මොකද, අපි හරියාකාරව ඒ පාලනය හා යහ පාලනය ක්‍රියාත්මක කරපු නිසා තමයි. ඒ වාගේම අද මේ පළාත් සභාව තුළිනුත් අපි විවිධ තර්ක විතර්කවලට ගියාට මදී. ගරු සභාපතිතුමනි, අපට අවශ්‍ය කරලා තිබෙනවා, හැම විටම යම්කිසි ප්‍රශ්නයක් එන කොට විපක්ෂයේ මන්ත්‍රීවරුනුත් ඇවිල්ලා තිබෙන්නේ මහජන නියෝජිතයෝ වශයෙන්. මේ ඉන්න ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත් ඇවිල්ලා තිබෙන්නේ මහජන නියෝජිතයන් වශයෙන්. එහෙම නම් එයට පිළිතුරු දෙන්න මම හිතන්නේ, ඒ එන ප්‍රශ්නයට අදාළව කටයුතු කරන්න තමුන්නාන්සේලා අපි දෙගොල්ලෝම එක තැනකට ඇවිල්ලා කථා කරලා විසඳන්න පුළුවන් නම් අන්න ඒක තමයි සැබෑ තත්ත්වය. උදාහරණයක් වශයෙන් අපි බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ ව්‍යුහ කමිටුවට ගිහිල්ලා, අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කරන කොට සමහර අවස්ථාවලදී විපක්ෂයේ මන්ත්‍රීවරු එන්නේ නැහැ. එහෙම එන්නේ නැතිව මෙතැනට ප්‍රශ්නය ඉදිරිපත් කරලා මදී. එතැනදී ඒ ප්‍රශ්නය සාකච්ඡා කරලා එතැනදී පිළිතුර ගන්නවා නම්, ඒවාට අවශ්‍ය කරන ශක්තිය ඒ තුළින්ම නිර්මාණය වෙනවා. අද තමුන්නාන්සේලා සමහරු පුරුදු වෙලා තිබෙන්නේ මෙතැනට ඇවිල්ලා කථා කරලා ලකුණු ටික දා ගන්න. හැබැයි, මම කියනවා අපි ඕනෑම විටක ගමේ සංවර්ධනය හා අනෙකුත් සංවර්ධන ක්‍රියාවලිය වෙනුවෙන් ඕනෑම ප්‍රශ්නයකට අපි දෙගොල්ලෝ එක තැනකට එකතු වෙලා තීරණ ගන්නවා නම්, මම හිතන්නේ ඒ ප්‍රශ්නවලට හරියාකාරව පිළිතුරු ලැබෙනවා.

ගරු සභාපතිතුමනි, අපි දැක්කා. පසුගිය දවස්වල අද මේ රටේ ගෙන යන වැඩ පිළිවෙළ තුළ අතිගරු ජනාධිපතිතුමා මේ රට දියුණු කරන්න, දෙවැනි වතාවටත් අතිගරු ජනාධිපතිතුමා මේ රටේ මහා දැවැන්ත සංවර්ධනයක් කර ගෙන යාමට අධ්‍යාපනය වෙනුවෙන් විශේෂ වූ වැඩ සටහන් ක්‍රියාත්මක කරනවා. අද උතුරු මැද ඒ වාගේම උතුරු නැගෙනහිර පළාත් තුළ අපි බලය බෙදලා දීලා ඒ තුළින් අවශ්‍ය කරන ප්‍රතිපාදන වෙන් කරලා, ඒ සියලුම නායකයන්ට අවශ්‍ය කරන ශක්තිය පළාත් සභා පිහිටුවලා ක්‍රියාත්මක කරන්න, සංවර්ධනය කරන්න මුදල් ටික ලබා දුන්නත්, අද ඒ ආයතනවලින් කිසිම සංවර්ධනයක් ඒ ජනතාවට සිදු වන්නේ නැහැ. ඒ මන්ත්‍රීවරු සහ ඒ ඉන්න මහ ඇමතිවරු නැත්නම් ඒ ඉන්න නිලධාරීන් ඒ ප්‍රදේශයේ ජනතාවට හරියාකාරව සේවය කරන්න කටයුතු කරලා නැහැයි කියලා මේ අවස්ථාවේදී අපි කියනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

රාජිත ගියා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

රාජිත ගියා ගියා කියලා මේ බේරුවල ඉන්න අපිව ගෙනියන්න බැහැ. රාජිත තමුන්නාන්සේලාට ලොකු වුණාට අපට රාජිත ලොකු මිනිහෙක් නොවෙයි. රාජිත එක

පාරක් නොවෙයි පක්ෂය මාරු කළේ. මේ නව වැනි පාරට තමයි රාජිත පක්ෂය මාරු කළේ. තමුන්නාන්සේලාට ලොකු වුණාට අපට ඒක ලොකු නැහැයි කියලා අපි කියනවා. ඒ නිසා බේරුවල ආසනයේ රාජිත නොවෙයි හෙට රනිල් වික්‍රමසිංහ බේරුවලට ආවත් අපි බේරුවල ආසනය ජයග්‍රහණය කරනවා. අතිගරු ජනාධිපතිතුමා 9 වැනිදා උදේට මේ ජයග්‍රහණය කරනවා. ඒක තමුන්නාන්සේ නොවෙයි, කවුරු ආවත් අපි ඒක කරලා පෙන්වනවා. (බාධා කිරීම්) අන්න ඒ නිසා තමයි අද එල්.ටී.ටී.ඊ. යත් එක්ක එකතු වෙලා, ටී.එන්.ඒ. සංවිධානය අද උදව් කරන්න එකතු වෙන්නේ. අද එහෙම පොදු අපේක්ෂකයාට උදව් කරනවාට, හෙට අනිද්දා වන කොට එල්.ටී.ටී.ඊ. සංවිධානය ස්ථාපිත කරන්න තමයි තමුන්නාන්සේලාගේ බලාපොරොත්තුව. අපි භය නැතිව කියනවා. ආපහු ත්‍රස්තවාදය ඇති කරන්න හැදුවොත් තමුන්නාන්සේලාට සාප වේවා කියලා කියනවා.

ඒ නිසා අවසාන වශයෙන් කියන්නේ, නැවත වතාවක් මේ රටේ නායකයා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මිස ඔය ඉන්න මෛත්‍රීපාල සිරිසේන නොවෙයි. අපි අවසානයේ කියනවා, මෛත්‍රීපාල සිරිසේනට අවසානයේ සිදු වෙන්නේ අයියෝ සිරිසේන කියන්න තමයි. ඒක හොඳට මතක තියා ගන්න. ඒ බව මතක් කරමින් අද මේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින් මහා දැවැන්ත වැඩ කටයුත්තක් කර ගෙන යන අපේ මහ ඇමතිතුමා ප්‍රධාන අපේ සමස්ත පළාත් සභාවේ ඉන්න සමස්ත ගරු අමාත්‍යවරුන් ප්‍රධාන ගරු මන්ත්‍රීවරුන්ට අපි කියනවා, තමුන්නාන්සේලාට අපිත් එක්ක එකතු වෙන්න. හෙට අනිද්දා වන කොට තමුන්නාන්සේලාට වෙන්නේ තමුන්නාන්සේලාගේ නායකයාත් තමුන්නාන්සේලාව දා ගෙන යනවා. ඔය මෛත්‍රීපාල සිරිසේනව අවසානයේදී අතරමං කරලා සිරිසේනට වෙන්නේ, අහිංසක මන්ත්‍රීවරුන්ට විනය පරීක්ෂණ කළා වැරදි කරන කොට, අවසානයේ අපට තිබෙන්නේ, මෛත්‍රීපාල සිරිසේනටත් නව වැනිදායින් පස්සේ විනය පරීක්ෂණයක් තියන්න කියන එක මතක් කරමින්, ජය වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

05 යිද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා, නියමිත වෙලාවට කථාව අවසන් කරන්න සිදු වෙනවා. නැත්නම් සවස 5.00 වන කොට ඉවර කර ගන්න බැරි වෙයි. බාධා කරන්න එපා. ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න දෙන්න.

[ අ.භා. 03.31 ]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා මට කථා කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන. ප්‍රථමයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ළඟදීම අ.පො.ස. (සා.පෙළ) විභාගය එනවා. මම හිතන්නේ, ඒකේ ප්‍රශ්නයක් තිබෙනවාද දන්නේ නැහැ ඊළඟ ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන්නේ කවුද කියලා. මොකද, යන හැම පාරේම කණුවක් කණුවක් ගානේ මහින්ද රාජපක්ෂව ගහලා තිබෙනවා. ඉතින් මම හිතනවා, අර කළුතර වුණ වැඩේ වාගේම මේකෙත් ප්‍රශ්න පත්‍රය වේලාසන එළියට දාලා ප්‍රශ්නයක් එහෙම තිබෙනවාද දන්නේ නැහැ කියලා. ඊළඟ ජනාධිපතිවරණයට ඉදිරිපත් වන්නේ කවුද? මහින්ද රාජපක්ෂ. යටින් ගහලා තිබෙනවා අනුග්‍රහය මෙරිල් පෙරේරා. ජා ඇළ හැම කණුවේම ගහලා

තිබෙනවා. ඉතින් අපේ ජා ඇළ කොට්ඨාශයේ අධ්‍යාපනය භාරව ඉන්න මන්ත්‍රීතුමා හැටියට මම හිතනවා, එහෙම එකක්වත් වෙනවාද දන්නේ නැහැ කියලා. ඒකයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආණ්ඩු පක්ෂයේ අය අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා කථා කරද්දී ගොලුවෝ ටික වාගේ අහගෙන හිටියා. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී. කවුරුත් කෑගහනවා මම දැක්කේ නැහැ. ඔක්කොම නිකම් ගොලු වෙලා. අමුතු ලෝකයකට ගිහිල්ලා හිටියේ. ඇත්ත කථා කරද්දී ඔහොම වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රකාශයේ තිබෙනවා, අපේ පාසල්වල අධ්‍යාපනය ගැන ඉතාමත් උසස් අන්දමින් ආණ්ඩු පක්ෂයේ අය කථා කරනවා. දැන් මේ ශිෂ්‍යත්ව ප්‍රතිඵලය ගත්තාම, පසුගිය 2011 සිට 2013 වසර වන තෙක් තිබෙනවා. ඒ අවුරුදු තුනේම 10% තමයි සමස්ත ප්‍රතිශතය. 10% ක් තමයි පාස් වෙලා තිබෙන්නේ. දැන් වසරින් වසර අපි අරගෙන බැලුවොත් මේ රජය කරලා තිබෙන්නේ මොනවාද? මේ ප්‍රතිඵලත්, අර මහ බැංකුවේ වාර්තාව වාගේ ප්‍රතිඵල උසස් කරලා පෙන්වන්න, හැමදාම කඩඉම් ලකුණු ප්‍රමාණය යටට ගේනවා. කඩඉම් ලකුණු ප්‍රමාණය යටට ගෙනැල්ලා පෙන්වනවා මේ පාස් වෙලා තිබෙන ප්‍රතිශතය වැඩියි කියලා. ඉතින් මේ වාගේ දේවල් කරලා තමයි අද මේ රජය -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මම හිතන්නේ ඔබතුමා කථා කළාට ශිෂ්‍යත්වය ලකුණු Out කරන විධියවත් දන්නේ නැහැ. ශිෂ්‍යත්වය පාස් කරන්නේ තිබෙන සම්පත් ප්‍රමාණයට. ඔබතුමා ඒක දන්නෙත් නැහැ. ශිෂ්‍යත්වය පාස් කරන්නේ කොහොමද කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පොඩ්ඩක් අහගන්න කෝ? ඔබතුමාගේ වාරයේ කථා කරන්න කෝ? ශිෂ්‍යත්වය පාස් වෙන්නේ කොහොමද කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශිෂ්‍යත්ව විභාගය ගැන මගේ කිසිම ප්‍රියතාවයක් නැහැ. මොකද, පහ වසරේදී ළමයෙක්ව මනිනවා නම්, මම හිතන්නේ ඒක වැරදියි කියලා. (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමාට බාධා කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතැන කථාව මගේද නැත්නම් මේ අයගේද? (බාධා කිරීම්) ආණ්ඩු පක්ෂයෙන් වෙලාව අරගෙන දෙන්න. මන්ත්‍රීවරුත් කථා කරනවා අහගෙන ඉන්න පුරුදු වෙන්න. ඔබතුමන්ලාට අවස්ථාව තිබෙනවා කථා කරන්න. අපි කියන දෙයක් පොඩ්ඩක් අහ ගන්න. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මන්ත්‍රීතුමා කථා කළා මේ දහම් අධ්‍යාපනය ගැන. දහම් අධ්‍යාපනය ගැන කථා කළා. හැම අවුරුද්දේම ලක්ෂය බැගින් දුන්නා කියලා. ඇත්ත. ලක්ෂයක් දුන්නා. ඒ දුන්නේ මොනවාටද? මේ දහම් පාසල්වලට ලක්ෂය බැගින් දීලා කරන්නේ - හැම ඡන්දයක් ආපු වෙලාවේදීම, පළාත් සභා ඡන්දයට ඉස්සෙල්ලා හැම පන්සලකටම පල්ලියකටම ලක්ෂය ගණනේ බෙදා ගෙන ගියා, දහම් පාසල්වලට කියලා. 2015 අයවැයෙන් අපේ මහ ඇමතිතුමා කියනවා, 2015 අයවැයෙන් වෙන් කරලා මේ දෙසැම්බර් මාසයේ දෙනවාලු.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අවුරුද්ද අන්තිමට දෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ලබන වසරේ අයවැයෙන් වෙන් කරලා තිබෙන්නේ. නමුත් මේ වසරේ අන්තිමට මේවා ඔක්කොම දෙනවාලු. මේ මොනවාද කරන්නේ? අද පල්ලියත් පන්සලත් මුදලට ගන්න හදන්නයි මේ රජය බලාපොරොත්තු වෙන්නේ. මහින්ද රාජපක්ෂ හිතනවා නම්, ආගම ධර්මයත් මුදලට ගන්න පුළුවන් කියලා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉතාමත් කනගාටු වෙනවා. ඒ තරමටම මේ මහින්ද රාජපක්ෂ අද බංකොලොත් වෙලා. (බාධා කිරීම්) අන්න ඒක තමයි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා පිළිබඳව එතුමාට අපහාස වන ආකාරයට කථා කරන්න බැහැ. වහාම ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් අපේක්ෂකයා. දැන් ජනාධිපති නොවෙයි. දැන් අපේක්ෂකයා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

තවම ජනාධිපති. ඒකවත් දන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හරි ජනාධිපති අපේක්ෂක. ඉඳගන්නකෝ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ශ්‍රීනාත් මන්ත්‍රීතුමා, විෂයට අනුව කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හොඳයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දහම් පාසල්වලට ලක්ෂයක් බෙදන්න අඩි 6 x 8 කටවුට් එකක් ගහලා - පන්සල ඇතුළේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ පින්තූරයයි, අපේ ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමාගේ පින්තූරයයි, බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ පින්තූරයයි ගහලා පන්සලේ චෛතය ළඟ තියලා තමයි රුපියල් ලක්ෂය දෙන්නේ. (බාධා කිරීම්) ඒ මෙදා පාරනේ. ගිය පාර දුන්නේ කොහොමද? ඔබතුමා ගිහිල්ලා බලන්න තවමත් පන්සල් ඇතුළේ නැද්ද කියලා ඔය බෝඩ් එක. (බාධා කිරීම්) ආ තියෙනවා. ඔන්න ඕක තමයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තමුන්නාන්සේ මූලාසනයට කථා කරන්න

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ජා - ඇළ කලාපයේ අධ්‍යාපනය භාරව ඉන්න මන්ත්‍රීතුමා හැටියට රැස්වීම්වලට මමත් යනවා. පසුගිය රැස්වීමේදී කිව්වා. ජා -ඇළ කලාපයේ අධ්‍යක්ෂතුමිය ලියුමක් පෙන්වලා කිව්වා, (බාධා කිරීම්) ඔබතුමා බොරු කියන්න එපා. ඒ අධ්‍යක්ෂතුමිය ලියුම කියවද්දී මොනවාද කිව්වේ? මේ තීන්ත ගාන රු. 75,000/- , රු. 50,000/- දෙන්න අනිවාර්යයෙන්ම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු පමණක් ගෙන්විය යුතුයි කියලා. ඊට පස්සේ -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මේක අපේ ආණ්ඩුව නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේක පළාත් සභාවේ සල්ලි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

නැහැ. නැහැ. මේක අපේ පළාත් සභාව.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ පළාත් සභාවේ අපිත් ඉන්නවා. ඔබතුමා පිළිගන්නවාද එහෙම කිව්වා කියලා. ඔබතුමා පිළිගන්නවාද එහෙම නියෝගයක් එව්වා කියලා. ඔබතුමා පිළිගන්නවාද එහෙම එකක් ඇරියා කියලා.

[සභාවේ ඝෝෂා]

ඒ හොඳටම ඇති. ඔබතුමා පිළිගන්නවා එහෙම එකක් ඇරියා කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මහ ඇමතිතුමා මීට ස්වල්ප වෙලාවකට ඉස්සෙල්ලා කිව්වා, (බාධා කිරීම්) එහෙම කියලා නැහැයි කියලා. දැන් මෙරිල් මන්ත්‍රීතුමා කියනවා එහෙම ලියුමක් ඇරලා තිබෙනවා කියලා. තිබෙනවාලු. මහ ඇමතිතුමා අපේ මේ මන්ත්‍රීතුමාට කිව්වා, එහෙම දෙයක් නැහැයි කියලා. එතුමා දන්නෙත් නැහැයි කිව්වා. එතකොට දැන් අධ්‍යාපන ඇමති ඔබතුමාද? නැත්නම් මහ ඇමතිතුමාද? බස්නාහිර පළාතේ අධ්‍යාපනය භාරව ඉන්නේ ඔබතුමාද? මහ ඇමති ප්‍රසන්න රණතුංගද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මූලාසනයට කථා කරලා කථාව අවසන් කරන්න. නැත්නම් මූලාසනය බොහොම අපහසුතාවයට පත් වෙනවා කාලයත් එක්ක.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකෙන්ම පැහැදිලි වෙනවා, මේ රජය, මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු සම්පූර්ණයෙන්ම අධ්‍යාපනය දේශපාලනීකරණය කරලා, තමන්ගේ ඡන්ද ව්‍යාපාරය පාසල තුළින් කරන්න, පාසලට දෙන තීන්ත බකට් එක බෙදන්නත් දෙමව්පියන්ව අනිවාර්යයෙන්ම කැඳවන්නය කියලා ලියුම් යවලා තිබෙනවා. අද මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට - (බාධා කිරීම්) මේ රටේ ජනතාව ඕක දැන ගත්තාම -

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලා සිටිනවා, කාලයත් එක්ක මූලාසනය බොහොම අපහසුතාවයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමන්ලාගේ කථාවට බාධාවක් නොකර, ඒ කාල පරිච්ඡේදයේ ඒ මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්නය කියලා ඉල්ලනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මගේ ආසනය ඉදිරියෙන් උදය ගම්මන්පිල ගරු මන්ත්‍රීතුමාගේ අමාත්‍යවරයෙකුගේ බෝඩ් එකක් ගෙනැල්ලා තියලා තිබෙනවා. අවුරුදු ගණනක් ආණ්ඩුවේ ඇමති ධූරයක් දරපු මන්ත්‍රීවරයෙක්ව විපක්ෂයට නොදැනුවත්ව තල්ලු කරලා තිබෙනවා. මේ පිළිබඳව ගරු සභාපතිතුමනි දැඩි අවධානය යොමු කරලා, ක්‍රියා කරන්න. මේ රාජකාරී මට්ටමෙන් කරන නිලධාරීන් ගෙන්වලා මේක නිවැරදි කරන්න කියලා ඉල්ලනවා. මේ පිළිබඳව ඔබතුමා දැනුවත් කරනවා. (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වන්න. මීළඟට සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා. 03.41 ]

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, මිනිස් බල හා රැකී රක්ෂා හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව අදහස් පළ කිරීමට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. ඒ වාගේම ප්‍රථමයෙන්ම මට වරප්‍රසාද ප්‍රශ්නයකුත් තිබෙනවා, 36(1) යටතේ. 2014 නොවැම්බර් මාසේ 04 වැනිදා ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා අජ්මාල් - මෙහෙමයි තිබෙන්නේ.

ඇමතිතුමා ලක්ෂ 35 න් ලක්ෂ 10 ක් ඉල්ලා ගත්තා. මේවා අතේ තිබෙනවා ලිඛිතව. ඒක ඒ ටේප් එක. මෙලෙස අපි ඉල්ලා සිටියා, මේක හැන්සාඩ් එකෙන් ඉවත් කරන්නය කියලා. නමුත් එය ඉවත් කරලා නැහැ. මේක බලන කෙනෙකුට වැරදි චිත්‍රයක් මවන්න පුළුවන්. එතුමා අදහස් කරපු සමහර ඒවා ඇහිලා නැහැ. ලක්ෂ 35 ක් දීලා ලක්ෂ 10 කට මේක විකුණුවා කියන එක තමයි එතුමා අදහස් කළේ. මෙවැනි චෝදනා සම්බන්ධව ටේප් එකක් තිබෙනවා නම් මේවා ඉදිරිපත් කරන්න. අල්ලස් හා දූෂණ කොමිසම තිබෙනවා නේ? ඒවාට වාර්තා කරලා මෙය නිවැරදි කරන්න. බැරි වෙලා හරි මේ හැන්සාඩ් එක බලන කෙනෙක් - විහිළුවට කියන්න පුළුවන් එතුමා ජෝකර් නිසා. නමුත් මේවා බලන කෙනෙක් වැරදි විධියට තේරුම් ගත්තොත් හිතන්නේ, මේ විහිළුවක් නොවෙයි. මේ ලක්ෂ 35 ක් දීලා, ලක්ෂ 10 කට තව කාට හරි විකුණනවා කියලා. මේ ඇමතිතුමාගේ සඳහන් කරලා තිබෙන්නේ. නමුත් මේ ප්‍රශ්නයේ මුල ඉඳන් පැටලුනේ මමත් සමඟ. තමුන්නාන්සේලාට තිබෙනවා, අපේ විමධ්‍යගත සල්ලිවලින් ලක්ෂ 35 න් එසේ ලක්ෂ ගණනක් කොළඹ දිස්ත්‍රික්කයට කවදාවත් වෙන් කරලා නැහැ. අජ්මාල් මන්ත්‍රීතුමා හිටියේ පසුගිය පළාත් සභාවේ. මේ පළාත් සභාවේ නොවෙයි. ඒ ගියවර අපේ පළාත් සභාවේ සියලු ලේඛන පරීක්ෂා කරලා එවැනි මුදලක් වෙන් කරලා තිබෙනවා නම් අපි ඒ ඕනෑම පරීක්ෂණයකට ලැහැස්තියි. එතුමාට හරි. ටේප් පටි තිබෙනවා නම්, අල්ලස් හා දූෂණ කොමිසමට හරි ඕනෑ එකකට පැමිණිලි කරලා අපව නිවැරදි කරන්නය කියලා

ඉල්ලා සිටිනවා. මොකද, අපි අබමල් රේණුවක තොපියක දෙයක් අද වන තෙක් කාගෙන්වත් කාලා බීලා නැහැ. ඒක අවංකව සිරිපාදේ කන්දට ගිහිල්ලා හරි දිවුරන්න පුළුවන් කියලා ප්‍රකාශ කරමින් මම ඒක පළමුවෙන් නිවැරදි කරන්න ඕනෑ.

එලෙසම අපි 2015 අයවැය ගැන කථා කරන කොට අපේ විශාලම අමාත්‍යාංශය බස්නාහිර පළාත් සභාවේ තිබෙනවා. ජනාධිපතිතුමා 2015 අයවැයෙන් මොකක්ද ලබා දුන්නේ කියන එක පළමුවෙන්ම අපි යොමු කරන්න ඕනෑ. පළාත් සභාව තුළ ගුරු පුරප්පාඩු සම්පූර්ණ කරන්න එතුමා යෝජනා කරලා තිබෙනවා. දෙවනුව, මේ අයවැයෙන් ගුරු සහායකයින් 50,000 ක් ගන්න එතුමා යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරවලට එතුමා යෝජනා කරලා තිබෙනවා, තවත් මිලියන 15,000 ක්. කෝටි 1500 ක් තවත් වෙන් කරන්නය කියලා. කෝටි 6000 ක් ලබා දුන්නා. පාසල් දහකට. එක පාසලකට කෝටි හය ගණනේ කෝටි හය දාහක් නිදහසෙන් පස්සේ හෝ නිදහසට පෙර කිසි කවරදාකවත් කෝටි 6000 ක මුදලක් මේ පාසල් සඳහා වෙන් කරගෙන නැහැ. ඊට අමතරව තවත් මිලියන 15,000 ක මුදලක් ජනාධිපතිතුමා මේ පාසල් සඳහා වෙන් කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් අපි අපේ ප්‍රණාමය පුද කරනවා. මේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා තවත් මිලියන 1500 ක්. පහ වසර ශිෂ්‍යත්ව ප්‍රමාණය - අද මතක නැහැ. දෙමව්පියන්ගේ තිබුණු ලොකුම ගැටළුව, මේ ළමයි කී දෙනෙක් ශිෂ්‍යත්වයෙන් ගොඩ දානවාද කියලා. 15,000 යි තිබ්බේ. 25,000 කරලා තව 10,000 ක් වැඩි කරලා තිබෙනවා. එහෙම නම් වැඩි ප්‍රමාණයක් අපේ බස්නාහිර පළාත් සභාවට ආවා. අපි විශේෂයෙන්ම අපේ බස්නාහිර පළාතේ ගුරුවරුන්ට ස්තූතිවන්ත වෙන්න ඕනෑ. පළමුවෙන් ආපු සිය දෙනාගෙන් 39 දෙනෙක් බස්නාහිර පළාතේ. තුන් වැනියා අපේ පළාත් සභාවේ. ඉතින් ශිෂ්‍යත්ව ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. මෙලෙස දැවැන්ත මුදල් සම්භාරයක් පළාත් සභාව තුළ වෙන් කරලා තිබෙනවා. අපේ එක මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කළා, ගුරුවරුන් බඳවා ගැනීමේදී අඩුපාඩු සිද්ධ වෙනවා කියලා. 98/23 චක්‍රලේඛය අනුව 1 AB පාසල්වලට විදුහල්පතිවරු පත් කරන්න පුළුවන් අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ ඒ ශ්‍රේණිධාරී විදුහල්පතිවරු කියලා. නමුත් මෙතුමා කිව්වා වාගේ සියලු දේ අපි - විද්‍යාකර බාලිකාවට පත් කිරීම පිළිබඳව අපි එකඟ වෙන්නේ නැහැ. නමුත් අපි දන්නවා පෞද්ගලිකව. දෙපාරක් දැම්මා. එක පාර පාසල් 65 ක විදුහල්පති පුරප්පාඩු තිබුණා. විදුහල්පතිවරු 33 දෙනයි සම්මුඛ පරීක්ෂණය ඉල්ලුවේ. අනික් එක පාසලකවත් ගුරුවරු ඉල්ලුවේ නැහැ. නැවත වතාවක් දැම්මා. ඒ වෙලාවේ පාසල් 50 කට දැම්මා. ඒ වෙලාවේ පාසල් 50 න්ම ඉල්ලුවේ, විදුහල්පතිවරු 25 දෙනයි. ඉතින් මේ පත්තරේ දැන්වීම් දැම්මත් ඒ බඳවා ගැනීම අනුව ගුරුවරු සහභාගී වෙන්නේ නැහැ. ඒ ගැටළුවට එක්තරා හේතුවක්. නමුත් විද්‍යාකර බාලිකා විද්‍යාලයේ ප්‍රශ්නය මේ ලෙස බලන්නේ නැහැ. මේකට ශ්‍රේණිධාරී ගුරුවරු විදුහල්පතිවරු හය දෙනෙකුට වඩා ඉල්ලුවා. මේ සියල්ල තිබෙද්දී මේ ලකුණු දීමේ ක්‍රමය මම හිතන්නේ Persanality කියලා මේකට ඉතා විශාල ලකුණු ප්‍රමාණයක් දීලා මේ චක්‍රලේඛයේ මොනවා තිබුණත්, මේ කරලා තිබෙන දේ අනුමත කරන්න බැහැ. මේ විදුහල්පතිව අන්දවලා මෙතැන ක්‍රියා කරනවා පමණක් නොවෙයි, මේ පරිපාලන සේවයේ විශිෂ්ටයන් වුණු, පරිපාලන සේවය සමත් අයට වඩා 2/II විදුහල්පතිවරයෙක් ලකුණු ගන්නවා නම් ඒක මම හිතන්නේ, මේ ක්‍රමය 98 චක්‍රලේඛය තියා රේඛීය අමාත්‍යාංශයෙන් ආවත් මේවා වෙනස් කරලා, අපට ගැළපෙන, අපේ පළාත් සභාවට උචිත විදුහල්පතිවරු තොරා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කරන්න කාලය එළඹීලා තිබෙනවාය කියන එක අපි මතක් කරන්න ඕනෑ. මම හිතන්නේ, අපි මීට පෙර අපේ විදුහල්පතිවරු පත් කළා වැඩ බලන්න. ඒ වැඩ බලන විදුහල්පතිවරු අපේ ප්‍රධාන අමාත්‍යතුමා, කරුණාසේන මැතිතුමන්ලා මෙතැන පත් කළා. මේක බොහොම හොඳට කර ගෙන යන්න පුළුවන් ක්‍රමයකට පත් කළා. නමුත් මේ තිබෙන මේ සම්මුඛ පරීක්ෂණ ක්‍රමය, ඉතාමත් වැරදි ක්‍රමයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. මේ විදුහල්පතිවරයා ඇවිල්ලා, මේ දවස් කිහිපයේදී කරලා තිබෙන මේ අකටයුතුකම් පිළිබඳව ගුරුවරුන් වාගේම විදුහල්පතිවරු සියලු දෙනා චෝදනා කර තිබෙනවා. මේ සඳහා මේ හඬ පට පවා අපට එවලා තිබෙනවා. මේ විදුහල්පතිතුමියට බනින හඬ පට පවා. අපි දැන් සභාගත කරනවා. මේ විදුහල්පතිතුමියට බණින හඬ පට පවා එවලා තිබෙනවා. ඉතින් මේ විදුහල්පතිතුමිය එක එක විධියට එක එක වෙලාවට කටයුතු කරනවා. අවුරුදු දහයක් වැඩ කරපු රියදුරා අයින් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒක සභාගත කරනවා නම් හොඳයි.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

සභාගත කරනවා. මේ රියදුරු සේවයෙන් ඉවත් කරනවා. ගේට්ටුවට කියනවා ගන්න එපා කියලා. රියදුරු ඇතුළට ගන්න එපාය කියලා. සෙනසුරාදා ආවේ නැහැ. ඉරිදා ආවේ නැහැ. රාජකාරී පැහැර හැරියා. රියදුරාව, මේ පාසලේ සංවර්ධන සමිතියෙන් අනුමත කරලා, අවුරුදු දහයක් වැටුප් ගෙවපු සේවකයෙක් මෙහෙම අයින් කරන්න පුළුවන්ද? මුරකරුට කියනවා, ඇතුළට ගන්න එපාය කියලා. මුරකරු ඒ හින්දා ඇතුළට ගන්නේ නැහැ. මුරකරු ඇතුළට ගත්තේ නැති නිසා සේවයට ආවේ නැහැයි කියලා රියදුරු අයින් කරනවා. රියදුරු අයින් කළ එකට මුරකරු සාක්ෂියට එනවා. ඒ නිසා මුරකරුට ගහනවා ලියුමක්. 2014.11.27 ඔබගේ සේවයේ අත්හිටුවීම සම්බන්ධයෙන්. බස්නාහිර විද්‍යාකර විද්‍යාලයේ සහන මුරකරු ලෙස මෙතෙක් ඔබ කළ සේවය අගය කරමි. අප විද්‍යාලයට පොදු ආරක්ෂක සේවයක් ලබා ගැනීමට කටයුතු කරන හෙයින් මින් ඉදිරියට ඔබගේ සේවය අවශ්‍ය නොවේ. එබැවින් කනගාටුවෙන් වුවද ඔබගේ සේවය අත්හිටුවීමට සිදු වන බව දැනුම් දෙමි. ඉස්සෙල්ලාම රියදුරාව අයින් කරනවා. දෙවැනියාට සාක්ෂිකරුවාට ඉන්නේ මුරකාරයා. මුරකාරයාත් අයින් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔය කැසට් පටයයි, ලිපි ලේඛන සියල්ලයි සභාගත කරන්න. ඒ වාගේම ඔබතුමාගේ කාලය අවසන් වෙමින් යනවා. තව විනාඩියක් දෙන්නම්.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

සභාගත කරනවා. තවත් එක කාරණයක් තිබෙනවා අපට කියන්න ඕනෑ. මෙපමණක් නොවෙයි, පසුගිය දවස් තුනක කලා උළෙලක් තියන්නය කියලා ළමයි රෑ දොළහාමාර, එකහාමාර, පාන්දර දෙක වෙන කල් පසුගිය දවස් තුනක රඳවාගෙන හිටියා. පාසලේ එක ගුරුවරියක් නැහැ. කාන්තා පාසලක්. එපමණක් නොවෙයි. 13 A පන්තිය. ඒ පන්තියේ දරුවන් දෙන්නෙකුට පියයුරු හදා ගන්න හැටි පිළිබඳව විදුහල්පතිතුමිය දේශනයක් දීලා තිබුණා. ඉතින් මෙවැනි මන්ද මානසික, මම දන්නේ නැහැ මොන අදහස් තිබෙනවාද කියලා. මේ පියයුරු හදා ගන්න හැටි තමයි ළමයි දෙන්නාට විදුහල්පතිවරයා කථා කරලා තිබෙන්නේ. ඒ ළමයි ගුරුවරුන් එක්ක කියලා තිබෙනවා. ඒ හඬ පට පවා අප ළඟ තිබෙනවා. කෙසේ වෙතත් අපට වෙලාව නැති වුණත් මේ සියල්ල පිළිබඳව පරීක්ෂණයක් කරලා, මේ විදුහල්පතිවරයාව වහාම - මොන චක්‍රලේඛ තිබුණත් මාරු කරන්න කියලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඉල්ලා සිටිනවා. එක විනාඩියක් දෙන්න අවසන් කරන්න. මේ සියල්ල සියලු දෙනා දන්නවා. මේ දත්ත තිබෙනවා. ඒ වාගේම පළාත් සභාවේ මේ අමාත්‍යාංශය හොඳද නැද්ද කියලා අපට බලන්න පුළුවන් වෙන්නේ ඒ අමාත්‍යාංශය මහජනතාවට කොතරම් සමීප ද නැද්ද කියන කාරණය මතයි. ඒ මහජනතාව කොපමණ සමීපද කියන එක පැහැදිලි වෙනවා, ගරු මහ ඇමතිතුමාගේ මනාපවලින්. සියලුම මහ ඇමතිවරු රටේ මනාප අඩුවෙන් ගනිද්දී 35,000 ක් අරන් පටන් ගත්ත අපේ මහ ඇමතිතුමාගේ මනාප ප්‍රමාණය දෙලක්ෂ අසූ දාහක් දක්වා වැඩි වෙනවාය කියන්නේ, අවුරුද්දෙන් අවුරුද්ද මේ අධ්‍යාපනය දැවැන්ත පරිවර්තනයක් හැටියට වෙනස් වෙලා තිබෙනවා. ඒ නිසා අවසාන වශයෙන් තව මගෙන් විනාඩියක් ගියා. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන්න යෝජනා කරලා තිබෙනවා. ඉඩම් අමාත්‍යාංශය යටතේ අපි ඉඩම් සහ පොලිස් බලතල උතුරු නැගෙනහිරට ඉල්ලන කොට, ටී.එන්.ඒ. සංවිධානය ඉල්ලන කොට අපි හැමදාම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය දෙන්න පුළුවන්කමක් නැහැ. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඒ සියල්ලට විරුද්ධව ඒකීය ලංකාව රැක ගැනීමට පෙනී හිටපු පක්ෂයක් වශයෙන් මහජන එක්සත් පෙරමුණ, අද මේ හෙළ උරුමය අරන් තිබෙන තීන්දුව, ටී.එන්.ඒ. සංවිධානයත් එක්ක එකට වාඩි වීමට ගත්ත තීන්දුව නිර්දය ලෙස විවේචනය කරමින්, ඒ අයට අපි අපේ ලැජ්ජාව,

කනගාටුව ප්‍රකාශ කරමින්, මේ අයවැයට අපේ සහයෝගය ලබා දෙනවා කියලා ප්‍රකාශ කරමින් ඔබ සියලු දෙනාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් නගන්නේ. දැන් මෙතැන සභාගත කරන්න කියලා හඬ පටය යෝජනාවක් ආවා. ඒ හඬ පටය පිළිබඳව මේ සභාවට අවබෝධයක් නැහැ. ඒවායේ තියෙන්නේ මොනවාද? අසභ්‍ය දේවල් තිබෙනවාද? ඒ නිසා අපි ඒ සම්බන්ධව ක්‍රමවේදයක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට සභාගත කළාට පසුව බලා ගන්න පුළුවන්. සභාගත කළාට පසුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා ළඟ තිබෙනවා. අධ්‍යාපන ඇමතිතුමා ළඟ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

එතුමා කියන්නේ, ඒක මට ලබා දෙන්න කියලා. ඉදිරි කටයුතු පහසු වෙන්න.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

නැහැ. සභාගත කරන්න පෙර ඒක මන්ත්‍රීවරුන්ට දැන ගන්න - ලිපි ලේඛන විධියට අපට දැන ගන්න අවස්ථාව තිබෙනවා නම් හොඳයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක විෂය භාර ඇමතිතුමාට අපි ලබා දෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

සභාගත කළාම මහ ඇමතිතුමාට දෙන්න බැහැ. මේ හැම මන්ත්‍රීවරයෙකුටම ලබා දෙන්න ඕනෑ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මොකද, ඒකේ සභාව අපහසුවට පත් වන, සභාව අවමානයට ලක් වන යම් දෙයක් ඇතුළත් වෙලා තිබෙන්න ඉඩ තිබෙනවා. එහෙම නම් ඒ සම්බන්ධව විවාදයක් අවශ්‍ය වෙනවා. ඒක සභාගත කරනවාද නැද්ද කියලා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමා අපට කොපියක් ලබා දෙනවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මීට කලිනුත් මෙවැනි ඒවා සභාගත කරලා තිබෙනවා. එතකොට සභාගත කළාම අවශ්‍ය මන්ත්‍රීවරයාට ඒක ඕනෑ නම් ලබා ගන්න පුළුවන්.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගියවර නොවෙයි. ඊට කලින් සභා වාරයේදී මෙවැනි තත්ත්වයක් උද්ගත වෙලා ඒක -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාගත කරන ඕනෑ දෙයක් සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට ගන්න පුළුවන්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගන්න පුළුවන්. දැන් CD මාර්ගයෙන් නේ දෙන්නේ ඔබතුමන්ලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

CD එකක් ඕනෑ නම් දෙන්නම්. අවශ්‍ය නම් දෙන්නම්. ඉල්ලීම් කරන්න. මීළඟට හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට විනාඩි 08 ක කාලයක් ලබා දෙනවා.

[ අ.භා. 03.52 ]

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

බොහොමත්ම ස්තුතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම හිතන්නේ 2015 අයවැය විවාදයේ යම් වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම ඉතා සතුටු වෙනවා. විශේෂයෙන්ම අද මේ පළාත් සභාවේ වැදගත්ම විෂය කථා

[ ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා]

බහකට ලක් වන පළාත් සභාවක්. මම හිතන්නේ, මේ බස්නාහිර පළාත් සභාවේ කථා කරන්න දෙයක් තිබෙනවා නම්, කථා කරන්න තිබෙන එකම අමාත්‍යාංශය තමයි මේක. මොකද, අපේ පළාත් සභාවේ මුළු වියදමෙන් 70% කට වඩා වැඩි මුදලක් අපේ මහ ඇමති ප්‍රසන්න රණතුංග මැතිතුමා එතුමාගේ අමාත්‍යාංශය යොදා ගෙන තිබෙනවා. අනික් ඇමතිවරුන්ගේ කැමැත්ත අකමැත්ත කොහොමද කියන එක මම දන්නේ නැහැ. කෙසේ වෙතත් විශේෂයෙන්ම, අපි කථා කරන්න ඕනෑ අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳව. අපේ රටේ අනාගතය තීරණය කරන විෂයයක් තමයි අධ්‍යාපනය කියන්නේ. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අධ්‍යාපනයට ඇති වෙලා තිබෙන තත්ත්වය ගැන කල්පනා කරන කොට භයානක තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා. ප්‍රධාන වශයෙන් අද අධ්‍යාපනය ගැන කථා කරන කොට මූලිකම කාරණාව තමයි ළමයෙක් ඇතුළත් කරන එක. ළමයෙක් ඇතුළත් කරන කොට අද ඇති වෙලා තිබෙන තත්ත්වය. ඉතින් ළමයෙක් අද ඇතුළත් කරන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. (බාධා කිරීම්) අද තරුණයෙක් හෝ තරුණියක් කසාද බඳින්න ඉස්සෙල්ලා ඔවුන්ට අද කල්පනා කරන්න වෙලා තිබෙනවා -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඒවා ඔහොම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, එතුමාට බාධා කරන්න එපා.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

කවුද ඒ කථා කරන්නේ. කටහඬ විතරයි. පේන්නේ නැහැ. කෙසේ වෙතත් අද ඇති වෙලා තිබෙන තත්ත්වය අනුව අධ්‍යාපනය ගැන කථා කරන කොට මූලික වශයෙන් ළමයෙක්ව ඇතුළත් කරන එක තමයි ලොකුම ප්‍රශ්නය. අද කොපමණ මුදලක් මේ අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කළත්, අද ළමයෙකුව ඉස්කෝලයකට ඇතුළත් කරන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අද තරුණයෙක්, තරුණියක් කසාද බඳින්න ඉස්සෙල්ලා, ළමයෙක් ලබා ගන්න ඉස්සෙල්ලා කල්පනා කරන්න වෙනවා, ළමයාව ඇතුළත් කරන්නේ මොන ඉස්කෝලයටද කියලා. ඒ අනුව ඔප්පු තිරප්පු හදා ගෙන, ගෙවල් දොරවල් මාරු කර ගෙන, අද ළමයෙක්ව ඉස්කෝලවලට දාන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. කල්පනා කරලා බලන්න. මෙතැන ඉන්න හැමෝටම මම හිතන්නේ, මන්ත්‍රීවරුන් හැටියට මේක අපට හැමදාම අත් විඳින්න වෙනවා. අද වැඩිපුරම ඔක්තෝබර්, නොවැම්බර් මාසවල මේ මහජන නියෝජිතයන්ට ජනතාවගේ ගැටළු එනවා නම්, වැඩිම ගැටළු එන්නේ ළමයෙකුව ඉස්කෝලයට දාන එක පිළිබඳව. මේකයි ඇත්ත තත්ත්වය. අද ළමයෙකුව ඉස්කෝලයට දාන්න, හරි ක්‍රියාමාර්ගයක් ගන්න, හරි පිළිවෙතක්, හරි කාර්ය පටිපාටියක් කර ගෙන නැති තත්ත්වයයි අපට පේන්නේ. විශේෂයෙන්ම අද ජනතාවගේ ඒ කථා අහලා බලන කොට ඉස්කෝලේ අල්ලපු වැටේ ඉන්න - (බාධා කිරීමක්)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ කථා කරමින් හිටියේ, ඒ ළමයින් ඇතුළත් කිරීමේ ක්‍රමවේදයක් හරියට ක්‍රියාත්මක කරලා නැහැ. අද ඉස්කෝලේ අල්ලපු වැටේ ඉන්න දරුවාව පාසලට ඇතුළත් කරන්න විධියක් නැහැ. අද තමන්ගේ නිවස, තමන්ගේ දෙමව්පියන්ගේ නමින් තිබෙනවා නම් අද ළමයාව පාසලකට දැමීමේදී අසාධාරණයක් සිදු වෙනවා. ලකුණු කැපෙනවා. එවැනි තත්ත්වයක් උදා වෙලා තිබෙන්නේ. ඉතින් ළමයා මොනවා කරන්නද? දෙමව්පියන්ගේ නැත්නම්, ආච්චිගෙයි සීයාගෙයි නමට ඉඩම තිබෙනවා නම්, එහෙම නැත්නම් නිවස තිබෙනවා නම්, ලකුණු කැපෙනවා. ඉතින් මම විශේෂයෙන්ම මේ අධ්‍යාපනය ගැන කථා කරන කොට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මම විශේෂ අවධානයක් යොමු කරනවා. මේ ළමයින් ඇතුළත් කිරීමේ වැඩ පිළිවෙළ මීට වඩා හොඳින් සාධාරණ ලෙස ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්නය කියලා. දැන් ළමයාව ඉස්කෝලයට ඇතුළත් කළාට පසුව මොකක්ද වෙන්නේ? ළමයාව ඉස්කෝලයට ඇතුළත් කළාට පස්සේ ළමයා සම්මුඛ පරීක්ෂණයට ගිය දවසේ ඉඳන් දෙමව්පියන්ගෙන් සල්ලි එකතු කරනවා. මේකයි වෙන්නේ. අද ළමයෙකුව ඉස්කෝලයට ඇතුළත් කරන්නත් මුදල් දෙන්න ඕනෑ. ඊට පස්සේ ටිකට් විකුණන්න කියනවා. එහෙම නැත්නම් වෙනත් ආධාරවලට මුදල් එකතු කරනවා. එහෙම නැත්නම් ප්‍රශ්න පත්‍රවලට මුදල් එකතු කරනවා. එහෙම නැත්නම් තීන්ත ගාන්න කියලා මුදල් එකතු කරනවා. අද කල්පනා කරලා බලන්න. අද කෝටි ගණනක් මේ මුදල් එකතු කරන්නේ අධ්‍යාපනය සඳහා. අපි

බලාපොරොත්තු වන අධ්‍යාපන ක්‍රමය ඊට වඩා වෙනස්. අපි බලාපොරොත්තු වෙන්නේ ගුණාත්මකතාවයෙන් යුතුව නොමිලයේ ඒ නිදහස් අධ්‍යාපනය ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ. අද අධ්‍යාපනය දෙමව්පියන්ට විශාල බරක් වෙනවා. නොමිලයේ අධ්‍යාපනය කියලා බෝඩ් කැල්ලට කිව්වාට, අද දෙමව්පියන්ට තිබෙන ලොකුම බර තමයි පාසල්වල විදුහල්පතිවරුන්, ගුරුවරුන්. ඒ අයට කරන්න දෙයකුත් නැහැ. කල්පනා කරලා බලන්න. අද රුපියල් කීයක මුදලක් ලබා දෙනවාද පාසල්වල විදුලි බිල ගෙවන්න. මේක දෙමව්පියන්ට, ගුරුවරුන්ට - ඇත්තටම ඒගොල්ලොනුත් අසාධාරණයකට ලක් වෙලා තිබෙනවා. අද පාසලකට ඒ විදුලි බිල ලැබෙන්නේ නැහැ. එතකොට කවුද ඒ විදුලි බිල ගෙවන්නේ? වතුර බිල කවුද ගෙවන්නේ? ඒ විදුලි බිල, වතුර බිල ගෙවීම ගුරුවරුන්ගේ, එහෙම නැත්නම් විදුහල්පතිවරුන්ගේ පඩියෙන් අපට බලාපොරොත්තු වෙන්න පුළුවන්ද? බැහැ. එතකොට මුදල් එකතු කරන්න වෙනවා. ඒ නිසා අපි නිදහස් අධ්‍යාපනය කියලා කථා කළාට, අපට මේ අවාසනාවන්ත තත්ත්වය තිබෙනවා. අනික් එක තමයි මේ ප්‍රශ්න පත්‍ර. මේ ප්‍රශ්න පත්‍ර ගත්තොත් බොහෝ විට වැරදි ප්‍රශ්න තිබෙන්නේ. ඒ වාගේම තමයි ප්‍රශ්න පත්‍ර අද එළියට යනවා. මේක මුදලට. මම හිතන්නේ, මේ සියල්ලටම ප්‍රධාන හේතුව තමයි මේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දේශපාලනීකරණය. ඉතින් මේ දේශපාලනීකරණය පිළිබඳව අද සුදුසු කෙනා සුදුසු තැනට නැති අධ්‍යාපන ක්‍රමයක් තිබෙන්නේ. මේ දේශපාලනීකරණය නිසා අද අපේ රටේ අනාගතය භාර ගන්න ඉන්න දූ දරුවන්ට අපේ රටේ අනාගතය භාර ගන්න ඉන්න ඒ දරුවන්ට අසාධාරණයක් වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි අද අපේ මේ ජනාධිපතිවරණයටත් මේ පාසල් තෝරා ගෙන තිබෙනවා. අද තාප්පවල තිබෙන්නේ රටේ නායකයාගේ දේශපාලන කැම්පේන් එක. ඒ වාගේම මේ පත්තරවල තිබෙන Add ටික. කල්පනා කරලා බලන්න. මම හිතන්නේ තව පාසලක් හදලා නිම කරන්න තිබුණා, මේ පත්තරවල තිබෙන Add ටික නතර කළා නම්. මේ කාගේ මුදල්ද? මහජනතාවගේ මුදල්වලින් තමයි මේ පත්තරවල Add දාලා තිබෙන්නේ. මේ මහින්දෝදය විද්‍යාගාර ටික විවෘත කරන හැම සැරේකටම පත්තරේක පිටු භාගයක, පිටුවක Add එකක් තිබෙනවා. ඉතින් මේකට කාගේ මුදල් ද වෙන් කරන්නේ. මම හිතන්නේ, මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න. මේවා මහජනතාවගේ මුදල්. මේ පත්තර Add වලට දාන මහජනතාවගේ මුදල් ටික එකතු කළා නම්, තවත් මහින්දෝදය විද්‍යාගාරයක් හදන්න තිබුණා. ඉතින් මම හිතන්නේ, මහජනතාවගේ මුදල් අසාධාරණ ලෙස වෙන් කරන්නේ නැතිව, අධ්‍යාපනය කියන්නේ වැදගත්ම විෂය. මේ ගැන විශේෂ අවධානය යොමු කරන්නය කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 04.01 ]

**ගරු අශෝක දයාරත්න**
Ashoka Dayarathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයෙන් බස්නාහිර පළාත් සභාවට තේරී පත් වී දැනට ස්වාධීන මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරන මට මෙම අවස්ථාවේදී, මෙම අයවැය වෙනුවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම හුඟාක් සන්තෝෂ වෙනවා. ගරු සභාපතිතුමනි, මේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ මම හැමදාම සොයා ගත්ත, මම කැමැති, ඉදිරියට ගෙනියන්න පුළුවන් විෂයයක් මම තෝරා ගත්තා. ඒ තමයි නොවිධිමත් අධ්‍යාපන ඒකකය සහ විශේෂ අධ්‍යාපන ඒකකය සම්බන්ධව. මගේ හොඳ බලාපොරොත්තුවක් තිබෙනවා. ඒ බලාපොරොත්තු මේ වන විට ගරු ප්‍රධාන අමාත්‍යතුමා මඟින් හුඟාක් සාර්ථක වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම නොවිධිමත් අධ්‍යාපන ඒකකවල පාසල් නොයන දරුවන් 450 දෙනෙක් පාසල් ගත කරලා තිබෙනවා. ඒ වාගේම විවිධ පාඨමාලා ලබා දී ජාතික සුදුසුකම් සහතිකය, NVQ කියන සහතිකය ලබා දීලා තිබෙනවා. ස්ථිර වාසස්ථාන නොමැති වීදි දරුවන් 75 දෙනෙකුට සාක්ෂරතා පන්ති පවත්වලා තිබෙනවා. ඒ වාගේම නොවිධිමත් දරුවන් 125 කට ආසන්න සංඛ්‍යාවකට පෙර පාසල් හතරක් ආරම්භ කරලා දීලා තිබෙනවා. පාසල් අධ්‍යාපනය අතරමග නතර කළ දරුවන් සඳහා ජල නල විදුලි කාර්මික හා ඇලුමිනියම් Partitions පිළිබඳ වෘත්තීය පුහුණු ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම විශේෂ අධ්‍යාපන ඒකකය ගැන මම කථා කළොත්, බස්නාහිර පළාත තුළ විශේෂ අධ්‍යාපන ඒකකයේ වයස 16 ඉක්මවූ දරුවන්ට කිසිම පාසලක් නැහැ පාසලෙන් අස් කළාට පස්සේ. මේ සම්බන්ධව ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් එක්ක මම පසුගිය විවාදවලදී කථා කළා. එහි ප්‍රතිඵලයක් ලෙස ගරු මහ ඇමතිතුමා ඇත්ත වශයෙන්ම සංවේදී වෙලා ගම්පහ දිස්ත්‍රික්කයේ නියමු ව්‍යාපෘතියක් කරන්නය කියලා මා හට ලබා දුන්නා. මේ වන කොට

[ ගරු අශෝක දයාරත්න]

ඒ නියමු ව්‍යාපෘතිය ආරම්භ කරන්න මූලික සැලැස්ම දමලා මේ අයවැයෙන් ඒකට අවශ්‍ය ප්‍රතිපාදන සඳහාත් ව්‍යාපෘති වාර්තාවක් දීලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒ නව ව්‍යාපෘතිය හදලා දැත්ගම කනිෂ්ට විද්‍යාලයේ අක්කර දෙකක භූමි ප්‍රමාණයක් දීලා මිලියන 25 ක ඇස්තමේන්තුවක් අපි ලබා දීලා තිබෙනවා. අයවැයෙන් පසුව අපි ඒක ආරම්භ කරන්න උත්සාහ කරනවා. ඒ වාගේම 2015 ජාතික අයවැය මගින් විශේෂ අධ්‍යාපනය ලබන දරුවන් දිරි ගැන්වීමට රුපියල් 750 ක් දීමට අතිගරු ජනාධිපතිතුමා යෝජනා කරලා තිබෙනවා. එයත් දැන් අපේ බස්නාහිර පළාතේ විශේෂ දරුවන්ට ලබා දීමට කටයුතු කරන්න යෝජනා වී තිබෙනවා. විශේෂයෙන්ම මේ විශේෂ අධ්‍යාපන ඒකකයේ දරුවන් වෙනුවෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මම පොඩි යෝජනාවක් කරනවා. ඒ වාගේම ඒ ක්ෂේත්‍රයට අදාළ ගුරුවරුන් සම්බන්ධයෙන්. ඒ ක්ෂේත්‍රයට අදාළ නිලධාරීන්ව විදේශ රටවලට ගෙන ගොස් ඒ සම්බන්ධව ලොකු අධ්‍යයනයක් ලබා දෙන ලෙස මම යෝජනා කරනවා. ඒ වාගේම විශේෂ අධ්‍යාපන ඒකකයට ගුරුවරුන් අරගෙන එම අය ටික කාලයකින් වෙනත් ස්ථානවලට ස්ථානමාරු ගන්නවා. මේක නවත්වලා ස්ථිර සේවයේ අඩුම වශයෙන් වසර පහක්වත් ඒ දරුවන් වෙනුවෙන් ඒ සේවය ලබා දෙන්න කියලා මම අධ්‍යාපන ඇමතිතුමාට යෝජනා කරනවා. මම විශේෂයෙන්ම ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මේ විශේෂ අධ්‍යාපන ඒකකය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දැක්වීම සම්බන්ධව පෞද්ගලිකව මාගේ ස්තූතිය පුද කරනවා.

මේ අවස්ථාවේදී මීට පෙර මේ සම්බන්ධව කථා කරපු මගේ සහෝදර ඉන්දික මහීෂ බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා මට දෝෂාරෝපණයක් කළා. ඇත්ත වශයෙන්ම මම ඒ ගැන කනගාටු වෙන්නේ නැහැ. මම ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයෙන් අයින් වුණේ ඇයි? අයින් වෙන්න හේතු මම ඊයේ කිව්වා. හැබැයි, අපේ සමහර අය ඉන්නවා. මේ සභාවේ කවුරුත් දන්නවා අපේ සෝම හිමියන්ව. ඒ සෝම හිමියන්ගේ වාහනයටත් වඳින උපාසක උපාසිකාවෝ හිටියා. ඒක අපි කවුරුත් දන්නවා. ඒ වාගේ ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා ළඟ කකුල් දෙක අල්ලලා වඳින පිරිසක් අපේ ඉන්නවා. (බාධා කිරීම්) හැබැයි, දයාරත්න ඒ තත්ත්වයට ගිහිල්ලා නැහැ. දයාරත්න ඉතාමත් කොන්ද කෙළින් තියා ගෙන තමන්ගේ සේවය කරලා මම මේ ස්ථානයට පත් වුණාය කියලා ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ගරු සභාපතිතුමනි, අපේ කළා වාගේ මෙතුමාගේත් ඒ අනවශ්‍ය ඒවා නවත්වන්න කියන්න.

[ අ.භා. 04.07 ]

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මම මගේ කථාව ආරම්භ කිරීමේදී අපේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණාවක් පිළිබඳව මදකට අවධානය යොමු කරනවා. මගේ නමත් සඳහන් කරමින් එතුමා සඳහන් කළා, අපි ලබා දුන්න ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රයක වැරදි තිබෙනවා කියලා. ඒ වාගේම මම මෙහිදී සඳහන් කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සාමාන්‍ය පෙළ සඳහා සූදානම් වන දරුවන්ට ඔවුන්ගේ ඉංග්‍රීසි ප්‍රතිඵල ඉහළ නැංවීම උදෙසා වැඩ සටහනක් සූදානම් කරන්නය කියලා අපි කලාප අධ්‍යක්ෂතුමිය හරහා දැනුම් දුන්නාට පස්සේ ගුරු උපදේශකවරුන් තමයි මේ ප්‍රශ්න පත්‍රය හදලා තිබෙන්නේ. කැලණිය කලාපයේ. ඒ නිසා ඒකේ වැරැද්දක් තිබෙනවා නම් ඒක පෙන්වා දීම පිළිබඳව මම ගරු මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වන අතර, ඔබතුමා මාර්ගයෙන් මම ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, එහි අඩුපාඩුවක් තිබේ නම් කලාප අධ්‍යක්ෂතුමිය හරහා ඒ පිළිබඳව සොයා බලා පරීක්ෂා කරන ලෙසට. ඒ ඇරෙන්නට කිසිසේත්ම නුසුදුසු අය ලවා අපි මේවා කරවන්නේ නැහැ. ඊට අදාළ නිලධාරීන් ලවා තමයි මේ කටයුත්ත කරන්නේ.

දෙවනුව, විශේෂයෙන්ම අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, මිනිස් බල හා රැකී රක්ෂා සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ අයවැය පිළිබඳවයි අපි මේ විවාදය පවත්වන්නේ. මාධ්‍ය පසුබිමක් තිබෙන, වෘත්තීමය පසුබිමක් තිබෙන ආණ්ඩු පක්ෂය නියෝජනය කරන අයෙක් විධියට මගේ වෘත්තීය වගකීමක් තිබෙනවා, අද මේ විවාදයේදී ප්‍රවෘත්ති අමාත්‍යාංශය පිළිබඳව, ප්‍රවෘත්ති කියන විෂය පිළිබඳව යම්කිසිවක් සඳහන් කිරීමට. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ විෂය පිළිබඳව මම සියලු දෙනාගේ අවධානය යොමු කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගරු මහ ඇමතිතුමා, එතුමාට ලබා දී තිබෙන මේ අමාත්‍යාංශය සම්බන්ධයෙන්

ඉතාමත්ම වැදගත්ම පියවර කිහිපයක් මේ වසරේදී යෝජනා කර තිබෙනවා. මම හිතන්නේ, මාධ්‍යකරුවන් විධියට අපි ඉතාමත්ම සතුටු විය යුතුයි මේ කාරණා පිළිබඳව. එතුමා මෙහිදී සඳහන් කරලා තිබෙනවා. විශේෂයෙන්ම ජනමාධ්‍ය ක්ෂේත්‍රයට විශාල සේවයක් කළ ප්‍රවෘත්ති සහ කාලීන තොරතුරු මගින් මහජනතාව දැනුවත් කිරීමේ සුවිශේෂී කාර්යභාරයක නියැලී සිටින ජනමාධ්‍යවේදීන් මගින් තවදුරටත් ඵලදායී සහ කාර්යක්ෂම සේවාවක් සපයා ගැනීම සඳහා ඔවුන්ට පහසුකම් සැපයීමට, ඉදිරි වසරේදී අපේක්ෂා කරන බව. මම හිතන්නේ, මාධ්‍යකරුවන් විධියට අපි ඉතාමත් සතුටු වෙන්න ඕනෑ. ඔවුන්ට අවශ්‍ය ඒ වෘත්තීමය පුහුණුව වාගේම ඒ පහසුකම් සැලසීම පිළිබඳව. ඒ වාගේම තවත් කරුණක් තිබෙනවා. ඒ තමයි මාධ්‍යකරුවන් ඇගයීමට ලක් කිරීමට පියවර ගන්නා බව. තෙවැනි කාරණය තමයි තොරතුරු කේන්ද්‍රයක් ආරම්භ කිරීමට කටයුතු කරන බව. මේ කාරණා තුනම විශේෂයෙන්ම බස්නාහිර පළාතේ, මේ රටේ දියුණුම පළාතේ, මේ රටේ වැඩිම මාධ්‍ය හා සම්බන්ධ පිරිසක් ජීවත් වන පළාතේ මාධ්‍යකරුවන් විධියට මේ කාරණාව අපි ඉතාමත්ම අගය කොට සලකනවා. ඒ වාගේම තමයි මා මෙහිදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු මහ ඇමතිතුමාට යෝජනා කර සිටිනවා. මාධ්‍යකරුවන්ව පුහුණු කරන්නට, ඔවුන්ට නව තාක්ෂණය පිළිබඳ දැනුම ලබා දෙන්නට ඒ හරහා ලෝකයේ මාධ්‍යයේ තිබෙන්නා වූ නව ප්‍රවණතාවයන් පිළිබඳව මාධ්‍යකරුවන්ට දැනුම ලබා දීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළක් සකසා දීම සඳහා එතුමාගේ අවධානය යොමු කරන ලෙසට. මම හිතන්නේ, මේ පළාත් සභාවේ විශේෂයෙන්ම මෑත කාලීනව මේ රටේ ජනමාධ්‍ය හරහා මේ පළාත් සභාවට විශාල ජනප්‍රියතාවයක් ලැබිලා තිබෙනවා. ඒ ජනප්‍රියතාව හරහා මේ පළාත් සභාව තුළ සිදු වන්නා වූ කටයුතු පිළිබඳව ජනතාව වඩ වඩාත් අවධානය යොමු කරන පසුබිමක් තුළ මාධ්‍යකරුවන්ගේ සුභසාධනය සඳහා මේ ආකාරයට කටයුතු කිරීම පිළිබඳව මම මේ අවස්ථාවේදී ගරු මහ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඊළඟට තවත් විශේෂ කාරණයක් මා මෙහිදී මතක් කරන්න කැමැතියි. අපි ජීවත් වන බස්නාහිර පළාතේ අපි දන්නවා, විද්‍යුත් මාධ්‍ය බැලුවොත් එහෙම, ගුවන් විදුලි සහ රූපවාහිනී මාධ්‍ය බැලුවොත් මේ රටේ තිබෙන සියලුම රූපවාහිනී නාලිකාවන් බස්නාහිර පළාතේ ජනතාවට දැක ගැනීමේ හැකියාව තිබෙනවා. මේ රටේ තිබෙන සියලුම ගුවන් විදුලි නාලිකාවන් බස්නාහිර පළාතේ ජනතාවට අසන්නට හැකියාව තිබෙනවා. ඒ වාගේම මුද්‍රිත මාධ්‍ය ගත්තොත් මේ රටේ සියලුම පුවත්පත් පාහේ බස්නාහිර පළාතේ ජනතාවට සමීප වෙනවා. ඒ වාගේම සඟරා ආදිය සමීප වෙනවා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නව වැදගත් කාරණයක් තිබෙනවා. මෑත කාලීනව අන්තර්ජාලය හරහා ඉතාමත් විශාල ලෙස තොරතුරු සන්නිවේදනය ආරම්භ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මෙය බස්නාහිර පළාත තුළ අපි දකිනවා. ඒක ආකාර දෙකකින් අපි දකිනවා. එකක් තමයි සමාජ ජාලා වෙබ් අඩවි හරහා. අනික් එක තමයි E පුවත්පත්, එහෙමත් නැත්නම් අන්තර්ජාල පුවත්පත් හරහා. එතකොට මේවායේ කිසියම් වූ ආකාරයකට සමාජයට ඍජු බලපෑමක් එල්ල කරන්නට විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ජනතාවට ඍජු බලපෑමක් එල්ල කරන්නට අද දවසේදී හැකියාවක් ලැබිලා තිබෙනවා. නමුත් ඉතාමත්ම කනගාටුදායක තත්ත්වයක් තිබෙනවා. පසුගිය දිනවල අපි මේ අන්තර්ජාලය ඔස්සේ, සමාජ ජාලා වෙබ් අඩවි දිහා බලද්දී මේ E පුවත්පත් දිහා බලද්දී අපට තේරෙන කාරණාවක් තමයි ඉතා විශාල වශයෙන් අසත්‍ය පුවත් මේවායේ පළ වෙනවා. ඕපා දූප පළ වෙනවා. පුද්ගලික මඩ ගැසීම් තිබෙනවා. විකෘති කරන ලද පුවත් මේවායේ සඳහන් වෙනවා. ඒ අනුව මාධ්‍ය සදාචාරයෙන් ඔබ්බට ගියපු වැරදි තොරතුරු මේ අන්තර්ජාලය හරහා බස්නාහිර පළාත තුළ වේගවත්ව ක්‍රියාත්මක වන බව අපි මෙහිදී සඳහන් කළ යුතු වෙනවා. ඒ නිසා මේවා කියවන, විශේෂයෙන්ම පාසල් යන දූ දරුවන්ට - අද අපි කථා කරන්නේ, අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළත් එකී අමාත්‍යාංශයේ අයවැය පිළිබඳ විවාදය. ඒ නිසා අධ්‍යාපනය, ප්‍රවෘත්ති කියන විෂයයන් දෙකම අයිති වෙලා තිබෙන්නේ, අපේ ගරු මහ ඇමතිතුමාට. ඒ නිසා මම මෙහිදී යෝජනා කරනවා. අපේ පාසල් මට්ටමින් දරුවන්ට ජනමාධ්‍යකරණය පිළිබඳව, ප්‍රවෘත්ති වාර්තාකරණය පිළිබඳව කිසියම් පුහුණු වැඩමුළු මාලාවක් පවත්වන්නය කියලා. විශේෂයෙන්ම මම මෙහිදී බලාපොරොත්තු වන්නේ දරුවන්ට මේ විෂය පිළිබඳව දැනුම ලබා දෙන අතරතුරේදීම හොඳ සහ නරක වෙන් කොට හඳුනා ගැනීමට, මාධ්‍ය සදාචාරය හඳුනා ගැනීමට, මාධ්‍ය තුළින් සිදු විය යුතු වගකීම, මාධ්‍යයේ තිබෙන්නා වූ ප්‍රබල භාවය හඳුනා ගැනීම සඳහා විශේෂයෙන්ම බස්නාහිර පළාතේ පාසල් දරුවන් දැනුවත් කිරීම සඳහා ප්‍රවෘත්ති විෂය ක්ෂේත්‍රය යටතේ ගරු ඔබතුමා මාර්ගයෙන් අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඉදිරියේදී කිසියම් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියලා. මොකද, එතුමාට ඒක ඉතාමත්

[ ගරු සුසාර දිනාල් සිල්වා]

පහසුවෙන් කරන්න පුළුවන්. අධ්‍යාපන විෂයත්, ඒ වාගේම ප්‍රවෘත්ති විෂයත් එකම අමාත්‍යාංශයක් යටතේ පවතින නිසා.

ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම නැවත වාරයක් මෙවර අයවැය ලේඛනයේදී, විශේෂයෙන්ම මුදල් ප්‍රකාශයේදී ගරු මහ ඇමතිතුමා සඳහන් කරලා තිබෙනවා, මාධ්‍ය සම්බන්ධයෙන් පුහුණු වැඩ මුළු සංවිධානය කිරීම සඳහා විශේෂ ප්‍රමුඛතාවයක් දී කටයුතු කරනවාය කියලා. එහිදී පාසල් සිසුන්ට, පාසල් හැර ගිය අයට, ඒ වාගේම මාධ්‍ය පිළිබඳව උනන්දුවක් දක්වන අයට ඒවා කිරීමට එතුමා අවධානය යොමු කොට තිබීම පිළිබඳව මාධ්‍යකරුවෙක් විධියට මේ සභාවේදී මගේ ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 04.13 ]

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතේ හය වන පළාත් සභාව ආරම්භ කරලා පසුගිය මාස අට ඇතුළතදී මේ සභා ගර්භය තුළ කිසිදු ජනතාවාදී අදහසක් යෝජනා කරලා, සාකච්ඡා කරලා, සම්මත කරලා, ක්‍රියාත්මක නොවුණු අවස්ථාවක 2015 අයවැය සඳහා සාකච්ඡාවකට සම්බන්ධ වෙන්න අද අපට අවස්ථාව ලැබිලා තිබෙනවා. විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ඒ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් පිළිබඳව අද දවසේ අපගේ අවධානයට යොමු වන විට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ යමක් ප්‍රකාශ කළ යුතුයි කියන එක මම විශ්වාස කරනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අපගේ ස්තුතිය පුද කර සිටිනවා. විශේෂයෙන්ම නිදහස් අධ්‍යාපනය සඳහා රුපියල් මිලියන 18,670 ක් මේ වැය ශීර්ෂයන් යටතේ වෙන් කර තිබීම පිළිබඳව. හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විපක්ෂය නියෝජනය කරන අපට අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන්ට තිබෙන ගැටළුව තමයි මේ මුදලින් වැඩි මුදලක්, වැඩි ප්‍රතිශතයක් නිදහස් අධ්‍යාපනය සඳහා නොව මේ අධ්‍යාපන ධාරාව, මේ අධ්‍යාපන ව්‍යුහය දේශපාලනීකරණය සඳහා යෙදවීම පිළිබඳව විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත්, ඒ ක්ෂේත්‍රය තුළ සිටින නිලධාරීන්ටත් බරපතළ ගැටළුවක් මේ වන විට මතු වෙලා තිබෙනවා. ඒ පිළිබඳව බොහෝ මන්ත්‍රීවරු මීට පෙර මේ සභාවේ අදහස් ප්‍රකාශ කර සිටියා. ඔවුන්ගේ අදහස් දක්වා සිටියා.

ඒ එක්කම මම ස්තුතිවන්ත වෙනවා. එදා එක්සත් ජාතික පක්ෂයේ රාජ්‍ය නායකයින් ආරම්භ කළ නොමිලයේ පාසල් පොත්, නොමිලයේ නිල ඇඳුම්, දිවා ආහාර ලබා දීමේ ව්‍යාපෘති අදටත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා යටතේ අඛණ්ඩව සිදු කරමින් ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳව මම මගේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේ නැවත පුද කර සිටිනවා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නොමිලයේ ලබා දෙන ඒ සියලු කටයුතුත් එක්ක අපට බැහැර කළ නොහැකි කටයුතු කිහිපයක් තිබෙනවා. ඒ තමයි අදටත් පාසල්වල දූවා දරුවන්ට, ඒ දූවා දරුවන්ගේ දෙමව්පියන්ට මේ පාසල් ගොඩනැගිලිවල වර්ණ ආලේප කිරීමට, ඒ වාගේම අධ්‍යාපන චාරිකා, අධ්‍යාපන සම්මන්ත්‍රණ පැවැත්වෙනවා. ඒ වාගේම අපි සෑම ක්‍රීඩාවක් සඳහාම සහ පුටු, මේස සහ අනෙකුත් අලුත්වැඩියාවන් සඳහා ඒ පිරිවැය අදටත් මේ වර්තමානයේත් ඒ පාසල් යන දූවා දරුවන්ට සහ ඔවුන්ගේ දෙමව්පියන්ට දැරීමට සිද්ධ වෙනවා. අන්න ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අදටත් අල්ලපු වත්තේ වැටෙන පොල් ගෙඩිය හොරකම් කර ගෙන විකුණලා ඒ අධ්‍යාපන පිරිවැය දරන්න සමාජයේ දෙමව්පියන්ට, පාසල් යන දූවා දරුවන්ට අද සිද්ධ වෙනවාය කියන එක අපට මාධ්‍ය හරහා දකින්නට ලැබෙන්නේ. ඒ සමාජ අසාධාරණය, ඒ සමාජ පීඩාව අදටත් මේ සමාජය තුළ තිබෙනවා. ඒක බැහැර කරන්න බැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විපක්ෂයේ අප නගන චෝදනාව නොවෙයි. මේ තමයි සමාජයේ තිබෙන යථාර්ථය කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම මේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ තිබෙන බරපතළම ගැටළුව මොකක්ද? මේ පිළිබඳව කිහිප දෙනෙක්ම අදහස් ප්‍රකාශ කළා. ඒ තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විභාග ප්‍රශ්න පත්‍ර කලින් පිට වීම. මේ අක්‍රමිකතාවය, වසර ගණනාවක් පුරාවට සෑම විභාගයක් පටන් ගන්නට පෙර, ආරම්භ කිරීමට පෙර සිද්ධ වන අවස්ථාව. මේ අක්‍රමිකතාවය වළක්වන්න මේ වන විට මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශය හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය අපොහොසත් වෙලා තිබෙනවා. අකර්මන්‍ය වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වෙනුවට අතීසාරයට අමුඩෙ ගහනවා වාගේ තීන්දු තීරණ අරන් තිබෙනවා. දැන් මේ වන විට තීන්දු අරන් තිබෙනවා. දැන් මාස කිහිපයක ඉඳලා විභාගය පැවැත්වෙන දින කිහිපයකට ඉහත සිට සියලුම උපකාරක පන්ති මේ වන කොට තහනම් කරලා තිබෙනවා. මම හිතන්නේ ලෝකයේ තිබෙන එකම

රට විභාගය ආසන්නයේදී තමන්ගේ ගුරුවරයාගෙන් උපදෙස් ලබා ගන්නට, තමන්ගේ ගුරුවරයාගෙන් ඒ අවශ්‍ය සහාය ලබා ගන්න තහනම් කරපු එකම රට වශයෙන් ගිනස් වාර්තා පොතට මේ ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය යොමු වෙනවාය කියන එක, ඇතුළත් වෙලා තිබෙනවාය කියන එක මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම විශේෂයෙන්ම ඔබතුමා වෙත දන්වා සිටිනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවැනි කැකිල්ලේ තීන්දු දෙන රජයක් යටතේ අපට පුංචි සැකයක් තිබෙනවා, හෙට දවසේ අලුත උපන් බිළිඳාට අම්මාගෙන් කිරි බොන එකටත් සීමාවන් සහ වේලාවන් පනවයිද කියන එක. ඒ පිළිබඳවත් විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් වශයෙන් අපට පුංචි සැකයක් තිබෙනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂ අවධානයක් ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත ඔබතුමා මගින් මම යොමු කිරීමට උත්සාහ කරනවා. ඒ තමයි මේ රටේ අපි දන්නවා, වෛද්‍ය වාර්තා අනුව 20% ක් මානසික ආතතිය සහ මානසික පීඩනයෙන් ජීවත් වෙන ජනතාවක් - අපේ මුළු ජනගහනයෙන් 20% ක් මානසික ආතතියට යොමු වෙලා තිබෙනවාය කියන එක වෛද්‍ය වාර්තා අනුව තිබෙනවා. එහෙම නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ ප්‍රතිශතය පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් පොදුයි. එහෙම නම් ඒ වෙනුවෙන් අපේ අවධානය යොමු වෙනවාද? මේ වන විට පාසල්වල සිදු වන පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර සිදු වන සිය දිවි නසා ගැනීම් අද ඉහළ අගයක් ගනිමින් පවතිනවා. අපි දන්නවා, අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපන අමාත්‍යාංශය හරහා චක්‍රලේඛ පිට වී තිබෙනවා. සෑම පාසලකම සිසු දරු දැරියන්ට උපදේශන සේවාවන් පැවැත්විය යුතුයි. ඒ සඳහා පුහුණු ගුරුවරුන් යොමු කළ යුතුයි. නමුත් ඒක ප්‍රායෝගිකව පාසල්වල ක්‍රියාත්මක වෙන්නේ නැහැයි කියන එක වගකීමෙන් කියනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ උපදේශන සේවාවන්, ඒ ගත්තා වූ තීන්දුව නිවැරදිව තවත් සාක්ෂාත් කරන්න, එය තවත් තහවුරු කරන්නය කියන එක, විශේෂයෙන්ම ඒ තුළින් මේ මානසික ආතතියට පත් වෙලා තිබෙන, ඒ වාගේම ඒ හරහා නොයෙකුත් ආකාරයෙන් සමාජ විරෝධී කටයුතුවලට ඇබ්බැහි වන සිය දිවි නසා ගැනීම්වලට යොමු වන, පාසල් දූවා දරුවන්ගේ ජීවිතය අපට බේරා ගන්න පුළුවන් කියන එක මම විශ්වාස කරනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උපදේශන සේවාවන් පිළිබඳව විශේෂ අවධානයක් මේ අධ්‍යාපන ව්‍යුහය හරහා යොමු විය යුතුයි කියලා මම විශ්වාස කරනවා.

ඒ එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මම විශ්වාස කරනවා. අපේ අලුත ඉපදෙන දරුවන්ගෙන් 3% ක් හෝ 4% ක් ආබාධයකින් යුක්තව ඉපදෙනවාය කියන එක වාර්තාවල තිබෙනවා. එක්කෝ මානසික, එක්කෝ ශාරීරික ආබාධයන්. ඔවුන් වෙනුවෙන් මේ අධ්‍යාපනය, විශේෂයෙන් විශේෂ අධ්‍යාපන ඒකකය තවදුරටත් ශක්තිමත් කළ යුතුයි කියන එක අපි විශ්වාස කරනවා. ඒ සඳහා වෙන් කර ඇති මුදල් කෙසේවත් ප්‍රමාණවත් නැහැයි කියන එක මම මේ අවස්ථාවේදී ගරු සභාවේ අවධානයට යොමු කර සිටිනවා. ඒ සඳහා හොඳම උදාහරණය ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීට වසර කිහිපයකට ප්‍රථම රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛයක් නිකුත් වුණා. විශේෂයෙන්ම සෑම රාජ්‍ය ආයතනයකම, පොදු ආයතනයකම ආබාධිත පුද්ගලයින්ට ළඟා විය හැකි ආකාරයට ඒ පරිසරය සකස් කළ යුතුයි, ඒ භෞතික වෙනස්කම් සිදු කළ යුතුයි කියලා. නමුත් මම දන්නා විධියට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහෝ පාසල්වල අන්න ඒ වෙනස්කම් ටික අදටත් සිදු වෙලා නැහැ. ආබාධිත පුද්ගලයෙක් ආවොත් පාසලේ ප්‍රධාන කාර්යාලයට යන්න, විදුහල්පතිවරයා හමු වෙන්න අපහසුයි. එවැනි කටයුතු අදටත් ඒ භෞතික සංවර්ධනයන් සිදු කර නැහැ. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට විශේෂ මැදිහත්වීමක් සහ එතුමාට ඒ සඳහා විශේෂ වගකීමක් තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී විශ්වාස කරනවා.

ඒ එක්කම මම විශේෂයෙන්ම අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳවත් විනාඩියක් කථා කරනවා. මේ වන විට අප ප්‍රදේශයේ විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කය තුළ අපද්‍රව්‍ය එකතු කිරීම යම්කිසි ආකාරයකට සාර්ථකව කෙරෙනවාය කියන එක අපි පිළිගන්නවා. හැබැයි, අපද්‍රව්‍ය එකතු කිරීම පමණයි සිද්ධ වෙන්නේ. එය නිසි පරිදි බැහැර කරලීම කිසිසේත්ම සිද්ධ වෙන්නේ නැහැ. මේ වන විට ඒ පළාත් පාලන ආයතනවලින් එකතු කරන අපද්‍රව්‍ය ඉතාමත්ම අවිධිමත් ලෙස කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කරදියාන වෙන්න පුළුවන්. අනෙකුත් කොට්ඨාශවල ඒ බැහැර කිරීම සිදු වෙනවා. ඒ හරහා විශාල සමාජීය අර්බුදයක් මේ වන විටත් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ පිළිබඳව ස්ථිරසාර, දිගු කාලීන වැඩ පිළිවෙළක් සඳහා විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු වෙතැයි කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 04.22 ]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරු බොහොමයක් අයවැයක හර පද්ධතිය පිළිබඳව වගකීමෙන් තොරව තමන්ගේ කථා පැවැත්වූවා කියලා මම විශ්වාස කරනවා. විශේෂයෙන්ම අයවැයක හර පද්ධතිය පිළිබඳව, Values පිළිබඳව මේ නිලධාරීන් පවා දැන ගෙන සිටිනවාද යන්න අද දිනයේ මතු වෙලා තිබෙන ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක්කෝ හර පද්ධතිය පිළිබඳව වැටහීමක් නැහැ. එහෙම නැත්නම් තැකීමක් නැහැ. ඒ නිසා අද අයවැය පළාත් සභාව තුළ විහිළුවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ අතර තමයි මේ තත්ත්වයට පත් වෙන්නට දේශපාලඥයෝ වාගේම අර එහා පැත්තේ කාමරවල ඉන්න නිලධාරීන් ද වගකිවයුතු වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දන්නවා එක්තරා සේවකයෙක්, එක්තරා නිලධාරියෙක්, ප්‍රබල පුද්ගලයෙක් මේ තමන්ගේ තනතුර ආරක්ෂා කර ගන්න අර ගෙන එනවා, 1956 බස් ජන සතු කරද්දී, බණ්ඩාරනායක මහත්තයා ජනසතු කරපු බස් එකේ තමන්ගේ සීයා ගිය ඡායාරූපයක්. එක්තරා නිලධාරියෙක් අරගෙන එනවා, තමන්ගේ සීයා බණ්ඩාරනායක මැතිතුමා බස් ජන සතු කරද්දී, ඒ බස් එකේ වාඩි වෙලා හිටපු ෆොටෝ එකක්. ඒක ගෙනැල්ලා දේශපාලඥයින්ට මානසික අල්ලසක් දෙනවා. මම ඔරිජිනල් ශ්‍රී ලංකාකාරයෙක් කියලා. (බාධා කිරීම්) ඔබතුමා දන්නවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, එහෙම නිලධාරීන් මේ සභාව ඇතුළේ රාජ්‍යයට නොවෙයි වැඩ කරන්නේ. මේ ආණ්ඩුවට වැඩ කරන්නේ. මේ රාජ්‍යයට නොවෙයි වැඩ කරන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නම කියන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම කියන්න බැඳිලා නැහැ, මේකේ නිලධාරියාගේ නම. නිලධාරීන් ඉන්නවා. ඒකට තමයි මහ ඇමති කෙනෙක් ඉන්නේ. මහ ඇමතිට පුළුවන්කම තිබෙන්න ඕනෑ. කශේරුවක් තිබෙන්න ඕනෑ, ඒ නිලධාරීන්ගෙන් වැඩ ගන්න. ඒ ඔක්කොම දැනෙන තැනකට දැනෙන්න, රිදෙන තැනකට රිදෙන්න, වදින තැනකට වදින්න කියන්නේ. වැදෙනවා නම්, රිදෙනවා නම්, දැනෙනවා නම් තොප්පිය දා ගත්තාට කමක් නැහැ. (බාධා කිරීමක්)

ඒ නිසා ඔබතුමාගේ මාර්ගයෙන් ඉදිරිපත් කරන්නේ. මේ පළාත් සභාව තුළ අද මොකක්ද වෙලා තිබෙන්නේ? මම ඊයේ කථා කළා. සමූපකාර කොමසාරිස්ට වැඩියෙන්ම අල්ලස් දෙන්නේ සමූපකාරවල සභාපතිවරු කියලා. ඒ වාගේම පළාත් සභාව යටතේ පාලනය වන, පළාත් පාලන ආයතනවල සභාපතිවරු, නගරාධිපතිවරු වැඩියෙන්ම අල්ලස් දෙන්නේ සහකාර කොමසාරිස්ට. මොනවා කිව්වාත් වැඩක් නැහැ. මොන දූෂණ, වංචා ගැන කිව්වත් වැඩක් නැහැ. කොමසාරිස්තුමියට ආවාම කොමසාරිස්තුමිය දානවා ඒක සහකාර කොමසාරිස්ට. එයා කෙළින්ම අල්ලසට අහු වෙනවා. කොමසාරිස්තුමිය ආසයි බයයි. බෝට්ටුවේ නමයි. ඒ නිසා යන්නේ නැහැ. නීති නිලධාරී මහත්වරු - මේක තමයි යථාර්ථය. (බාධා කිරීම්)

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේට මම කියන්නේ, මේ යථාර්ථය තුළ මේ පළාත් සභාව ඉදිරියට යන්න පුළුවන්ද? අපි ඔක්කොම කරන්නේ මොකටද? රටේ ජනතාව සංවර්ධනය කරන්න. මේ මොකක්ද සංවර්ධනය. මේ පළාත් සභාව හරහා පුද්ගල සංවර්ධනයක් සිද්ධ වෙලා තිබෙනවාද? නැහැ. පුද්ගල සංවර්ධනයක් එනවා. නගර සභාවල සභාපතිවරු විතරක්. නාගරික මන්ත්‍රීවරු විතරක්. එදා මම සභාවේදී මතු කරපු තාර දාපු පාර උඩින් කොන්ක්‍රීට් දානවා. කොන්ක්‍රීට් උඩින් බ්‍රේලින් ගල් අල්ලනවා. මේකට අදාළ TO, මේ තාක්ෂණ නිලධාරියා තමයි මේකට වාර්තා හදලා ඇස්තමේන්තු හදන්නේ. ඔහු ඒ පාරට ගිහින් පාර මනින්න ඕනෑ. පාරේ තත්ත්වය කියන්න ඕනෑ. හැබැයි, සමහර TO මහත්වරු නගර සභාවට එන්නේ, Volvo වල. මර්සඩීස් Bens වල. එහෙම තමයි TO මහත්වරු නගර සභාවට එන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා විෂයට අදාළව කථා කරන්න ඕනෑ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඉතින් විෂයය නේන්නම්?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පාර මොකක්ද? කවුද නිලධාරියා කියලත් කියනවා නම් හොඳයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

අයියෝ මහත්තයෝ පළාත් සභාවේ පාරවල් තිබෙනවා 88,000 ක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ කීපයක් ඔබතුමා නම් කරනවා නම් වඩා හොඳයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒකට තමයි මහ ඇමතිතුමා ඉන්නේ. හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා හැමදාම කථා කරනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

උත්තරයක් දෙන්න පුළුවන් විධියට පාර නම් කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමා මහ ඇමතිතුමා කියන දේ අහලා මගෙන් අහනවා. මුලින්ම ඔබතුමා රීති පොත කියවන්න. (බාධා කිරීම්)

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පාර නම් කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර මූලාසනයට ඇහුම්කන් දෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කැස්බෑව ආසනයේ පාරවල් 38 ක වාර්තාවක් ඊළඟ සභාවේදී ඔබතුමාගේ අතට දෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හා. බොහොම හොඳයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

හැබැයි පරීක්ෂණ පවත්වන්න ඕනෑ. හෙක්ටර් බෙත්මගේට කරපු එක කරන්න එපා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මතක් තියා ගන්න. කෝප් එකෙත් තියෙනවා. TO මහත්වරු කරන වැරදි අනන්තයි. අප්‍රමාණයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යථාර්ථය තුළ දැන් ප්‍රසන්න රණතුංග ගරු මහ ඇමතිතුමා ඉදිරිපත් කරනවා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය. වැඩක් නැහැ. කොළඹ කුණු පුත්තලමට වඩම්මන පුත්තලම් බූරු ව්‍යාපෘතියක් තිබෙනවා. මේ පිළියන්දලට එකතු වන කුණු කොළොන්නාවට ගෙනිහිල්ලා, කොළොන්නාවෙන් කෝච්චියේ දාලා පුත්තලම් ගෙනියනවා. කුණු කිලෝ එකක් පුත්තලමට යන කොට රු. 150/- ක් විතර වෙලා. සමහර වෙලාවට කුණු කන්න පුළුවන්. ප්‍රසන්න රණතුංග ගරු මහ ඇමතිතුමා දන්නේ නැහැ පුත්තලම් බූරු ව්‍යාපෘතිය ගැන. කොළඹ දිස්ත්‍රික්කයේ කුණු පුත්තලම් වඩම්මන ව්‍යාපෘතිය. ගිය වසරේ පාර්ලිමේන්තු අයවැයේදී මේකට සල්ලි වෙන් කළා. ඒක කරන්න බැරි වුණා. දැන් මේ අවුරුද්දෙත් දාලා තිබෙනවා. මේ පුත්තලම් බූරු ව්‍යාපෘතිය. පිළියන්දල කුණු පුත්තලම් වඩම්මනවා. මේ කොමිස් ගහන සමාගම මොකක්ද? ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යථාර්ථය තුළ අද ගන්න ගුරුවරුන්ට මොකක්ද වෙලා තිබෙන්නේ? බොහෝ අය දන්නේ නැහැ, මේ නිලධාරීන් තමන් රාජ්‍ය සේවකයෝ කියලා. ඔවුන් හිතාගෙන ඉන්නේ රජයේ සේවකයෝ කියලා. මේ පවතින ආණ්ඩුවේ සේවකයෝ කියලා. මේ ඔක්කොම වරද්දාගෙන. මේ ඔක්කොම ශ්‍රී ලංකා රාජ්‍යයට අයිති සේවකයෝ. තමන්ගේ යුතුකම කරන්න ඕනෑ පළාතේ ජනතාවට. එහෙම නැතිව දේශපාලන අධිකාරියේ සමහරුන්ට ඕනෑ විධියට නොවෙයි. එහෙම කරන නිලධාරීන් තමයි අද මේකේ වැඩියෙන්ම ඉන්නේ. ඒ නිසා තමයි මේ පළාත් සභාව මෙපමණ මුදල් සම්භාරයක් වියදම් කරන බස්නාහිර පළාත් සභාව මේ තැනට වැටිලා තිබෙන්නේ.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ප්‍රසන්න රණතුංග මැතිතුමාගෙන් ඉල්ලන්නේ, සිය දෙවැනි ඉණිමේ පළමුවැනි අවුරුද්ද. අලුත් අයවැය ඉදිරිපත් කරපු වෙලාවේ

කොහොම හරි බලන්න මේ නිලධාරි වාදයෙන් මේක බේරා ගන්න. මේ නිලධාරීන් තමයි මේක වැරදි තැනකට අරන් යන්නේ. ඒ නිසා තමුන්නාන්සේ වඩාත් අවධානය යොමු කළ යුත්තේ, මේ කාරණා සම්බන්ධයෙන්. නගර සභාවල සභාපතිවරයකුගේ වරදවල් කෝටියක් කිව්වත්, ප්‍රසන්න රණතුංග ගරු මහ ඇමතිතුමා ඔලුව හරවලා බලන්නේ නැහැ. ඒ නිසා මේ සභාව සම්බන්ධයෙන් ජනතා අප්‍රසාදය දවසින් දවස වැඩි වෙනවා.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට කොහේටද යන්න පුළුවන් වෙන්නේ. මේ සභාවේ ප්‍රසන්න රණතුංග ගරු මහ ඇමතිතුමාගෙන් මම ප්‍රශ්නයක් ඇහුවා. කොළඹ Ministry of Crabs. කකුළු අමාත්‍යාංශය කියන අමාත්‍යාංශයට නම දැම්මේ කොහොමද කියලා. දැන් අවුරුදු එකහාමාරක් වෙනවා. ප්‍රසන්න රණතුංග ගරු මහ ඇමතිතුමාගෙන් ප්‍රශ්නය අහලා. මේ සභාවේදී පොරොන්දු වුණා, අමාත්‍යාංශය කියන වචනය ව්‍යාපාර නාම ලියාපදිංචියකට දෙන්න බැහැ. නමුත් දැන් කකුළු අමාත්‍යාංශයට අවසර දීලා කොළඹ කොටුවේ දුවගෙන යනවා. හෙට උදේට මේ රටේ කැසිනෝ අමාත්‍යාංශය කියලා ව්‍යාපාරිකයෙක්, එහෙම නැත්නම් එතනෝල් අමාත්‍යාංශය කියලා ව්‍යාපාරයක් පටන් ගත්තොත් බස්නාහිර පළාත් සභාවේ ව්‍යාපාර නාම ලියාපදිංචිය දෙනවාද? අද ඒ නිලධාරීන් අවුරුදු එකහාමාරක්, අඩුම ගණනේ ඒ අදාළ පුද්ගලයින්ගෙන් ඇයි මෙහෙම වුණේ කියලා ඇහුවේ නැහැ. ප්‍රසන්න රණතුංග ගරු මහ ඇමතිතුමා අපට මේ බෙදපු පොත් පිංචේ තිබෙනවා, ඔවුන්ගේ කාර්යභාරය මොකක්ද කියලා. Printed නිර්වචනයවත් ඒ අදාළ නිලධාරීන් දන්නේ නැහැ. එහෙම තිබෙද්දී මේ සභාව ඉදිරියට යන්න බැහැ. ඒ නිසා අපි ප්‍රසන්න රණතුංග ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, ඔබතුමාට අලුතෙන් හිතන්න වෙනවා. ඔබතුමාට අලුතෙන් දකින්න වෙනවා. අපි ගියවර දැක්කා, ඔබතුමා විවිධ Products හදාගෙන එනවා. අර සුපසන් නිම්තෙර. ඒ වාගේ මොකක් හරි හදාගෙන එන්න. ඇවිල්ලා මේ නිම්තෙරින් එගොඩ වෙන්න. මේකෙන් එගොඩ වෙන්න. මේකෙන් එගොඩ වෙන්න අමාරුයි. කකුලෙන් අදිනවා. නිලධාරීන් අදිනවා. සමහර දේශපාලඥයෝ අදිනවා. තමුන්නාන්සේ උදේට නැගිටින කොට තමුන්නාන්සේගේ පස් දෙනාගෙන් එක්කෙනෙක් අඩුයි දැන්. දැන් එක්කෙනෙක් මේ පැත්තට ඇවිල්ලා. ඒ නිසා නිලධාරී වාදය විතරක් නොවෙයි, පුද්ගල දේශපාලනයත් මේ ඇතුළේ ඇතුළත් වෙලා තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපිත් එක්ක ගිය මැතිවරණයේදී මෙහෙම තිබුණේ නැහැ. ඒ නිසා ඔබතුමාට මතක් කරනවා. මේ පළාත් සභාවේ ගුරුවරු, විදුහල්පතිවරු ඉන්නවා. පාසලේ සංවර්ධන කමිටුවට ලැබෙන සල්ලි, එහෙම නැත්නම් පාසලේ උත්සවයකදී ලැබෙන සල්ලි, චෙක්පත් ලැබුණාම මහත්තයාගේ ගිණුමට තැන්පත් කර ගන්න ගුරුවරු ඉන්නවා. විදුහල්පතිවරු ඉන්නවා. පාසලට හම්බ වුණු චෙක්පත් තමන්ගේ මහත්තයාගේ ගිණුමට දා ගත්ත විදුහල්පතිවරු. දැන් එක ප්‍රශ්නයක් මම ගියවර සභාවේදී යොමු කරලා තිබෙනවා. ඒකට පිළිතුරු දෙන්න ගරු මහ ඇමතිතුමා කල් ඉල්ලලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම බස්නාහිර පළාතේ අධ්‍යාපන, පළාත් පාලන උපදේශක කාරක සභාව මීට වඩා ක්‍රමවත් විය යුතුයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න උත්සාහ ගන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

උත්සාහ ගන්න, ගන්නවා. හරි. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි ඔබතුමාට කියන්නේ, අධ්‍යාපන උපදේශක කාරක සභාව මීට වඩා කාර්යක්ෂම විධියට කරන්න පුළුවන්. වැඩියෙන්ම තිබෙන්නේ, දිනය දෙනවා. දිනය කල් දානවා. ඒ නිසා එහෙම කරන්න එපා. ලබන වසරේවත් කියපු දිනයට කියපු වෙලාවට ගරු ප්‍රධාන අමාත්‍යතුමා ලෙන් දොර ඇරලා එළියට එන්න ඕනෑ. ඇවිල්ලා පළාත් සභාවේ අධ්‍යාපන උපදේශක කාරක සභාවේ වාඩි වෙන්න ඕනෑ. අපට එන්න කියනවා. එන්න කියලා දවස් දෙකට ඉස්සෙල්ලා කියනවා මේක නැහැයි කියලා. ඒ නිසා අවසාන වශයෙන් මට එක්සත් ජාතීන්ගේ හිටපු මහ ලේකම් කොෆී අනන් මහත්මයා සංවර්ධනය පිළිබඳව කියපු ප්‍රකාශයක් තිබෙනවා. යම් රටක් සංවර්ධනය වන්නේ නම්, ඒ රටේ ජනතාව සෞඛ්‍ය සම්පන්නව සහ සැකෙන් බියෙන් තොරව ජීවත් විය යුතු රටක් බවට පත් වෙන්න ඕනෑ. ඒ නිසා අපි දන්නවා, මේ රටේ ජනතාවට සැකෙන් බියෙන් තොරව ජීවත් වෙන්න පුළුවන්ද නැද්ද කියන එක අපි ජනවාරි මාසේ අට වැනිදාට තීන්දු කරන්න ඕනෑ. ජනවාරි අට කියන්නේ -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යුද්ධය ඉවර කරලා කළේ, ඒක තමයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනවාරි 08 කියලා කියන්නේ, ජනාධිපතිවරණය නොවෙයි. ලසන්ත වික්‍රමතුංගව මහ පාරේ ඝාතනය කරපු දවස. ජනවාරි 08 කියන්නේ ලසන්ත වික්‍රමතුංගව මහා පාරේ ඝාතනය කරපු රාජ්‍ය ත්‍රස්තවාදීන්ගේ දවස. ඒ නිසා ජනවාරි 08 ට මේ සාපය නවත්වන්න මේ බස්නාහිර පළාතේ බහුතර ජනතාව මේ පාපකර සමාගමට විරුද්ධව එකතු වෙනවාය කියලා විශ්වාස කරනවා.

[ අ.භා. 04.31 ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු මහ ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ විනාඩි කිහිපයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන. එතුමාගේ වැය ශීර්ෂයන් ගණනාවක් තිබුණත් සියලු දෙනා උනන්දු වෙන්නේ සහ වැඩි අවධානයක් යොමු කරන්නේ, අධ්‍යාපන විෂය පිළිබඳව වැඩිපුර අදහස් ප්‍රකාශ කරන්න. ඒ වාගේම අපිත් අධ්‍යාපන විෂය සම්බන්ධයෙන් කාරණා කිහිපයක් කියන්නට මේ වෙලාව පාවිච්චි කරනවා. අපි දන්නවා. අද ලංකාවේ පවුල් ඒකකයන්වල සුවිසාලම උනන්දුව තිබෙන්නේ, තමන්ගේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් උදා කරලා දෙන්න ගන්න උත්සාහයට. ඒක තමයි බලාපොරාත්තු පැසේ, බලාපොරොත්තු මල්ලේ ඉහළටම ඇවිල්ලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ අයවැය විවාද පවත්වන වෙලාවල්වලදී පළාත් සභාවට ආපු මුල් කාලයේ අපි දිගින් දිගටම කිව්වා, ලංකාවේ අධ්‍යාපනයේ පන්ති පරතරය පුළුල් වෙමින් තිබෙනවාය කියලා. ලංකාවේ අධ්‍යාපනය ඇති හැකි අයට අවශ්‍ය තරම් ගන්නත්, අහිංසක මිනිස්සුන්ට ඒ අධ්‍යාපනයේ අයිතිවාසිකම අහුරා තිබෙනවාය කියන කාරණයක් අපි දිගින් දිගට කිව්වා. ඒ නිසා ඒ පරතරය අඩු කරන්න යම් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුයි කියන කාරණය අපි කිව්වා.

1945 දී සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ඇති කරපු නිදහස් අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලදී මේ පරතරය අඩු කිරීමේ ක්‍රියාදාමයක් තිබුණා. ඒ හරහා මධ්‍ය මහා විද්‍යාල සංකල්පය බිහි වෙලා, ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල දරුවන්ට අධ්‍යාපනයේ ඉඩ ප්‍රස්ථාව නිර්මාණය කර ගැනීමේ හැකියාව ලැබුණා. මම විශ්වාස කරන්නේ, ඊට පස්සේ එවැනි අවස්ථාවක් නැවත ඇති වෙන්නේ, ද්විතියික පාසල් සංකල්පය ඇවිල්ලා, විශේෂයෙන්ම තාක්ෂණික විෂය ධාරාව ඇතුළත් උසස් අධ්‍යාපනයක් ඇවිල්ලා ඇති වුණු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා තමයි මේ තත්ත්වය පුළුල් වෙන්නේ. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තවමත් මේ තත්ත්වය පවතින්න බලපාන ප්‍රධාන කාරණයක් තමයි දරුවන් ඇතුළත් කරන්න තිබෙන ප්‍රශ්නය. මම අවස්ථා ගණනාවකදී කිව්වා, මේ රටේ ඊළඟ කැරැල්ල මතු වෙන්නේ, පාසල් දරුවෝ ඇතුළත් කිරීම සඳහා වූ ප්‍රශ්නය නිසා කියන කාරණය. මම ඒක දිගින් දිගට කිව්වා. අදත් ඒ ප්‍රශ්නයට නිසියාකාරව විසඳුම් හම්බ වෙලා නැහැ. අපි දන්නවා, පාසල් දරුවෝ ඇතුළත් කිරීම කියන කාරණය ජාතික ප්‍රතිපත්තියක් තුළ නිර්මාණය කරන එකක්. ඒකට අපට මැදිහත් වෙන්න බැහැයි කියන විශ්වාසයේ තමයි අපි ඉන්නේ. නමුත් අපි පළාත් සභාවක් විධියට පාසල් දරුවෝ ඇතුළත් කිරීම සඳහා වූ ප්‍රතිපත්තිය නිර්මාණය කිරීමේ කාර්යය අපට නැති වුණත්, ඊට බලපෑම් කිරීමේ කාර්යයේ අපි සක්‍රියව දායකත්වය දෙන්නම ඕනෑ. මේ පාසල් දරුවෝ ඇතුළත් කිරීමේ චක්‍රලේඛය හදලා තිබෙන්නේ, ජාතික පාසල්වලට දරුවෝ ඇතුළත් කරන්න අවශ්‍ය සුදුසුකම් සපුරා ලීමේ කාරණා සලකා බලලා විතරයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ වාගේ ප්‍රදේශවල, අවිස්සාවේල්ල ආසනයේ ඈත දුෂ්කර ප්‍රදේශවල, ජනපදවල, ගම්මානවල, අලුතෙන් නිර්මාණය කරන අලුත් ගම්මානවල, ගම් පුළුල් කිරීම යටතේ ඉඩම් බෙදලා දුන්නාට පස්සේ, මිනිස්සු පදිංචි වුණාට පස්සේ ඒ අයට ඔය කියන සුදුසුකම්, අධ්‍යාපනය සඳහා දරුවෝ ඇතුළත් කරන්න පාවිච්චි කරන චක්‍රලේඛයේ සුදුසුකම් සපුරන්න පුළුවන්කමක් නැහැ. ඔප්පුව නැහැ. ඒ අයට දීර්ඝ කාලීන පදිංචිය නැහැ. ඒ අය ඉන්නේ ඉතාම පුංචි ඉඩම් කට්ටිවල. ඒ නිසා දෙමව්පියන්ට ඔප්පුවලින් දරුවන්ට අයිතිය ලියා දෙන්න පුළුවන්කමක් නැහැ. මේ සියලු කාරණා මත දරුවෝ ඇතුළත් කිරීමේ කාරණයේදී ඒ අය ඇඩි දුෂ්කරතාවයට පත් වෙනවා. ඒ නිසා හොඳ පාසලකට දරුවෝ ඇතුළත් කර ගන්න බැරිව යනවා. ඒ නිසා දේශපාලඥයෝ පස්සේ යන්න සිද්ධ වෙනවා. අපිත් සමහර වෙලාවට මැදිහත් වෙනවා. හැබැයි, ඒකේදී 100% ක් සාධාරණය ඉෂ්ට කරන්න බැරිව යනවා. ඒ නිසා අපි මේ ග්‍රාමීය ප්‍රදේශවල අහිංසක මිනිස්සු මුහුණ දෙන

[ ගරු මහේෂ් අල්මේදා ]

ප්‍රශ්නවලට සාධාරණය ඉෂ්ට කරලා දෙන්න පුළුවන් විධියට මේ පාසල් දරුවෝ ඇතුළත් කිරීමේ ප්‍රතිපත්තිය නිර්මාණය කිරීමේ කාරණයට පළාත් සභාවක් විධියට මැදිහත් වෙලා ඒ අයට සාධාරණය ඉෂ්ට කරලා දුන්නේ නැත්නම් මේ රටේ දරුවන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් නැවත වතාවක් කැරැල්ලක් නිර්මාණය වන එක නතර කරන්න බැහැයි කියන කාරණය අපි මේ වෙලාවේ මතක් කරලා දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා. මේ වැය ශීර්ෂයට අධ්‍යාපන විෂය සඳහා තමයි පළාත් සභා මුදල් වෙන් කිරීම්වල, වැඩිම මුදල වෙන් කරලා තිබෙන්නේ. මුළු සමස්තය සැලකුවාම 38% ක්. මේකේදී ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. අපේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාත් කිව්වා, අතිගරු ජනාධිපතිතුමා අයවැය ප්‍රකාශය ඉදිරිපත් කරද්දී එතුමා බොහොම පැහැදිලිව කිව්වා, ශ්‍රී ලංකා ගුරු සේවය සඳහා සේවා ව්‍යවස්ථාවක් අනුමත කරන අතර, එමගින් 240,000 ක් පමණ වන ගුරුවරුන්ගේ උසස් වීම්, වැටුප් වර්ධක හා සේවා ආශ්‍රිත පරිපාලන ගැටළු ඉතා කාර්යක්ෂම ලෙස විසඳන්න අපේක්ෂා කරනවාය කියලා. ඒ වාගේම ගුරුවරුන්ගේ නිවාඩු හා වැටුප් වර්ධක අනුමත කිරීම විදුහල්පතිවරුන්ගේ මට්ටමට විමධ්‍යගත කරන්න අවශ්‍ය කටයුතු කරනවාය කියලා. ඒකේදීම තමයි කිව්වේ, ග්‍රාමීය පාසල්වල ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව, තොරතුරු තාක්ෂණය හා සෞන්දර්යය හා ක්‍රීඩා විෂයන්ට අදාළ ගුරු සහායකයන් 50,000 ක් පත් කරන්න අවශ්‍ය බඳවා ගැනීම් කරන්න කටයුතු කරනවාය කියලා. මේ නිසා ගරු සභාපතිතුමනි, අපි කියන්නට උත්සාහ කළේ, අපි දන්නවා අධ්‍යාපන විෂය සංවර්ධනය කරන්න වර්තමානයේ භෞතික සම්පත වාගේම මානව සම්පතත් දැවැන්ත විධියට සංවර්ධනය කරලා තිබෙනවා. නමුත් මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. ගුරුවරුන්ගේ ආකල්ප සංවර්ධනය සඳහා වූ යම් වැඩ පිළිවෙළක් වෙනුවෙන් මේ පළාත් සභාවේ අයවැයේදී මුදල් වෙන් කරන්න ඕනෑය කියලා. මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. මට එකම එක කාරණයක් කියන්නට ඕනෑ. ගරු සභාපතිතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා කථා කරද්දී කිව්වා, අවසාන වශයෙන් අධ්‍යාපනයට දේශපාලනය ඇඟිලි ගහනවා නම්, එය රටේ අනාගතය අඳුරු වෙන්න පුළුවන් කියලා. මේකේදී මට කියන්න ඕනෑ එකම එක කාරණයයි. මම හිතන්නේ අධ්‍යාපනයට දේශපාලන වශයෙන් ඇඟිලි ගැසීම ජනතා විමුක්ති පෙරමුණ තරම් කිසි කෙනෙක් කළේ නැහැ. අපි දන්නවා. ඕනෑම ශිෂ්‍යයෙක් තමන්ගේ අධ්‍යාපනයේ අග්‍ර ඵලය නෙලා ගන්නේ විශ්ව විද්‍යාල අධ්‍යාපනයේදී. අද මේ රටේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය, විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ වහල්ලු බවට පත් කර ගෙන තිබෙනවා, ජනතා විමුක්ති පෙරමුණ. අද යම් ප්‍රමාණයකට මේක අඩු කර ගෙන තිබෙනවා. මේක වෙනස් කරන්න කටයුතු කරලා තිබෙනවා. නමුත් තමන්ට නිදහසේ අධ්‍යාපනය කරන්න තිබෙන අයිතිය නතර කරලා දාපු දයා පතිරණලාව, ධර්මසිරිලාව මරා දාලා, ඒ විතරක් නොවෙයි, ඒ මරා දැම් හරහා එවකට පැවති රජයට ත්‍රිමා විතාරණ වාගේ ශිෂ්‍යයන් මරන්න අයිතියත් නිල වශයෙන් ගෙනැත් දීපු ජනතා විමුක්ති පෙරමුණ මේ කාරණය කියද්දී, අපට යම් විහිළුවක් මතක් වෙනවා කියන කාරණය තමයි මතක් කරන්න තිබෙන්නේ. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 04.40 ]

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ගෞරවයත්, ස්තුතියත් පුද කරනවා, මේ අවස්ථාවේ විපක්ෂය වෙනුවෙන් අවසාන වශයෙන් අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව. ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ දෙවැනි ධුර කාලයේ පළමුවැනි අයවැය ලේඛනය වෙනුවෙන් විපක්ෂයේ මන්ත්‍රීවරු බොහෝ පිරිසක්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු බොහෝ පිරිසක් තමන්ගේ අදහස් මේ අයවැය ලේඛනය පිළිබඳව මතක් කළා. ඒ වාගේම විශේෂයෙන් අධ්‍යාපනය

පිළිබඳව බොහෝ මන්ත්‍රීවරු ගණනාවක් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරපු නිසාම ඒ පිළිබඳව කථා කරන්න, වෙහෙසෙන්න අවශ්‍යතාවයක් නැතෙයි කියලා මම කල්පනා කරනවා. නමුත් එක කාරණයක් පිළිබඳව මතක් කරනවා. ද්විතියික හා ප්‍රාථමික පාසල් සංකල්පය පිළිබඳව කල්පනා කළේ, ග්‍රාමීය මට්ටමේ තිබෙන සමහර පාසල් වැසී යාම වැළැක්වීම සඳහා ඒවා ද්විතියික හා ප්‍රාථමික මට්ටමෙන් එහෙම නැත්නම් පැරණි මධ්‍ය මහා විද්‍යාල මට්ටමෙන් මේ විද්‍යාල ක්‍රමය හඳුන්වන්නට ඕනෑය කියලා. නමුත් අපි දන්නවා. සමහර තැන්වල ඒ ක්‍රමය සාර්ථක වුණත්, බොහෝ තැන්වල මේ ක්‍රමය අසාර්ථක බවට පත් වෙලා තිබෙනවා. මේ ප්‍රධාන ඇමතිතුමාගේ වාර්තාවලට අනුව දරුවන් 50 කට අඩු විද්‍යාල 66 ක් දක්වා අඩු වෙලා කියලා තිබුණත් මම හිතන්නේ, මේ අවුරුද්ද අවසාන වන කොට ඒ තිබුණු තත්ත්වය, 76 දක්වාම වර්ධනය වෙලා තිබෙනවාය කියන එක මම ප්‍රථමයෙන්ම මතක් කරන්නට ඕනෑ. ඒ නිසා විශේෂයෙන්ම අනෙක් කලාප කෙසේ වෙතත් හෝමාගම කලාපය බැලුවත් හෝමාගම කලාපය මේ ආකාරයට දරුවෝ ප්‍රාථමික විද්‍යාලවලට ඇතුළත් වීමේ අඩුකම නිසාම, වැහෙන විද්‍යාල ප්‍රමාණය අලුතෙන් දැන් හතරක් පහක් බවට පරිවර්තනය වෙමින් යනවා. ඒ නිසා අපට කියන්න තිබෙන්නේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අපේ පාසල අපේ දෑතින් සුරකිමු කියන සංකල්පය වෙනුවට අපේ පාසල අපේ දෑතින් වනසමු කියන තැනට තමයි අපට යන්න වෙන්නේ, මේ තත්ත්වය ක්‍රමවත්ව වළක්වා ගන්නට කටයුතු නොකළොත්.

ඒ වාගේම අපි දන්නවා, අද මහින්දෝදය නව තාක්ෂණික මධ්‍යස්ථාන ඇති කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපේ ප්‍රසාදය අපි පළ කරනවා. නමුත් ඒ තෝරා ගැනීම් සමහර තැන්වලට ගියාම දේශපාලන කාරණා මත තමයි විද්‍යාල තෝරා ගෙන තිබෙන්නේ. දැන් උදාහරණයක් විධියට මම එක කාරණයක් කියන්නම්. හෝමාගම නියෝජනය කරන පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් දෙපළක් මෙතැන ඉන්නවා. 1 ශ්‍රේණියේ සිට 12 ශ්‍රේණිය දක්වා තිබෙන මත්තේගොඩ විද්‍යාදීප විද්‍යාලයේ අද එවැනි තාක්ෂණ ගොඩනැගිල්ලක් නැහැ. නමුත් මාඹුල්ගොඩ තිබෙන 1 සිට 6 දක්වා තිබෙන විද්‍යාලයට ලක්ෂ ගණනක් වියදම් කරලා අද ඒ විද්‍යාගාරයක් ලබා දුන්නත් ඒකෙන් ප්‍රයෝජනය ගන්න ඒ විද්‍යාලයේ ඒ දරුවන්ට අහිමි වෙමින් යනවා. ඒ නිසා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සංවර්ධනය කරන්න ඉඩ නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

සංවර්ධනය කරන්න ඉඩ නැහැයි කියලා මේ මහජන මුදල් වැරදි විධියට කාබාසිනියා වෙනවා නම්, රටකට ඇති තත්ත්වය මොකක්ද? මේක තමයි මේ සංවර්ධනය කියලා කියන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මාස තුනක් ඉවසන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මාස තුනක් ඉවසන්න කියලා කියන්නේ, ඒ ගොඩනැගිල්ල ගිහිල්ලා වෙනත් තැනක තියන්නද? ගරු සභාපතිතුමනි, ඒ විද්‍යාලයත් වැහෙන තත්ත්වයට යන්නේ. මෙන්න මේ තත්ත්වය එක පැත්තකින් අවිධිමත් විධියට - (බාධා කිරීමක්) මේක අපි කියන්නේ, මේ ප්‍රධාන ඇමතිතුමාගේම කාර්යභාරය නොවෙයි. නමුත් අද හෝමාගම තිබෙන තත්ත්වය තමයි පළාත් සභාවේ ජයග්‍රහණයක් නොවන දෙයකට - පළාත් සභාවේ ඕනෑම ජයග්‍රහණයක් තමන් වෙත ළඟා කර ගන්න කැමැති මධ්‍යම රජයේ ඇමතිවරයා පළාත් සභාවක දුර්වලතාවයක් වුණොත් ආ ඕක මගේ නොවෙයි, ඕක පළාත් සභාවේ උදවියට ගිහිල්ලා කියන්න කියලා තමයි අද එහේ ඉන්න මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිවරයාගේ වගකීම වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ආසනේ ප්‍රශ්න, ආසනේ විසඳගන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මත්තෙගොඩ විද්‍යාලයේ දෙමව්පියෝ, දරුවෝ සියලු දෙනා ගිහිල්ලා මේ මාඹුල්ගොඩ විද්‍යාලයේ මේක ඇතුළු කරන්න එපාය කියලා කියද්දී මාඹුල්ගොඩ විද්‍යාලයේ තිබුණු දේශපාලන රැස්වීමකට ගිහිල්ලා දීපු පොරොන්දුවක්

[ ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා ]

ඉෂ්ට කරන්න ගිහිල්ලා අද මේ විනාශය කර ගෙන තිබෙන්නේ. මම කියන්නේ, මේ එක උදාහරණයක් විතරයි. ඒ නිසා අනික් පැත්තෙන් මම මතක් කරන එක කාරණයක් තමයි, බස්නාහිර පළාතේ ඉඩම්වල අයිතිය පිළිබඳව අද ප්‍රශ්නයක් තිබෙනවා. අද රජයේ ඉඩම්වල අයිතිය අපට තිබුණත්, අද මේ රජයේ ඉඩම් පාලනය කරන්නේ මධ්‍යම ආණ්ඩුවට අවැසි විදියට. ඒ නිසාම අපට පේනවා බස්නාහිර පළාත් සභාවට අයිති ඉඩම්වල ආදායම අද බස්නාහිර පළාතට අහිමි වෙමින් යනවා. ඒ නිසා අපි මේ අවස්ථාවේදී මතක් කරන්නේ. අනික් පැත්තෙන් මේ ඉඩම්වල අයිතිය විතරක් නොවෙයි. අද සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමතිතුමාට මතක් කරන්න කැමැතියි. අද සාමාන්‍ය ගැමියෙක් තමන් කරන සුළු ව්‍යාපාරයක් වෙනුවෙන් තක්සේරු වාර්තාවක් ගන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියාම අද ඒ තක්සේරු වාර්තාව ගන්න අනන්ත අප්‍රමාණ වාර්තා පුරවන්න ඕනෑ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඔහුට ඉඩමේ තක්සේරුව, ඇපයට තියන ඉඩම ලක්ෂ ගණනක් වටිනවා නම්, ඔහුට ගන්න ඕනෑ තක්සේරු වටිනාකම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ. මට වෙලාව මදි නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩි 08 යි තිබෙන්නේ. (බාධා කිරීම්)

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

12 ක් තිබිලා, 2 ක් දුන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. 10 ක් තිබිලා දුන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

12 ක් තිබිලා 2 ක් දුන්නා. 10 ක් තිබිලා 3 ක් දුන්නා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමා කථාව කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසා අවසාන වශයෙන් මම එකක් කියන්නම්. මේ වෙලාවේ අපි මේ ප්‍රධාන ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන අද ඉතාම ශෝචනීය තත්ත්වයක් ඇති වෙලා තිබෙන පළාත් පාලනය පිළිබඳව අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාත් මතක් කළා. ඒ නිසා ප්‍රධාන ඇමතිතුමාට කියනවා. අද මේ බස්නාහිර පළාතේ ඉතාම නින්දනීය තත්ත්වයට පත් වෙලා තිබෙන ආයතනයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා, පළාත් පාලන ආයතන. සභාපතිවරයෙකුගෙන් අහන්නේ නැතිව වැලි කපන්න බැහැ. කොන්ත්‍රාත් කරන්නේ සභාපති. කොන්ත්‍රාත් කරන්නේ මන්ත්‍රී. පාරවල්වලට ගල් ටික අදින්න ඕනෑ මන්ත්‍රී. මේක තමයි මේ ආණ්ඩුවට වෙලා තිබෙන දේ. මේ පිළිබඳවත් අපි දන්නවා. පළාත් සභාවේ මන්ත්‍රීවරුත් ඉන්නේ දැඩි කම්පනයකින්. ඒ නිසා ගරු ප්‍රධාන ඇමතිතුමාට අපි කියනවා. ඒ පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගේ ගෞරවය රැකෙන විදියට වැඩ කරන්නය කියන එක.

[සභාවේ සෝෂා]

ඒ අය තමයි මට කිව්වේ කියන්න කියලා. (බාධා කිරීමක්) මහ ඇමතිතුමාට කියන්න කිව්වා, සභාපතිවරු (බාධා කිරීම්) ඒ නිසා අපිත් මහ ඇමතිතුමාට කොයි වෙලාවේ හරි කියන්න ලැහැස්ති වෙලා ඉන්නේ කියලා, ඒ අය තමයි මට කියන්න කිව්වේ.

[සභාවේ සෝෂා]

ප්‍රධාන ඇමතිතුමාට මතක් කරනවා, මීට වඩා හොඳ නිරවුල් තාවයක් ඇති කරන්න කටයුතු කරන්න කියලා.

[සභාවේ සෝෂා]

[ අ.භා. 04.50 ]

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ප්‍රධාන අමාත්‍ය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව අදහස් දක්වපු සියලුම ගරු මන්ත්‍රීවරුන්ට පළමුවෙන්ම මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා. අපි විශ්වාස කරනවා, පසුගිය පළාත් සභා මැතිවරණයේදී බස්නාහිර පළාතේ ජනතාව විශාල ඡන්ද ප්‍රමාණයකින් අපට ජයග්‍රහණය කරවලා, පෞද්ගලිකව මනාප විශාල ප්‍රමාණයක් ලබා දීලා නැවත වරක් පත් කළේ අපි ගැන තිබුණු විශ්වාසය නිසා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් පිළිබඳව මේ කථා කරපු අදාළ කරුණු පිළිබඳව ඉදිරියේදී ගොනු කිරීමක් කරලා උපදේශක කාරක සභාවේදී ඒ පිළිබඳව සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා. නමුත් කෙටියෙන් මම ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරපු අදහස්වලට මගේ කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. නැත්නම් ඒ පිළිබඳ වැරදි අර්ථ කථනයක් හෙට මාධ්‍ය හරහා යන්න පුළුවන් නිසා.

ගරු සභාපතිතුමනි, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා, එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීවරු සරුදම් අරුණැල්ල වැඩ සටහන ගැන කථා කළා. එතුමන්ලාගේ කථාවේදී එතුමන්ලා කිව්වා, මේ වැඩ සටහනේදී දූෂණය, වංචාව, නාස්තිය සිදු වෙනවාය කියලා. ගරු සභාපතිතුමනි, මේක පැහැදිලි කරන්න ඕනෑ. මේ වැඩ සටහනේ අපි ප්‍රතිපාදන දෙන්නේ අදාළ ග්‍රාම සේවක, සමෘද්ධි සංවර්ධන නිලධාරී ඇතුළු රාජ්‍ය නිලධාරීන් සහතික කරපු දහම් පාසල්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වෙලා, ඒ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ තමයි මේ වැඩේ සිද්ධ වෙන්නේ. එතකොට අපි ඒ ආයතනවලට චෙක්පතක් තමයි දෙන්නේ. එතකොට ඒ වැඩ සටහනේදී යම් හෙයකින් ඔබතුමන්ලා කියන දූෂණ වංචා රාශියක් සිදු වෙනවා නම්, ඒ ගැන අධීක්ෂණය කරන්නත් ඒ දහම් පාසල්වල ආගමික නායකයන්ගේ ප්‍රධානත්වයෙන් උපදේශක මණ්ඩලයක් පත් කරලා, ඒක පවා අධීක්ෂණය කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා. අපි ව්‍යාපෘති කිහිපයක් පිළිබඳව අධීක්ෂණය කළා. අපි ලක්ෂයක් දෙන කොට ලක්ෂ දෙක තුනක වැඩ දහම් පාසල්වල කරලා තිබුණා. ඒ නිසා මම ප්‍රතික්ෂේප කරනවා, එක්සත් ජාතික පක්ෂයේ මේ මන්ත්‍රීවරු මේ ආගමික නායකයින් දූෂණය, වංචාව, නාස්තිය කරනවාය කියලා ආගමික නායකයින්ව හෑල්ලුවට ලක් කිරීම පිළිබඳව. එහෙම වැඩ පිළිවෙළක් මේ වැඩ පිළිවෙළ තුළ නැහැ. ඒ නිසා ඒක මම හිතන්නේ, රටට හෙළි වුණාම ඒක ඔබතුමන්ලාටත් හොඳ නැහැ. ඔබතුමන්ලාගේ පක්ෂයටත් හොඳ නැහැ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපේ පාසල අපේ දෑතින් සුරකිමු කියන වැඩ සටහන ගැන විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු අදහස් ඉදිරිපත් කළා. මම දන්නවා. ඒ වැඩ පිළිවෙළ විරුද්ධ පක්ෂයට පොඩ්ඩක් රිදුනා. මොකද, ඒක සිද්ධ වුණේ, දෙසැම්බර් මාසයේ මැතිවරණයක් ආසන්නයේදී. නමුත් ඒ මන්ත්‍රීවරු දැන ගෙන හිටියේ නැහැ. අපි මේක පළමුවැනි පාරට කරපු දෙයක් නොවෙයි. මේක පසුගිය අවුරුදු දෙකෙත් අපි මේ විධියටම කළා. ඒ විධියට මේ චෙක් එක දෙන්න ඒ වැඩ සටහන කළේ නැහැ. ඒකේදී ප්‍රතිඵල විශ්ලේෂණයක් කළා. ශිෂ්‍යත්වයේ දරුවන්ට සහතිකපත් දුන්නා. ඒ වාගේම ගුරු පුහුණුව ලබපු අයට සහතික ටික දුන්නා. ඊට අමතරව චෙක්පත දුන්නා. ඊටත් අමතරව ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමාගේ අයවැයේදී පළාත් සභාවලට ලබා දෙනවාය කියපු අතිරේක මුදල් සඳහා ව්‍යාපෘති හඳුනා ගැනීමත් ඒ රැස්වීමේදී කරන්න කිව්වා. ඒ නිසා ඒ වැඩ සටහනේ මම වගකීමෙන් කියනවා. ඒක අපේ මන්ත්‍රීවරු කිව්වා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වයෙන් කරන්න කියලා. ඔව්. ඒක ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වයෙන් තමයි කරන්න කිව්වේ, ඒකේ අධීක්ෂණ කටයුත්ත පැහැදිලිවම ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට භාර නිසා. හැබැයි, අපි කාටවත් එන්න එපාය කියලා කිව්වේ නැහැ. ඔබතුමන්ලා සහභාගී වුණා නම් මේ වැඩ පිළිවෙළ ගැන දැන ගන්න තිබුණා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වයෙන් ඒ වැඩ සටහන කරන්න කියලා අපි කිව්වා.

අපි දන්නවා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් සමහර උත්සවවලට ඇවිල්ලා සහභාගී වුණා. ඒ නිසා අපේ සමහර මන්ත්‍රීවරු හැඳුවා අධ්‍යාපනය දේශපාලනීකරණය කළා කියලා කියන්න. මම හිතන්නේ, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඒ සඳහා උත්තරයක් දුන්නා. හැබැයි, මම තමුන්නාන්සේලාට කියන්න ඕනෑ. ඔය සමහර විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු Face book හරහා, යුනිෆෝම් පිටින් දරුවන්ව සිරිකොතට ගෙන්වපු ක්‍රමවේද අපි අනුගමනය කළේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මේ මන්ත්‍රීවරු කරපු අය දන්නවා. ඒවා පසුගිය දවස්වල පුවත්පත්වල ගියා. ඒ කියපු අය තමයි අද කථා කරන්නේ අධ්‍යාපනය දේශපාලනීකරණය කරලා කියලා. අපි මොනම වෙලාවකවත් අධ්‍යාපනය දේශපාලනීකරණය කරන්න කටයුතු කරලා නැහැ. ගරු සභාපතිතුමනි, අපි දෙමළ විෂය ගුරුවරු සම්බන්ධව කරපු ක්‍රමවේදයක් තිබුණා. දෙමළ ගුරුවරු බස්නාහිර පළාතේ උපාධිය ගත් ගුරුවරුන්ට විභාගයෙන් තොරව පත්වීම් දුන්නා. නමුත් කළුතර දිස්ත්‍රික්කයේ තිබුණු පුරප්පාඩු සඳහා තවත් ගුරුවරු බඳවා ගන්න තිබුණු අවශ්‍යතාවය නිසා පළාතෙන් පිට ගුරුවරුන්ට පවා අපි ඒ අවස්ථාව ලබා දුන්නා. මීටත් අමතරව මේ වන කොට තවත් 2011 න් පස්සේ දෙමළ උපාධිය ගත් ගුරුවරුන්ව බඳවා ගැනීමේ වැඩ පිළිවෙළත් අපි මේ වන කොට ක්‍රියාත්මක කරලා කටයුතු කරගෙන යනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපේ මන්ත්‍රීවරු පාසල්වල මුදල් එකතු කරන එක ගැන කථා කළා. මම පැහැදිලිව කියන්න ඕනෑ. අපි දෙන මේ මුදල්වලින් පාසලක් නඩත්තු කරන්න හැකියාවක් නැහැ. ඒ සඳහා දෙමව්පියන්ගේ, ප්‍රදේශවාසීන්ගේ, සුභපතන්නන්ගේ දායකත්වය පාසල්වලට අවශ්‍යයි. මම කනගාටු වෙනවා. මොකද, පාසලක් අධ්‍යාපන කටයුතු කරන කොට ඒ පාසල ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කරන්න අපි මේ වාර්ෂිකව දෙන පනස් දාහෙන් හෝ ලක්ෂයෙන් ඒක කරන්න බැහැ. ඒ අයට ලබා දෙන මුදල්වලින් කරන්න බැහැ. අපි ඒ මුදල් ලබා දෙනවාට අමතරව අපි මන්ත්‍රීවරු - මම සන්තෝෂ වෙනවා. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්ත්‍රීවරු විශාල වශයෙන් අධ්‍යාපනය සඳහා තමන්ට ලැබෙන ප්‍රතිපාදනවලින් මුදල් වෙන් කරනවා. නමුත් කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ. අද මේ මුදල් ගැන කථා කරන විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් පාසල්වල සංවර්ධන කටයුතුවලට ලබා දෙන දායකත්වය ඉතාමත්ම අල්පයි. අපි ඉල්ලීමක් කරනවා. ඔය තරම් දුකක් තිබෙනවා නම්, කරුණාකරලා ප්‍රතිපාදන ටිකක් වෙන් කරලා, පාසල්වලටත් කටයුතු කරන්න කියලා.

ඒ වාගේම පාසල් දරුවන් ඇතුළත් කිරීම සම්බන්ධව කථා කළා. අග්‍රවිනිශ්චයකාරවරයා වශයෙන් සරත් එන්. සිල්වා මැතිතුමා ඉන්න කොට තමයි මේ සම්බන්ධව මූලික සාකච්ඡාව සිදු වුණේ. එදා ඒ තීන්දුව අරගෙන ලකුණු දෙන ක්‍රමවේදය පවා පැහැදිලිව කියලා දීලා තිබෙනවා. ඒ ක්‍රමවේදයට පිටින් පාසල්වලට දරුවන් ඇතුළත් කරන්න විදුහල්පතිවරුන්ට බැහැ. ඒ නිසා දරුවන් බඳවා ගත්තාට පස්සේ ඒ 42 සීමාව තුළ අපි දරුවන් සීමාව පවත්වා ගෙන යන්න අපේ මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. 42 සීමාව තුළ ඇතුළත් කර ගන්නා ක්‍රියාන්විත පාසල්වල පුරප්පාඩු සඳහා ගරු සභාපතිතුමනි, අපි අපට ලැබෙන අභියාචනාත් සලකලා ඒ දරුවන්වත් ඇතුළත් කරන්න කටයුතු කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා අධ්‍යාපනය ගැන ලොකු උනන්දුවකින් කථා කළා. මම එතුමාගෙන් ඇහුවා, අර බස්නාහිර පළාත් පාසල්වල ස්වේච්ඡා සේවයේ යොදවන ගුරුවරු සම්බන්ධව. මම ඔබතුමා මාර්ගයෙන් මෙම සභාව දැනුවත් කරන්න ඕනෑ. 2008 උපාධිධාරී ගුරු විභාගය සමත් වුණු සියලුම උපාධිධාරීන්ට ගුරු පත්වීම් ලබා දෙන්න අපි කටයුතු කළා. ඒ වාගේම 2011 ගුරු විභාගය සමත් වුණු, වාණිජ විෂයේ අවසාන ලකුණු ගත් අය ඇරෙන්න අනෙක් සියලු දෙනාට පත්වීම් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ගුරු විභාගය අසමත් වුණු අයට සංවර්ධන සහකාර පත්වීම් සියලු දෙනාට ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපට වාණිජ විෂයේදී අවසාන ලකුණු ගත්, විභාගයේ 40 බැගින් අරගෙන ඊළඟ ලකුණු ගත්ත අයදුම්කරුවන් 350 ක් හිටියා. ඒ අයට මේ පත්වීම් ලබා දීම සඳහා අපි ඉල්ලීමක් කළා. ක්‍රමවේදයක් අවශ්‍ය කරනවා. මොකද, ඊළඟ විභාගය 2014 තියන්න අපි කටයුතු කරලා තිබෙනවා. 2014 නැත්නම් 2015 මුල් භාගයේදී. එතකොට පරණ විභාගයෙන් ඒ අයව ඇතුළත් කර ගන්න බැරි වන හින්දා අපි ඔවුන්ගෙන් ඉල්ලීමක් කළා, ස්වේච්ඡාවෙන් වැඩ කරන්න. ගුරු පුහුණුව ලබන්න. ඒ අයට එතකොට අපට කැබිනට් පත්‍රිකාවක් දාලා පත්වීම් ලබා දෙන්න පුළුවන් කියලා. අපි කාටවත් එපා කිව්වේ නැහැ. වෙනත් රැකියා කරන අයටත් අපි උදව් කළා. ඒ සියලු දෙනාටම පත්වීම් ලබා දෙන්නත් අපි කටයුතු කරනවාය කියන එක ඔබතුමා හරහා සභාවට කියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, එතුමා ඉදිරිපත් කරපු දරුවා - මම ඇහුවේ ඒකයි ඔබතුමාගෙන්. ස්වේච්ඡා පත්වීමක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවාද කියලා. මේ එයින් දරුවෙක්. ස්වේච්ඡාවෙන් කරන අය මේ වන කොට පාසල් පද්ධතියට ඇතුළත් කරලා තිබෙනවා. එහෙම කෙනෙක් තමයි මේ ඉන්නේ. ඒ නිසා මෙතුමා වැරදි තොරතුරු සභාගත කිරීම තුළින් සභාව නොමග යවන්න කටයුතු කිරීම පිළිබඳව මම කනගාටු වෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, පබා මන්ත්‍රීතුමිය, මීනුවන්ගොඩ කලාපයේ කරපු වැඩ සටහන පිළිබඳව. මට ඔබතුමා කියද්දී, අපේ නිලධාරියෙක් ගෙන්වලා කථා කළා. හැබැයි, එතැනදී මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා ඒ කාරණාව. ඒ විතරක් නොවෙයි. එතුමිය ඉල්ලා තිබුණේ, පාසල්වල අවසර ලබා ගැනීමක් සඳහා. ඒ අවසරය මීනුවන්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් ලබා දීලා තිබුණා. නමුත් පළමුවැනි වැඩ සටහන කරන කොටම අපට ආපු පැමිණිලි නිසා, ඒ පෞද්ගලික දායකත්වය ලබා ගන්නා නිසා ඒ පළමු වැනි වැඩ සටහනෙන් පස්සේ ඒ වැඩ සටහන අවලංගු කරන්නත් අපි කටයුතු කරලා තිබෙනවා. ඔබතුමාගේ දැන ගැනීම සඳහා ඒක දැනුවත් කළේ.

ඒ වාගේම ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා, අපි නිලධාරීන්ගෙන් අපේ පාසල අපේ දැතින් සුරකිමු වැඩ සටහනේ තොරතුරු ලබා ගන්න ඉල්ලීමක් කළා. එහිදී කරපු වැඩ සටහන පිළිබඳව ප්‍රගතියක් දැන ගැනීමට අවශ්‍ය නිසා. විශේෂයෙන් ගුරුවරු, විදුහල්පතිවරු මහන්සි වෙන දේවල් මේ. මේවා ජනතාව දැනුවත් කරන්න, නිලධාරීන්ව දැනුවත් විය යුතු නිසා තමයි ඒ කාරණාව කිව්වේ. නමුත් ඔබතුමන්ලා එතැනදී කිවේ මොකක්ද? අපේ පාසල අපේ දැතින් සුරකිමු කියන වැඩ සටහන හරහා දූෂණ සිද්ධ වුණාය කියලා. ඔබතුමන්ලා ආගමික නායකයින්ට විතරක් නොවෙයි පාසල්වල විදුහල්පතිවරු, ගුරුවරු හා පාසල් සංවර්ධන සමිති හොරු ගණනට කථා කරපු එක ගැන මම කනගාටු වෙනවා. ඒ අයත් විශාල දායකත්වයක් අපේ පාසල් ගොඩ නගන්න කටයුතු කරලා තිබෙනවාය කියන කාරණාව මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අර ප්‍රදීප් වීජේරත්නසේකර මගේ පෞද්ගලික ලේකම්තුමා කියපු කාරණා පිළිබඳව. අපි ලියුමක් ඇරියා. අපට අවශ්‍ය වුණේ මම මගේ මහජන දිනය හැම බදාදා, බ්‍රහස්පතින්දා හා සෙනසුරාදා දිනවල කරන කෙනෙක්. දවස් තුනක්. එදාට එන ගුරුවරු සම්බන්ධව, ඒ පැමිණිලි සම්බන්ධව අපි සාකච්ඡා කරලා විසඳන්න කටයුතු කරනවා. එතැනදී සමහර ලිපි ලේඛන නිලධාරීන් හරහා එන කොට ඒක එන්නේ නැහැ. නිලධාරීන් හරහා රාජකාරී මට්ටමෙන් එනවා නම් ඔබතුමා කියපු ආකාරයට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හරහා ඉහළට පළාත් ලේකම්තුමාට එන්න පුළුවන්. නමුත් ඇමතිවරයා හැටියට මගේ පෞද්ගලික ලේකම් හරහා තොරතුරු ලබා ගැනීම සඳහා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. ඒත් ගුරුවරුන්ගේ. මම දන්නවා. ඔබතුමන්ලාට මේවා කරද්දී ඔබතුමන්ලාගේ වෘත්තීය සමිති පවත්වාගෙන යන්න බැහැ. සාමාජිකයෝ බඳවා ගන්න බැහැ. ඒ නිසා මේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම තුළින් අපි ගුරුවරුන්ගේ සුභ සාධන කටයුතුවල ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තිබෙනවාය කියන කාරණාව මතක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රධාන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 104, 109, 110, 111, 112, 113, 114 හා 115 වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ සම්බන්ධයෙන් සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***ශීර්ෂ අංක 104 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 55 යි, විපක්ෂව 31 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 104 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 55 for, 31 against and 00 decliners.*

***ශීර්ෂ අංක 109 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 55 යි, විපක්ෂව 31 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 109 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 55 for, 31 against and 00 decliners.*

***ශීර්ෂ අංක 110 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 55 යි, විපක්ෂව 31 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 110 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 55 for, 31 against and 00 decliners.*

***ශීර්ෂ අංක 111 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 55 යි, විපක්ෂව 31 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 111 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 55 for, 31 against and 00 decliners.*

***ශීර්ෂ අංක 112 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 55 යි, විපක්ෂව 31 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 112 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 55 for, 31 against and 00 decliners.*

***ශීර්ෂ අංක 113 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 55 යි, විපක්ෂව 31 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 113 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as* 55 *for,* 31 *against and* 00 *decliners.*

***ශීර්ෂ අංක 114 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 55 යි, විපක්ෂව 31 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No.* 114 *should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 55 for, 31 against and 00 decliners.*

***ශීර්ෂ අංක 115 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 55 යි, විපක්ෂව 31 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 115 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as* 55 *for, 31 against and* 00 *decliners.*

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී පූර්ණ කාරක සභාව පළාත් සභා තත්ත්වයට පත් කරනවා.

***ඊට අනුකූලව අ.භා. 05.03 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***

*Accordingly at 05.03 p.m. the Provincial Council resolved itself into a committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ]**
[Progress of the whole council]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශීර්ෂ අංක 100 ආණ්ඩුකාරවරයා, 101 බස්නාහිර පළාත් සභාව, 102 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳ වැය ශීර්ෂ අද දින පෙ.ව. 9.00 සිට පෙ.ව. 11.00 දක්වා සාකච්ඡාවට බඳුන් වුණා. සම්ප්‍රදායානුකූලව ඒ පිළිබඳව බෙදීමක් නොමැති වන නිසා එම වැය ශීර්ෂයන් සභා සම්මත වූ බව ප්‍රකාශ කරනවා. ඉන් අනතුරුව ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන, මිනිස් බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් පිළිවෙළින් 104, 109, 110, 111, 112, 113, 114 හා 115 යන ශීර්ෂයන් යටතේ විවාදය අද දින එනම්, 2014.12.02 දින පෙ.ව. 11.000 සිට ප.ව. 5.00 දක්වා විවාදය පැවති අතර, ඒ පිළිබඳව බෙදීමක් ඇති වූ නිසා, ඡන්ද විමසීමේදී එම වැය ශීර්ෂයන්ට පක්ෂව ඡන්ද 55 ක්, විපක්ෂව ඡන්ද 31 ක්, වැලකුණු 00 යනුවෙන් බෙදුණු අතර, එම වැය ශීර්ෂයන් වැඩි ඡන්ද 24 කින් සභා සම්මත වූ බව ප්‍රකාශ කරනවා.

# කල් තැබීම
## ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 05.04 ට, 2014 දෙසැම්බර් මස 03 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 05.04 p.m till 09.00 a.m, on 03.12.2014*